ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්

පියෙකු මෙන් මවක මෙන්

# වාර්ෂික වාර්තාව 2024



ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්

# අන්තර්ගතය


1. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් පිළිබඳ තොරතුරු
2. අධ්‍යක්ෂ මණ්ඩලය
3. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සමූහයේ ව්‍යුහය
4. සභාපතිතුමාගේ පණිවිඩය
5. සමූහ ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ සමාලෝචනය
6. විගණන සහ අනුකූලතා කමිටු වාර්තාව
7. මූල්‍ය වාර්තා
8. ආයතනික තොරතුරු
9. වාර්ෂික මහා සභාවේ දැන්වීම
10. පෙරකලාසි පත්‍රය

# ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් පිළිබඳ තොරතුරු

1962 දී ස්ථාපිත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් (SLIC), සම්පූර්ණයෙන්ම රජයට අයත් ව්‍යවසායකයක් වන අතර ශ්‍රී ලංකාවේ වඩාත්ම විශ්වාසදායක හා මූල්‍යමය වශයෙන් ශක්තිමත් ආයතනවලින් එකකි. දශක හයකට අධික ගෞරවනීය උරුමයක් සහිතව, SLIC ශ්‍රී ලාංකිකයන්ගේ පරම්පරා ගණනාවක ජීවිත හා වත්කම් ආරක්ෂා කිරීමේ කාර්යයේ යෙදී ඇති අතර ජාතික ආර්ථික සංවර්ධනයට සැලකිය යුතු දායකත්වයක් ලබා දී තිබේ.

සමාගම රක්ෂණ, සෞඛ්‍ය සේවා, විනෝදාංශ, බලශක්තිය සහ සේවා යන ප්‍රධාන අංශවල ක්‍රියාත්මක වන අනුබද්ධ සමාගම් සමූහයක් හරහා උපායමාර්ගික නායකත්වයක් හා පාලනයක් ද පවත්වා ගනියි.

මූල්‍යමය ශක්තිය, ස්ථාවරත්වය සහ මහජන සේවයට ඇති කැපවීම තුළින් කීර්තිමත් වන SLIC, විශ්වාසය, වගකීම සහ ජාතියේ ප්‍රගමනය යන මූලික වටිනාකම් තවදුරටත් ඉහළ නැංවීමට කටයුතු කරයි.

## අපගේ දැක්ම

අවදානම් සුරක්ෂිතකරණය සහ ජීවිත ආයෝජන ප්‍රශස්කරණය සම්බන්ධයෙන් ජාතියේ පළමු තේරීම බවට පත්වීම.

## අපගේ මෙහෙවර

අපගේ පාරිභෝගිකයින්ට වටිනාකම ලබාදෙන අවදානම් සුරක්ෂිතකරණය සහ ජීවිත ආයෝජන ප්‍රශස්තකරණය අපි සපයන්නෙමු. ඒ සඳහා කැපවූ වෘත්තිකයන් කණ්ඩායමේ දායකත්වය අපි හඳුනාගන්නා අතර, වගකීම් සහගත ආයතනික පුරවැසියන් වශයෙන් අපි කොටස්හිමිකරුවන් වෙත ඉහළම වටිනාතම ලබා දෙන්නෙමු.

# අධ්‍යක්ෂ මණ්ඩලය

## නුසිත් කුමාරතුංග මහතා

### සභාපති

නුසිත් කුමාරතුංග මහතා දශක තුනකට අධික පළපුරුද්දක් සහිත කීර්තිමත් මූල්‍ය වෘත්තිකයෙකි. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකු වන අතර ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ ද සාමාජිකයෙකි. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් දේපල කළමනාකරණ හා තක්සේරුණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය ද ලබා ගෙන ඇත. ප්‍රයිස් වෝටර්හවුස් කූපර්ස් හි සිය වෘත්තීය ජීවිතය ආරම්භ කිරීමෙන් පසු, ඔහු 2000 දී නුසිත් කුමාරතුංග සහ සමාගම ආරම්භ කළේය. මෙය විශේෂයෙන් කුඩා හා මධ්‍යම ව්‍යවසායන් (SME) වෙත අවධානය යොමු කරමින් විගණන, බදු සැලසුම් සහ ව්‍යාපාරික උපදේශන සේවා සපයන ප්‍රසිද්ධ ආයතනයකි.



නුසිත් මහතා ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍යම ව්‍යවසාය අංශයේ සංවර්ධනයේ ප්‍රධාන චරිතයක් වූ අතර, ව්‍යවසායකයන්ට ඔවුන්ගේ මූල්‍ය කළමනාකරණ කුසලතා වර්ධනය කිරීමට උපකාර කිරීම සඳහා ලෝක බැංකුවේ සහ මුදල් අමාත්‍යාංශයේ අරමුදල් දායකත්වයෙන් පුහුණු වැඩසටහන් ගණනාවක් පැවැත්වීය. ඔහු බදුකරණය සහ ආර්ථික ප්‍රතිපත්ති වැඩිදියුණු කිරීම සඳහා උපදේශක මණ්ඩලවල සේවය කරමින් ජාතික ආර්ථික කථිකාවන්ට ද සම්බන්ධ වී ඇත.

වර්තමානයේ කුමාරතුංග මහතා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් ආයතනවල සභාපති වන අතර ලංකා විදුලිබල මණ්ඩලයේ සහ සීමා සහිත ලංකා රෝහල් සංස්ථා පෞද්ගලික සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි.

## දුෂ්මන්ත තොටවත්ත මහතා

### අධ්‍යක්ෂ

දුෂ්මන්ත තොටවත්ත මහතා 2022 අගෝස්තු 22 වන දින සිට අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලද අතර ඔහු සීමාසහිත කැන්විල් හෝල්ඩිංස් පෞද්ගලික සමාගමේ සහ සීමා සහිත එල්.සී.බී. ෆයිනෑන්ස් පෞද්ගලික සමාගමේ සභාපතිවරයා වේ. තොටවත්ත මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකු වන අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් වාණිජ විද්‍යාවේදී උපාධිය (විශේෂ උපාධිය) සහ කොළඹ විශ්ව විද්‍යාලයෙන් මූල්‍ය ආර්ථිකවිද්‍යා පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ගෙන ඇත.



ඔහු රාජ්‍ය ව්‍යවසායන් සහ පෞද්ගලික ආයතනවල ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන මූල්‍ය නිලධාරී සහ ප්‍රධාන අභ්‍යන්තර විගණක ලෙස සාර්ථක කාර්ය සාධන වාර්තාවක් සහිත, මූල්‍ය කළමනාකරණ, ආයතනික පාලනය, උපායමාර්ගික කළමනාකරණ සහ මහජන සම්බන්ධතා යන ක්ෂේත්‍රවල පුළුල් පළපුරුද්දක් සහිත දක්ෂ නායකයෙකු වන අතර වසර 40 කට අධික පළපුරුද්දක් ඇත.

## කේ. රවින්ද්‍ර පත්මප්‍රිය මහතා

### අධ්‍යක්‍ෂ

කේ. රවින්ද්‍ර පත්මප්‍රිය මහතා 2022 සැප්තැම්බර් 30 වන දින සිට අධ්‍යක්‍ෂ මණ්ඩලයට පත් කරන ලදී.
පත්මප්‍රිය මහතා රාජ්‍ය අංශයේ විවිධ තනතුරුවල වසර 32 කට අධික පළපුරුද්දක් සහිත කීර්තිමත් රාජ්‍ය සේවකයෙකි. ඔහු වර්තමානයේ මුදල් අමාත්‍යාංශයේ තොරතුරු තාක්‍ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ ජනරාල්වරයා ලෙස සේවය කරයි.



ඔහු කැලණිය විශ්ව විද්‍යාලයේ භෞතික විද්‍යාවේදී උපාධිධාරියෙකු වන අතර ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් (SLIDA) මහජන කළමනාකරණ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ගෙන ඇත.

## ජනාධිපති නීතිඥ නීල් උනම්බුවේ මහතා

### අධ්‍යක්‍ෂ

නීල් උනම්බුවේ ජනාධිපති නීතිඥවරයා නීති ක්ෂේත්‍රයේ දශක තුනකට අධික පළපුරුද්දක් සහිත නීති වෘත්තිකයෙකි. ඔහු අතිරේක සොලිසිටර් ජනරාල්වරයකු ලෙස විශ්‍රාම ගෙන ඇති අතර, ඉහළ පෙළේ නීතිමය පරීක්‍ෂණ, නියාමන අනුකූලතාව සහ රජයේ උපදේශක භූමිකාවන්හි තීරණාත්මක කාර්යභාරයක් ඉටු කර ඇත.



බුද්ධිමය දේපළ, වාණිජ සහ මූල්‍ය නීතියේ විශේෂඥයෙකු වන ඔහු ඇමරිකා එක්සත් ජනපදයේ ජෝර්ජ් වොෂිංටන් විශ්ව විද්‍යාලය, සහ ඉතාලියේ ටියුරින් විශ්ව විද්‍යාලය, වෙතින් ශාස්ත්‍රපති උපාධි දෙකක් ලබා ගෙන ඇත. ඔහු සයිබර් නීතිය, ගුවන් නීතිය සහ න්‍යෂ්ටික ආරක්‍ෂණ පිළිබඳව ජාත්‍යන්තර වශයෙන් පුහුණුව ලබා ගෙන ඇත.

නීතිපති දෙපාර්තමේන්තුවේ ඔහුගෙ සේවා කාලය තුළ, ඔහු මුදල් අමාත්‍යාංශය, ශ්‍රී ලංකා රේගුව සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත නීතිමය මඟ පෙන්වීම ලබා දී ඇත. එයට අමතරව, ඔහු පරමාණුක බලශක්ති අධිකාරිය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ අනෙකුත් රාජ්‍ය ආයතන සඳහා නීති උපදේශකයෙකු ලෙස ද සේවය ලබා දී ඇත.

වර්තමානයේ ඔහු නීති වෘත්තියේ නිරත වන අතර සීමාසහිත ශ්‍රී ලංකා ටෙලිකොම් සහ මොබිටෙල් සමාගමේ අධ්‍යක්‍ෂ මණ්ඩල සමාජිකයකු වශයෙන් ද කටයුතු කරයි.

## රාජීව් ධර්මේන්ද්‍ර මහතා

### අධ්‍යක්‍ෂ

රාජීව් මහතා 2025 ජනවාරි 1 වන දින සිට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්හි, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් යන ආයතන දෙකටම විධායක නොවන අධ්‍යක්‍ෂවරයෙකු ලෙස පත් කරන ලදී. රාජීව් මහතා, MAS හෝල්ඩින්ස් ආයතනයේ විශාලතම ව්‍යාපාර ඒකකයක් වන MAS ඉන්ටිමේට්ස් හි ප්‍රධාන විධායක නිලධාරි වශයෙන්, 2019 මාර්තු මාසයේදී පත්විය. MAS හි වසර 21 කට අධික පළපුරුද්දක් සහිත රාජීව් මහතා 2003 දී UNICHELA පානදුර හි සාමාන්‍යාධිකාරී ලෙස MAS සමාගමට එක් වූ අතර 2004 දී MAS / Sara Lee Courtaulds ඒකාබද්ධ ව්‍යාපාරයේ වෙළඳ අධ්‍යක්‍ෂ තනතුරට උසස් කරන ලදී.



ඔහු එකල MAS ඉන්ටිමේට්ස් හි ප්‍රධාන ගනුදෙනුකරුවන් හතර දෙනෙකු පමණ සමඟ සම්බන්ධ වෙමින් ව්‍යාපාරික හා වෙළඳ අධ්‍යක්ෂ වශයෙන් 2004 සිට  නායකත්ව භූමිකාවන් ඉටුකර ඇත.  රාජීව් මහතා MAS ඉන්ටිමේට්ස් හි සැපයුම් දාම සහ තාක්‍ෂණ ආයතනයක වන Silueta ආයතනය සාර්ථක ඇඳුම් හා තාක්‍ෂණ නවෝත්පාදන මධ්‍යස්ථානයක් ලෙස පරිණාමය කිරීම සඳහා වූ වගකිම දරමින් 2010 දී එහි ප්‍රධාන විධායක නිලධාරී ලෙසද සේවය කළේය. වර්තමාන පත්වීමට පෙර, එනම්  ප්‍රධාන විධායක නිලධාරී ලෙස උසස් වන තෙක් රාජීව් මහතා 2016 සිට MAS ඉන්ටිමේට්ස් හි ප්‍රධාන අලෙවිකරණ නිලධාරී ලෙස සේවය කළේය. MAS ඉන්ටිමේට්ස් හි ඔහුගේ වගකීම් වලට අමතරව, රාජීව් සමස්ත MAS සමාගම් සමූහය පුරා නවෝත්පාදන න්‍යාය පත්‍රය සහ අදියර ක්‍රියා මාර්ගය තීරණය කරන MAS හි නවෝත්පාදන මණ්ඩලයේ සභාපති ලෙස ද නායකත්වය සපයයි.

රාජීව් මහතා ලන්ඩන් කිංග්ස් විද්‍යාලයෙන් ගණිතය සහ ආර්ථිකවිද්‍යා පිළිබඳ විද්‍යාවේදී උපාධිය සහ ලන්ඩන් ආර්ථික විද්‍යාලයෙන් මූල්‍ය විද්‍යා පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ගෙන ඇත. ඔහු හාවර්ඩ් සහ INSEAD ව්‍යාපාරික විද්‍යාලවලින් විධායක අධ්‍යාපනය ලබා ගෙන ඇත.

## රොහාන් බුල්ජන්ස් මහතා

### අධ්‍යක්‍ෂ



න්‍යෂ්ටික, මූල්‍ය සේවා, තොරතුරු තාක්‍ෂණ, තෙල් හා ගෑස් අංශවල ජ්‍යෙෂ්ඨ වෘත්තිකයෙකු වන බුල්ජන්ස් මහතා දුරකථන, ඩිජිටල් පරිවර්තනය, දත්ත විශ්ලේෂණ, සයිබර් ආරක්‍ෂණ, ඩිජිටල් වාණිජ්‍යය සහ නැගී එන තාක්‍ෂණයන්හි ජයග්‍රහණ හරහා ආයතනික උපායමාර්ගික න්‍යාය පත්‍රය ඉදිරියට ගෙන යාම සඳහා නායකත්වය සැපයීමට සමත් වේ.

ඔහු ඕස්ට්‍රේලියාවේ රාජකීය මෙල්බෝර්න් තාක්‍ෂණ ආයතනයෙන් තොරතුරු තාක්‍ෂණ පිළිබඳ ව්‍යාපාරික ශාස්ත්‍රපති උපාධිය (MBIT) ලබා ගෙන ඇත.

සේවා විශිෂ්ටත්වය සහ පාරිභෝගික අත්දැකීම වැඩිදියුණු කිරීම, මෙහෙයුම් කාර්යක්‍ෂමතාව වර්ධනය කිරීම, නව ආදායම් ප්‍රවාහ ජනනය කිරීම සහ ව්‍යාපාරික විශිෂ්ටත්වය ලබා ගැනීම සඳහා විශාල පරිවර්තන තොරතුරු තාක්‍ෂණ ව්‍යාපෘති මෙහෙයවීම කෙරෙහි අවධානය යොමු කරමින් ව්‍යාපාර වලට උචිත  තොරතුරු තාක්‍ෂණ උපායමාර්ග නිර්මාණය කිරීමේ පළපුරුද්ද ඔහු සතුවේ.

බුල්ජන්ස් මහතා ව්‍යාපාරික නවෝත්පාදනය, ප්‍රශස්ත සේවා සැපයුම්, පාරිභෝගික සම්බන්ධීකරණය සහ තොරතුරු තාක්ෂණ පරිවර්තන ව්‍යාපෘති ගෙන එමින් ව්‍යාපාරික කාර්යක්ෂමතාව සහ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා ව්‍යවසාය නිර්මාණ/ව්‍යාපාරික නිර්මාණ පරිචයක් ස්ථාපනය කළේය. ඔහුගේ ප්‍රවීණතාව, සංවිධානයක තරඟකාරිත්ව වාසිය ඇගයීම, ඩිජිටල් අවස්ථා සහ තර්ජන හඳුනා ගැනීම සහ ඩිජිටල් උපාය මාර්ග මත නිර්වචනය කරන ලද තරඟකාරී ස්ථානය කරා ආයතනය මෙහෙයවීමේ කුසලතාවයන්ගෙන් සමන්විත වේ.

ඔහු, සමස්ත විදුලි සන්නිවේදන අගය දාමය හරහා ව්‍යාපාරික සඵලදායිතාවය සහ කාර්යක්ෂමතාව ඇතිකිරීම, බැංකු ක්ෂෙත්‍රෙය් පරිවර්තනීය ඩිජිටල් ගමන් මග සහ ව්‍යාපාරයට වටිනාකම ලබා දීම සඳහා තොරතුරු තාක්ෂණ මෙහෙයුම් ආකෘති ස්ථාපනය කිරීම පිළිබඳ ප්‍රවීණයකු වේ. ජාත්‍යන්තර අත්දැකීම් සහිත බුල්ජන්ස් මහතාගේ ප්‍රවීණතාව එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ඕස්ට්‍රේලියාව, ටැන්සානියාව, ඉන්දියාව, ඊජිප්තුව, සෞදි අරාබියාව සහ ශ්‍රී ලංකාවේ බොහෝ සමාගම් විසින් අපේක්ෂා කරන ලදී. ඔහු විශාල ව්‍යාපෘති කිහිපයක් හරහා බහු සංස්කෘතික කණ්ඩායම් වෙත නායකත්වය දෙන අතරම, තාක්ෂණය විචක්ෂණශීලී සහ ලාභදායී ආකාරයෙන් භාවිතා කරමින් සාර්ථක ව්‍යාපාර ප්‍රතිඵල  ලබා දීමේ විශේෂඥයෙකි. ඔහු ඩිජිටල් තාක්ෂණයන් සහ ඒවායේ බලපෑම (අන්තර්ජාල වස්තු, කෘතිම බුද්ධිය, ඩිජිටල් කාර්යක්ෂේත්‍රය, සංජානන පරිගණකකරණය, බ්ලොක්චේන්, විශාල දත්ත, ක්ලවුඩ්ස්, සමාජ මාධ්‍ය, ආදිය) පිළිබඳ දැනුම් සහ අවබෝධතා රැසක් ඇති අයෙකි.

**ශිරෝමි කෝදාගොඩ මහත්මිය**

**සමාගම් ලේකම්**



අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරන ලදුව, 2024 අප්‍රේල් 2 වන දින සිට ශිරෝමි කෝදාගොඩ මහත්මිය සමාගම් ලේකම් වශයෙන් කටයුතු කරයි. ඇය සමාගම් ලේකම් කාර්යාලය තුල සුමට පරිපාලනයක් සහතික කිරීමේ සහ සමාගම් පනතේ විධිවිධාන වලට අනුකූලව අවශ්‍යතා සපුරාලමින් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

ඇය පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් කලාවේදී උපාධිය (BA) ලබා ගෙන ඇත. ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ඇතුළත් වූ ඇය 1992 දී නීතිඥවරියක් වශයෙන් නීතිඥ සංගමයට පිළිගන්නා ලදී.

සමාගමට එක්වීමට පෙර කෝදාගොඩ මහත්මිය වසර 30 ක් සීමාසහිත කොකා-කෝලා බීම ශ්‍රී ලංකා සමාගමේ  සේවය කළාය. එම සමාගමේ ඇයගේ වෘත්තීය ජීවිතය අධ්‍යක්ෂ (නීතිමය හා පාලන) සහ දේශීය ආචාර ධර්ම නිලධාරී (LEO) ලෙස පත්වීමෙන් අවසන් විය.  එම පත්වීමට පෙර, ඇය අභ්‍යන්තර  නීති උපදේශක ලෙස සේවය කළ අතර එම සමාගමේ නීති නිලධාරී සහ නීති කළමනාකරු ලෙස නම් කරන ලදී. ඇය දශකයකට වැඩි කාලයක් කොකා-කෝලා බීම සමාගමේ සමාගම් ලේකම් ලෙස සේවය කර ඇත.

ආයතනික නීතිමය කටයුතු, අනුකූලතාව, පාලනය, ආචාර ධර්ම, නිෂ්පාදන වගකීම් පිළිබඳ නඩු  සහ සිවිල් හා කාර්මික නඩු  යන ක්ෂේත්‍රවල වසර 30 කට අධික වෘත්තීය නීතිමය පළපුරුද්දක් කෝදාගොඩ  මහත්මිය  සතුව ඇත. කොකා-කෝලා බීම සමාගමේ ඇයගේ වෘත්තීය ජීවිතය තුළ, ඇය ආයතනික පාලන ක්‍රියාවලිය, ව්‍යවස්ථාගත අනුකූලතාව සහ අංශ අනුකූලතා තන්ත්‍ර සංවර්ධනය සඳහා පුළුල් දායකත්වයක් ලබා දී ඇත.

# ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සමූහයේ ව්‍යූයහ



# සභාපතිතුමාගේ පණිවිඩය



2024 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මෙම සමාලෝචනය ඉදිරිපත් කිරීම මහත් ගෞරවයක් සහ වගකීමක් ලෙස මම සලකමි. මෙම වර්ෂය සීමාසහිත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්හි දීර්ඝකාලීන ඉතිහාසයේ පරිවර්තනීය පරිච්ඡේදයක් ලෙස සටහන් වූයේ, වර්ධනය වන නියාමන අවශ්‍යතාවලට ප්‍රතිචාර වශයෙන් අපි ප්‍රධාන පරිවර්තනයකට භාජන වූ බැවිනි. 2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්ත නියාමන (සංශෝධන) පනත සහ 2023 මාර්තු 17 දිනැති අමාත්‍යමණ්ඩල තීරණය (23/0431/604/046) අනුව, සංස්ථාව 2024 පෙබරවාරි 1 වන දින සිට වෙනම ආයතන දෙකකට නීතිමය වශයෙන් වෙන් කරන ලදී. මෙම නීතිමය වෙන් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා පිළිවලින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් තෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් තෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් ස්ථාපිත කරන ලදී.

මෙම ප්‍රතිව්‍යුහගතකරණය, නියාමන අනුකූලතාව වැඩිදියුණු කිරීම, මෙහෙයුම් පරිපාලනය සුගම කිරීම, සහ අපගේ රක්ෂණ ව්‍යාපාරය තුළ පැහැදිලි මූල්‍ය විනිවිදභාවය සහතික කිරීම කෙරෙහි වැදගත් පියවරක් නියෝජනය කරයි. එය කර්මාන්තයේ හොඳම පිළිවෙත් සමඟ සංස්ථාව පෙළගැස්වීමෙන්, ජාතික මූල්‍ය ක්ෂෙත්‍රය තුළ එහි දීර්ඝකාලීන පැවැත්ම ශක්තිමත් කරයි. මේ මොහොත වනවිට, සමාගමේ නීතිමය සහ ආයතනික අනන්‍යතාවයේ අනාගත දිශාව සම්බන්ධයෙන් අමාත්‍යාංශය වෙතින් විධිමත් මග පෙන්වීමක් අපේක්ෂා කර සිටින බැවින් මව් සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් යන නම වෙනස් නොකර පවතියි.

මෙම සංක්‍රමණයෙන් පසුව, සංස්ථාව සිය ආයෝජන කළඹ කළමනාකරණය සහ සිය පුළුල් දේපල වත්කම් බදු දීම කෙරෙහි මෙහෙයුම් අවධානය යොමු කර ඇත. මෙම ක්‍රියාකාරකම්, සංස්ථාවේ සම්ප්‍රදායික රක්ෂණ භූමිකාවෙන් වෙනස් වුවද, රාජ්‍ය වත්කම්වල ප්‍රයෝජනයන් ප්‍රශස්ත කිරීම සහ ශ්‍රී ලංකා රජයට නිරන්තර මූල්‍ය ප්‍රතිලාභ ලබා දීම මගින් ජාතික සංවර්ධනයට අඛන්ඩ ධනාත්මක දායකත්වයක් ලබා දෙමින් සිටී.

රක්ෂණ, සෞඛ්‍ය සේවා, බලශක්තිය, විනෝදාස්වාදය සහ සහායක සේවා ඇතුළු ආර්ථිකයේ ප්‍රධාන අංශ කිහිපයකම ක්‍රියාත්මක වන පුළුල් සහ විවිධාංගීකරණය වූ සමාගම් සමූහයක මව් ආයතනයක් ලෙස සංස්ථාව ක්‍රියා කරයි. මෙම අනුබද්ධිත සමාගම් හරහා, SLIC, සමූහ මට්ටමේ ශක්තිමත් අධීක්ෂණ සහ පරිපාලන වගකීම් පවත්වා ගෙන යන අතර තම ආර්ථික ප්‍රගතිය පෝෂණය කිරීමේ සහ මහජන අවශ්‍යතා ඉටුකරීම සඳහා සේවා සැපයීමේ සිය උපායමාර්ගික භූමිකාව අඛන්ඩව ඉටු කරමින් සිටියි.

වෙනස්කම් මධ්‍යයේ, සංස්ථාවේ මූල්‍ය කාර්ය සාධනය ස්ථාවර තත්ත්වයේ පැවතුණි. සමාලෝචනයට භාජනය වන වර්ෂය සඳහා, සමාගම බදු අය කිරීමට පෙර රුපියල් බිලියන 3.5 ක ලාභයක් සහ කොටස් හිමියන්ට ගෙවිය හැකි රුපියල් බිලියන 3.6 ක ලාභයක් වාර්තා කළේය. ප්‍රධාන වශයෙන් විචක්ෂණශීලී ආයෝජන කළමනාකරණය සහ කුලී ආදායම මගින් ශක්තිමත් වූ මෙම කාර්ය සාධනය, ව්‍යුහාත්මක පරිවර්තන කාල පරිච්ඡේදයක් තුළ සංස්ථාවේ ශක්තිය සහ පීඩනයන්ට මුහුණ දීමේ හැකි හැකියාව පිළිබිඹු කරයි. සම්පූර්ණ වත්කම් රුපියල් බිලියන 115.1 ක් ලෙස පැවති අතර, කොටස් හිමිකම රුපියල් බිලියන 107.7 ක් දක්වා ළඟා වූ බැවින්, සංස්ථාවේ ස්ථාවර මූල්‍ය පදනම තවදුරටත් ශක්තිමත් විය.

අපි ඉදිරියට යන විට, සමූහ මට්ටමේ මව් සමාගමක් ලෙස අපගේ හැකියාවන් වැඩිදියුණු කිරීම, අපගේ අනුබද්ධ සමාගම්වලට ඔවුන්ගේ මෙහෙයුම් ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා අඛණ්ඩ සහාය ලබා දීම, සහ ජාතික ප්‍රමුඛතා සමඟ අපගේ උපාය මාර්ගය පෙළගැස්වීම කෙරෙහි අපගේ අවධානය යොමු වේ.

අවසාන වශයෙන්, සුවිශේෂී වෙනස්කම් සනිටුහන් කල මෙම වර්ෂය පුරාවට, තම කැපවීම සහ සහාය ලබාදීම වෙනුවෙන් මුදල් අමාත්‍යාංශය, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව, අපගේ අධ්‍යක්ෂ මණ්ඩලය, සහ සංස්ථාවේ සියලුම සේවකයින්ට මගේ හෘදයාංගම කෘතඥතාවය පිරිනැමීමට කැමැත්තෙමි. අපි අපගේ ගමනේ ඊළඟ අදියර තුල ඉදිරියට පා නගන අතර, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් සම්බන්ධයෙන් දිගු කලක් පුරාවට සබැඳි අඛණ්ඩතාව, මහජන සේවය, සහ ජාතික දායකත්ව යන මූලික වටිනාකම් ඉහළ නැංවීමට අපි කැපවී සිටිමු.

**නුසිත් කුමාරතුංග**
සභාපති
2025 මැයි 30

# සමූහ ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ සමාලෝචනය



2024 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්හි සඳහා සමූහ ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ සමාලෝචනය ඉදිරිපත් කිරීම මහත් ගෞරවයකි. නියාමන අවශ්‍යතා සමඟ අනුකූලවීම සඳහා සහ අපගේ මෙහෙයුම් අනාගතය සඳහා සූදානම් කිරීම සඳහා සැලකිය යුතු ප්‍රතිව්‍යුහගතකරණයක් සිදු කළ බැවින් මෙම වර්ෂය අපගේ ආයතනික පරිණාමයේ සුවිශේෂී මොහොතක් ලෙස සටහන් විය. අපගේ ජීවිත සහ සාමාන්‍ය ව්‍යාපාරවල නීතිමය වෙන් කිරීම තුලින් SLIC සමූහ මට්ටමේ මව් ආයතනයක් ලෙස ප්‍රතිස්ථානය වූ අතර, උපායමාර්ගික අධීක්ෂණ, විනයගත ආයෝජන කළමනාකරණය, සහ අපගේ අනුබද්ධ සමාගම් හරහා වැඩිදියුණු කළ පරිපාලනයේ නව යුගයක් ආරම්භ කර ඇත.

අපි ව්‍යුහාත්මක වෙනස්කම් තුලින් ගමන් කිරීමෙන් සහ නව මෙහෙයුම් ආකෘතීන් පිළිගත් බැවින් 2024 වර්ෂය ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් (SLIC) සම්බන්ධයෙන් සුවිශේෂී පරිවර්තනයක් ලෙස සටහන් විය. 2024 පෙබරවාරි 1 වන දින සිට බලපවත්වන පරිදි අපගේ ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරවල නීතිමය වෙන් කිරීම, නියාමන අණ සමඟ අනුගත වීමේ සහ එක් එක් අංශය කෙරෙහි අවධානය යොමු කරමින් ලබාගන්නා වර්ධනය සඳහා වේදිකාව සකස් කිරීමේ ප්‍රධාන පියවරක් විය.

මෙම ප්‍රතිව්‍යුහගතකරණය අපට අපගේ මෙහෙයුම් සුගම කිරීමට අවස්ථාව ලබා දුන් අතර, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් වර්තමානයේ වෙනම ආයතන ලෙස ක්‍රියාත්මක වේ. SLIC, මව් සමාගම් භූමිකාවකට සංක්‍රමණය වී, අපගේ ආයෝජන කළඹ සහ දේපල වත්කම් කළමනාකරණය කෙරෙහි අවධානය යොමු කර ඇත. මෙම සංක්‍රාන්තිය අනුකූලතාව සහතික කිරීම සම්බන්ධයෙන් පමණක් නොව, අපගේ සම්පත් ප්‍රශස්ත කිරීම සහ අපගේ පාර්ශවකරුවන් වෙත තිරසාර වටිනාකම ලබා දීම සම්බන්ධයෙන් ද අප ස්ථානගත කරනු ලබන්නේය.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය උපායමාර්ගික සංක්‍රමණ කාල පරිච්ඡේදයක් ලෙස සටහන් වූ අතර, එම කාලය තුළ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් ශක්තිමත් මූල්‍ය ප්‍රතිඵල ලබා දුන්නේය. 2024 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා, SLIC බදු අය කිරීමට පෙර රුපියල් බිලියන 3.5 ක ලාභයක් වාර්තා කළ අතර, කොටස් හිමියන්ට ගෙවිය හැකි ලාභ රුපියල් බිලියන 3.6 ක් විය. සම්පූර්ණ වත්කම් රුපියල් බිලියන 115.1 ක් ලෙස පැවති අතර, සම්පූර්ණ කොටස් රුපියල් බිලියන 107.7 ක් දක්වා ළඟා වූ බැවින් යහපත් මූල්‍ය භාරකාරිත්වයක් මෙන්ම මෙහෙයුම් විනයක් පිළිබිඹු කරයි.

තවද, 2024 දෙසැම්බර් 31 වන දිනට, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් සමූහයක් ලෙස බදු අය කිරීමට පෙර රුපියල් බිලියන 14.1 ක ලාභයක් සහ කොටස් හිමියන්ට ගෙවිය හැකි රුපියල් බිලියන 9.1 ක ලාභයක් වාර්තා කළ අතර, සම්පූර්ණ වත්කම් රුපියල් බිලියන 435 ක් විය. මෙම ප්‍රතිඵල අපගේ ආයෝජන කළඹේ ශක්තිය සහ සිය විවිධ ව්‍යාපාරික ක්ෂේත්‍ර හරහා දිගුකාලීන වටිනාකම නිර්මාණය කිරීම සම්බන්ධයෙන් සමූහයේ හැකියාව පිළිබඳ අවධාරණය කරනු ලබයි.

අපගේ අනුබද්ධ සමාගම් රක්ෂණ, සෞඛ්‍ය සේවා, බලශක්තිය, සහ විනෝදාස්වාදය ඇතුළු ප්‍රධාන කර්මාන්ත හරහා ජාතික ආර්ථිකයේ වැදගත් කාර්යභාරයක් අඛණ්ඩව ඉටු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ උපායමාර්ගික මාර්ගෝපදේශනයෙන්, සෑම ආයතනයක්ම අපගේ සමස්ත දැක්මෙහි සහ පරිපාලන ප්‍රමිතීන් සමඟ අනුකූලව පවතියි.

අනාගතය දෙස අවධානය යොමු කරමින්, අපි සමූහ මට්ටමේ මව් සමාගමක් ලෙස අපගේ හැකියාවන් වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමුකර ඇත්තෙමු. මෙයට අපගේ ආයෝජන උපාය මාර්ග ප්‍රශස්ත කිරීම, අපගේ දේපල කළඹ සඵලදායී ලෙස කළමනාකරණය කිරීම, සහ අපගේ අනුබද්ධ සමාගම්වලට උපායමාර්ගික දිශානතිය ලබා දීම ඇතුළත් වේ. SLIC හි සංගමික ව්‍යවස්ථාවලිය සහ ආයතනික ව්‍යුහය සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ අනාගත ක්‍රියාමාර්ගය තීරණය කිරීම සඳහා අමාත්‍යාංශය සමඟ සම්බන්ධ වී කටයුතු කිරීමට ද අපි කැපවී සිටිමු.

පරිවර්තනීය වර්ෂයක් සම්බන්ධයෙන් මෙනෙහි කරමින්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්හි අඛණ්ඩ ප්‍රගතියට දායක වූ සියලුම දෙනාට මගේ අවංක ස්තුතිය පිරිනමමි. මෙම සංක්‍රමණය පුරාවට ස්ථාවර මග පෙන්වීම සහ සහාය සම්බන්ධයෙන් මම මුදල්, ආර්ථික ස්ථායීකරණ, සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයට, සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට ස්තුතිවන්ත වීමට

කැමැත්තෙමි. අපගේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නොසැලෙන සහාය සහ සමූහය පුරා අපගේ සේවකයින්ගේ කැපවූ දායකත්ව ද මම අගයමි. විශේෂයෙන්ම, SLIC ජීවිත සහ SLIC සාමාන්‍ය යන අපගේ කණ්ඩායම්වල අඛණ්ඩ සහයෝගිතාව සහ හවුල් විශේෂඥතාව මව් සමාගම සඳහා සුමට සංක්‍රමණයක් සහතික කිරීමේදී තීරණාත්මක විය. අපි SLIC සමූහය පුරාවට සහ ජාතියට දීර්ඝකාලීන වටිනාකමක් ලබා දීමේ පැහැදිලි අරමුණක් සහ හවුල් කැපවීමක් සමඟ එක්ව ඉදිරියට ගමන් කරමු.



**චන්දන එල්. අලුත්ගම**
සමූහ ප්‍රධාන විධායක නිලධාරී
2025 මැයි 30

# විගණන සහ අනුකූලතා කමිටු වාර්තාව

සංවිධානයේ මූල්‍ය තත්ත්වය අව්‍යාජ ආකාරයෙන් නියෝජනය කරන බව සහතික කරමින් සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල නිරවද්‍යතාව අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් විගණන සහ අනුකූලතා කමිටුව (ACC) ප්‍රමුඛව වගකියනු ලැබේ. තවද, සමාගම සදාචාරාත්මක ප්‍රමිතීන් සහ නියාමන අවශ්‍යතා සමඟ අනුකූලතාවයෙන් ක්‍රියාත්මක වන බව කමිටුව විසින් සහතික කරනු ලබයි. කමිටුවේ සභාපතිත්වය භාණ්ඩාගාර අධ්‍යක්ෂවරයා විසින් දරන අතර, ඔහු විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු සහ ජ්‍යෙෂ්ඨ වරලත් ගණකාධිකාරීවරයෙකු ද වෙමින් ද කමිටුවේ සේවය කරයි. සමාගම් ලේකම්වරයා රැස්වීම්වල ලේකම්වරයා ලෙස කටයුතු කරයි. අනුකූලතා සහ විගණන කාර්යයන් දෙකම කමිටුව වෙත වාර්තා කරන අතර, මෙහෙයුම් කාර්යන්හි ස්වාධීනත්වය, රාජකාරි කටයුතු පැහැදිලිව වෙන් කිරීම තුලින් ආරක්ෂා කරනු ලැබේ.

මූල්‍ය, විගණන, සහ රක්ෂණ ක්ෂේත්‍රවල විශේෂඥතාව ඇති ජ්‍යෙෂ්ඨ වෘත්තිකයින් විසින් කමිටුව වෙත ලබාදෙන දායකත්වය හේතුවෙන්, මූල්‍ය වාර්තාකරණ, අභ්‍යන්තර පාලන, අනුකූලතාව, සහ බාහිර විගණන අධීක්ෂණය ඇතුළුව සිය වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීමට එමගින් කමිටුවට හැකියාව ලැබේ.

## යොමුකිරීමේ අනුදේශ

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්හි විගණන සහ අනුකූලතා කමිටුවේ යොමුකිරීමේ අනුදේශ විගණන සහ අනුකූලතා කමිටු ප්‍රඥප්තියේ පැහැදිලිව දක්වා ඇත. මෙම ප්‍රඥප්තිය ශ්‍රී ලංකා සුරැකුම්පත් හා වෙළඳ කොමිසම (SEC) සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (2023) විසින් ඒකාබද්ධව නිකුත් කරන ලද "ආයතනික පරිපාලනය පිළිබඳ ප්‍රශස්ත පරිච සංග්‍රහය" සහ 2021 දී නිකුත් කරන ලද "රජයට අයත් ව්‍යාවසාය සමාගම් සඳහා වූ ආයතනික පරිපාලනය පිළිබඳ මාර්ගෝපදේශය" ඇතුළු විගණන කමිටු සඳහා මාර්ගෝපදේශක මූලධර්ම සහ ප්‍රශස්ථ භාවිතයන් සමඟ අනුකූල වේ. සමාගමේ අනාවරණ පද්ධති, පාලන, සහ මූල්‍ය, ගිණුම්කරණ, ප්‍රසම්පාදන, නීතිමය අනුකූලතාව, සහ සදාචාරය වැනි ක්ෂේත්‍ර හරහා අභ්‍යන්තර පාලන පිළිබඳ වැඩිදියුණු තරන ලද අධීක්ෂණය ප්‍රඥප්තියේ විෂයපථය තුල අන්තර්ගත වේ. එයට කළමනාකරණය සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපිත කරන ලද ව්‍යාපාරික අවදානම් කළමනාකරණය අධීක්ෂණය කිරීම ද ඇතුළත් වේ. කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට වගකීමෙන් බැඳෙන අතර අධ්‍යක්ෂ මණ්ඩලයට සිය ක්‍රියාකාරකම් පිළිබඳ නිරන්තර වාර්තා සපයයි.

### කමිටුවේ රැස්වීම්

2024 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ, කමිටුවේ රැස්වීම් පහක් පවත්වන ලදී. කමිටු රැස්වීම්වල ක්‍රියාවලිය ප්‍රමාණවත් විස්තර සහිතව වාර්තා කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිරන්තරයෙන් යොමු කරනු ලැබේ. විගණකාධිපති කාර්යාලයේ නියෝජිතයින් වෙත ආරාධනා කිරීමෙන් ඔවුන් ද රැස්වීම්වලට සහභාගී වීම සිදුවේ.

2024 වර්ෂයේ රැස්වීම්වලට කමිටු සාමාජිකයින්ගේ පැමිණීම පහත සඳහන් පරිදි වේ:

| අධ්‍යක්ෂවරයාගේ නම | රැස්වීම් සංඛ්‍යාව | සහභාගී වූ දින |
|---|---|---|
| දුෂ්මන්ත තොටවත්ත මහතා<br><br>(2024 සැප්තැම්බර් 19 වන දිනේ සිට කමිටුවේ සභාපති ලෙස තටයුතු කරයි) | 3 | 24/04/2024, 12/09/2024, 19/09/2024 |
| රවින්ද්‍ර පත්මප්‍රිය මහතා | 2 | 24/04/2024, 19/09/2024 |
| නිශාන්ත දයානන්ද මහතා | 3 | 24/04/2024, 12/09/2024, 19/09/2024 |

වාර්තාකරණ දිනයට, පහත සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් විගණන සහ අනුකූලතා කමිටුවේ කටයුතු කරති: දුෂ්මන්ත තොටවත්ත මහතා, රවින්ද්‍ර පත්මප්‍රිය මහතා, නිශාන්ත දයානන්ද මහතා

### අභ්‍යන්තර විගණනය

ආයතනය විසින් සුදුසුකම් ලත් වරලත් ගණකාධිකාරීවරයෙකුගේ නායකත්වයෙන් අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක කරනු ලබයි. විගණන කමිටුව විසින් අභ්‍යන්තර විගණන උපාය මාර්ගය අනුමත කරනු ලබන අතර ඒවායේ ස්වාධීන සහ ඉහළ ප්‍රමිතීන්ට අනුකූලතාව සහතික කිරීම සඳහා අභ්‍යන්තර විගණන සහ පරීක්ෂණ ක්‍රියාවලීන් නිරන්තරයෙන් තක්සේරු කර අධීක්ෂණය කරනු ලබයි. අභයන්තර විගණන අංශයට සිය කාර්යයන් ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය අධිකාරිය සහ සම්පත් ලබා දී ඇති බව කමිටුව විසින් සහතික කරනු ලබයි. නියමිත රැස්වීම් වලදී, අභ්‍යන්තර විගණන සැලැස්මේ ප්‍රගතිය අධීක්ෂණය කිරීම සහ ප්‍රධාන සොයාගැනීම් තක්සේරු කිරීම සඳහා කමිටුව විසින් අභ්‍යන්තර විගණන ප්‍රධානීගේ වාර්තා සමාලෝචනය කරනු ලබයි.

## බාහිර විගණනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වගන්තිය අනුව විගණකාධිපතිවරයා බාහිර විගණකවරයා ලෙස පත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (4) වගන්තියට අනුකූලව, 2024 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල වාර්ෂික විගණනයට සහාය වීම සඳහා විගණකාධිපතිවරයා විසින් සුදුසුකම් ලත් විගණකවරයෙකු ලෙස Messrs BDO Partners ආයතනය පත් කරන ලදී. එයට අමතරව, කමිටුව බාහිර විගණකවරයා විසින් පෙන්වාදෙන ලද සොයාගැනීම් සහ නිර්දේශ සම්බන්ධයෙන් කළමනාකරණයේ ප්‍රතිචාරය සහිත කළමනාකරණ ලිපිය සමාලෝචනය කමිටුව විසින් සිදුකරන ලදි.

## විගණන කමිටුව වෙත තොරතුරු ලැබීම

විගණන සහ අනුකූලතා කමිටුවට කළමනාකාරීත්වයෙන් සහ බාහිර විගණකවරුන් යන දෙපාර්ශවයෙන්ම ප්‍රමාණවත්, විශ්වසනීය, සහ කාලෝචිත තොරතුරු ලැබී ඇති බව කමිටුව විසින් තහවුරු කරනු ලබයි. සිය වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීමට මෙමගින් කමිටුවට හැකියාව ලැබේ.

## වත්කම් සහ වගකීම් තක්සේරු කිරීම සහ හානිකරණය

සාධාරණ අගය ගිණුම්කරණය භාවිතය වැඩිවීම සහ එහි සැලකිය යුතු බලපෑම සැලකිල්ලට ගෙන, සාධාරණ අගය තීරණය කිරීමේදී භාවිත කරනු ලබන සැලකිය යුතු උපකල්පන විනිවිදභාවයෙන් යුතුව හෙළිදරව් කිරීම, හොඳින් සමාලෝචනය කිරීම සහ අවශ්‍ය පරිදි ප්‍රශ්න කිරීම විගණන කමිටුව විසින් සහතික කරනු ලබන්නේය. අමතරව, හානිකරණය තක්සේරු කිරීමේ ක්‍රියා පටිපාටිය සතුටුදායක බවට කමිටුව විසින් තහවුරු කරනු ලබන්නේය.

## ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියන් (IFRSs) හඳුන්වා දීම

ආයතනය තුළ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියන් (IFRSs) පිළිගැනීමේ ප්‍රගතිය විගණන කමිටුව විසින් අධීක්ෂණය කරනු ලබයි. නිසි කාලසීමාවන් තුල පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අතරතුරදී මෙම ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය සහ වර්ධනයන් පිළිබඳව කමිටුව විසින් වරින් වර යාවත්කාලීන කිරීම් සපයනු ලබන්නේ ය.

## ස්වාධීන බාහිර උපදේශනය

සුදුසු අවස්ථාවලදී ස්වාධීන බාහිර උපදේශනය ලබා ගැනීමට, විගණන කමිටුවේ ප්‍රඥප්තිය විසින් එයට අවසර දෙනු ලැබේ.

## අභ්‍යන්තර විගණන ප්‍රධානී, අනුකූලතා ප්‍රධානී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරුට අවදානම්, විගණන සහ අනුකූලතා කමිටු රැස්වීම් වලට ප්‍රවේශ වීමට ඇති හැකියාව

අභ්‍යන්තර විගණන ප්‍රධානීන්, අනුකූලතා ප්‍රධානී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරු, අවදානම් විගණන සහ අනුකූලතා කමිටුව වෙත ඍජු ප්‍රවේශයක් පවතින අතර, එය අනෙක් අතට අධ්‍යක්ෂ මණ්ඩලයට ඍජුවම වගකිව යුතුය.

## විගණන නොවන සේවා

සමාලෝචනයට භාජන වර්ෂය තුළ දී බාහිර විගණකවරුන් විසින් විගණන නොවන සේවා සපයන ලදී.

## අනුකූලතා කාර්යය

අනුකූලතා වැඩසටහනේ ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීම සහ අදාළ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවලට සහාය වීම ආයතනික අනුකූලතා කාර්යයට පැවරී ඇත. අනුකූලතා ප්‍රධානී, ජ්‍යෙෂ්ඨ කළමනාකරු අවදානම්, සහ ප්‍රධාන මූල්‍ය නිලධාරී, සෑම අංශයකම අනුකූලතා සම්බන්ධීකරණ නිලධාරීන්ගේ සහාය ඇතිව අනුකූලතා වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකිව යුතුය. වර්ෂය පුරා ඇතිවිය හැකි විශේෂිත ගැටළු සහ අවදානම් කෙරෙහි අවධානය යොමු කිරීම අනුකූලතා නිලධාරී සහ කමිටුව අතර වාර්තාකරණ ව්‍යුහය විසින් සිදුකරනු ලබයි. වගකිවයුතු නිලධාරීන් ලෙස නම් කරන ලද දෙපාර්තමේන්තු ප්‍රධානීන්, නිශ්චිත බැඳීම්වලට අනුකූල වීම සහතික කිරීම සම්බන්ධයෙන් වගකිව යුතුය.

ශක්තිමත්, ස්වාධීන අනුකූලතා කාර්යයක් පවත්වා ගනිමින් පිරිවැය කාර්යක්ෂමව කළමනාකරණය කිරීම සඳහා අනුකූලතාව පවත්වා ගැනීමට සමාගම විසින් "ස්වයංපෝෂිත" ආකෘතියක් අනුගමනය කර ඇත. ඵලදායී සහභාගීත්වයක් සහතික කිරීම සඳහා එක් එක් දෙපාර්තමේන්තුවේ අනුකූලතා සම්බන්ධීකාරකවරුන් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. සමාලෝචන කාල පරිච්ඡේදය තුළ, ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර හරහා ප්‍රශස්ථ භාවිතයන් ඇතුළත් කිරීම සඳහා අනුකූලතා කාර්යය ශක්තිමත් කරන ලදී. සංවිධානය අනුකූලතා කාර්යය අමතර බරක් නොවන අතර සමාගමේ අභිප්‍රේත කොටසක් ලෙස දකින බවට සහතික කිරීම සඳහා අනුකූලතා සංස්කෘතියක් පෝෂණය කර ඇත. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්හි අනුකූලතා ක්‍රියාවලිය සඳහා සම්පත් නියුක්ති කිරීම සහ එය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ සම්පූර්ණ විස්තරයක් ආයතනික පාලන අංශය යටතේ අඩංගු අනුකූලතා පරිච්ඡේදය, තුල සපයනු ලැබේ.

## අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණ කාර්යය අධීක්ෂණය කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වෙනම උප කමිටුවකට, එනම් අවදානම් කළමනාකරණ කමිටුව (BRMC) වෙත පවරා ඇත. අභ්‍යන්තර විගණන ප්‍රධානී BRMC හි සාමාජිකයෙකු වන අතර, 1998 දී නිකුත් කරන ලද "බැංකු සංවිධානවල අභ්‍යන්තර පාලන පද්ධති සඳහා රාමුව" අනුව, ව්‍යවසාය අවදානම් කළමනාකරණ අංශය විසින් සමාගමේ අභ්‍යන්තර පාලන රාමුව සමාලෝචනයට ලක්කරනු ලැබේ. මෙහි අරමුණ වන්නේ අභ්‍යන්තර පාලන පද්ධති අවදානම් කළමනාකරණ රාමුවට ගැළපෙන ලෙස සංවිධානය කිරීමත්, BASEL රාමුවේ මූලධර්මයන්ට අනුකූල වීමත් සහතික කිරීමයි. මෙම රාමුව යටතේ, කළමනාකරණ අධීක්ෂණය, අවදානම් ඇගයීම, පාලන ක්‍රියාකාරකම්, කාර්ය බෙදාහැරීම, තොරතුරු හා සන්නිවේදන ක්‍රියාවලීන්, නිරීක්ෂණ ක්‍රියාකාරකම් සහ අධීක්ෂණ අධිකාරීන් විසින් සිදුකරන අභ්‍යන්තර පාලන පද්ධතිවල ඇගයීම ඇතුළත් වේ. BRMC විසින්,  මෙම පාලනයන් පිළිබඳව වරින් වර සමාලෝචන පවත්වන අතර, ඒවායේ කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා ස්ථාපිත ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක වේ.

## නිගමනය

පසුගිය වර්ෂය පුරාවට අභ්‍යන්තර විගණන අංශය සහ බාහිර විගණකවරුන් යන දෙපාර්ශවයේම  ඵලදායීත්වය සහ ස්වාධීනත්වය පිළිබඳ කමිටුව සෑහීමට පත්ව සිටියි.  එය ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම අනුමත කරනු ලබන අතර සමාගමේ මූල්‍ය ප්‍රකාශන විශ්වසනීය යැයි සලකනු ලබයි. තවද, බාහිර විගණකවරුන්ගේ වාර්තාවේ අනාවරණය කර ඇති පරිදි සියලුම අදාළ නීති සහ රෙගුලාසි වලට පූර්ණ වශයෙන් අනුකූල වීම සහතික කරමින් කමිටුව සමාගමේ අනුකූලතා රාමුව ගැන සෑහීමකට පත්ව සිටියි. සමාලෝචන කාල පරිච්ඡේදය තුළ හඳුනාගත් අනුකූලතාව නොදක්වන ඕනෑම අවස්ථාවක් සම්බන්ධයෙන් නිවැරදි කිරීමේ සහ වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන ඇත.



**දුෂ්මන්ත තොටවත්ත**
සභාපති - විගණන සහ අනුකූලතා කමිටුව
2025 මැයි 30

# මූල්‍ය වාර්තා

1. සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

2. අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය

3. ප්‍රධාන මූල්‍ය නිලධාරියාගේ වගකීම් ප්‍රකාශය

4. ස්වාධීන විගණකවරයාගේ වාර්තාව

5. මූල්‍ය ප්‍රකාශ

# සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සමාගම සහ සමූහය සඳහා 2024 දෙසැම්බර් 31 දින අවසන් වූ වර්ෂය සඳහා වන විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සමඟ තම වාර්ෂික වාර්තාව සාමාජිකයින් වෙත ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳ ප්‍රීතියට පත් වේ.

මෙම වාර්තාවේ අන්තර්ගතය 2007 අංක 07 දරන සමාගම් පනත, අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත (සංශෝධිත) සහ 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනත සහ ඒවාට කරන ලද සංශෝධන සහ ආයතනික පාලනයේ ප්‍රශස්ථ පිළිවෙත්වල අවශ්‍යතා ද සැලකිල්ලට බඳුන් කර ඇත.

## සමාගමේ ප්‍රධාන කටයුතු

සමාගමේ මූලික කාර්යය සමාලෝචනයට ලක් වූ මූල්‍ය වර්ෂය තුළ වෙනස් කරන ලදී. සමාගම විසින් එහි සංකීර්ණ රක්ෂණ මෙහෙයුම් දිගුකාලීන රක්ෂණ සහ සාමාන්‍ය රක්ෂණ ලෙස වෙන් කිරීමට ක්‍රමවේද ආරම්භ කරන ලදී. මෙම ක්‍රියාමාර්ගය 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 53 වන වගන්තියට අනුකූල වීම සඳහා ගනු ලැබූ අතර එය අනිවාර්ය අවශ්‍යතාවකි.

එබැවින්, සමාගම විසින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ සීමාසහිත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් නම් වූ සම්පූර්ණ අනුබද්ධ සමාගම් දෙකක් සහිත මව් සමාගම් ආකෘතියක් යටතේ එහි මෙහෙයුම් ප්‍රතිව්‍යුහගත කළේය.

2024 පෙබරවාරි 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි, රක්ෂණ කොමිෂන් සභාව විසින් මෙම අදාළ අනුබද්ධ සමාගම් වෙත බලපත්‍ර ප්‍රදානය කළ අතර, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් වර්තමානයේ මව් සමාගම ලෙස ක්‍රියාත්මක වේ.

## කොටස් හිමිකම පිළිබඳ තොරතුරු

2024 දෙසැම්බර් 31 වන දිනට, 99.98% කොටස් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් භාණ්ඩාගාර ලේකම්වරයා සතු වේ. 2024 දෙසැම්බර් 31 වන දිනට ලියාපදිංචි කොටස් හිමියන් 08 දෙනෙකු සාමාන්‍ය කොටස් අයිතිය ලබාගෙන සිටියහ. සියලුම කොටස් හිමියන්ට සමාන ලෙස සැලකීම පිළිබඳ සහතික වීමට සමාගම විසින් සෑම විටම උත්සාහ දරනු ලැබේ.

## අනුබද්ධ සමාගම්

| අනුබද්ධ සමාගමේ නම | කොටස් හිමිකම් ප්‍රතිශතය |
|---|---|
| ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් | 100% |
| ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් | 100% |
| සීමාසහිත ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා පුද්ගලික සමාගම | 100% |
| සීමාසහිත කැනෝවින් හෝටල්ස් ඇන්ඩ් ස්පාස් පුද්ගලික සමාගම | 100% |
| සීමාසහිත කළමනාකරණ සේවා රක්‍ෂණ පුද්ගලික සමාගම | 100% |
| සීමාසහිත ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම | 99.94% |
| සීමාසහිත ලංකා හොස්පිටල්ස් පුද්ගලික සමාගම | 51.34% |

සමාගම, සීමාසහිත කැන්විල් හෝල්ඩිංස් පුද්ගලික සමාගමේ 52.05% කොටස් හිමිකමක් ලබා සිටි අතර 2024 ජූලි 8 වන දින කැන්විල් හෝල්ඩිංස් පුද්ගලික සමාගමේ ආයෝජනය භාණ්ඩාගාර ලේකම්වරයා වෙත ලබාදෙන ලදී.

## ලියාපදිංචි කාර්යාලය

සමාගමේ ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන කාර්යාලය කොළඹ 02, වොක්ශෝල් වීදිය, අංක 21, "රක්‍ෂණ මන්දිරය" හි පිහිටා ඇත.

## සමූහයේ ප්‍රධාන කටයුතු

2024 පෙබරවාරි 1වන දින සිට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්හි මූලික ක්‍රියාකාරකම දිගුකාලීන (ජීවිත) රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නිරතවීම වන අතර, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් කාර්යක්ෂම ලෙස සාමාන්‍ය රක්ෂණ මෙහෙයුම් කෙරෙහි අවධානය යොමු කරයි. සීමාසහිත ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා පුද්ගලික සමාගම ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් (LPG) ගබඩා කිරීමේ විශේෂඥයෙකු වන අතර, සීමාසහිත ලිට්‍රෝ ගෑස් ලංකා  සමාගම ගෘහස්ථ, වාණිජ සහ තොග ආකාරවලින් LPG ආනයන සහ බෙදා හැරීම සම්බන්ධයෙන් වගකීමට බැඳී සිටියි. ලංකා හොස්පිටල් පුද්ගලික සමාගම සෞඛ්‍ය සේවා සපයනු ලබන අතර,  කළමනාකරණ සේවා රක්‍ෂණ පුද්ගලික සමාගම වැටුප් කළමනාකරණ විසඳුම් ලබා දෙයි. සීමාසහිත කැන්විල් හෝල්ඩිංස් පුද්ගලික සමාගමේ මූලික ව්‍යාපාරය හෝටල් ව්‍යාපෘති කළමනාකරණය සහ ආයෝජනය කිරීම වන අතර, සීමාසහිත කැනෝවින් හෝටල්ස් ඇන්ඩ් ස්පාස් පුද්ගලික සමාගම මූලිකවම දකුණු අධිවේගී මාර්ගයට යාබද  අලෙවිසැල් හිමිකරීත්වය දරමින් ඒවා කළමනාකරණය කරයි.

## මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

සමාගම සහ සමූහයේ කටයුතුවල සත්‍ය සහ සාධාරණ දර්ශනයක් පිළිබිඹු කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුයි. අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් අතරට, වංචා හෝ දෝෂ හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක වැරදි ප්‍රකාශනවලින් තොර මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම, ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ අනුගමනය කිරීම සහ තත්වයන් යටතේ සාධාරණ ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීම සඳහා අදාළ අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, පවත්වාගෙන යාම ඇතුළත් වේ.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සහ ලංකා ගිණුම්කරණ ප්‍රමිති, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනත සහ 2007 අංක 07 දරන සමාගම් පනතට අනුකූලව වාර්ෂික වාර්තාවේ මූල්‍ය තත්ත්ව  ප්‍රකාශය, ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම්/ස්කන්ධය වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් සකස් කර ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහසයි.

## මූල්‍ය ප්‍රකාශන සහ විගණකගේ වාර්තාව

2024 දෙසැම්බර් 31 වන දින අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති මත පදනම්ව සකස් කර ඇත. ප්‍රධාන මූල්‍ය නිලධාරී සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අත්සන් කරන ලද සමූහය සහ සමාගමේ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්ෂික වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන කොටස යටතේ ලබා දී ඇත. මෙම මූල්‍ය ප්‍රකාශ සහ සටහන් 2024 දෙසැම්බර් 31 වන දිනට  සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි කාර්ය සාධනය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දර්ශනයක් ලබා දෙයි.

## විගණකගේ වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වන වගන්තියේ නියමයන් අනුව විගණකාධිපතිවරයා බාහිර විගණකවරයා ලෙස පත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(4) වගන්තියට අනුව, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන වාර්ෂික විගණනයේදී විගණකාධිපතිවරයාට සහාය වීම සඳහා, වරලත් ගණකාධිකාරීවරුන්ගේ සමාගමක් වන Messrs BDO Partners, විගණකාධිපතිවරයා විසින් සුදුසුකම් ලත් විගණකවරයෙකු ලෙස පත් කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාවේ අනිවාර්ය අංගයක් වන මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකගේ වාර්තාව වාර්ෂික වාර්තාවේ ලබා දී ඇත.

## විගණන සහ අනෙකුත් ආශ්‍රිත සේවා සඳහා ගාස්තු

සමාලෝචනයට ලක් වූ වර්ෂය තුළ විගණන ගාස්තු ලෙස ගෙවන ලද මුදල සහ අනෙකුත් ආශ්‍රිත සේවා සඳහා ගෙවන ලද මුදල පහත දක්වා ඇත. මෙම ඡේදයේ අනාවරණය කරන ලද ඒවා හැර විගණකවරුන්ට  සමාගම සමඟ වෙනත් කිසිදු සම්බන්ධතා උනන්දුවක් නොමැති බවට අධ්‍යක්ෂ මණ්ඩලය අවබෝධයෙන් සිටියි. .

| | **2024 (රු. 000)** | **2023 (රු. 000)** |
|---|---|---|
| ව්‍යවස්ථාපිත විගණන ගාස්තු | 1,690 | 5,649 |
| විගණන නොවන ආශ්‍රිත සේවා | 726 | 10,113 |

## ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අනුගමනය කරන ලද සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කර ඇත.

## අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන පද්ධති

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ අවදානම් කළමනාකරණ කර්තව්‍යය ක්‍රියාත්මක කර අධීක්ෂණය කර ඇත.

සමාගම ශක්තිමත් අභ්‍යන්තර පාලන ප්‍රතිපත්ති සහ ක්‍රමවේද ක්‍රියාත්මක කර ඇති අතර එවැනි ප්‍රතිපත්ති සහ ක්‍රමවේද සමාගමේ අභ්‍යන්තර විගණන අංශය විසින් අධීක්ෂණය කරනු ලැබේ. විගණන සහ අනුකූලතා කමිටුව සමාගමේ අභ්‍යන්තර පාලන කර්තව්‍යය අධීක්ෂණය කරයි.

සමාලෝචනයට ලක් වූ වර්ෂය සඳහා සමාගමේ අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ කර්තව්‍යයේ ඵලදායිත්වය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත්ව සිටියි.

## අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය තත්ත්වය, කාර්ය සාධනය, මුදල් ප්‍රවාහ සහ නියාමන සහ ව්‍යවස්ථාපිත සාධක සලකා බැලීමෙන්, සමාගමට සහ සමූහයට ඉදිරි කාලය තුළ තම මෙහෙයුම් දිගටම කරගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත්වේ. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අඛණ්ඩ පැවැත්මේ පදනම අනුගමනය කරන ලදී.

## පිරිවැටුම/දළ ලිඛිත වාරිකය (GWP)

සමාලෝචනයට ලක් වූ වර්ෂය සඳහා සමාගමේ මුළු පිරිවැටුම රුපියල් මිලියන 10,914 ක් වාර්තා වී ඇති අතර සැසඳුම් අගය (2023) රුපියල් මිලියන 64,194 කි. සැසඳීමේ අගය පසුගිය වර්ෂයේ රක්ෂණ ව්‍යාපාරික ප්‍රතිඵල වලින් සමන්විත විය.

### ලාභාංශ

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2024 මූල්‍ය වර්ෂය සඳහා කොටසකට රුපියල් 2.12 ක අතුරු ලාභාංශයක් (මුළු මුදල රුපියල් 1,271,270,329.92) ප්‍රකාශයට පත් කර ඇත.

ප්‍රකාශයට පත් කරන ලද අවසාන ලාභාංශය සඳහා 2007 අංක 07 දරන සමාගම් පනතේ 56 වන වගන්තිය යටතේ නුබුන්වත්භාවය පිළිබඳ පරීක්ෂණ අවශ්‍යතාවය සමාගම විසින් සපුරාලන බව අධ්‍යක්ෂවරුන් විසින් තහවුරු කර ඇත. නුබුන්වත්භාවය පිළිබඳ සහතිකය විගණකවරු වෙතින් ලබා ගන්නා ලදී.

### පරිත්‍යාග

2024 වර්ෂය තුළ සමාගම විසින් කිසිදු පරිත්‍යාගයක් සිදු කර නොමැත.

## වගකීම් සහ ප්‍රතිපාදන

සමාලෝචනයට ලක් වූ මූල්‍ය වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය සියලුම අදාළ වාර්තාකරණ අයිතම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සහතික කිරීමට සියලුම සාධාරණ පියවර ගෙන ඇත.

මෙම වාර්තාවේ දිනය වන විට, මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණවත් ප්‍රතිපාදන සිදු නොකිරීමට හේතු වන කිසිදු තත්වයක් පිළිබඳව අධ්‍යක්ෂවරුන් දැනුවත් වී නොමැත.

## මූල්‍ය ප්‍රතිඵල සහ විසර්ජන

| | 2024 (රු. 000) | 2023 (රු. 000) |
|---|---|---|
| බදු පෙර ලාභය (PBT) | 3,546,102 | 10,703,813 |
| ආදායම් බදු වියදම් | 89,537 | 2,925,242 |
| බදු පසු ලාභය | 3,635,639 | 7,778,571 |
| අනෙකුත් විස්තීර්ණ ආදායම | 89,897 | 67,065 |
| ඉදිරියට ගෙන ආ විසර්ජනය නොවන ලාභය | 42,429,005 | 40,260,537 |
| විසර්ජනය සඳහා ඇති ලාභ | 46,154,539 | 48,106,174 |
| ගෙවන ලද ලාභාංශ | 1,271,268 | 2,272,841 |
| ජීවිත රක්ෂණයෙන් කොටස් හිමියන්ට ලැබෙන අතිරික්තය | 47,044 | 3,444,484 |
| ගොඩනැගිල්ලේ ප්‍රත්‍යාගණන අතිරික්තය මත වූ ක්ෂයවීම් මාරුව | - | 73,582 |
| කොටස් නැවත මිලදී ගැනීම | - | 33,424 |
| ප්‍රත්‍යාගණන සංචිතයෙන් මාරුව | 459,652 | - |
| ජීවිත අනුබද්ධ සමාගමට වත්කම් මාරු කිරීමේදී ප්‍රත්‍යාගණන සංචිතය ආදායමක් ලෙස හඳුනාගැනීම | 232,728 | - |
| සාමාන්‍ය අනුබද්ධ සමාගමට වත්කම් මාරු කිරීමේදී ප්‍රත්‍යාගණන සංචිතය ආදායමක් ලෙස හඳුනාගැනීම | 265,717 | - |
| බෝග රක්ෂණ බද්ද සම්බන්ධ වියදම සඳහා සිදුකළ ගිණුම් සැකසීම | 21,940 | - |
| ඉදිරියට ගෙනා විසර්ජනය නොවන ලාභය | 44,991,048 | 42,429,005 |

## බදු සඳහා ප්‍රතිපාදන

සමාගමේ බදු තත්ත්වය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර ඇත.

## සංචිත

වර්ෂය තුළ සංචිතවල වෙනස්වීම් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ දක්වා ඇත.

## ආයෝජන

2024 දෙසැම්බර් 31 වන දිනට සමාගම සතුව ඇති ආයෝජනවල වටිනාකම රුපියල් මිලියන 85,912 ක් (2023 - රුපියල් මිලියන 279,696) වේ. සමාගමට අයත් ආයෝජනවල සවිස්තරාත්මක වර්ගීකරණය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර ඇත.

## දේපල, පිරියත සහ උපකරණ

දේපල, පිරියත සහ උපකරණ පිළිබඳ විස්තර වාර්ෂික වාර්තාවේ ලබා දී ඇත.

## ආයෝජන දේපලවල සාධාරණ අගය

සමාගම ආයෝජන දේපල යටතේ වර්ගීකරණය කරන ලද ඉඩම් සහ ගොඩනැගිලි වාර්තාකරණය සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තිය ලෙස සාධාරණ අගය ආකෘතිය භාවිතා කරයි. ඒ අනුව, දේපල තක්සේරු කිරීමේ සුදුසු අත්දැකීම් සහිත ස්වාධීන වරලත් තක්සේරුකරු ඒ. ඒ. එම්. ෆාතිහු මහතා (MRICS) විසින් ආයෝජන දේපල තක්සේරු කර ඇත. එම තක්සේරුවේ ප්‍රතිඵල 2024 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇත.

## වාර්තාකරණ දිනයෙන් පසු සිදුවන සිදුවීම්

වාර්තාකරණ දිනයෙන් පසු සිදුවන සිදුවීම් මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 47 යටතේ අනාවරණය කර ඇත.

## සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය (LKAS 24) – සම්බන්ධිත පාර්ශව තොරතුරු වාර්තා කිරීමේ ප්‍රමිතියට අනුව, මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අනුගමනය කරන ලද සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු මෙම වාර්ෂික වාර්තාවේ ඇතුළත් වේ.

## අධ්‍යක්ෂ මණ්ඩලය

2024 දෙසැම්බර් 31 වන දිනට නිල තත්වයේ සිටි සමාගමේ අධ්‍යක්ෂවරුන් පහත පරිදිය:

| | |
|---|---|
| රොනල්ඩ් සී. පෙරේරා මහතා | 01.08.2022 දින පත්කරන ලදී - 08.10.2024 දින ඉල්ලා අස්විය |
| නඹමාල් එම්. පැල්පොල මහතා | 30.09.2022 දින පත්කරන ලදී - 08.10.2024 දින ඉල්ලා අස්විය |
| අචාර්ය එස්.එම්. පී. කිත්සිරි මංචනායක මහතා | 22.08.2022 දින පත්කරන ලදී - 09.10.2024 දින ඉල්ලා අස්විය |
| එස්. නිශාන්ත දයානන්ද මහතා | 26.12.2019 දින පත්කරන ලදී - 31.12.2024 දින ඉල්ලා අස්විය |
| අනිල් කොස්වත්ත මහතා | 26.12.2019 දින පත්කරන ලදී |
| කේ. රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා | 30.09.2022 දින පත්කරන ලදී |
| දුෂ්මන්ත තොටවත්ත මහතා | 22.08.2022 දින පත්කරන ලදී |
| පී. නුසිත් කුමාරතුංග මහතා | 18.10.2024 දින පත්කරන ලදී |

## මෙම වාර්තාවේ දිනට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය

1. පී. නුසිත් කුමාරතුංග මහතා
2. දුෂ්මන්ත තොටවත්ත මහතා
3. කේ. රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා
4. රොහාන් පී. බුල්ජන්ස් මහතා - 2025 ජනවාරි 01 වන දින සිට පත් කරන ලදී.
5. කේ. රජීව් ධර්මේන්ද්‍ර මහතා - 2025 ජනවාරි 01 වන දින සිට පත් කරන ලදී.
6. එන්. ඩී. බී. උනම්බුව මහතා, ජනාධිපති නීතිඥ - 2025 ජනවාරි 01 වන දින සිට පත් කරන ලදී.
7. අනිල් කොස්වත්ත මහතා - 02.01.2025 දින ඉල්ලා අස්විය.

## ආවර්තනයට යටත්ව හෝ වෙනත් ආකාරයකින් විශ්‍රාම යාම සහ නැවත පත්වීම

කන්දේගමගේ රවීන්ද්‍ර පත්මප්‍රිය සහ පලවින්නගේ නුසිත් සමරසී කුමාරතුංග මහත්වරු සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 93 වන වගන්තිය සමඟ කියවන 92 වන වගන්තිය යටතේ විශ්‍රාම ගන්නා ලද අතර නැවත පත්වීම සඳහා ඔවුන් සුදුසුකම් සපුරාලනු ලබයි.

## සමාගම සමඟ ගිවිසුම්ගතවීම් පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ උනන්දුව

අධ්‍යක්ෂවරුන් ගිවිසුම්ගතවීම් පිළිබඳ උනන්දුව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර ඇත. මෙම උනන්දුව අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීමේදී නිසි ලෙස අනාවරණය කර ඇත. අධ්‍යක්ෂවරු සමාගමේ කිසිදු කොටස් හිමිකමක් නොලබති.

## අධ්‍යක්ෂවරුන්ගේ වේතන

වර්ෂය තුළ ගෙවන ලද අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු සහ පාරිශ්‍රමිකය රුපියල් මිලියන 1.8 ක් වන අතර පසුගිය වර්ෂයේ (2023) වාර්තා කරන ලද එම වටිනාකම රුපියල් මිලියන 6.1 කි.

## ප්‍රකාශිත ප්‍රාග්ධනය

2024 දෙසැම්බර් 31 වන දිනට සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය 2007 අංක 07 දරන සමාගම් පනතට අනුකූලව රුපියල් මිලියන 6,000 කි. 2024 දෙසැම්බර් 31 වන දිනට, 99.98% කොටස් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් භාණ්ඩාගාර ලේකම්වරයා සතුව පැවතුණි.

## ව්‍යවස්ථාපිත ගෙවීම්

රජය, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) සහ සේවකයන් සම්බන්ධයෙන් සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත වේලාවට සිදු කර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ දැනුම සහ විශ්වාසය පරිදි සෑහීමකට පත්ව ඇත.

## පරිසරය

සමාගම අදාළ පාරිසරික නීති සහ රෙගුලාසි වලට අනුකූලව කටයුතු කරනු ලබන අතර කිසිදු ආකාරයේ හානිකර ක්‍රියාකාරකම්වල නොයෙදේ.

## නීති සහ රෙගුලාසි සමඟ අනුකූලතාව

ස්වාධීන විගණකයින්ගේ වාර්තාවේ වෙනත් ආකාරයකින් අනාවරණය කර ඇති පරිදි සමාගම මූල්‍ය වර්ෂය තුළ සියලුම අදාළ නීති සහ රෙගුලාසි වලට අනුකූල වී ඇත. අනුකූලතා අංශය සමාගමේ අනුකූලතා කර්තව්‍ය අධීක්ෂණය කර විගණන සහ අනුකූලතා කමිටුව සහ අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කරනු ලබයි. තවද, සම්මත කාල අනුකූලතා වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබේ.

## මූල්‍ය ප්‍රකාශනවල අනුමැතිය

විගණන කරන ලද මූල්‍ය ප්‍රකාශන 2025 ජූනි 02 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## වාර්ෂික මහා සභා රැස්වීම

වාර්ෂික මහා සභා රැස්වීම 2025 ජූනි 30 වන දින, පෙ.ව. 10.00 ට, කොළඹ 02, වෝක්ස්හෝල් වීදිය, අංක 21, "රක්ෂණ මන්දිරය" හි පිහිටි සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ශ්‍රවණාගාරයේ පවත්වනු ලැබේ.

2007 අංක 7 දරන සමාගම් පනතේ 168(1)(k) වගන්තිය අනුව, මෙම වාර්තාවේ අන්තර්ගතය අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් නිල වශයෙන් පිළිගනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි

**ශිරෝමි කෝදාගොඩ**
සමාගම් ලේකම්
2025 ජූනි 02

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්

**නුසිත් කුමාරතුංග**
සභාපති
2025 ජූනි 02

**දුෂ්මන්ත තොටවත්ත**
අධ්‍යක්ෂ
2025 ජූනි 02

# අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය

2007 අංක 07 දරන සමාගම් පනතේ 150, 152, සහ 153 වගන්තිවල, මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ රාජකාරි සහ වගකීම් දක්වා ඇත. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකවරුන්ගේ වගකීම වාර්ෂික වාර්තාවට ඇතුළත් කර ඇති විගණක වාර්තාවේ පැහැදිලි කර ඇත.

2007 අංක 07 දරන සමාගම් පනතට අනුව, ශේෂ පත්‍ර දිනට අවසන් වන ගිණුම්කරණ කාල සීමාව සඳහා සමාගමේ ලාභ හෝ අලාභ හෝ ආදායම් සහ වියදම් ඇතුළුව, එදිනට සමාගමේ මූල්‍ය තත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් සමාගමේ මූල්‍ය ප්‍රකාශන මගින් ලබා දීම සහතික කිරීම අධ්‍යක්ෂවරුන්ගේ වගකීමයි. සමාගමේ සමස්ත තත්වය පිළිබඳ සාධාරණ නිරූපණයක් ද මූල්‍ය ප්‍රකාශන තුලින් ඉදිරිපත් කළ යුතුය.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRSs සහ LKASs), 2007 අංක 07 දරන සමාගම් පනත, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනත, සහ 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත්කිරීමේ පනත අනුව සකස් කර ඉදිරිපත් කර ඇති බවට සහතික වීම අධ්‍යක්ෂවරු වෙතින් අපේක්ෂා කෙරේ.

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති නිරන්තරයෙන්ම යොදා ගත් බවත්, යෝග්‍ය විනිශ්චය සහ ඇස්තමේන්තු ක්‍රියාත්මක කළ බවත් අධ්‍යක්ෂවරුන් විසින් සනාථ කරනු ලැබේ. එයට අමතරව, සමාගම සතුව අනාගත කාලය සඳහා කටයුතු කරගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ඇති බවට ඔවුන් හට සාධාරණ අපේක්ෂාවක් ඇති අතර, එබැවින් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ව්‍යාපාර අඛණ්ඩතාවය පදනම අදාල කරගනු ලැබ ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.



**ශිරෝමී කෝදාගොඩ**
සමාගම් ලේකම්
2025 ජුනි 02

# ප්‍රධාන මූල්‍ය නිලධාරියාගේ වගකීම පිළිබඳ ප්‍රකාශය

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්හි (සමාගම) මූල්‍ය ප්‍රකාශන සහ සමාගම හා අනුබද්ධිත සමාගම්වල (සමූහය) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 2024 දෙසැම්බර් 31 වන දින පහත සඳහන් අවශ්‍යතාවන්ට අනුකූලව සකස් කර ඉදිරිපත් කරන ලදී.

i. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරණ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (SLFRS/LKASs)
ii. 2007 අංක 07 දරන සමාගම් පනත
iii. 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී භාවිතා කරන ලද ආකෘති සහ ඒවායේ සිදු කරන ලද හෙළිදරව් කිරීම් අදාළ නියාමකයින් විසින් නියම කරන ලද ආකෘතිවලට අනුකූල වන අතර, ඒවා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවන්ට ද අනුකූල වේ. අපගේ දැනුම අනුව, මූල්‍ය ප්‍රකාශන තුළින්, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මෙම වාර්ෂික වාර්තාවට ඇතුළත් කර ඇති අනෙකුත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තොරතුරු, සමාගමේ මූල්‍ය තත්වය, ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහය සෑම අතින්ම සාධාරණව නිරූපණය කරන බව අපි සනාථ කරමු. ඊට අමතරව, සමාගමට එහි ක්‍රියාකාරීත්වය පවත්වාගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ඇති බවත්, මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ව්‍යාපාර අඛණ්ඩතාවය පදනම යොදා ඇති බවත් අපි සනාථ කරමු.

කළමනාකරණය විසින් එහි මූල්‍ය වාර්තාකරණ වගකීම් ඉටු කරනු ලබන බවට සහතික වීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. ප්‍රධාන මූල්‍ය නිලධාරියා වශයෙන්, මූල්‍ය වාර්තාකරණය පිළිබඳ ප්‍රමාණවත් ගිණුම්කරණ ප්‍රතිපත්ති, ක්‍රියාමාර්ග සහ අභ්‍යන්තර පාලන ස්ථාපනය කිරීම සහ නඩත්තු කිරීම මාගේ වගකීම වේ. මූල්‍ය ප්‍රකාශන සියලු ආකාරයෙන් නිරවද්‍ය සහ සම්පූර්ණ බවට සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා නිර්මාණය කරන ලද අභ්‍යන්තර පාලන පද්ධතියක් කළමනාකරණය සතුව ඇත. මූල්‍ය වාර්තා විශ්වසනීය වන අතර මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා සුදුසු පදනමක් වන බවටත්, වත්කම් නිසි ලෙස ගණනය කර ආරක්ෂා කර ඇති බවටත් සාධාරණ සහතිකයක් අභ්‍යන්තර පාලන විසින් ලබා දෙන බව කළමනාකරණයේ විශ්වාසය වේ. අභ්‍යන්තර පාලන සහ ක්‍රියාමාර්ග නිරන්තරයෙන්ම අනුගමනය කරනු ලබන බව සහතික කිරීම සඳහා SLIC අභ්‍යන්තර විගණකවරුන් විසින් වරින් වර සමාලෝචනයන් සිදුතරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්වාධීන අධ්‍යක්ෂවරයකුගේ නායකත්වයෙන් යුත් විගණන සහ අනුකූලතා කමිටුවක් පත් කර ඇත. විගණන සහ අනුකූලතා කමිටුව විසින් අභ්‍යන්තර විගණන කාර්යභාරය, විගණන පසු විපරම් කමිටු වාර්තා සහ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කර ඇත. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වගන්තියේ විධිවිධාන අනුව, කොටස් හිමියන් වෙනුවෙන් විගණකාධිපති විසින් මූල්‍ය ප්‍රකාශන විගණනය කර ඇත. ස්වාධීන විගණකවරයාට විගණන සහ අනුකූලතා කමිටුව වෙත පූර්ණ සහ නිදහස් ප්‍රවේශයක් ඇති අතර කළමනාකරණයේ නියෝජනයක් සහිතව හෝ රහිතව රැස්වීම් පැවැත්වීමට හැකියාව ඇත. අපගේ දැනුම අනුව පහත සඳහන් කරුණු සනාථ කරමු.

i. මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන්වල වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම් හැර, සමාගම අදාළ වන සියලුම නීති, රීති සහ රෙගුලාසි සහ මාර්ගෝපදේශවලට අනුකූල වී ඇත.
ii. මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන්වල සහ විගණකාධිපතිවරයා විසින් වෙනත් ආකාරයකින් ප්‍රකාශ කර නොමැති නම් හැර, විශේෂ අනුකූල නොවීම් නොමැත.
iii. වාර්තාකරණ දිනට සමාගම විසින් සියලු බදු, තීරුබදු සහ සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් සහ සමාගමේ සේවකයින් වෙනුවෙන් සහ ඔවුන් සම්බන්ධයෙන් ගෙවිය යුතු සියලු දායකත්ව සහ බදු ගෙවීම, හෝ අදාළ අවස්ථාවන්හිදී ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම සිදු කර ඇත.
iv. සංචිතකරණ සහ නුබුන්වත්භාවයට අදාළ මාර්ගෝපදේශයන්ට අනුකූලව ක්‍රියාකර ඇති අතර, සමස්ත සංචිත මූල්‍ය වටිනාකම, සම්මත කළ හැකි වත්කම් මඟින් සම්පූර්ණයෙන්ම ආවරණය වී ඇත.
v. ස්කන්ධ ප්‍රාග්ධනය අදාළ රෙගුලාසි අනුව නියම කර ඇති අවම ප්‍රාග්ධන අවශ්‍යතාවන්ට ගැලපේ.



**ශ්‍රියානි කුලසිංහ**
ප්‍රධාන මූල්‍ය නිලධාරී
2025 ජූනි 02

# ස්වාධීන විගණකවරයාගේ වාර්තාව

සභාපති
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්හි මූල්‍ය ප්‍රකාශ සහ අනෙකුත් නීතිමය සහ නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව.

## 1. මූල්‍ය ප්‍රකාශ

### 1.1 මතය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වන ව්‍යවස්ථාවේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමග ගැලපෙන පරිදි, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්හි ("සමාගම") මූල්‍ය ප්‍රකාශ සහ සමාගම හා එහි අනුබද්ධිත සමාගම්වල ("සමූහය") ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන විගණනය මාගේ මග පෙන්වීම යටතේ සිදු කරන ලදී. එම මූල්‍ය ප්‍රකාශනවලට 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, සහ 09 සිට 120 දක්වා පිටුවල සඳහන් වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති තොරතුරු ඇතුළු මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඇතුළත් වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වන වගන්තියේ විධිවිධාන අනුව මගේ වාර්තාව නියමිත කාලයේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබේ. මෙම විගණනය සිදු කිරීම සඳහා මා හට, බාහිර පාර්ශව සඳහා සේවා සපයන වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයක සහාය හිමිවිය.

මාගේ මතය අනුව, සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන 2024 දෙසැම්බර් 31 දිනට සමාගමේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහ පිළිබඳව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ දර්ශනයක් ලබා දෙයි.

### 1.2 මතය සඳහා වූ පදනම

මම මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (SLAuSs) අනුකූලව සිදු කළෙමි. එම ප්‍රමිතිවලට යටතේ වූ මාගේ වගකීම්, මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකාධිපතිවරයාගේ වගකීම කොටසේ වැඩිදුරටත් විස්තර කර ඇත. මම ලබා ගත් විගණන සාක්ෂි මාගේ මතයට පදනමක් සැපයීම සඳහා ප්‍රමාණවත් සහ සුදුසු බව මම විශ්වාස කරමි.

**විශේෂ අවධානයට ලක් කළ යුතු කරුණ**

**සමාගම සහ සමූහය**

මම මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් අංක 46 වෙත අවධානය යොමු කළෙමි. එහිදී සමාගම විසින් දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වෙන්වූ නීතිමය ඒකක දෙකක් බවට පරිවර්තනය කිරීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරනු ලබන වෙන්කිරීම් ක්‍රියාවලියෙහි තත්ත්වය, 2011 අංක 03 දරන රක්ෂණ කර්මානය විධිමත් කිරීමේ (සංශෝධන) පනතේ 53 වගන්තියට අනුව විස්තර කර ඇත. 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 30 වන වගන්තියට අදාළ පරිපාලන ක්‍රියාවලිය පිළිබඳ තත්ත්වය, සහ කළමනාකරණ සේවා රක්ෂණ (පුද්ගලික) සමාගම වෙතින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් වෙත සේවකයන් මාරු කිරීම සම්බන්ධ තොරතුරුද සටහනේ සඳහන් වේ. මෙම වෙන්කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමත් සමඟ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් ආයතනයට සිදුවන බලපෑම් සහ එයට අනුරූපව කළමනාකරණ සේවා රක්ෂණ (පුද්ගලික) සමාගමේ මෙහෙයුම් කටයුතු වෙත ඇති බලපෑමද එහි සඳහන් වේ. මෙම කරුණ සම්බන්ධයෙන් මාගේ මතය වෙනස් කර නොමැත.

### 1.3 සමාගමේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

අනෙකුත් තොරතුරු යනු 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් තොරතුරු වන නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ සම්බන්ධ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන, මෙම විගණන වාර්තාවේ දිනයෙන් පසුව මා වෙත ලැබීමට අපේක්ෂා කෙරෙන තොරතුරුය. අනෙකුත් තොරතුරු පිළිබඳ වගකීම කළමනාකරණය සතු වේ.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ මතය මගින් අනෙකුත් තොරතුරු ආවරණය නොවන අතර මම ඒ සම්බන්ධයෙන් කිසිදු සහතික නිගමනයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන විගණනයට අදාළව, ඉහත හඳුනාගෙන ඇති අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී, අනෙක් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ සැලකිය යුතු ලෙස නොගැලපේද නැතහොත් විගණනයේදී මා ලබාගත් දැනුම සමඟ සැලකිය යුතු ලෙස වැරදි ලෙස ප්‍රකාශ කර ඇති බව පෙනේද යන්න සලකා බැලීම මගේ වගකීම වේ.

වාර්ෂික වාර්තාව කියවන විට, එහි සැලකිය යුතු වැරදි ප්‍රකාශයන් ඇති බව මා නිගමනය කරන්නේ නම්, එම කාරණය නිවැරදි කිරීම සඳහා පාලනය භාරව සිටින අය වෙත දැනුම් දිය යුතුය. තවදුරටත් සැලකිය යුතු නිවැරදි නොකළ වැරදි ප්‍රකාශයන් ඇත් නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තියේ විධිවිධානවලට අනුකූලව නියමිත වේලාවට සභාගත කරනු ලබන පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන මාගේ වාර්තාවට ඇතුළත් කරනු ලැබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය පවරා ඇති පාර්ශවයන්ගේ වගකීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ දැක්මක් ලබා දෙන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ වංචා හෝ දෝෂ හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සඳහා අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් කළමනාකරණය විසින් වගකිව යුතු වේ.

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී, සමූහයේ අඛණ්ඩ පැවැත්මේ හැකියාව තක්සේරු කිරීම, අදාළ වන පරිදි අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු හෙළිදරව් කිරීම සහ කළමනාකරණය විසින් සමූහය ඈවර කිරීමට හෝ මෙහෙයුම් නැවැත්වීමට අදහස් කරන්නේ නම් හෝ එසේ කිරීමට වෙනත් යථාර්ථවාදී විකල්පයක් නොමැති නම් ගිණුම්කරණයේ අඛණ්ඩ පැවැත්මේ පදනම භාවිතා කිරීම කළමනාකරණය සතු වගකීමකි.

සමාගමේ සහ සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා පාලනය පවරා ඇති පාර්ශව වගකිව යුතුය.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වන වගන්තියට අනුව, සමාගමේ සහ සමූහයේ වාර්ෂික සහ වරින් වර මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට හැකි වන පරිදි සියලුම ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම්වල නිසි පොත්පත් සහ වාර්තා පවත්වා ගැනීම සමාගම සහ සමූහය විසින් සිදුකල යුතුයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකාධිපතිගේ වගකීම්

මාගේ අරමුණ වන්නේ සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචාවක් හෝ දෝෂයක් හේතුවෙන් ඇති වූ ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරද යන්න පිළිබඳව සාධාරණ සහතිකයක් ලබා ගැනීම සහ මාගේ මතය ඇතුළත් විගණක වාර්තාවක් නිකුත් කිරීමයි. සාධාරණ සහතික කිරීම යනු ඉහළ මට්ටමේ සහතිකයක් වන නමුත්, එය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සිදු කරන ලද විගණනයක් වන අතර සෑම විටම පවතින සැලකිය යුතු මට්ටමේ වැරදි ප්‍රකාශනයක් හඳුනාගනු ඇතැයි සහතික කිරීමක් නොවේ. වැරදි ප්‍රකාශන වංචාව හෝ දෝෂයකින් ඇති විය හැකි අතර ඒවා තනි වශයෙන් හෝ සමූහිකව මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගත් පරිශීලකයින්ගේ ආර්ථික තීරණවලට සාධාරණ ලෙස බලපෑම් කළ හැකි යැයි අපේක්ෂා කළ හැකි නම් ඒවා ප්‍රමාණාත්මක ලෙස සලකනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූල විගණනයක කොටසක් ලෙස, මා විසින් විගණනය පුරාවටම වෘත්තීයමය තීරණයක් ක්‍රියාත්මක කරන අතර සහ වෘත්තීයට ආවේණික සැකයක් පවත්වා ගනිමි. තවද මම :

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනවල අවදානම් හඳුනාගෙන තක්සේරු කිරීම, එම අවදානම්වලට ප්‍රතිචාර දක්වන විගණන පටිපාටි සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම, සහ මාගේ මතයට පදනමක් සැපයීම සඳහා ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම සිදු කරමි. වංචාවකින් ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයක් හඳුනා නොගැනීමේ අවදානම දෝෂයකින් ඇති වන ප්‍රමාණාත්මක වැරදි ප්‍රකාශනයක් හඳුනා නොගැනීමේ අවදානමට වඩා අධික වේ. මන්ද යත් වංචාවට දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, හිතාමතා අතපසු කිරීම්, වැරදි නිරූපණයන් හෝ අභ්‍යන්තර පාලනය ඉක්මවා යාම ඇතුළත් විය හැක.
- සමාගමේ සහ සමූහයේ අභ්‍යන්තර පාලනවල ඵලදායිතාව පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අරමුණු සඳහා නොව, අවස්ථාවන්ට සුදුසු විගණන ක්‍රමවේදයන් සැලසුම් කිරීම සඳහා විගණනයට අදාළ අභ්‍යන්තර පාලන පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සිදු කරමි. කෙසේවුවද, භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාවය සහ කළමනාකරණය විසින් කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ ඒ ආශ්‍රිත අනාවරණයන්ගේ සාධාරණත්වය තක්සේරු කිරීම සිදු කරමි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ කළමනාකරණය විසින් කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ අදාළ හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාව ඇගයීමට ලක් කළෙමු.

- කළමනාකරණය විසින් අඛණ්ඩ ව්‍යාපාර ගිණුම්කරණ පදනම භාවිතා කිරීමේ යෝග්‍යතාවය පිළිබඳ නිගමනයට පැමිණීම

  සහ ලබා ගත් විගණන සාක්ෂි පදනම් කරගෙන, අඛණ්ඩ ව්‍යාපාරයක් ලෙස දිගටම පැවතීමේ සමූහයේ හැකියාව පිළිබඳ සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි සිදුවීම් හෝ තත්ත්වයන්ට සම්බන්ධ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින්නේ දැයි සොයා බලමි. සැලකිය යුතු අවිනිශ්චිතතාවයක් පවතින බව මා විසින් නිගමනය කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශනවල ඒ ආශ්‍රිත අනාවරණයන් වෙත මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කිරීමට හෝ එවැනි අනාවරණයන් ප්‍රමාණවත් නොවේ නම්, මාගේ මතය වෙනස් කිරීමට මා හට අවශ්‍ය වේ. මාගේ නිගමන මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගත් විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වෙතත්, අනාගත සිදුවීම් හෝ තත්ත්වයන් සමාගමට සහ සමූහයට අඛණ්ඩ ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩ පැවතීම නතර කරවීමට හේතු විය හැක.

- මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය, හෙළිදරව් කිරීම් ඇතුළුව, එම ප්‍රකාශන, වාර්තා කර ඇති ගනුදෙනු සහ සිදුවීම් සාධාරණව නිරූපණය වන පරිදි ඉදිරිපත් වී ඇතිද යන්නද සළකා බලමි.

- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා සමූහය තුළ ආයතන හෝ ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල මූල්‍ය

  තොරතුරු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගනිමි. සමූහය පිළිබඳ විගණනය සඳහා මඟ පෙන්වීම, අධීක්ෂණය සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මා වගකිව යුතුය. මාගේ විගණන මතය සම්බන්ධයෙන් මම සම්පූර්ණයෙන්ම වගකිව යුතුය.

විගණනයේ දී මා විසින් හඳුනාගත් අභ්‍යන්තර පාලනයේ කිසියම් සැලකිය යුතු අඩුපාඩුකම් සහ සැලකිය යුතු විගණන සොයාගැනීම් ඇතුළු අනෙකුත් කරුණු සම්බන්ධයෙන් පාලනය පවරා ඇති පාර්ශව දැනුවත් කරන ලදි.

## 2. අනෙකුත් නීතිමය සහ නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

**2.1** 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 2007 අංක 07 දරන සමාගම් පනත පහත සඳහන් අවශ්‍යතා සම්බන්ධයෙන් විශේෂිත විධිවිධාන දක්වා ඇත.

**2.1.1** විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගෙන ඇති අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනෙන පරිදි, 2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ අවශ්‍යතාවයට අනුව සමාගම විසින් නිසි ගිණුම්කරණ වාර්තා තබා ඇත.

**2.1.2** සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 සහ 153 වන වගන්තිවල අවශ්‍යතාවයට අනුකූල වේ.

**2.1.3** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තිවල අවශ්‍යතාවයන්ට අනුකූලව, ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පෙර වසරට අනුරූප වේ.

**2.1.4** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වන වගන්තියේ අවශ්‍යතාවයට අනුව, ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල පෙර වර්ෂයේ මා විසින් කරන ලද සියලුම නිර්දේශ ඇතුළත් වේ.

**2.2** ප්‍රමාණාත්මක කරුණුවලට සීමා වී ක්‍රියාත්මක කරන ලද ක්‍රමවේදයන් සහ ලබා ගත් සාක්ෂි පදනම් කරගැනීමේ දී පහත කරුණු සම්බන්ධයෙන්, කිසිවක් මාගේ අවධානයට යොමු වී නොමැත;

**2.2.1** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ අවශ්‍යතාවයට අනුව සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලින් බැහැරව සමාගම විසින් අත්සන් කරන ලද ඕනෑම ගිවිසුමක් සම්බන්ධයෙන් සමාගමේ පාලක මණ්ඩලයේ ඕනෑම සාමාජිකයෙකුට ඍජු හෝ වක්‍ර උනන්දුවක් ඇති බව ප්‍රකාශ කිරීමට.

**2.2.2** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වන වගන්තියේ අවශ්‍යතාවයට අනුව සමාගම කිසියම් අදාළ ලිඛිත නීතියකට, සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද සාමාන්‍ය සහ විශේෂ නියෝගවලට අනුකූල වී නැත යන්න ප්‍රකාශ කිරීමට.

**2.2.3** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වන වගන්තියේ අවශ්‍යතාවයට අනුව සමාගම එහි බලතල, කාර්යයන් සහ යුතුකම්වලට අනුකූලව ක්‍රියා කර නැත යන්න ප්‍රකාශ කිරීමට.

**2.2.4** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වන කොටසේ අවශ්‍යතාවයට අනුව සමාගමේ සම්පත් කාල සීමාවන් තුළ සහ අදාළ නීතිවලට අනුකූලව සකසුරුවම් ලෙස, කාර්යක්ෂම සහ ඵලදායී ලෙස ලබා ගෙන භාවිතා කර නැත යන්න ප්‍රකාශ කිරීමට.

**ජී. එච්. ඩී. ධර්මපාල**
**විගණකාධිපති (වැඩ බලන)**

# මූල්‍ය ප්‍රකාශ

1. මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
2. ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය
3. ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය
4. මුදල් ප්‍රවාහ ප්‍රකාශය
5. මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනට | සටහන් | සමූහය 2024 රු. 000' | සමූහය 2023 රු. 000' | සමාගම 2024 රු. 000' | සමාගම 2023 රු. 000' |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| මූල්‍ය ආයෝජන | 5 | **316,397,047** | 258,084,996 | **45,242,308** | 251,108,987 |
| උප සමාගම්වල සිදුකරන ලද ආයෝජන | 6 | **-** | - | **39,924,534** | 23,823,892 |
| ආශ්‍රිත සමාගම්වල ආයෝජන | 7 | **198,673** | 198,673 | **198,673** | 198,673 |
| දේපල, පිරියත සහ උපකරණ | 8 | **41,916,840** | 74,808,439 | **215,202** | 12,644,259 |
| භාවිත අයිතිය සහිත වත්කම් | 9 | **1,256,637** | 1,149,793 | **-** | 501,037 |
| ආයෝජන දේපල | 10 | **3,759,812** | 3,321,320 | **17,965,274** | 2,362,320 |
| අස්පෘශ්‍ය වත්කම් | 11 | **3,256,775** | 3,188,957 | **-** | 116,025 |
| ඔප්පු හිමියන් වෙත ලබාදෙන ලද ණය | 12 | **2,288,853** | 2,095,884 | **-** | 2,095,884 |
| ලැබිය යුතු ප්‍රතිරක්ෂණ | 13 | **3,260,696** | 1,868,737 | **-** | 1,868,737 |
| ලැබිය යුතු වාරික | 14 | **5,933,582** | 6,290,934 | **-** | 6,290,934 |
| විලම්භිත බදු වත්කම් | 15 | **254,677** | 403 | **-** | - |
| අනෙකුත් වත්කම් | 16 | **22,613,923** | 19,221,424 | **10,975,040** | 5,113,477 |
| විලම්භිත වියදම් | 17 | **732,566** | 620,872 | **-** | 620,872 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 18 | **33,130,712** | 18,520,139 | **555,913** | 5,885,171 |
| **මුළු වත්කම්** | | **435,000,793** | 389,370,571 | **115,076,944** | 312,630,268 |
| | | | | | |
| **වගකීම් සහ කොටස්හිමියන්ගේ ස්කන්ධය** | | | | | |
| **ස්කන්ධය** | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 19 | **6,000,000** | 6,000,000 | **6,000,000** | 6,000,000 |
| නියාමන සීමා සහිත සංචිත | | **98,237** | 98,237 | **-** | 98,237 |
| ප්‍රත්‍යාගණන සංචිතය | 20 | **24,894,015** | 22,828,004 | **10,428,987** | 8,410,899 |
| විකිණීම සඳහා පවතින සංචිත | 21 | **25,185,469** | 9,578,134 | **21,037,732** | 9,578,134 |
| ආදායම් සංචිත | 22 | **91,161,343** | 84,203,128 | **70,206,962** | 67,691,963 |
| **සමාගමේ සාමාන්‍ය කොටස් හිමියන්ට අත්කරගත හැකි මුළු ස්කන්ධය** | | **147,339,064** | 122,707,503 | **107,673,681** | 91,779,233 |
| පාලනය නොවන අයිතිය | 6.4 | **7,422,979** | 13,233,465 | **-** | - |
| **මුළු ස්කන්ධය** | | **154,762,043** | 135,940,968 | **107,673,681** | 91,779,233 |

| | | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | සටහන් | **2024 රු. 000'** | 2023 රු. 000' | **2024 රු. 000'** | 2023 රු. 000' |
| වගකීම් | | | | | |
| රක්ෂණ ගිවිසුම් වගකීම්- ජීවිත | 23 | **216,783,321** | 183,784,492 | **-** | 183,784,492 |
| රක්ෂණ ගිවිසුම් වගකීම් - ජීවිත නොවන | 24 | **20,441,265** | 20,496,192 | **-** | 20,496,192 |
| ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ | | **3,239,796** | 1,183,597 | **-** | 1,183,597 |
| ප්‍රවර්තන බදු වගකීම් | 25 | **2,539,500** | 3,010,059 | **907,421** | 2,114,571 |
| විලම්භිත බදු වගකීම් | 15 | **9,557,363** | 7,942,524 | **4,450,847** | 3,923,071 |
| කල්බදු වගකීම් | 9 | **1,021,591** | 847,561 | **547,991** | 567,226 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් | 26 | **3,023,881** | 2,473,643 | **-** | 1,738,388 |
| වෙනත් වගකීම් | 27 | **22,708,944** | 27,846,688 | **1,497,004** | 6,597,465 |
| මූල්‍ය වගකීම් | 28 | **923,089** | 5,844,847 | **-** | 446,033 |
| **මුළු වගකීම්** | | **280,238,750** | 253,429,603 | **7,403,263** | 220,851,035 |
| **මුළු වගකීම් සහ ස්කන්ධය** | | **435,000,793** | 389,370,571 | **115,076,944** | 312,630,268 |

පිටු අංක 44 සිට 131 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවර්යය අංගයක් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 7 දරණ සමාගම් පනතේ අවශ්‍යතාට අනුකූලව සකස් කර ඇත.

**ශ්‍රියානි කුලසිංහ**
ප්‍රධාන මූල්‍ය නිළධාරී

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් කරන ලදි.

නුසිත් කුමාරතංග
සභාපති

**ආර්. පී. බුල්ජන්ස්**
අධ්‍යක්ෂ

කොළඹ
**2025 ජූනි 02**

# ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | සමූහය 2024 රු. 000' | සමූහය 2023 රු. 000' | සමාගම 2024 රු. 000' | සමාගම 2023 රු. 000' |
|---|---|---|---|---|---|
| ආදායම | 29 | **182,086,157** | 170,784,832 | **10,913,916** | 64,193,766 |
| දළ ලිඛිත වාරිකය | 30 | **51,264,470** | 43,320,585 | **3,589,653** | 44,224,745 |
| නොඉපැවූ දළ වාරික පිළිබඳ සංචිතයේ වෙනස | 31.2 | **557,953** | (466,762) | **137,078** | (466,762) |
| දළ ඉපයූ වාරික | | **51,822,423** | 42,853,823 | **3,726,731** | 43,757,983 |
| ප්‍රතිරක්ෂණකරුවන්ට පවරන ලද වාරික | 31.3 | **(8,280,428)** | (6,374,682) | **(319,941)** | (6,374,682) |
| නොඉපැවූ ප්‍රතිරක්ෂණ වාරික පිළිබඳ සංචිතයේ වෙනස | 31.4 | **(567,272)** | (520,935) | **(134,991)** | (520,935) |
| ශුද්ධ ඉපයූ වාරික | 31 | **42,974,723** | 35,958,206 | **3,271,799** | 36,862,366 |
| වෙනත් මෙහෙයුම් වෙතින් ලැබූ ආදායම | 30.1 | **104,399,831** | 103,215,334 | - | - |
| | | **147,374,554** | 139,173,540 | **3,271,799** | 36,862,366 |
| අනෙකුත් ආදායම් | | | | | |
| ආයෝජන ආදායම් | 32 | **36,365,220** | 29,490,139 | **6,313,117** | 28,443,595 |
| ගාස්තු සහ කොමිස් ආදායම් | 33 | **75,965** | 57,571 | **238** | 57,571 |
| ශුද්ධ උපලබ්ධි/උපලබ්ධි නොවූ ලැබීම් | 34 | **(26,054)** | (829,217) | **(137,891)** | (2,587,778) |
| අනෙකුත් (වියදම්)/ආදායම් | 35 | **(1,703,528)** | 2,892,799 | **1,466,653** | 1,418,012 |
| | | **34,711,603** | 31,611,292 | **7,642,117** | 27,331,400 |
| ආදායම | | **182,086,157** | 170,784,832 | **10,913,916** | 64,193,766 |
| ප්‍රතිලාභ, අලාභ සහ වියදම් | | | | | |
| ශුද්ධ ප්‍රතිලාභ සහ හිමිකම් | 36 | **(23,498,359)** | (21,778,074) | **(2,005,398)** | (21,778,074) |
| ප්‍රාරක්ෂණය සහ ශුද්ධ අත්පත්කර ගැනීමේ පිරිවැය | 37 | **(3,821,575)** | (3,501,658) | **(339,855)** | (3,501,658) |
| ගිවිසුම් වගකීම්වල වෙනස්වීම - ජීවිත අරමුදල | | **(26,409,382)** | (18,289,725) | **(1,834,641)** | (18,289,725) |
| අනෙකුත් මෙහෙයුම් සහ පරිපාලන වියදම් | | **(23,875,946)** | (20,450,203) | **(3,187,920)** | (9,920,496) |
| අනුබද්ධිත ආයතනවල සේවා වියදම් | | **(90,428,617)** | (86,806,657) | - | - |
| ශුද්ධ ප්‍රතිලාභ, අලාභ සහ වියදම් | | **(168,033,879)** | (150,826,317) | **(7,367,814)** | (53,489,953) |
| බදු පෙර ලාභය | 38 | **14,052,278** | 19,958,515 | **3,546,102** | 10,703,813 |
| ආදායම් බදු වියදම් | 39 | **(4,964,899)** | (6,203,340) | **89,537** | (2,925,242) |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | | **9,087,379** | 13,755,175 | **3,635,639** | 7,778,571 |

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | සමූහය<br>2024<br>රු. 000' | <br>2023<br>රු. 000' | සමාගම<br>2024<br>රු. 000' | <br>2023<br>රු. 000' |
|---|---|---|---|---|---|
| අනෙකුත් විස්තීර්ණ ආදායම් | | | | | |
| *ලාභ හෝ අලාභ වලට වර්ගීකරණය නොවන අයිතම* | | | | | |
| දේපල, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය මත ලාභය/(අලාභය) | | **2,965,656** | 9,432 | **3,035,403** | - |
| භාවිත අයිතිය සහිත වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමෙන් ලැබෙන ලාභ/අලාභ | | **347,173** | - | **-** | - |
| දේපල, පිරියත සහ උපකරණ සහ භාවිත අයිතිය සහිත වත්කම් සංචිත ප්‍රත්‍යාගණනය මත විලම්භිත බදු බලපෑම | | **(726,046)** | 45,167 | **(518,870)** | 45,167 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම මත ආයුගණක ලාභ/(අලාභ) | 26 | **(336,622)** | (110,935) | **110,698** | 6,665 |
| ආයුගණක ලාභ/(අලාභ) මත විලම්භිත බදු බලපෑම | 39.2 | **69,591** | 89,446 | **(20,803)** | 60,400 |
| *ලාභ හෝ අලාභයට පසුව නැවත වර්ගීකරණය කරන ලද හෝ කළ හැකි අයිතම* | | | | | |
| විකිණීමට ඇති මූල්‍ය වත්කම්වල සාධාරණ අගයේ ශුද්ධ වෙනස | | **26,644,317** | 15,801,903 | **11,257,109** | 15,801,903 |
| විකිණීමට ඇති සංචිතයේ සාධාරණ අගය මත විලම්බිත බදු බලපෑම | 39.2 | **(278,179)** | (115,602) | **(110,802)** | (115,602) |
| වර්ෂයේ අනෙකුත් විස්තීර්ණ ආදායම, බද්දෙන් ශුද්ධ | | **28,685,890** | 15,719,411 | **13,752,735** | 15,798,533 |
| වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම | | **37,773,269** | 29,474,586 | **17,388,374** | 23,577,104 |
| වර්ෂය සඳහා මුළු ලාභය බෙදීයන ආකාරය: | | | | | |
| සමාගමේ කොටස් හිමියන් සඳහා | | **8,466,020** | 13,064,845 | **3,635,639** | 7,778,571 |
| අධිකාරිය නොමැති කොටස් හිමිකම | | **621,359** | 690,330 | **-** | - |
| වර්ෂය සඳහා මුළු ශුද්ධ ලාභය | | **9,087,379** | 13,755,175 | **3,635,639** | 7,778,571 |
| වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම වෙන්කර ඇති ආකාරය : | | | | | |
| සමාගමේ කොටස් හිමියන් සඳහා | | **37,189,627** | 28,811,607 | **17,388,374** | 23,577,104 |
| පාලනය නොවන අයිතිය | | **583,642** | 662,979 | **-** | - |
| වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම | | **37,773,269** | 29,474,586 | **17,388,374** | 23,577,104 |

| | | | | | |
|---|---|---|---|---|---|
| කොටසක මූලික/තනුක කළ ඉපැයීම්(රු.) | 40 | **14.12** | 21.79 | **6.06** | 12.97 |
| කොටසක ලාභාංශය (රු.) | 41 | **2.12** | 3.79 | **2.12** | 3.79 |

වරහන් තුළ ඇති සංඛ්‍යා වලින් අඩු කිරීම් දැක්වේ.

44 සිට 131 දක්වා පිටුවල ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

**කොළඹ**
**2025 ජුනි 02**

# ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

## 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| සමූහය | ප්‍රකාශිත ප්‍රාග්ධනය | ප්‍රත්‍යාගණන සංචිතය | පොදු සංචිතය | විකිණීම සඳහා පවතින සංචිතය |
|---|---|---|---|---|
| | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' |
| 2023 ජනවාරි 01 දිනට ශේෂය | 6,000,000 | 22,972,908 | 643,442 | (246,970) |
| 2022 අංක 14 දරන අධිභාර බදු පනත යටතේ අයකළ අධිභාර බද්ද සඳහා ගැලපීම | - | - | - | - |
| 2023 ජනවාරි 01 දිනට ගලපන ලද ශේෂය | 6,000,000 | 22,972,908 | 643,442 | (246,970) |
| වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම | | | | |
| වර්ෂය සඳහා ලාභය | - | - | - | - |
| අනෙකුත් විස්තීර්ණ ආදායම, බද්දෙන් ශුද්ධ | - | 54,599 | - | 15,686,301 |
| වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම | - | 54,599 | - | 15,686,301 |
| ගොඩනැගිල්ල ප්‍රත්‍යාගණනය මත අතිරික්තය මත ක්ෂයවීම් මාරු කිරීම | - | (101,735) | - | - |
| ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කිරීම | - | (76,975) | - | - |
| ස්කන්ධය තුළ සෘජුවම වාර්තාකළ සමාගමේ අයිතිකරුවන් සමග ගණුදෙනු | | | | |
| ජීවිත රක්ෂණයෙන් කොටස් හිමියන්ට ආරෝපණය වන අතිරික්තය | - | - | - | - |
| ගෙවූ ලාභාංශ | - | - | - | - |
| ඉඩම් විකිණීම මත ප්‍රත්‍යාගණන සංචිතයේ උපලබ්ධි වීම | - | (20,793) | - | - |
| කොටස් ආපසු මිලදී ගැනීම | - | - | - | - |
| භාවිතා අයිතිය ඇති වත්කම්වල ක්ෂය මාරු කිරීම | - | - | - | - |
| මාරුකරන ලද විකිණීම සඳහා පවතින සංචිත - ජීවිත අරමුදල | - | - | - | (5,861,197) |
| 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය | 6,000,000 | 22,828,004 | 643,442 | 9,578,134 |

| | සීමා නොකරන ලද සංචිතය | නියාමන සීමා සහිත සංචිත | ජීවිත රක්ෂණයෙන් අතිරික්තය | රඳවාගත් ඉපැයුම් | මුළු වටිනාකම | පාලනය නොවන අයිතිය | මුළු ස්කන්ධය |
|---|---|---|---|---|---|---|---|
| | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' |
| | 466,179 | 98,237 | 20,708,853 | 51,754,512 | 102,397,161 | 12,897,579 | 115,294,740 |
| | - | - | - | (334,236) | (334,236) | - | (334,236) |
| | 466,179 | 98,237 | 20,708,853 | 51,420,276 | 102,062,925 | 12,897,579 | 114,960,504 |
| | | | | | | | |
| | - | - | - | 13,064,845 | 13,064,845 | 690,330 | 13,755,175 |
| | - | - | - | 5,863 | 15,746,763 | (27,352) | 15,719,411 |
| | - | - | - | 13,070,708 | 28,811,608 | 662,978 | 29,474,586 |
| | - | - | - | 101,735 | - | - | - |
| | - | - | - | - | (76,975) | - | (76,975) |
| | | | | | | | |
| | - | - | 3,444,484 | (3,444,484) | - | - | - |
| | - | - | - | (2,272,841) | (2,272,841) | (327,092) | (2,599,933) |
| | - | - | - | 20,793 | - | - | - |
| | - | - | - | (33,424) | (33,424) | - | (33,424) |
| | - | - | - | 77,407 | 77,407 | - | 77,407 |
| | - | - | - | - | (5,861,197) | - | (5,861,197) |
| | 466,179 | 98,237 | 24,153,337 | 58,940,170 | 122,707,503 | 13,233,465 | 135,940,968 |

# ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

## 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| සමූහය | ප්‍රකාශිත ප්‍රාග්ධනය<br>රු. 000' | ප්‍රත්‍යාගණන සංචිතය<br>රු. 000' | පොදු සංචිතය<br>රු. 000' | විකිණීම සඳහා පවතින සංචිතය<br>රු. 000' |
|---|---|---|---|---|
| **2024 ජනවාරි 01 දි දිනට ශේෂය** | 6,000,000 | 22,828,004 | 643,442 | 9,578,134 |
| 2022 අංක 14 දරන අධිභාර බදු පනත යටතේ අය කළ අධිභාර බද්ද සඳහා ගැලපීම | - | - | - | - |
| **2024 ජනවාරි 01 දිනට ගලපන ලද ශේෂය** | 6,000,000 | 22,828,004 | 643,442 | 9,578,134 |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | | | | |
| වර්ෂය සඳහා ලාභය | - | - | - | - |
| අනෙකුත් විස්තීර්ණ ආදායම, බද්දෙන් ශුද්ධ | - | 2,596,258 | - | 26,366,138 |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | - | 2,596,258 | - | 26,366,138 |
| ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කිරීම | - | - | - | - |
| ගොඩනැගිල්ල ප්‍රත්‍යාගණනය මත අතිරික්තය මත ක්ෂයවීම් මාරු කිරීම | - | (31,802) | - | - |
| මාරුකරන ලද විකිණීම සඳහා පවතින සංචිත - ජීවිත අරමුදල | - | - | - | (10,758,803) |
| **ස්කන්ධය තුළ සෘජුවම වාර්තාකළ සමාගමේ අයිතිකරුවන් සමග ගණුදෙනු** | | | | |
| ජංගම ගිණුමේ ශේෂය පාරිතෝෂික තක්සේරු සංචිතයට මාරු කිරීම | - | - | - | - |
| අනුබද්ධ සමාගම් වන SLICLL සහ SLICGL වෙත වත්කම් පැවරීමේදී ප්‍රත්‍යාගණන සංචිතය උපලබ්ධිවීම | - | (498,445) | - | - |
| බෝග රක්ෂණ බද්ද වියදම ගැලපීම | - | - | - | - |
| පෙර වසරේ ගැලපීම | - | - | - | - |
| අනුබද්ධිත සමාගම විකිණීම | - | - | - | - |
| ජීවිත රක්ෂණයෙන් කොටස් හිමියන්ට ආරෝපණය කළ යුතු අතිරික්තය | - | - | - | - |
| ගෙවූ ලාභාංශ | - | - | - | - |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 6,000,000 | 24,894,015 | 643,442 | 25,185,469 |

වරහන් තුළ ඇති සංඛ්‍යා වලින් අඩු කිරීම් දැක්වේ.

44 සිට 131 දක්වා පිටුවල ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

**කොළඹ**
**2025 ජුනි 02**

| | සීමා නොකරන ලද සංචිතය | නියාමන සීමා සහිත සංචිත | ජීවිත රක්ෂණයෙන් අතිරික්තය | රඳවාගත් ඉපැයුම් | මුළු වටිනාකම | පාලනය නොවන අයිතිය | මුළු ස්කන්ධය |
|---|---|---|---|---|---|---|---|
| | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' |
| | 466,179 | 98,237 | 24,153,337 | 58,940,170 | 122,707,503 | 13,233,465 | 135,940,968 |
| | - | - | - | (327,826) | (327,826) | - | (327,826) |
| | 466,179 | 98,237 | 24,153,337 | 58,612,344 | 122,379,677 | 13,233,465 | 135,613,142 |
| | | | | | | | |
| | - | - | - | 8,466,020 | 8,466,020 | 621,359 | 9,087,379 |
| | - | - | - | (238,789) | 28,723,607 | (37,717) | 28,685,890 |
| | - | - | - | 8,227,231 | 37,189,627 | 583,642 | 37,773,269 |
| | - | - | - | (459,652) | (459,652) | - | (459,652) |
| | - | - | - | 31,802 | - | - | - |
| | - | - | - | - | (10,758,803) | - | (10,758,803) |
| | | | | | | | |
| | - | - | - | 37,589 | 37,589 | - | 37,589 |
| | - | - | - | 498,445 | - | - | - |
| | - | - | - | 21,940 | 21,940 | - | 21,940 |
| | - | - | - | 199,954 | 199,954 | - | 199,954 |
| | - | - | - | - | - | (6,393,646) | (6,393,646) |
| | - | - | 2,594,805 | (2,594,805) | - | - | - |
| | - | - | - | (1,271,268) | (1,271,268) | (482) | (1,271,750) |
| | 466,179 | 98,237 | 26,748,142 | 63,303,581 | 147,339,064 | 7,422,979 | 154,762,043 |

# ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

## 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| සමාගම | ප්‍රකාශිත ප්‍රාග්ධනය | ප්‍රත්‍යාගණන සංචිතය | පොදු සංචිතය |
|---|---|---|---|
| | රු. 000' | රු. 000' | රු. 000' |
| 2023 ජනවාරි 01 දිනට ශේෂය | 6,000,000 | 8,516,289 | 643,442 |
| වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම | | | |
| වර්ෂය සඳහා ලාභය | - | - | - |
| වෙනත් විස්තීර්ණ ආදායම්, බද්දෙන් ශුද්ධ | - | 45,167 | - |
| වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම | - | **45,167** | - |
| ගොඩනැගිලි ප්‍රත්‍යාගණන අතිරික්තය මත ක්ෂයවීම් මාරුකිරීම් | - | (73,581) | - |
| ප්‍රත්‍යාගණන සංචිතයට මාරුකිරීම් | - | (76,975) | - |
| ස්කන්ධය තුළ සෘජුවම වාර්තාකළ සමාගමේ අයිතිකරුවන් සමඟ ගණුදෙනු | | | |
| ජීවිත රක්ෂණයෙන් කොටස් හිමියන්ට ආරෝපණය වන අතිරික්තය | - | - | - |
| ගෙවූ ලාභාංශ | - | - | - |
| මාරු කරන ලද විකිණීම සඳහා පවතින සංචිත - ජීවන අරමුදල | - | - | - |
| කොටස් ආපසු මිලදී ගැනීම | - | - | - |
| 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය | **6,000,000** | **8,410,899** | **643,442** |
| | | | |
| 2024 ජනවාරි 01 දිනට ශේෂය | **6,000,000** | **8,410,899** | **643,442** |
| වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම | | | |
| වර්ෂය සඳහා ලාභය | - | - | - |
| වෙනත් විස්තීර්ණ ආදායම්, බද්දෙන් ශුද්ධ | - | 2,516,533 | - |
| වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම | - | **2,516,533** | - |
| අනුබද්ධ සමාගම් වන SLICLL සහ SLICGL වෙත වත්කම් පැවරීමේදී ප්‍රත්‍යාගණන සංචිතය උපලබ්ධිවීම | - | (498,445) | - |
| ප්‍රත්‍යාගණන සංචිතයට මාරුකිරීම | - | - | - |
| මාරු කරන ලද විකිණීම සඳහා පවතින සංචිත - ජීවිත අරමුදල | - | - | - |
| ස්කන්ධය තුළ සෘජුවම වාර්තා කළ සමාගමේ අයිතිකරුවන් සමඟ ගණුදෙනු | | | |
| ජීවිත රක්ෂණයෙන් කොටස් හිමියන්ට ආරෝපණය කළ යුතු අතිරික්තය | - | - | - |
| ගෙවූ ලාභාංශ | - | - | - |
| වෙන් කිරීම හේතුවෙන් මාරු කිරීම | - | - | - |
| බෝග රක්ෂණ බද්ද වියදම ගැලපීම | - | - | - |
| 2024 දෙසැම්බර් 31 දිනට ශේෂය | **6,000,000** | **10,428,987** | **643,442** |

වරහන් තුළ ඇති සංඛ්‍යා වලින් අඩු කිරීම් දැක්වේ.

44 සිට 131 දක්වා පිටුවල ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

**කොළඹ**
**2025 ජුනි 02**

| | විකිණීම සඳහා පවතින සංචිත | සීමා නොකරන ලද සංචිත | නියාමන සීමා සහිත සංචිත | ජීවිත රක්ෂණයෙන් අතිරික්තය | රඳවාගත් ඉපයීම් | මුළු ස්කන්ධය |
|---|---|---|---|---|---|---|
| | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' |
| | (246,970) | 466,179 | 98,237 | 20,708,853 | 40,260,537 | 76,446,567 |
| | | | | | | |
| | - | - | - | - | 7,778,571 | 7,778,571 |
| | 15,686,301 | - | - | - | 67,065 | 15,798,533 |
| | **15,686,301** | **-** | **-** | **-** | **7,845,636** | **23,577,104** |
| | - | - | - | - | 73,581 | - |
| | - | - | - | - | - | (76,975) |
| | | | | | | |
| | - | - | - | 3,444,484 | (3,444,484) | - |
| | - | - | - | - | (2,272,841) | (2,272,841) |
| | (5,861,197) | | - | - | - | (5,861,197) |
| | - | - | - | - | (33,424) | (33,424) |
| | **9,578,134** | **466,179** | **98,237** | **24,153,337** | **42,429,005** | **91,779,233** |
| | | | | | | |
| | **9,578,134** | **466,179** | **98,237** | **24,153,337** | **42,429,005** | **91,779,233** |
| | | | | | | |
| | - | - | - | - | 3,635,639 | 3,635,639 |
| | 11,146,307 | - | - | - | 89,895 | 13,752,735 |
| | **11,146,307** | **-** | **-** | **-** | **3,725,534** | **17,388,374** |
| | - | - | - | - | 498,445 | - |
| | - | - | - | - | (459,652) | (459,652) |
| | 313,291 | - | - | - | - | 313,291 |
| | | | | | | |
| | - | - | - | (47,044) | 47,044 | - |
| | - | - | - | - | (1,271,268) | (1,271,268) |
| | - | - | (98,237) | - | - | (98,237) |
| | - | - | - | - | 21,940 | 21,940 |
| | **21,037,732** | **466,179** | **-** | **24,106,293** | **44,991,048** | **107,673,681** |

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | සමූහය 2024 රු. 000' | සමූහය 2023 රු. 000' | සමාගම 2024 රු. 000' | සමාගම 2023 රු. 000' |
|---|---|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය** | | | | | |
| පාරිභෝගිකයින් වෙතින් ලද වාරික | | **51,621,821** | 43,640,446 | **4,735,089** | 44,544,606 |
| ගෙවන ලද ප්‍රතිරක්ෂණ වාරික | | **(6,734,235)** | (7,035,449) | **(204,214)** | (7,035,449) |
| රක්ෂණ හිමිකම් සහ ප්‍රතිලාභ ගෙවීම් | | **(24,676,386)** | (24,142,984) | **(1,946,707)** | (24,142,984) |
| හිමිකම් සහ ප්‍රතිලාභ සම්බන්ධයෙන් ප්‍රතිරක්ෂණ ලැබීම් | | **1,701,529** | 2,605,366 | **117,754** | 2,605,366 |
| ණය ගැතියන් වෙතින් ලද මුදල් | | **106,830,718** | 91,895,232 | **269,521** | 1,303,913 |
| සිලින්ඩර තැන්පතු මත ලද/(ගෙවූ) මුදල් | | **62,891** | 72,257 | - | - |
| සේවකයින් වෙත සහ ඔවුන් වෙනුවෙන් ගෙවන ලද මුදල් | | **(12,307,379)** | (9,349,755) | - | (7,135,343) |
| සැපයුම්කරුවන් වෙත ගෙවන ලද අත්තිකාරම් | | **(672,903)** | - | - | - |
| ලද පොළිය | | **19,284,208** | 23,967,659 | **4,151,638** | 21,983,657 |
| ලද ලාභාංශ | | **1,093,356** | 479,503 | **1,683,574** | 2,055,272 |
| වෙනත් මෙහෙයුම් මුදල් ගෙවීම් | | **(98,338,358)** | (80,751,888) | **(3,084,201)** | (7,746,781) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ** | අ | **37,865,262** | 41,380,387 | **5,722,454** | 26,432,257 |
| ගෙවන ලද විශ්‍රාමික පාරිතෝෂික | 26 | **(226,243)** | (201,139) | **(9,239)** | (110,165) |
| ගෙවන ලද පොලී වියදම | | **(431,172)** | 475,192 | - | - |
| ගෙවන ලද ආදායම් බදු | 25 | **(5,008,699)** | (3,465,110) | **(1,740,793)** | (2,341,357) |
| ගෙවන ලද අධිභාර බදු | | **(327,826)** | (334,236) | - | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **31,871,322** | 37,855,094 | **3,972,422** | 23,980,735 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වෙතින් මුදල් ප්‍රවාහය** | | | | | |
| මූල්‍ය ආයෝජන අත්පත්කරගැනීම් | 5.5 | **(72,122,983)** | (79,469,152) | **(22,854,600)** | (77,243,702) |
| මූල්‍ය ආයෝජන වෙතින් ලැබීම් | | **54,158,035** | 59,269,353 | **17,967,589** | 59,269,353 |
| වෙනත් මූල්‍ය වත්කම් අත්පත් කරගැනීම/වෙතින් ආපසුගැනීම් | | **(433,884)** | - | - | - |
| අනුබද්ධිත සමාගම් අත්පත්කරගැනීම, ශුද්ධ මුදල් | 6.2.1 | - | 66,400 | - | - |
| අනුබද්ධිත සමාගම් විකිණීම හේතුවෙන් ශුද්ධ මුදල් පිටතට ගලායාම | 6.2.2 | **(141,582)** | - | - | - |
| දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලැබෙන ආදායම | | **60,052** | 110,655 | | 38,336 |
| දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම | 8 | **(1,712,476)** | (1,180,642) | **(40,073)** | (371,582) |
| අස්පෘශ්‍ය වත්කම් අත්පත් කරගැනීම | 11.2 | **(80,638)** | (153,759) | **(2,126)** | (101,062) |
| ආයෝජන දේපල අත්පත් කරගැනීම | 10 | **(15,458)** | (4,975) | - | - |
| කාරක ප්‍රාග්ධන කටයුතු සඳහා දරන ලද වියදම් | 8.1.3 | **(1,097,988)** | (142,898) | - | - |
| දෙන ලද සේවක ණය | | **(57,841)** | (1,554,365) | - | (1,471,393) |
| සේවක ණය අය කිරීම | | **1,231,073** | 834,978 | - | 716,657 |
| රක්ෂණ ඔප්පු හිමියන්ට ලබා දුන් ණය | 12 | **(3,871,307)** | (1,876,443) | **(1,893,260)** | (1,876,443) |
| රක්ෂණ ඔප්පු හිමියන් විසින් පියවන ලද ණය | 12 | **4,505,739** | 1,893,380 | **2,259,932** | 1,893,380 |
| ලද ලාභාංශ | | **211,213** | - | - | - |
| ලද පොලී | | **4,205,277** | - | - | - |
| **ආයෝජන කටයුතු සඳහා භාවිතා කරනලද ශුද්ධ මුදල්** | | **(15,162,768)** | (22,207,468) | **(4,562,538)** | (19,146,456) |
| **මූල්‍ය කටයුතු වලින් ලැබෙන මුදල් ප්‍රවාහ** | | | | | |
| කොටස් ආපසු මිලදී ගැනීම | | - | (33,424) | - | (33,424) |
| ගෙවන ලද ලාභාංශ | 22.2 | **(1,271,268)** | (2,272,841) | **(1,271,268)** | (2,272,841) |
| පාලනය නොවන අයිතිය වෙත ගෙවූ ලාභාංශය | | **(482)** | (327,093) | - | - |
| ගෙවන ලද කල්බදු වාරිකය | 9.2 | **(529,036)** | (498,120) | **(259,568)** | (249,621) |
| සමුච්චිත නොවූ නැවත ලබාගත හැකි වරණීය කොටස් මුදාහැරීමෙන් ලද මුදල | | **37,527** | 176,000 | - | - |

| | | | | |
|---|---|---|---|---|
| වෙන් කිරීම හේතුවෙන් SLICLL සහ SLICGL වෙත මාරු කරන ලද මුදල් | **-** | - | **(2,783,973)** | - |
| භාවිතයේ අයිතිය ඇති වත්කම් අත්පත් කර ගැනීම | **-** | (8,920) | **-** | (8,920) |
| ණය ආපසු ගෙවීම් | **-** | (1,001,712) | **-** | - |
| බෝග රක්ෂණ බද්ද ගැලපීම | **21,940** | - | **21,940** | - |
| මූල්‍ය කටයුතු සඳහා භාවිතා කරන ශුද්ධ මුදල් | **(1,741,319)** | (3,966,110) | **(4,292,869)** | (2,564,806) |
| මුදල් සහ මුදල් සමාන දේ මත විනිමය අනුපාත වෙනස්වීම්වල බලපෑම | **(545,727)** | (2,594,770) | **(240)** | (2,587,778) |
| මුදල් සහ මුදල් සමාන දේවල ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | **14,421,508** | 9,086,744 | **(4,883,225)** | (318,305) |
| වසර ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ | **17,786,115** | 8,697,630 | **5,439,138** | 5,757,443 |
| වසර අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ (සටහන A) | **32,207,623** | 17,784,374 | **555,913** | 5,439,138 |

## සටහන A - මුදල් සහ මුදල් සමාන දේ පිළිබඳ විශ්ලේෂණය

| | | | | |
|---|---|---|---|---|
| බැංකුවේ සහ අතේ ඇති මුදල් | **6,946,446** | 5,908,869 | **9,239** | 1,320,851 |
| කෙටිකාලීන ආයෝජන | **26,184,266** | 12,611,270 | **546,674** | 4,564,320 |
| *බැංකු අයිරාව | **(923,089)** | (735,765) | **-** | (446,033) |
| | **32,207,623** | 17,784,374 | **555,913** | 5,439,138 |

වරහන් තුළ ඇති සංඛ්‍යාවලින් අඩු කිරීම් දැක්වේ.

**මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබෙන මුදල් ප්‍රවාහය සමඟ මෙහෙයුම් ලාභය සංසන්දනය කිරීම**

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සමාගම<br>2024<br>රු. 000' | <br>2023<br>රු. 000' |
|---|---|---|
| මෙහෙයුම් වලින් ලාභය | **3,546,102** | 5,392,465 |
| දිගුකාලීන රක්ෂණ අරමුදලේ වැඩිවීම | **(1,834,641)** | 23,595,911 |
| බෝග රක්ෂණ බද්ද ගැලපීම | **21,940** | - |
| ක්ෂයවීම් ගාස්තුව | **94,698** | 491,992 |
| ඔප්පු මත ලබාදුන් ණයෙන් ලද පොලී ආදායම | **(383,541)** | - |
| භාවිතා අයිතිය සහිත වත්කම්වල පිරිවැය | **35,406** | 258,156 |
| භාවිතා අයිතිය වගකීම - කල්බදු පොලී | **92,633** | - |
| දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලැබුණු ලාභය | **-** | (12,588) |
| ආයෝජන ආදායම - උපලබ්ධි නොවූ ලැබීම්/පාඩු | **(340,015)** | (445,070) |
| පාරිතෝෂික ප්‍රතිපාදන | **24,155** | 325,068 |
| විදේශ විනිමය ගණුදෙණු මත ලැබීම් /(පාඩු) | **240** | 2,587,778 |
| අනුබද්ධ සමාගමට කළ ආයෝජනය විකිණීම | **10,399,358** | - |
| කැන්විල් හෝල්ඩින් සමාගමමේ හානිකරණය යථාවත් කිරීම | **(100,642)** | - |
| සාධාරණ අගයෙන් ලැබුණු ලාභය ලාභ හා අලාභ ප්‍රකාශයට සටහන් කිරීම | **(89,492)** | (204,348) |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මත හානිකරණය | **-** | (2,676,150) |
| ණයගැති වැඩිවීම / (අඩුවීම) | **2,191,312** | (1,881,765) |
| නොඉපයූ රක්ෂණ වාරිකවල වැඩිවීම/(අඩුවීම) | **-** | 987,698 |
| හිමිකම් ප්‍රතිපාදනවල වැඩිවීම / (අඩුවීම) | **(2,914,569)** | (2,317,110) |
| ණයහිමි වැඩිවීම/(අඩුවීම) | **(5,020,490)** | 319,126 |
| ඔප්පුහිමි අත්තිකාරම් ගෙවීම්වල වැඩිවීම/(අඩුවීම) | **-** | 11,096 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් | **5,722,454** | 26,432,259 |

44 සිට 131 දක්වා පිටුවල ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

**කොළඹ**
**2025 ජූනි 02**

# බණ්ඩමය සමාලොචනය: මූල්‍ය තත්ව ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනට | 2024 | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | මව් සමාගම රු. 000' | ජීවිත නොවන රක්ෂණය රු. 000' | ජීවිත රක්ෂණය රු. 000' | සෞඛ්‍ය සේවා රු. 000' | බලශක්ති රු. 000' | වෙනත් රු. 000' | ඉවත්කිරීම් රු. 000' | එකතුව රු. 000' |
| **වත්කම්** | | | | | | | | |
| මූල්‍ය ආයෝජන | 45,242,308 | 36,982,166 | 219,921,456 | 7,868,036 | - | - | 6,383,081 | 316,397,047 |
| අනුබද්ධිත සමාගම්වල ආයෝජන | 39,924,534 | - | | - | 5,000,000 | 20,500,000 | (65,424,534) | - |
| ආශ්‍රිත සමාගම්වල ආයෝජන | 198,673 | - | | - | - | - | - | 198,673 |
| දේපල, පිරියත සහ උපකරණ | 215,202 | 611,198 | 439,971 | 6,582,765 | 19,098,801 | 36,931,063 | (21,962,160) | 41,916,840 |
| භාවිත අයිතිය සහිත වත්කම් | - | - | | 550,771 | 186,237 | 54,000 | 465,629 | 1,256,637 |
| කල්බදු දේපළ | - | - | - | - | - | - | - | - |
| ආයෝජන වත්කම් | 17,965,274 | - | | - | - | 1,308,000 | (15,513,462) | 3,759,812 |
| අස්පෘශ්‍ය වත්කම් | - | 61,879 | 76,858 | 124,045 | - | 1,188 | 2,992,805 | 3,256,775 |
| ඔප්පුහිමියන් වෙත ණය | - | - | 2,288,853 | - | - | - | - | 2,288,853 |
| ලැබියයුතු ප්‍රතිරක්ෂණ | - | 1,972,225 | 1,288,471 | - | - | - | - | 3,260,696 |
| ලැබිය යුතු වාරික | - | 5,144,352 | 789,230 | - | - | - | - | 5,933,582 |
| විලම්භිත බදු වත්කම් | - | 254,677 | - | - | - | 190 | (190) | 254,677 |
| වෙනත් වත්කම් | 10,975,040 | 1,583,253 | 1,875,074 | 2,290,497 | 10,324,805 | 1,761,922 | (6,196,668) | 22,613,923 |
| විලම්භිත වියදම් | - | 732,566 | - | - | - | - | - | 732,566 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 555,913 | 3,791,489 | 11,945,357 | 1,095,204 | 15,071,428 | 812,903 | (141,582) | 33,130,712 |
| **මුළු වත්කම්** | 115,076,944 | 51,133,805 | 238,625,270 | 18,511,318 | 49,681,271 | 61,369,266 | (99,397,081) | 435,000,793 |
| **වගකීම් සහ ස්කන්ධය** | | | | | | | | |
| **වගකීම්** | | | | | | | | |
| රක්ෂණ ගිවිසුම් වගකීම් - ජීවිත | - | - | 216,783,321 | - | - | - | - | 216,783,321 |
| රක්ෂණ ගිවිසුම් වගකීම් - ජීවිත නොවන | - | 20,441,265 | - | - | - | - | - | 20,441,265 |
| භාවිත අයිතිය සහිත වගකීම් | 547,991 | - | - | 314,290 | 159,120 | 190 | - | 1,021,591 |
| ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ | - | 1,751,702 | 1,488,094 | - | - | - | - | 3,239,796 |
| වර්තන බදු වගකීම් | 907,421 | 404,367 | 559,691 | 299,862 | 368,159 | 84 | (84) | 2,539,500 |
| විලම්භිත බදු වගකීම් | 4,450,847 | - | - | 1,177,736 | 3,549,283 | 379,497 | - | 9,557,363 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් | - | 1,391,859 | 898,427 | 490,125 | 234,917 | 13,535 | (4,982) | 3,023,881 |
| වෙනත් වගකීම් | 1,497,004 | 4,898,031 | 3,368,754 | 1,650,890 | 13,570,376 | 7,007,361 | (9,283,472) | 22,708,944 |
| මූල්‍ය වගකීම් | - | 268,146 | 254,925 | 400,018 | 2,160,000 | 5,119,434 | (7,279,434) | 923,089 |
| **මුළු වගකීම්** | 7,403,263 | 29,155,370 | 223,353,212 | 4,332,921 | 20,041,855 | 12,520,101 | (16,567,972) | 280,238,750 |
| **ස්කන්ධය** | | | | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 6,000,000 | 14,000,000 | 12,500,000 | 2,671,543 | 1,947,109 | 41,870,087 | (72,988,739) | 6,000,000 |
| එකවරක් ලැබෙන අතිරික්තයන් වෙතින් නියාමක සීමා කරන ලද සංචිත | | 1,000,000 | 98,237 | - | - | - | (1,000,000) | 98,237 |
| ප්‍රත්‍යාගණන සංචිතය | 10,428,987 | 185,236 | 223,243 | 1,549,583 | 5,075,104 | 12,239,164 | (4,807,302) | 24,894,015 |
| විකුණුම් සඳහා පවතින සංචිත | 21,037,732 | 4,182,152 | (34,415) | - | - | - | - | 25,185,469 |
| ආදායම් සංචිත | 70,206,962 | 2,611,047 | 2,484,993 | 9,957,271 | 22,617,203 | (5,260,086) | (11,456,047) | 91,161,343 |
| පාලනය නොවන අයිතිය | | - | - | - | - | - | 7,422,979 | 7,422,979 |
| **මුළු ස්කන්ධය** | 107,673,681 | 21,978,435 | 15,272,058 | 14,178,397 | 29,639,416 | 48,849,165 | (82,829,109) | 154,762,043 |
| **මුළු වගකීම් සහ ස්කන්ධය** | 115,076,944 | 51,133,805 | 238,625,270 | 18,511,318 | 49,681,271 | 61,369,266 | (99,397,081) | 435,000,793 |

| | 2023 | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | ජීවිත නොවන රක්ෂණය<br>රු. 000' | ජීවිත රක්ෂණය<br>රු. 000' | සෞඛ්‍ය සේවා<br>රු. 000' | බලශක්ති<br>රු. 000' | වෙනත්<br>රු. 000' | ඉවත්කිරීම්<br>රු. 000' | එකතුව<br>රු. 000' |
| | | | | | | | |
| | 45,549,965 | 205,559,021 | 6,976,010 | - | - | - | 258,084,996 |
| | 20,134,852 | 3,796,543 | - | 5,000,000 | 20,500,000 | (49,431,395) | - |
| | 198,673 | - | - | - | - | - | 198,673 |
| | 12,551,299 | 92,962 | 5,384,711 | 19,164,199 | 37,615,267 | - | 74,808,439 |
| | 24,493 | 476,543 | 550,363 | 62,392 | 36,002 | | 1,149,793 |
| | - | - | - | - | - | - | - |
| | 2,362,320 | - | - | - | 959,000 | - | 3,321,320 |
| | 116,026 | - | 79,061 | - | 1,065 | 2,992,805 | 3,188,957 |
| | - | 2,095,884 | - | - | - | - | 2,095,884 |
| | 1,813,217 | 55,520 | - | - | - | - | 1,868,737 |
| | 5,578,337 | 712,597 | - | - | - | - | 6,290,934 |
| | - | - | - | - | 403 | - | 403 |
| | 615,961 | 5,074,790 | 2,329,069 | 14,153,468 | 2,010,658 | (4,962,523) | 19,221,424 |
| | 620,872 | - | - | - | - | - | 620,872 |
| | 3,820,828 | 3,143,743 | 999,579 | 9,885,051 | 670,938 | - | 18,520,139 |
| | **93,386,843** | **221,007,603** | **16,318,793** | **48,265,110** | **61,793,333** | **(51,401,113)** | **389,370,571** |
| | | | | | | | |
| | - | 183,784,492 | - | - | - | - | 183,784,492 |
| | 20,496,192 | - | - | - | - | - | 20,496,192 |
| | 18,739 | 548,486 | 249,095 | 31,050 | 191 | | 847,561 |
| | 1,183,597 | - | - | - | - | - | 1,183,597 |
| | 543,315 | 1,576,133 | 483,706 | 406,905 | - | - | 3,010,059 |
| | 3,923,072 | - | 1,134,821 | 2,647,203 | 237,428 | - | 7,942,524 |
| | 1,070,190 | 668,199 | 369,817 | 176,170 | 189,267 | - | 2,473,643 |
| | 4,162,319 | 3,011,186 | 1,192,662 | 14,518,073 | 7,044,959 | (2,082,510) | 27,846,688 |
| | 264,461 | 181,573 | 289,731 | 2,880,000 | 5,109,082 | (2,880,000) | 5,844,847 |
| | **31,661,885** | **189,770,069** | **3,719,832** | **20,659,401** | **12,580,927** | **(4,962,510)** | **253,429,603** |
| | | | | | | | |
| | 6,500,000 | 500,000 | 2,671,543 | 1,947,109 | 41,870,087 | (47,488,739) | 6,000,000 |
| | - | 98,237 | - | - | - | - | 98,237 |
| | 8,339,227 | 71,672 | 1,306,247 | 5,078,752 | 12,875,568 | (4,843,463) | 22,828,004 |
| | 4,082,926 | 5,495,208 | - | - | - | - | 9,578,134 |
| | 42,802,805 | 25,072,417 | 8,621,171 | 20,579,848 | (5,533,249) | (7,339,866) | 84,203,128 |
| | - | - | - | - | - | 13,233,465 | 13,233,465 |
| | **61,724,958** | **31,237,534** | **12,598,961** | **27,605,709** | **49,212,406** | **(46,438,603)** | **135,940,968** |
| | **93,386,843** | **221,007,603** | **16,318,793** | **48,265,110** | **61,793,333** | **(51,401,113)** | **389,370,571** |

# බණ්ඩමය සමාලෝචනය: ආදායම් ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනට | 2024 | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | මව් සමාගම රු. 000' | ජීවිත නොවන රක්ෂණය රු. 000' | ජීවිත රක්ෂණය රු. 000' | සෞඛ්‍ය සේවා රු. 000' | බලශක්ති රු. 000' | වෙනත් රු. 000' | ඉවත්කිරීම් රු. 000' | එකතුව රු. 000' |
| දළ ලිඛිත වාරිකය | - | **25,332,582** | **26,358,581** | - | - | - | **(426,693)** | **51,264,470** |
| නොඉපවූ දළ වාරික පිළිබඳ සංචිතවල වෙනස්වීම | - | 557,953 | - | - | - | - | - | **557,953** |
| **දළ ඉපයූ වාරික** | - | **25,890,535** | **26,358,581** | - | - | - | **(426,693)** | **51,822,423** |
| ප්‍රතිරක්ෂකයින් වෙත පැවරූ වාරික | - | (7,252,681) | (1,027,747) | - | - | - | - | (8,280,428) |
| දළ නොඉපවූ ප්‍රතිරක්ෂණ වාරික පිළිබඳ සංචිතවල වෙනස්වීම | - | (567,272) | - | - | - | - | - | (567,272) |
| **ශුද්ධ ඉපයූ වාරික** | - | **18,070,582** | **25,330,834** | - | - | - | **(426,693)** | **42,974,723** |
| වෙනත් මෙහෙයුම් වෙතින් ලැබූ ආදායම | - | - | - | 13,650,106 | 90,774,076 | 209,485 | (233,836) | 104,399,831 |
| | - | **18,070,582** | **25,330,834** | **13,650,106** | **90,774,076** | **209,485** | **(660,529)** | **147,374,554** |
| **ප්‍රතිලාභ සහ අලාභ** | | | | | | | | |
| ශුද්ධ ප්‍රතිලාභ සහ හිමිකම් | - | (10,509,915) | (12,994,471) | - | - | - | 6,027 | (23,498,359) |
| ප්‍රතිරක්ෂණය සහ ශුද්ධ අත්පත් කර ගැනීම් පිරිවැය | - | (293,003) | (3,528,572) | - | - | - | - | (3,821,575) |
| ගිවිසුම්ගත වගකීම්වල වෙනස්වීම - ජීවිත අරමුදල | - | - | (26,409,382) | - | - | - | - | (26,409,382) |
| අනුබද්ධ සමාගම් සේවා වියදම | - | - | - | (7,699,588) | (82,646,523) | (82,506) | - | (90,428,617) |
| **මුළු ප්‍රතිලාභ සහ අලාභ** | - | **(10,802,918)** | **(42,932,425)** | **(7,699,588)** | **(82,646,523)** | **(82,506)** | **6,027** | **(144,157,933)** |
| **වෙනත් ආදායම්** | | | | | | | | |
| ආයොජන ආදයම | 3,282,348 | 5,322,486 | 27,466,406 | 678,048 | 826,783 | 63,739 | (1,274,590) | 36,365,220 |
| ගාස්තු සහ කොමිස් ආදායම | - | - | 75,965 | - | - | - | - | 75,965 |
| ශුද්ධ උපයාගත්/උපයානොගත් ලාභ | (240) | (521,789) | (158,094) | (433,884) | 506,279 | 581,674 | - | (26,054) |
| වෙනත් ආදායම්/(වියදම්) | 1,334,337 | 116,467 | 523,185 | 50,969 | 139,920 | 500,139 | (4,368,545) | (1,703,528) |
| | **4,616,445** | **4,917,164** | **27,907,462** | **295,133** | **1,472,982** | **1,145,552** | **(5,643,135)** | **34,711,603** |
| **වියදම්** | | | | | | | | |
| වෙනත් මෙහෙයුම්, ආයෝජන සම්බන්ධ සහ පරිපාලන වියදම් | (1,518,620) | (8,144,470) | (5,948,025) | (4,350,329) | (4,202,180) | (895,895) | 1,183,573 | (23,875,946) |
| **බදු පෙර ලාභය** | **3,097,825** | **4,040,358** | **4,357,846** | **1,895,322** | **5,398,355** | **376,636** | **(5,114,064)** | **14,052,278** |
| ආදායම් බදු වියදම | (40,557) | (753,602) | (1,763,044) | (555,890) | (1,710,240) | (141,566) | - | (4,964,899) |
| **බදුපසු ලාභය/කොටස්හිමියන්ගේ අරමුදල වෙත මාරුකරන ලදී.** | **3,057,268** | **3,286,756** | **2,594,802** | **1,339,432** | **3,688,115** | **235,070** | **(5,114,064)** | **9,087,379** |

| 2023 | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | ජීවිත නොවන රක්ෂණය රු. 000' | ජීවිත රක්ෂණය රු. 000' | සෞඛ්‍ය සේවා රු. 000' | බලශක්ති රු. 000' | වෙනත් රු. 000' | ඉවත්කිරීම් රු. 000' | එකතුව රු. 000' |
| | **23,145,056** | **21,079,689** | **-** | **-** | **-** | **(904,160)** | **43,320,585** |
| | (466,762) | - | - | - | - | - | **(466,762)** |
| | **22,678,294** | **21,079,689** | **-** | **-** | **-** | **(904,160)** | **42,853,823** |
| | (5,700,815) | (673,867) | - | - | - | - | (6,374,682) |
| | (520,935) | - | - | - | - | - | (520,935) |
| | **16,456,544** | **20,405,822** | **-** | **-** | **-** | **(904,160)** | **35,958,206** |
| | - | - | 12,418,608 | 92,936,009 | 119,013 | (2,258,296) | 103,215,334 |
| | **16,456,544** | **20,405,822** | **12,418,608** | **92,936,009** | **119,013** | **(3,162,456)** | **139,173,540** |
| | | | | | | | - |
| | (10,017,691) | (11,760,383) | - | - | - | - | (21,778,074) |
| | (755,440) | (2,746,218) | - | - | - | - | (3,501,659) |
| | - | (18,289,725) | - | - | - | - | (18,289,725) |
| | - | - | (7,209,581) | (81,612,069) | (35,309) | 2,050,302 | (86,806,657) |
| | **(10,773,131)** | **(32,796,326)** | **(7,209,581)** | **(81,612,069)** | **(35,309)** | **2,050,302** | **(130,376,114)** |
| | | | | | | | |
| | 5,796,446 | 22,666,949 | 1,257,662 | 1,258,324 | 86,527 | (1,575,769) | 29,490,139 |
| | - | 57,571 | - | - | - | - | 57,571 |
| | (1,907,846) | (679,932) | (518,044) | 1,471,534 | 805,071 | - | (829,217) |
| | 774,207 | 876,493 | 76,934 | 276,702 | 1,059,614 | (171,151) | 2,892,799 |
| | **4,662,807** | **22,921,081** | **816,552** | **3,006,560** | **1,951,212** | **(1,746,920)** | **31,611,292** |
| | | | | | | | |
| | (4,934,071) | (5,219,817) | (4,115,591) | (5,597,945) | (1,649,544) | 1,066,765 | (20,450,203) |
| | **5,412,149** | **5,310,760** | **1,909,988** | **8,732,555** | **385,372** | **(1,792,309)** | **19,958,515** |
| | (1,068,416) | (1,861,703) | (564,759) | (2,583,997) | (124,465) | - | (6,203,340) |
| | **4,343,733** | **3,449,057** | **1,345,229** | **6,148,558** | **260,907** | **(1,792,309)** | **13,755,175** |

# මූල්‍ය ප්‍රකාශ වලට සටහන්

## 1. වාර්තාකරණ ආයතනය

### 1.1 ආයතනික තොරතුරු

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් ("සමාගම/SLIC") ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කරන ලද සහ පවත්වාගෙන යන සීමිත වගකීම් සහිත රාජ්‍ය සමාගමකි. සමූහයේ/සමාගමේ ලියාපදිංචි කාර්යාලය කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටා ඇති අතර ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය 'රක්ෂණ මන්දිරය', අංක 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02 හි පිහිටා ඇත.

2024 දෙසැම්බර් 31 දිනට සහ එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ සමාගම සහ එහි පරිපාලිත සමාගම්වල (සාමූහිකව "සමූහය" සහ තනි තනිව "සමූහ ආයතන" ලෙස සඳහන්) සහ සමූහයේ ආශ්‍රිත සමාගම්වලින් සමන්විත වේ. සමූහය තුළ සියලුම සමාගම්වල මූල්‍ය ප්‍රකාශන 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන පොදු මූල්‍ය වර්ෂයක් සඳහා සකස් කර ඇත.

මව් සමාගමේ සාමාන්‍ය කොටස් 599,568,144 ක් (99.97%) භාණ්ඩාගාර ලේඛකවරයා සතු වේ. ඉතිරිය සමාගමේ සේවකයින් සහ කලින් සේවය කල සේවකයින් සතු වේ.

නීත්‍යානුකූල වෙන්කිරීමත් සමග ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් සඳහා රක්ෂණ ව්‍යාපාර කරගෙන යාම සඳහා වූ බලපත්‍රය 2024 පෙබරවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි අවසන් කරන ලදී. තවද, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙන් ජීවිත රක්ෂණ ව්‍යාපාරය කිරීම සඳහා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් වෙතත්, ජීවිත නොවන රක්ෂණ ව්‍යාපාරය කිරීම සඳහා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් වෙතත් 2024 පෙබරවාරි 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි රක්ෂණ බලපත්‍ර ලබා දෙන ලදී.

IRCSL විසින් තීරණය කරන ලද පරිදි, ගරු නීතිපති තුමාගේ නීතිමය මතය/උපදෙස් ලබාගැනීමට යටත්ව SC SPL LA 173/24 අංක සහිත නඩුව අවසන් වන තෙක් 'ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් ' නම භාවිතා කිරීම සඳහා SLIC ට අවස්ථාව ලබා දී ඇත.

### 1.2 ප්‍රධාන කටයුතු සහ මෙහෙයුම්වල ස්වභාවය

#### 1.2.1 සමූහය/සමාගම

සියලුම ජීවිත නොවන රක්ෂණ, ජීවිත රක්ෂණ කටයුතු, සෞඛ්‍ය සේවාවන්, ආගන්තුක සත්කාර සේවා සහ ද්‍රව පෙට්‍රෝලියම් වායු (LPG) ආනයනය, සැකසීම, ගබඩා කිරීම, බෙදා හැරීම සහ විකිණීම වර්ෂය තුල සමූහයේ ප්‍රධාන කටයුතු විය.

**පරිපාලිත සමාගම්**

| පරිපාලිත සමාගම්වල නාමය | ප්‍රධාන කාර්යයන් |
|---|---|
| ලංකා හොස්පිටල් කෝපරේෂන් (පුද්) සමාගම | සෞඛ්‍යාරක්ෂාව සහ රසායනාගාර සේවාවන් සැපයීම |
| ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම | ද්‍රව පෙට්‍රෝලියම් වායු (LPG) ආනයනය, සැකසීම, ගබඩා කිරීම, බෙදා හැරීම සහ විකිණීම සහ අනෙකුත් ආනුෂාංගික සේවාවන් සැපයීම |
| සීමාසහිත ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්) සමාගම | ද්‍රව පෙට්‍රෝලියම් වායු (LPG) සඳහා තොග ගබඩා පහසුකම් සැපයීම |
| සීමාසහිත කැනෝවින් හෝටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්) සමාගම | වාණිජ කටයුතු සඳහා කාර්යාල ඉඩ කුලියට දීම සහ ආගන්තුක සත්කාර ව්‍යාපාරයේ නිරතවීම |
| සීමාසහිත කැන්විල් හෝල්ඩිංස් (පුද්) සමාගම | විනෝදාස්වාදන අංශය සම්බන්ධ ආයෝජන ප්‍රවර්ධනය, මව් සමාගමක් ලෙස පරිපාලිත සමාගම් පාලනය සහ අධීක්ෂණය (කැන්විල් හෝල්ඩිංස් (පුද්) සමාගමේ ආයෝජනය 2024 ජූලි 8 වන දින භාණ්ඩාගාර ලේඛකම්වරයාට පවරන ලදි.) |
| මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (පුද්) සමාගම (අක්‍රිය සමාගම) | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් වෙත වේතන කළමනාකරණ සේවාවන් සැපයීම (2024 ජනවාරි සඳහා පමණක්) |
| ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් | 2024 පෙබරවාරි 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කරගෙන යාම |
| ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් | 2024 පෙබරවාරි 1 වන දින සිට කාර්යක්ෂම වන ලෙස දිගුකාලීන ජීවිත රක්ෂණ ව්‍යාපාර කරගෙන යාම |

## 2. සකස් කිරීමේ පදනම

### 2.1 අනුකූලතා ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKASs/SLFRSs), 2007 අංක 07 සමාගම් පනත සහ 2000 අංක 43 රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත සමඟ අනුකූලව සකස් කර ඇත.

මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2025 ජූනි 2 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී.

### 2.2 මැනීමේ පදනම

විකල්ප පදනමක් මත මනිනු ලබන පහත සඳහන් ප්‍රධාන අයිතම් හැර, සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත.

- ඉඩම් සහ ගොඩනැගිලි සාධාරණ අගය මත මනිනු ලබයි
- විකිණීම සඳහා පවත්වාගන්නා ලද මූල්‍ය වත්කම් සාධාරණ අගය මත මනිනු ලබයි.
- ලාභ අලාභ හරහා සාධාරණ අගය සඳහා නියම කරන ලද මූල්‍ය වත්කම් සාධාරණ අගය මත මනිනු ලබයි.
- විකිණීම සඳහා ලබා ගත හැකි මූල්‍ය වත්කම් සාධාරණ අගය මත මනිනු ලබයි.
- රක්ෂණ ඔප්පු හිමියන්ගේ වගකීම් ආයුගණක වශයෙන් තීරණය කරන ලද අගයන්ට අනුව මනිනු ලැබ ඇත.
- නිශ්චිත ප්‍රතිලාභ බැඳීම සඳහා වන වගකීම් ආයුගණකව ගණනය කරනු ලබන අතර නිශචිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන වටිනාකම ලෙස පිළිගනු ලැබේ.

සමූහය/සමාගම විසින් එහි මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ද්‍රවශීලතාවයේ අනුපිළිවෙළ අනුව පුළුල් ලෙස ඉදිරිපත් කරයි.

### 2.3 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල

මූල්‍ය ප්‍රකාශන සමූහයේ ක්‍රියාකාරී මුදල වන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත. සියලුම අගයන් වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම් ආසන්නතම දහසට වටයා ඇත.

### 2.4 ඇස්තමේන්තු සහ විනිශ්චයන් භාවිතය

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී, කළමනාකරණය විසින් සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තා කරන ලද වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් ප්‍රමාණයන් යොදාගැනීමට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කර ඇත. සත්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තුවලට වඩා වෙනස් විය හැක.

ඇස්තමේන්තු සහ පාදක උපකල්පන අඛණ්ඩව සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා කරන ලද ප්‍රතිශෝධනයන් අනාගතයේදී හඳුනා ගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශවල හඳුනාගෙන ඇති වටිනාකම් වලට සැලකිය යුතු බලපෑමක් ඇති කරන උපකල්පන සහ ඇස්තමේන්තු අවිනිශ්චිතතාවය පිළිබඳ තොරතුරු පහත සටහන් යටතේ ඇතුළත් කර ඇත.

- සටහන 26 - නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල මැනීම: ප්‍රධාන ආයුගණක උපකල්පන
- සටහන 5,8,13,14 සහ 16 - මූල්‍ය නොවන වත්කම් සහ මූල්‍ය වත්කම් හානිකරණය සඳහා ප්‍රතිපාදන: ප්‍රධාන උපකල්පන
- සටහන 23 - දිගු කාලීන රක්ෂණයේ ආයුගණක තක්සේරුව; ප්‍රධාන ආයුගණක උපකල්පන
- සටහන 24 - IBNR / IBNER සහ UPR ඇතුළුව ජීවිත නොවන රක්ෂණ ප්‍රතිපාදන මැනීම
- සටහන 17 - විලම්බිත අත්පත් කර ගැනීමේ පිරිවැය (DAC) මැනීම
- සටහන 05 - ලැයිස්තුගත නොකල උපකරණවල සාධාරණ අගය මැනීම සහ ලාභ අලාභ මූල්‍ය ආයෝජන හරහා සාධාරණ අගය මැනීම
- සටහන 10 - ආයෝජන දේපලවල සාධාරණ අගය ගණනය

**සාධාරණ අගයන් මැනීම**

සමූහය/සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනාවරණ ගණනාවක් සඳහා මූල්‍ය සහ මූල්‍ය නොවන වත්කම් සහ වගකීම් ද්විත්යෙහිම සඳහා සාධාරණ අගයන් ගණනය කිරීම අවශ්‍ය වේ.

සමූහය සාධාරණ අගයන් මැනීම සම්බන්ධයෙන් පිහිටුවා ඇති පාලන රාමුවක් ඇත. මෙයට අදියර 3 සාධාරණ අගයන් ඇතුළුව සියලුම සුවිශේෂී සාධාරණ අගයන් මැනීම පිළිබඳ සමස්ත වගකීම සහිත ඇගයීම් කණ්ඩායමක් ඇතුළත් වන අතර එම කණ්ඩායම සෘජුවම ප්‍රධාන මූල්‍ය නිලධාරී වෙත වාර්තා කරයි.

ඇගයීම් පිළිබඳ සුවිශේෂි ගැටළු සමාගමට සහ අදාළ පරිපාලිත සමාගමේ විගණන කමිටු වෙත වාර්තා කරනු ලබයි.

වත්කමක හෝ වගකීමක සාධාරණ අගය මැනීමේදී, සමූහය/සමාගම හැකිතාක් දුරට නිරීක්ෂණය කළ හැකි වෙළඳපල දත්ත භාවිතා කරයි. තක්සේරුකරණ ශිල්පීය ක්‍රම සඳහා භාවිතා කරන යෙදවුම් මත පදනම්ව, සාධාරණ අගයන් පහත පරිදි ධූරාවලියක් තුළ විවිධ මට්ටම්වලට වර්ගීකරණය කර ඇත.

- 1වන මට්ටම - අනන්‍ය වත්කම් සහ වගකීම් සඳහා සක්‍රීය වෙළඳපොළවල මිල ගණන් (ගැලපුම් නොකළ)

- 2වන මට්ටම - වත්කමක් හෝ වගකීමක් සඳහා සෘජුවම හෝ වක්‍රව නිරීක්ෂණය කළ හැකි 1 වන මට්ටමේ ඇතුළත් කර ඇති මිල ගණන් හැර අනෙකුත් යෙදවුම්
- 3වන මට්ටම - නිරීක්ෂණය කළ හැකි වෙළඳපල දත්ත මත පදනම් නොවන වත්කම් හෝ වගකීම් සඳහා යෙදවුම් (නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්)

සාධාරණ අගයන් මැනීමේදී කරන ලද උපකල්පන පිළිබඳ වැඩි දුර තොරතුරු මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වල ඇතුළත් කර ඇත.

### 2.5 ප්‍රමාණාත්මතාව හා සමාහරණය

එක් වර්ගයක වැදගත් සමාන අයිතමයන් වෙන්ව වෙන්ව මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කරයි. ස්වභාවයෙන් හෝ කාර්යයෙන් වෙනස් අයිතමයන්, ඒවා ප්‍රමාණාත්මක නොවේ නම් LKAS 1 – "මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම" යටතේ ඉඩ දී ඇති පරිදි, වෙන්ව ඉදිරිපත් කරයි.

### 2.6 සංසන්දනාත්මක තොරතුරු

IRCSL අවශ්‍යතාවය අනුව, 2024 පෙබරවාරි 1 වන දින සිට සමාගම සිය සාමාන්‍ය සහ ජීවිත රක්ෂණ ව්‍යාපාරය වෙන් කරන ලදී. එම නිසා "සමාගම" යටතේ අනාවරණය කරන ලද මූල්‍ය තොරතුරුවල වෙන් කිරීමේ දිනය දක්වා රක්ෂණ ව්‍යාපාරික තොරතුරු ඇතුළත් වේ.

වත්මන් වසරේ ඉදිරිපත් කිරීමට අනුකූල වීම සඳහා අවශ්‍ය තැන්වලදී සංසන්දනාත්මක තොරතුරු නැවත වර්ගීකරණය කර ඇත.

### 2.7 අඛණ්ඩතා පැවැත්ම

ඉදිරි කාලය සඳහා ව්‍යාපාර කටයුතු කරගෙන යාමට ප්‍රමාණවත් තරම් සම්පත් පවතින බවට සෑහීමකට පත්වීමෙන්, සමූහයට/සමාගමට අඛණ්ඩ පැවැත්මේ හැකියාව පිළිබඳව අධ්‍යක්ෂවරුන් විසින් තක්සේරුවක් සිදුකර ඇත. තවද, සමූහයට/සමාගමට අඛණ්ඩ පැවැත්මක් සහිත ආයතනයක් වශයෙන් ඉදිරියට යාමේ හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි කිසිදු ආකාරයක සැලකිය යුතු අවිනිශ්චිතතාවයක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන් දැනුවත් වී නොමැත.

ලාභදායිත්වය, ආදායම් ප්‍රවාහ, කාරක ප්‍රාග්ධන කළමනාකරණය, ප්‍රාග්ධන වියදම්, මුදල් සංචිත සහ වර්තමාන ගෝලීය සහ දේශීය ආර්ථික තත්ත්වයන් යටතේ ව්‍යාපාර කටයුතු කරගෙන යාමට හැකිවන පරිදි සමාගම විසින් ක්‍රියාත්මක කරන ලද පිරිවැය කළමනාකරණ මුලපිරීම් වැනි පුළුල් පරාසයක සාධක සලකා බලමින් සමාගම සිය ව්‍යාපාරවල ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ තක්සේරු කර ඇත. විශ්ලේෂණය සහ පවතින තොරතුරු මත පදනම් වූ අනාගත දැක්ම මත පදනම්ව, සමූහය අඛණ්ඩ ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි කිසිදු ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පිළිබඳව අධ්‍යක්ෂවරුන් දැනුවත් වී නොමැත.
එබැවින්, මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත සකස් කරනු ලැබේ.
අතිරේක තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල 48 වන සටහනෙහි අනාවරණය කර ඇත.

## 3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කර ඇති සියලුම කාල පරිච්ඡේද සඳහා පහත ගිණුම්කරණ ප්‍රතිපත්ති සමූහය සහ සමාගම විසින් අඛණ්ඩව යොදාගෙන ඇත.

### 3.1 ඒකාබද්ධකරණ පදනම

#### 3.1.1 ව්‍යාපාර සංයෝජන

සමූහය විසින් ව්‍යාපාර සංයෝජන සඳහා ගිණුම්ගත කරනු ලබන්නේ, පාලනය සමූහයට මාරු කරන විට, අත්පත් කර ගැනීමේ ක්‍රමය භාවිතා කරමිනි. අත්පත් කර ගැනීමේදී මාරු කරන ලද ප්‍රතිෂ්ඨාව සාමාන්‍යයෙන් සාධාරණ අගයට මනිනු ලබන අතර, හඳුනාගත හැකි අත්පත්කරගත් ශුද්ධ වත්කම් ද සාධාරණ අගයට මනිනු ලැබේ. පැන නගින ඕනෑම කීර්තිනාමයක් හානිකරණය සඳහා වාර්ෂිකව පරීක්ෂා කරනු ලැබේ. අඩු මිලකට සිදු වූ මිලදී ගැනීමකින් ලැබෙන ලාභය වහාම ලාභ හා අලාභ ගිණුමේ හඳුනා ගනු ලැබේ. ගනුදෙනු පිරිවැය ණය හෝ කොටස් සුරැකුම්පත් නිකුත් කිරීමට අදාළ නම් හැර, දරන ලද පරිදි වියදම්ගත කරනු ලැබේ.මාරු කරන ලද ප්‍රතිෂ්ඨාව තුල පෙර පැවති සබඳතා පියවීමට අදාළ මුදල් ඇතුළත් නොවේ. එවැනි මුදල් සාමාන්‍යයෙන් ලාභ හෝ අලාභ ලෙස හඳුනා ගැනේ.

#### 3.1.2 පාලනය නොවන හිමිකම්

අත්පත් කර ගැනීමේ දිනයේ දී අත්පත් කර ගන්නාගේ හඳුනාගත හැකි ශුද්ධ වත්කම්වලට සමානුපාතික කොටසක් වශයෙන් පාලනය නොවන හිමිකම් (NCI) මනිනු ලැබේ. පාලනය අහිමි වීමක් සිදු නොවන මව් සමාගමේ පරිපාලිත සමාගමක පාලන හිමිකම් අනුපාතිකයේ වෙනස්කම් කොටස් ගනුදෙනු ලෙස ගිණුම්ගත කෙරේ.

#### 3.1.3 පරිපාලිත සමාගම්

පරිපාලිත සමාගම් යනු මව් සමාගම විසින් පාලනය කරනු ලබන ආයතන වේ. ආයතනයක ක්‍රියාකාරකම් වලින් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා එහි මූල්‍ය හා මෙහෙයුම් ප්‍රතිපත්ති පාලනය කිරීමට මව් සමාගමට බලය ඇති විට පාලනය පවතී. පාලනය තක්සේරු කිරීමේදී, වර්තමානයේ ක්‍රියාත්මක කල හැකි විභව ඡන්ද අයිතිවාසිකම් සැලකිල්ලට ගනු ලබයි. පරිපාලිත සමාගම් වල මූල්‍ය ප්‍රකාශ පාලනය ආරම්භ වන දිනයේ සිට පාලනය අවසන් වන දිනය දක්වා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ වලට ඇතුළත් කරනු ලබයි.

මව් සමාගම විසින් පරිපාලිත සමාගම් වෙත සිදු කරන ලද ආයෝජන, සමාගමේ මූල්‍ය ප්‍රකාශයන්හී, හානිකරණ අඩු කළ පිරිවැයට ඉදිරියට ගෙනයයි.

### 3.1.4 පාලනය අහිමි වීම
සමූහය/සමාගමට පරිපාලිත සමාගමක් මත පාලනය අහිමි වූ විට, එය පරිපාලිත සමාගමේ වත්කම් හා වගකීම්, සහ ඒ සම්බන්ධ පාලනය නොවන හිමිකම් සහ කොටස් වල වෙනත් අංගයන් හඳුනාගනු නොලැබේ. ඕනෑම ප්‍රතිඵලයක් ලෙස ලැබෙන ලාභ හෝ පාඩු ලාභ සහ අලාභ තුළ හඳුනාගනු ලැබේ. පෙර පැවති පරිපාලිත සමාගම කෙරෙහි රඳවා ගන්නා ලද ඕනෑම හිමිකමක් පාලනය අහිමි වූ විට සාධාරණ අගය මත මිනුම් කරනු ලබයි.

### 3.1.5 ගිණුම්ගත කරන ආයෝජනවල කොටස් හිමිකම්
ආශ්‍රිත සමාගමක් යනු සමාගමට සැලකිය යුතු බලපෑමක් ඇති සහ එයට පරිපාලිත සමාගමක් හෝ ඒකාබද්ධ ව්‍යාපාරයක් නොවන ආයතනයකි. සමූහය/සමාගම ආයෝජනකරුගේ ඡන්ද බලයෙන් 20% ක් හෝ ඊට වැඩි මාත්‍රාවක් රඳවා ගන්නා විට, එය එසේ නොවන බව පැහැදිලිව පෙන්නුම් කළ නොහැකි නම්, සැලකිය යුතු බලපෑමක් පවතින බවට අනුමාන කරනු ලැබේ. කොටස් ක්‍රමය භාවිතා කිරීමෙන් ආශ්‍රිත සමාගම්වල කොටස් හිමිකම ගිණුම්ගත කරනු ලැබේ. ඒවා මූලිකව හඳුනාගනු ලබන්නේ පිරිවැයට වන අතර එයට ගනුදෙනු පිරිවැයද ඇතුළත් වේ. සැලකිය යුතු බලපෑමක් හෝ ඒකාබද්ධ පාලනය නතර වන දිනය දක්වා සමූහයට අයත් ලාභ හෝ අලාභ කොටස සහ ගිණුම්ගත ආයෝජනවල කොටස් වල විස්තීර්ණ ආදායම ඇතුළත් වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ආශ්‍රිත සමාගම්වල ආයෝජන පිරිවැයෙන් හානිකරණය අඩුකර දක්වනු ලැබේ.

### 3.1.6 ඒකාබද්ධවීම මත අත්හරින ගණුදෙනු
සමූහ අන්තර් ශේෂයන් සහ ගනුදෙනු, සහ සමූහ අන්තර් ගනුදෙනු වලින් පැන නගින ඕනෑම උපලබ්ධි නොවූ ආදායමක් සහ වියදම් ඉවත් කරනු ලැබේ. ගිණුම්ගත ආයෝජක කොටස් හිමිකම් පිළිබඳ ගනුදෙනු වලින් පැන නගින උපලබ්ධි නොවූ ලාභ, ආයෝජකයා කෙරෙහි සමූහයේ අයිතිය ඇති ප්‍රමාණයට ආයෝජනයට එරෙහිව ඉවත් කරනු ලැබේ.උපලබ්ධි නොවූ අලාභ, උපලබ්ධි නොවූ ලාභ මෙන්ම, හානිකරණය පිළිබඳ සාක්ෂි නොමැති තාක් දුරට ඉවත් කරනු ලැබේ.

## 3.2 විදේශ මුදල් ගණුදෙනු
විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු, ගනුදෙනු සිදු වූ දිනවල විනිමය අනුපාත අනුව සමූහයේ/සමාගමේ ක්‍රියාකාරී ව්‍යවහාර මුදල් බවට පරිවර්තනය කෙරේ. විදේශ ව්‍යවහාර මුදල් වලින් දක්වා ඇති මුදල් වත්කම් සහ වගකීම්, වාර්තා කරන දිනයේ විනිමය අනුපාතයට අනුව ක්‍රියාකාරී මුදල් බවට පරිවර්තනය කෙරේ.

විදේශ ව්‍යවහාර මුදල් වලින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය නොවන වත්කම් සහ වගකීම් සාධාරණ අගය තීරණය කරන විට පැවති විනිමය අනුපාතයට අනුව ක්‍රියාකාරී මුදල් වලට පරිවර්තනය තරනු ලැබේ.

විදේශීය මුදල් ඒකකයක ඓතිහාසික පිරිවැය මත පදනම්ව මනිනු ලබන මුදල් නොවන අයිතම, ගනුදෙනුව සිදු වූ දිනයේ විනිමය අනුපාතයට අනුව පරිවර්තනය කරනු ලැබේ.

විදේශ ව්‍යවහාර මුදල් වෙනස්කම් සාමාන්‍යයෙන් ලාභ හා අලාභ ගිණුම් තුල හඳුනා ගැනේ.

## 3.3 රක්ෂණ ගිවිසුම්
**නිෂ්පාදන වර්ගීකරණය**
ශ්‍රී.ලං.මූ.නි.ප්‍ර. 4 ට අනුව රක්ෂණකරුවන් විසින් එළඹෙන ගිවිසුම්, පවරන ලද රක්ෂණ අවදානම් මට්ටම අනුව "රක්ෂණ ගිවිසුම්" හෝ "ආයෝජන ගිවිසුම්" ලෙස වර්ගීකරණය කළ යුතුය.

රක්ෂණ ගිවිසුම් යනු රක්ෂණ ඔප්පු හිමියන්ට අහිතකර ලෙස බලපාන නිශ්චිතව දක්වන ලද අවිනිශ්චිත අනාගත සිදුවීමක් (රක්ෂිත සිදුවීමක්) සිදුවුවහොත් රක්ෂණ ඔප්පු හිමියන්ට වන්දි ගෙවීමට එකඟ වීමෙන් සමාගම (රක්ෂකයා) වෙනත් පාර්ශවයකින් (රක්ෂණ ඔප්පු හිමියන්ගෙන්) සැලකිය යුතු රක්ෂණ අවදානමක් සහිතව පිළිගෙන ඇති ගිවිසුම් වේ. පොදු මාර්ගෝපදේශයක් ලෙස, රක්ෂිත සිදුවීම සිදු නොවූයේ නම් ගෙවන ලද ප්‍රතිලාභ, ගෙවිය යුතු ප්‍රතිලාභ සමග සංසන්දනය කිරීමෙන් සමාගම සැලකිය යුතු රක්ෂණ අවදානමක් තිබේද යන්න තීරණය කරයි.රක්ෂණ ගිවිසුම් මගින් මූල්‍ය අවදානම ද පැවරිය හැකිය.

ගිවිසුමක් රක්ෂණ ගිවිසුමක් ලෙස වර්ගීකරණය කළ පසු, සියලු අයිතිවාසිකම් සහ බැදීම් අහෝසි වුවහොත් හෝ කල් ඉකුත් වුවහොත් මිස, මෙම කාල සීමාව තුළ රක්ෂණ අවදානම සැලකිය යුතු ලෙස අඩු වුවද, එය එහි ජීවිත කාලය පුරාම රක්ෂණ ගිවිසුමක් ලෙස පවතී. කෙසේ වුවද, රක්ෂණ අවදානම සැලකිය යුතු තරම් වේ නම්, ආයෝජන ගිවිසුම් ආරම්භයෙන් පසු රක්ෂණ ගිවිසුම් ලෙස නැවත වර්ගීකරණය කළ හැකිය.

සමාගම විසින් අලෙවිකර ඇති සියලුම නිෂ්පාදන රක්ෂණ ගිවිසුම් වන අතර එබැවින් ශ්‍රී.ලං.මූ.නි.ප්‍ර. 4 -'රක්ෂණ කොන්ත්‍රාත්තු' යටතේ රක්ෂණ ගිවිසුම් ලෙස වර්ගීකරණය කර ඇත. මේ අනුව, වාර්තා කරන දිනයේදී සමාගමට එහි නිෂ්පාදන කළඹ තුළ කිසිදු ආයෝජන ගිවිසුමක් නොමැත.

### 3.3.1 රක්ෂණ ගිවිසුම් වගකීම්වලින් කොටස් හිමියන්ට මාරුකරන අතිරික්ත ලාභය
සෑම වාර්තාකරණ කාල පරිච්ඡේදයකදීම කොටස් හිමියන්ට ආරෝපණය කළ හැකි සංචිත භාවිතා කිරීමෙන් සමාගම කොටස් හිමියන්ගේ වටිනාකම තක්සේරු කරයි. සංචිතවල ආරම්භක සහ අවසන් ශේෂය අතර වෙනස, කොටස් හිමියන්ට ආරෝපණය කළ හැකි අතිරික්ත

ලාභය ලෙස සලකනු ලබන අතර වාර්තා කරන දිනට රක්ෂණ කොන්ත්‍රාත් වගකීමෙන් අඩු කරනු ලැබේ.කොටස් හිමියාට ආරෝපණය කළ හැකි අතිරික්ත ලාභය පහත දැක්වෙන පරිදි ආකාර දෙකකින් සමන්විත වේ.

- රක්ෂණ ඔප්පු හිමියන්ගේ අරමුදලෙන් කොටස් හිමියන්ට ආරෝපණය කළ යුතු අතිරික්ත ලාභය
- කොටස් හිමියන්ගේ වත්කම් වලින් උපයන ලද ලාභය

<u>රක්ෂණ ඔප්පු හිමියන්ගේ අරමුදලෙන් කොටස් හිමියන්ට ආරෝපණය කළ යුතු අතිරික්ත ලාභය</u>
අතිරික්තය ස්වාධීන උපදේශක ආයුගණකවරයාගේ නිර්දේශය මත ආයුගණක තක්සේරුවෙන් ලබා ගනී.

<u>කොටස් හිමියන්ගේ වත්කම් වලින් උපයන ලද ලාභය</u>
කොටස් හිමියන්ගේ වත්කම් වලින් උපයන ලාභ, අභ්‍යන්තර ආයුගණක දෙපාර්තමේන්තුවේ නිර්දේශය සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත පදනම් වේ.

## 3.4 ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

### 3.4.1 ආදායම් හඳුනාගැනීම

### 3.4.1.1 දළ ලිඛිත වාරිකය (GWP)

**(අ) ජීවිත රක්ෂණ දළ ලිඛිත වාරිකය**

ජීවිත රක්ෂණ ගිවිසුම් සඳහා වන දළ ලිඛිත වාරික, රක්ෂණ ඔප්පුහිමියා විසින් ගෙවිය යුතු විට ආදායමක් ලෙස පිළිගනු ලැබේ (දින 30 ක සහන කාලයක් සහිත රක්ෂණ ඔප්පු ගෙවිය යුතු ලෙස සලකනු ලැබේ). කලින් ලද ඕනෑම වාරිකයක්, අදාළ ඔප්පුවේ කොන්දේසි මගින් එවැනි වාරිකයක් ආදායමක් ලෙස පිළිගැනීමට අවශ්‍ය බව දක්වා ඇත්නම් පමණක් හැර.ආදායමක් ලෙස සටහන් නොකරන අතර වාරිකය ගෙවිය යුතු තෙක් වගකීමක් ලෙස සටහන් කරනු ලැබේ. ඔප්පුවල ඇස්තමේන්තුගත ආයු කාලය පුරා ලාභ හඳුනා ගැනීම සඳහා එවැනි ආදායමට එරෙහිව ප්‍රතිලාභ සහ වියදම් දක්වනු ලැබේ. තනි රක්ෂණ වාරික ව්‍යාපාර සඳහා, ඔප්පුව බලාත්මක වන දිනයේ සිට ආදායම හඳුනා ගැනේ.

**(ආ) ජීවිත නොවන රක්ෂණ දළ ලිඛිත වාරිකය**

දළ ලිඛිත වාරිකය යනු ගිණුම්කරණ කාලය තුළ ඇති කර ගත් ගිවිසුම් මගින් සපයනු ලබන මුළු ආවරණ කාලය සඳහා ලැබිය යුතු මුළු වාරික වේ. ප්‍රතිපත්තිය ආරම්භ වන දිනයේ දී ඒවා හඳුනා ගනු ලැබේ. ගිවිසුම ආරම්භයේදී, වාරිකය ලිඛිතව සටහන් කර ඇති අතර අදාළ ඔප්පු ආවරණයේ කාලසීමාව පුරාවට සමානුපාතික පදනමක් මත උපයා ගනු ලැබේ. හිමිකම් පෑමක් නොමැති වට්ටම් වැනි වාරික අනුපාතයේ කොටසක් වන වට්ටම්, දළ ලිඛිත වාරිකයෙන් අඩු කරනු ලැබේ.

**නොඉපයූ වාරික සංචිතය (UPR)**

උපයා නොගත් වාරික යනු වාර්තා කරන දිනට පසු අවදානම් කාල පරිච්ඡේදවලට අදාළ වන වසරක් තුළ ලියා ඇති වාරිකවල අනුපාතයන් වේ. වර්ෂය තුළ ලියා ඇති නමුත් කල් ඉකුත් නොවූ ආවරණ කාලයට අදාළ වාරිකයේ කොටස නොඉපයූ වාරික සංචිතයෙන් නියෝජනය කරයි.

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත්කිරීමේ පනත නියාමනය කිරීමට අනුකූලව, උපයා නොගත් වාරික දින 365 පදනමක් මත ගණනය කෙරේ. කෙසේ වුවද, අවදානම් කාලය ගිවිසුම් කාලයට වඩා සැලකිය යුතු ලෙස වෙනස් වන ගිවිසුම් සඳහා, රක්ෂණ ආරක්ෂණ ප්‍රමාණයට සමානුපාතිකව අවදානම් කාලය තුළ වාරිකය උපයා ගනු ලැබේ. පසුකාලීන කාල පරිච්ඡේදවලට ආරෝපණය කළ හැකි අනුපාතය, වගකීම් යටතේ ඇතුළත් කර ඇති උපයා නොගත් වාරික සඳහා ප්‍රතිපාදනයක් ලෙස විලම්භනය කරනු ලැබේ.

### 3.4.1.2 ප්‍රති-රක්ෂණ වාරික

රක්ෂණ ගිවිසුම් සඳහා වන දළ ප්‍රතිරක්ෂණ වාරික, වාරික ගෙවිය යුතු දිනට පෙර හෝ රක්ෂණ ඔප්පුව බලාත්මක වන දිනයේදී වියදමක් ලෙස සලකනු ලැබේ. ප්‍රතිරක්ෂණකරුවන් සමඟ එකඟ වූ අනුපාත මත ප්‍රතිරක්ෂණ වාරිකය තීරණය කරනු ලැබේ.

**(අ) ජීවිත නොවන රක්ෂණ ප්‍රති-රක්ෂණ වාරික**

ලිඛිත ප්‍රතිරක්ෂණ වාරිකය යනු කාලපරිච්ඡේදයට එළඹෙන ගිවිසුම් මගින් සපයනු ලබන සම්පූර්ණ ආවරණය සඳහා ගෙවිය යුතු මුළු වාරිකය වන අතර රක්ෂණ ඔප්පුව ආරම්භ කරන දිනයේදී එය හඳුනාගනු ලැබේ.

**නොඉපයූ ප්‍රති-රක්ෂණ වාරික සංචිතය**

උපයා නොගත් ප්‍රතිරක්ෂණ වාරිකය යනු වාර්තා කරන දිනට පසු අවදානම් කාල පරිච්ඡේදවලට අදාළව වසරක් තුළ ලියා ඇති වාරිකයේ අනුපාතයයි. අවදානම්-ඇතුළත් වන ගිවිසුම් සඳහා පවතින සෘජු රක්ෂණ ඔප්පුවල කාල සීමාව තුළ නොඉපයූ ප්‍රතිරක්ෂණ වාරිකය විලම්භනය කරනු ලැබේ. (2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත්කිරීමේ පනතේ නියාමනයට අනුකූලව දින 365 පදනම භාවිතා කරමින්.කෙසේ වෙතත්, අවදානම් කාල සීමාව ගිවිසුම් කාල සීමාවට වඩා සැලකිය යුතු ලෙස වෙනස් වන ගිවිසුම් සඳහා, රක්ෂණ ආරක්ෂණ ප්‍රමාණයට සමානුපාතිකව අවදානම් කාල සීමාව තුළ වාරිකය උපයා ගනු ලැබේ.)

**(ආ) ජීවිත රක්ෂණ ප්‍රති-රක්ෂණ වාරික**

ජීවිත රක්ෂණ ප්‍රතිරක්ෂණ වාරිකය, වාරිකය ගෙවිය යුතු දිනය හෝ රක්ෂණ ඔප්පුව බලාත්මක වන දිනය යන දෙකෙන් පූර්වයෙන් උදාවන දිනයේ දී වියදමක් ලෙස හඳුනා ගැනේ.

**3.4.1.3 ගාස්තු හා කොමිස් ආදායම**

**(අ) ප්‍රතිරක්ෂණ කොමිස් ආදායම**

බැහැර ප්‍රතිරක්ෂණ ගිවිසුම් මත ප්‍රතිරක්ෂණ කොමිස් ආදායම ලැබිය යුතු විට ආදායම ලෙස පිළිගැනේ.මූලික හඳුනාගැනීමෙන් පසුව, බැහැර ප්‍රතිරක්ෂණ ගිවිසුම් මත ප්‍රතිරක්ෂණ කොමිස් ආදායම, ගෙවිය යුතු අපේක්ෂිත වාරිකයේ කාලසීමාව පුරා සරල රේඛීය පදනමක් මත විලම්භනය කර ක්‍රමක්ෂය කරනු ලැබේ.

**(ආ) අනෙකුත් ගාස්තු ආදායම**

රක්ෂණ ගිවිසුම් ඔප්පු හිමියන්ගෙන් ඔප්පු පරිපාලන සේවා සහ අනෙකුත් ගිවිසුම් ගාස්තු අය කෙරේ. මෙම ගාස්තු ලැබීමෙන් හෝ ගෙවිය යුතු බවට පත් වූ විට ආදායමක් ලෙස පිළිගැනේ.

**3.4.1.4 ආයෝජන ආදායම**

ආයෝජන ආදායමට ආයෝජනය කරන ලද අරමුදල් මත පොලී ආදායම, ලාභාංශ ආදායම, ප්‍රාග්ධන ලාභ හෝ අලාභ සහ විදේශ මුදල් ලාභ හෝ අලාභ ඇතුළත් වේ.

**(අ) පොලී ආදායම**

සඵල පොලී ක්‍රමය භාවිතා කරමින් පොලී ආදායම ලාභ හෝ අලාභ තුල හඳුනා ගැනේ. සඵල පොලී අනුපාතය යනු මූල්‍ය වත්කමේ අපේක්ෂිත ආයු කාලය පුරාවට ඇස්තමේන්තුගත අනාගත මුදල් ලැබීම් හෝ ගෙවීම් (හෝ, සුදුසු අවස්ථාවලදී, කෙටි කාලයක්) මූල්‍ය වත්කමේ ධාරණ වටිනාකමට වට්ටම් කරන අනුපාතයයි. සඵල පොලී අනුපාතය ගණනය කිරීමේදී, මූල්‍ය උපකරණයේ සියලුම ගිවිසුම්ගත නියමයන් සැලකිල්ලට ගනිමින්, සමූහය/සමාගම විසින් අනාගත මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කරනු ලබන අතර එහිදී අනාගත ණය පාඩු සැලකිල්ලට නොගනී. ඵලදායී පොලී අනුපාතය ගණනය කිරීමේදී, සියලුම ගනුදෙනු පිරිවැය සහ ගාස්තු සහ ඵලදායී පොලී අනුපාතයේ අනිවාර්ය අංගයක් වන ගෙවන ලද හෝ ලැබුණු ලකුණු ඇතුළත් වේ. ගනුදෙනු පිරිවැයට මූල්‍ය වත්කමක් අත්පත් කර ගැනීම හෝ නිකුත් කිරීම සඳහා සෘජුවම ආරෝපණය වන වර්ධක පිරිවැය ඇතුළත් වේ.

**(ආ) ලාභාංශ ආදායම**

ආදායම ලැබීමේ අයිතිය ස්ථාපිත කළ විට ලාභාංශ ආදායම හඳුනාගනු ලැබේ.

**3.4.1.5 ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම්වලින් ලැබෙන ආදායම**

ගනුදෙනුකරුවන් සමඟ ඇති කර ගන්නා ගිවිසුම් වලින් ලැබෙන ආදායම, භාණ්ඩ හෝ සේවා සඳහා හුවමාරුවෙන් සමූහයට හිමිවන බවට අපේක්ෂා කරන ප්‍රතිෂ්ඨාව පිළිබිඹු වටිනාකමකට එම භාණ්ඩ හෝ සේවා වල පාලනය පාරිභෝගිකයා වෙත සම්ප්‍රේශණය කල විට භාන්ඩ අළෙවියෙන් ලැබෙන ආදායම හඳුනා ගැනේ.

**3.4.1.6 රෝහල් ආදායම**

පාරිභෝගිකයා සමූහය විසින් සපයනු ලබන ප්‍රතිලාභ එකවර ලබාගෙන පරිභෝජනය කරන බැවින්, සේවාව පිළිබඳ සම්පූර්ණ තෘප්තිය කරා ප්‍රගතිය මැනීම සඳහා යෙදවුම් ක්‍රමයක් භාවිතා කරමින්, කාලයත් සමඟ රෝහල් සේවාවන්ගෙන් ලැබෙන ආදායම සමූහය විසින් හඳුනා ගනු ලැබේ.

ආදායමේ කොටසක් නොවන සමූහය විසින් අභ්‍යන්තර සහ බාහිර උපදේශකයින් වෙනුවෙන් එකතු කරනු ලබන උපදේශන ගාස්තු ආදායමෙන් බැහැර කරනු ලැබේ.

**3.4.1.7 භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම**

වත්කමේ පාලනය පාරිභෝගිකයා සම්ප්‍රේශණය කරන අවස්ථාවේදී, එනම් සාමාන්‍යයෙන් උපකරණ භාරදීමෙන් පසුව භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම හඳුනාගනු ලැබේ. ගනුදෙනු මිලෙන් කොටසක් වෙන් කළ යුතු වෙනම කාර්ය සාධන බැඳීම් බවට පත්වන පොරොන්දු ගිවිසුමේ අඩංගු වේද යන්න සමූහය විසින් සලකා බලනු ලැබේ. භාණ්ඩ විකිණීම සඳහා ගනුදෙනු මිල තීරණය කිරීමේදී, සමූහය විසින් විචල්‍ය ප්‍රතිෂ්ඨාවේ බලපෑම් සහ සැලකිය යුතු මූල්‍යකරණ සංරචකවල පැවැත්ම තක්සේරු කරනු ලැබේ.

**(i) විචල්‍ය ප්‍රතිෂ්ඨාව**

ගිවිසුමක ප්‍රතිෂ්ඨාව තුල විචල්‍ය වටිනාකමක් ඇතුළත් වන්නේ නම්, භාණ්ඩ පාරිභෝගිකයා වෙත සම්ප්‍රේෂණය කිරීම සඳහා හුවමාරුවේදී එයට හිමිවන ප්‍රතිෂ්ඨාවේ අගය සමූහය විසින් ඇස්තමේන්තු කරනු ලබයි. ගිවිසුම ආරම්භයේදී විචල්‍ය ප්‍රතිෂ්ඨාව ඇස්තමේන්තු කරනු ලබන අතර, විචල්‍ය ප්‍රතිෂ්ඨාව සමඟ සම්බන්ධිත අවිනිශ්චිතතාවය පසුව විසඳන විට, හඳුනාගත් සමුච්චිත ආදායම් ප්‍රමාණයේ සැලකිය යුතු ආදායම් ප්‍රතිවර්තනයක් සිදු නොවන බවට ඉහළ සම්භාවිතාවක් ඇති වන තෙක් සීමා කරනු ලැබේ.භාණ්ඩ විකිණීම සඳහා වන ඇතැම් ගිවිසුම් මගින් පාරිභෝගිකයින්ට ආපසු ලබාදීමේ අයිතියක් හිමිකර දේ. ආපසු ලබාදීමේ අයිතිවාසිකම් විචල්‍ය ප්‍රතිෂ්ඨාවන්ට මග පාදනු ලබයි.

**(ii) ආපසු ලබාදීමේ අයිතිය**

ඇතැම් ගිවිසුම් මගින් පාරිභෝගිකයෙකුට නිශ්චිත කාල සීමාවක් තුළ භාණ්ඩ ආපසු ලබා දීමට අයිතියක් ලබා දේ. ආපසු ලබා නොගන්නා භාණ්ඩ ඇස්තමේන්තු කිරීම සඳහා සමූහය විසින් අපේක්ෂිත වටිනාකම් ක්‍රමය භාවිතා කරනු ලබයි. මන්ද යත් මෙම ක්‍රමය මගින් සමූහයට හිමිවන විචල්‍ය ප්‍රතිෂ්ඨාවේ ප්‍රමාණය වඩාත් හොඳින් පුරෝකථනය කරනු ලබයි. ගනුදෙනු මිලට ඇතුළත් කළ හැකි විචල්‍ය ප්‍රතිෂ්ඨාවේ ප්‍රමාණය තීරණය කිරීම සඳහා SLFRS 15 හි විචල්‍ය ප්‍රතිෂයා ඇස්තමේන්තු සීමා කිරීමේ අවශ්‍යතා ද අදාළ වේ. ආපසු ලබා දීමට අපේක්ෂා කරන භාණ්ඩ සඳහා, ආදායම වෙනුවට ආපසු ගෙවීමේ වගකීමක් සමාගම විසින් හඳුනා ගනු ලබයි.

**(iii) සැලකිය යුතු මූල්‍යකරණ සංරචකය**
පොදුවේ, සමූහයට තම ගනුදෙනුකරුවන්ගෙන් කෙටි කාලීන අත්තිකාරම් ලැබේ. SLFRS 15 හි ප්‍රායෝගික උපයෝගීතාව භාවිතා කරමින්, ගිවිසුම ආරම්භයේදී, පොරොන්දු වූ භාණ්ඩ හෝ සේවාව පාරිභෝගිකයා වෙත මාරු කිරීම සහ පාරිභෝගිකයා එම භාණ්ඩ හෝ සේවාව සඳහා ගෙවන කාලය අතර කාල සීමාව වසරක් හෝ ඊට අඩු කාලයක් තුළ අපේක්ෂා කරන්නේ නම්, සමූහය විසින් සුවිශේෂී මූල්‍යකරණ සංරචකයක බලපෑම් සඳහා පොරොන්දු වූ ප්‍රතිෂ්ඨාවේ ප්‍රමාණය වෙනස් නොකරයි.

**3.4.1.8 ආයෝජන දේපල වලින් ලැබෙන කුලී ආදායම**
ආයෝජන දේපල වෙතින් කුලී ආදායම බදුගිණුම් කාලය තුළ සරල මාර්ගික පදනමින් ආදායම ලෙස හඳුනාගනු ලැබේ. ලබා දෙනු ලබන කල්බදු දිරිදීමනා බදුගිණුම් කාලය තුළ සම්පූර්ණ කුලී ආදායමේ අනිවාර්ය කොටසක් ලෙස පිළිගනු ලැබේ.

**3.4.1.9 දේපල, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලැබෙන ලාභ/අලාභ**
දේපල, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලාභ/පාඩුව විකිණීම සිදුවන කාලය තුළ හඳුනාගනු ලබන අතර එය අනෙකුත් ආදායම යටතේ වර්ගීකරණය කරනු ලැබේ.

**3.4.2 ප්‍රතිලාභ, හිමිකම් සහ වියදම්**
**3.4.2.1 දළ ප්‍රතිලාභ සහ හිමිකම්**
**(අ) ජීවිත රක්ෂණ ව්‍යාපාරය**
මරණය දැනුම් දීම හෝ කාල සීමාව ඉකුත්වීම මත, මරණය සහ කල්පිරීම අනුව හිමිකම් ආදායමට එරෙහිව අය කෙරේ. අතුරු ගෙවීම් සහ පවාරණ පියවීමේදී පමණක් ගිණුම්ගත කරනු ලැබේ. ජීවිත රක්ෂණ වියදම්, ජීවිත රක්ෂණ ව්‍යාපාරයේ අත්පත් කර ගැනීමේ වියදම් සහ නඩත්තු වියදම් වලට අදාළ වේ. ආයෝජන සම්බන්ධ වියදම් ආයෝජනයේ ප්‍රාග්ධන පිරිවැයේ කොටසක් ලෙස නොසැලකෙන අතර, ඒවා උපචිත පදනම මත ගණනය කරනු ලැබේ.

**(ආ) ජීවිත නොවන රක්ෂණ ව්‍යාපාරය**
ජීවිත නොවන රක්ෂණ හිමිකම් වලට, වසර තුළ සිදුවන සියලුම හිමිකම්, වාර්තා කළ හෝ නොකල හිමිකම් සැකසීම සහ පියවීම, සුන්බුන් වටිනාකම අඩු කිරීම සහ අනෙකුත් අයකර ගැනීම් සහ පෙර වසරවලට වඩා කැපී පෙනෙන හිමිකම් සඳහා වන ගැලපීම් සමඟ සෘජුවම සම්බන්ධ වන හිමිකම් හැසිරවීමේ පිරිවැය ඇතුළත් වේ. තනිපුද්ගල හිමිකම් ගොනු සමාලෝචනය කිරීමෙන් සහ හිමිකම් පියවීමේ අවසාන පිරිවැයේ වෙනස්කම් ඇස්තමේන්තු කිරීමෙන්, හිඟ හිමිකම් තක්සේරු කරනු ලැබේ.

අතීත අත්දැකීම් සහ ප්‍රවණතා මත පදනම්ව අනාගත වගකීම පිළිබඳ වඩාත් යථාර්ථවාදී තක්සේරුවක් සහතික කිරීම සඳහා, වැය කරන ලද නමුත් වාර්තා නොකළ හිමිකම් (IBNR) සහ වැය කරන ලද නමුත් ප්‍රමාණවත් ලෙස වාර්තා නොකළ හිමිකම් (IBNER) සම්බන්ධයෙන් වන ප්‍රතිපාදනය සත්‍ය වශයෙන් අගය කරනු ලැබේ.ආයුගණක තක්සේරු කිරීම් කාර්තුමය පදනමක් මත සිදු කෙරේ.

දැනට පවතින තොරතුරු මත පදනම්ව හිමිකම් පෑම් සඳහා වන විධිවිධාන සාධාරණ ලෙස දක්වා ඇති බව අධ්‍යක්ෂවරුන් සලකන අතර, අවසාන වගකීම පසුකාලීන තොරතුරු සහ සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස වෙනස් වේ. මෙය සපයා ඇති වටිනාකම්වලට ගැලපීම් කිරීමට හේතු විය හැක. එවැනි වටිනාකම් එම කාල සීමාව සඳහා මූල්‍ය ප්‍රකාශනවල පිළිබිඹු වේ.

හිමිකම් ඇස්තමේන්තු කිරීමට භාවිතා කරන ක්‍රම සහ කරන ලද ඇස්තමේන්තු නිතිපතා සමාලෝචනය කරනු ලැබේ.

**3.4.2.2 ප්‍රතිරක්ෂණ හිමිකම්**
අදාළ ගිවිසුමේ නියමයන්ට අනුව අදාළ දළ රක්ෂණ හිමිකම් හඳුනාගන්නා අවස්ථාවේ ප්‍රතිරක්ෂණ හිමිකම් හඳුනා ගැනේ.

**3.4.2.3 ශුද්ධ විලම්භිත අත්පත් කිරීමේ වියදම්**
ව්‍යාපාරයේ නිෂ්පාදනය සමඟ වෙනස් වන සහ සෘජුවම සම්බන්ධ වන කොමිස් අත්පත් කර ගැනීමේ වියදම් තුල නියෝජනය වේ.ජීවිත නොවන රක්ෂණ ගිවිසුම් සඳහා අදාළ වන අත්පත් කර ගැනීමේ වියදම්, අදාළ ලිඛිත වාරිකය උපයන කාල සීමාව තුළ විලම්භනය කර ක්‍රමක්ෂය කරනු ලැබේ.විලම්භනය කරනලද අත්පත් කර ගැනීමේ පිරිවැය තුළ ප්‍රතිරක්ෂණ කොමිස් මුදල ද සම්බනධයෙන්ද ඒ ආකාරයෙන්ම කටයුතු කරනු ලැබේ.

**3.4.2.4 ජීවිත රක්ෂණ අරමුදලේ ආයුගණක ඇගයීම**
ස්වාධීන උපදේශක රක්ෂණ ආයුගණකවරයකු විසින් කරන ලද ජීවිත රක්ෂණ ව්‍යාපාරය පිළිබඳ වාර්ෂික විමර්ශනයකින් පසුව, ඔහුගේ නිර්දේශ මත, වසර අවසානයේදී සමාගම සඳහා වූ දිගුකාලීන රක්ෂණ ප්‍රතිපාදන සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන් එකඟ වී ඇත. ආයුගණක තක්සේරුව මඟින් සියලුම වගකීම් සැලකිල්ලට ගන්නා අතර, වියදම් ස්වාධීන උපදේශක ආයුගණක විසින් අනුමත කරන ලද උපකල්පන මත පදනම් වේ.

**3.4.2.5 වියදම්**
වියදම් උපචිත පදනම මත හඳුනා ගැනේ. ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී සහ දේපළ, පිරියත සහ උපකරණ නඩත්තු කිරීමේදී දරන ලද සියලුම වියදම් ලාභ හෝ අලාභ ප්‍රකාශයට තුල අය කර ඇත.

### 3.4.3 සේවක ප්‍රතිලාභ

**(අ) කෙටිකාලීන ප්‍රතිලාභ**

කෙටි කාලීන සේවක ප්‍රතිලාභ අදාළ සේවාව සපයන අවස්ථාවේදී දරනු ලැබේ. සේවකයෙකු විසින් සපයන ලද අතීත සේවාවක ප්‍රතිඵලයක් ලෙස මෙම මුදල ගෙවීමට සමූහයට වර්තමාන නෛතික හෝ ඵලදායී බැඳීමක් ඇත්නම් සහ වගකීම විශ්වාසදායක ලෙස ඇස්තමේන්තු කළ හැකි නම්, කෙටි කාලීන මුදල් ප්‍රසාද දීමනා හෝ ලාභ බෙදීමේ සැලසුම් යටතේ ගෙවීමට අපේක්ෂිත මුදල සඳහා වගකීමක් හඳුනා ගැනේ.

**(ආ) නිශ්චිත දායකත්ව සැලසුම්**

නිශ්චිත දායකත්ව සැලැස්මක් යනු පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්මක් වන අතර, ඒ යටතේ ආයතනයක් වෙනම ආයතනයකට ස්ථාවර දායක මුදල් ගෙවන අතර තවදුරටත් මුදල් ගෙවීමට නීතිමය හෝ ගිවිසුම්ගත බැඳීමක් නොමැත. සේවකයින් විසින් සේවා සපයනු ලබන කාල පරිච්ඡේදවල ලාභ හෝ අලාභ ප්‍රකාශයේ අර්ථ දක්වා ඇති දායකත්ව සැලසුම් සඳහා වන බැඳීම් රැකියා ප්‍රතිලාභ වියදමක් ලෙස පිළිගැනේ.

**සේවක අර්ථසාධක අරමුදල**

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්හි ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්, සීමාසහිත ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම සහ සීමාසහිත ලිට්‍රෝ ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම යන සමාගම්වල සේවකයින් අනුමත අර්ථසාධක අරමුදලට එක් එක් සේවකයාගේ වැටුපෙන් පිළිවෙලින් 15% සහ 10% ක දායකත්වයක් ලබා දේ.

අනෙකුත් සමූහ ආයතන සහ අනෙකුත් සමූහ ආයතනවල සේවකයින් අනුමත අර්ථසාධක අරමුදලට එක් එක් සේවකයාගේ වැටුපෙන් පිළිවෙලින් 12% සහ 8% ක දායකත්වයක් සපයයි.

**සේවා නියුක්තියන්ගේ භාර අරමුදල**

සමූහය සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට එක් එක් සේවකයාගේ වැටුපෙන් 3%ක් දායක කරනු ලැබේ.

**(ඇ) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම**

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්මක් වන අතර එය අර්ථ දක්වන ලද දායකත්ව සැලැස්මකින් වෙනස් වේ. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සම්බන්ධයෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ හඳුනාගෙන ඇති වගකීම, වාර්තා කරන දිනට අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන වටිනාකම වේ.LKAS 19 - 'සේවක ප්‍රතිලාභ' මගින් නිර්දේශ කර ඇති පරිදි, ප්‍රක්ෂේපිත ඒකක ණය (PUC) ක්‍රමය භාවිතා කරමින් වාර්තාකරණ දිනයේදී සුදුසුකම් ලත් ආයුගණකවරයෙකු විසින් අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ වගකීම ගණනය කිරීම වාර්ෂිකව සිදු කරනු ලැබේ.ආයුගණක තක්සේරුවට සේවකයින්ගේ වට්ටම් අනුපාතය, වැටුප් වර්ධක අනුපාතය සහ ශේෂ සේවා කාලය පිළිබඳ උපකල්පන සිදු කිරීම ඇතුළත් වේ. සැලසුම්වල දිගුකාලීන ස්වභාවය හේතුවෙන් එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිතතාවයකට ලක් වේ.

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ, සේවකයෙකු සම්බන්ධයෙන් වගකීම පැන නගින්නේ ඔහු ගේ සේවා කාලය අඛණ්ඩව වසර 5 ක් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණි. මෙම වගකීම සම්බන්ධයෙන් බාහිරව අරමුදල් සපයනු නොලැබේ. ශුද්ධ පොලී වියදම් සහ නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වලට අදාළ අනෙකුත් වියදම් ලාභය හෝ අලාභය තුල හඳුනා ගැනේ. නිරවුල් කිරීමක් සිදු වූ විට නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් පියවීමේදී සමූහය එය ලාභ සහ අලාභ හඳුනා ගනී.

ආයුගණක ලාභ සහ අලාභ ඇතුළත් ශුද්ධ අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ බැඳීම නැවත මැනීම, වෙනත් විස්තීර්ණ ආදායම තුල වහාම හඳුනා ගනු ලැබේ.

### 3.4.4 ආදායම් බදු වියදම

ආදායම් බදු වියදමට ප්‍රවර්තන සහ විලම්බිත බදු ඇතුළත් වේ. ප්‍රවර්තන සහ විලම්බිත බදු ලාභ හා අලාභ වශයෙන් හඳුනාගනු ලබන්නේ ස්කන්ධ හෝ අනෙකුත් විස්තීර්ණ ආදායමෙහි හි සෘජුවම පිළිගත් අයිතමවලට අදාළ වන ප්‍රමාණයට පමණි.

#### 3.4.4.1 ප්‍රවර්තන බද්ද

ආදායම් බදු සඳහා වන ප්‍රතිපාදනය මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති පරිදි ආදායම් සහ වියදම්වල අංග මත පදනම් වන අතර 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සහ එහි පසුකාලීන සංශෝධනවලට අනුකූලව ගණනය කරනු ලැබේ.

ප්‍රවර්තන ආදායම් බද්ද යනු වර්ෂය සඳහා බදු අය කළ හැකි ආදායම හෝ අලාභය මත ගෙවිය යුතු හෝ ලැබිය යුතු අපේක්ෂිත බද්ද වන අතර පෙර වර්ෂ සම්බන්ධයෙන් ගෙවිය යුතු හෝ ලැබිය යුතු බද්දට කළ හැකි ඕනෑම ගැලපීමක් අදාළ වේ. වාර්තාකරණ දිනයේදී බලාත්මක කරන ලද බදු අනුපාත භාවිතා කරමින් එය මනිනු ලැබේ.

අදාළ බදු රෙගුලාසි අර්ථ නිරූපණයට යටත් වන අවස්ථා සම්බන්ධයෙන් බදු වාර්තාවල දක්වන ස්ථාවරයන් කළමනාකරණය විසින් වරින් වර ඇගයීමට ලක් කරන අතර සුදුසු අවස්ථාවලදී විධිවිධාන ස්ථාපිත කරනු ලබයි.

#### 3.4.4.2 විලම්භිත බද්ද
මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා වත්කම් සහ වගකීම් ධාරණ අගය සහ බදුකරණ අරමුණු සඳහා භාවිතා කරන ලද ප්‍රමාණයන් අතර තාවකාලික වෙනස්කම් සම්බන්ධයෙන් විලම්බිත බදු හඳුනා ගැනේ.

විලම්බිත බදු වත්කම් සහ වගකීම්, සියලු තාවකාලික වෙනස්කම්, භාවිතයට නොගත් බදු බැර ඉදිරියට ගෙනයාම සහ භාවිතයට නොගත් බදු අලාභ සඳහා, අනාගතයේදී බදු අය කළ හැකි ලාභ ලබා ගත හැකි වන අතර ඒවා භාවිතා කළ හැකි ප්‍රමාණයට හඳුනා ගැනේ.

විලම්බිත බදු වත්කම් සෑම වාර්තාකරණ දිනකම සමාලෝචනය කරනු ලබන අතර අදාළ බදු ප්‍රතිලාභය තවදුරටත් සාක්ෂාත් කර ගැනීමට නොහැකි වන තරමට අඩු කරනු ලැබේ; අනාගත බදු අය කළ හැකි ලාභවල සම්භාවිතාව වැඩි දියුණු වූ විට එවැනි අඩු කිරීම් ප්‍රතිවර්තනය කරනු ඇත.

වාර්තාකරණ දිනයේ දී පනවන ලද හෝ සැලකිය යුතු ලෙස පනවන ලද බදු අනුපාත භාවිතා කරමින්, තාවකාලික වෙනස්කම් ආපසු හැරවීමේදී අදාළ කිරීමට අපේක්ෂා කරන බදු අනුපාත මගින් විලම්බිත බදු ගණනය කරනු ලැබේ.

හඳුනා නොගත් විලම්බිත බදු වත්කම් සෑම වාර්තාකරණ දිනකම නැවත තක්සේරු කරනු ලබන අතර, අනාගත බදු අය කළ හැකි ලාභ ලබා ගත හැකි ප්‍රමාණයට ඒවා භාවිතා කළ හැකි ප්‍රමාණයට හඳුනා ගනු ලැබේ.

ප්‍රවර්තන බදු වත්කම් ප්‍රවර්තන බදු වගකීම්වලට එරෙහිව හිලව් කිරීමට නීත්‍යානුකූලව බලාත්මක කළ හැකි අයිතියක් තිබේ නම් සහ විලම්බිත බදු එකම බදු අය කළ හැකි ආයතනයට සහ එකම බදුකරණ අධිකාරියට අදාළ වන විට විලම්බිත බදු වත්කම් සහ විලම්බිත බදු වගකීම් හිලව් කරනු ලැබේ.

#### 3.4.4.3 භෝග රක්ෂණ අයබදු (CIL)
2013 අංක 12 දරන මුදල් පනතේ 14 වන වගන්තියේ විධිවිධාන යටතේ බෝග රක්ෂණ අයබදු හඳුන්වා දෙන ලද අතර එය 2013 අප්‍රේල් 01 වන දින සිට බලාත්මක විය. එය ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ගෙවිය අතර බදු ගෙවීමෙන් පසු ලාභයෙන් 1% ක වගකීමක් ඇත.

## 3.5 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
### 3.5.1 දේපළ, පිරියත සහ උපකරණ
#### 3.5.1.1 මූලික හඳුනාගැනීම සහ මැනීම
සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරණය පිරිවැයෙන් අඩු කිරීමෙන් දේපල, පිරියත සහ උපකරණ අයිතම මනිනු ලැබේ. දේපල, පිරියත සහ උපකරණවල පිරිවැය යනු වත්කම එහි අපේක්ෂිත භාවිතය සඳහා එහි ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමේදී දරන ලද ඕනෑම වියදමක් සමඟ අත්පත් කර ගැනීමේ හෝ ඉදිකිරීම් පිරිවැයයි.

වත්කම අත්පත් කර ගැනීමට සෘජුවම ආරෝපණය කළ හැකි වියදම් පිරිවැයට ඇතුළත් වේ. ස්වයං-නිර්මාණිත වත්කම්වල පිරිවැයට පහත සඳහන් දෑ ඇතුළත් වේ.

- අමුද්‍රව්‍ය හා සෘජු ශ්‍රමයේ පිරිවැය
- වත්කම් ඒවායේ අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමට සෘජුවම ආරෝපණය කළ හැකි වෙනත් ඕනෑම පිරිවැයක්
- වත්කම ඉවත් කිරීමට හෝ භූමිය ප්‍රතිසංස්කරණය කිරීමට සමූහයට බැඳීමක් ඇති විට, අයිතම විසුරුවා හැරීමට සහ ඉවත් කිරීමට සහ ඒවා පිහිටා ඇති ස්ථානය ප්‍රතිසංස්කරණය කිරීමට යන පිරිවැය පිළිබඳ ඇස්තමේන්තුවක්

බැහැර කිරීමේදී  ලැබෙන ඕනෑම ලාභයක් හෝ අලාභයක් ලාභ හෝ අලාභයේ වෙනත් මෙහෙයුම් ආදායම තුල හඳුනා ගැනේ.

#### 3.5.1.2 පසුකාලීන වියදම් සහ ප්‍රතිස්ථාපනය
දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය, එම කොටස තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහයට ගලා ඒමට අවකාශ ඇතිනම්, එහි පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම් එම අයිතමයේ ධාරණ අගය අනුව හඳුනාගනු ලැබේ. ප්‍රතිස්ථාපනය කරන ලද කොටසෙහි ධාරණ අගය හඳුනා නොගැනේ. දේපල, පිරියත සහ උපකරණවල එදිනෙදා සේවා පිරිවැය ලාභ හෝ අලාභය තුල සිදු වූ අවස්ථාවේදී හඳුනා ගැනේ.

#### 3.5.1.3 ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය
වත්කමක් ලෙස පිළිගැනීමෙන් පසු, සාධාරණ අගය විශ්වාසදායක ලෙස මැනිය හැකි ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කළ දිනයේදී ප්‍රත්‍යාගණන වටිනාකමෙන්, පසුව රැස් වූ ක්ෂයවීම් සහ පසුව එකතු වූ හානිකරණ අගය අඩු කර ගෙන පවත්වාගෙන යනු ලැබේ. ප්‍රත්‍යාගණනය කරන ලද වත්කමක සාධාරණ අගය වාර්තා කරන දිනට එහි ධාරණ අගයට වඩා සැලකිය යුතු ලෙස වෙනස් නොවන බව සහතික කිරීම සඳහා තක්සේරු කිරීම් සිදු කරනු ලැබේ.

ඉඩම් සහ ගොඩනැගිලි තක්සේරු කිරීම වෘත්තීයමය වශයෙන් සුදුසුකම් ලත් තක්සේරුකරුවන් විසින් අවම වශයෙන් අවුරුදු තුනක කාලයක් සඳහා සිදු කරනු ලබන අතර සාධාරණ අගයේ වෙනස්වීම් හේතුවෙන් ඇතිවන ඕනෑම ලාභයක් හෝ අලාභයක් ඒවා පැන නගින වර්ෂයේ අනෙකුත් විස්තීර්ණ ආදායමට යටතේ හඳුනා ගැනේ. ප්‍රත්‍යාගණනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ධාරණ අගයෙහි වැඩිවීමක්, අනෙකුත් විස්තීර්ණ ආදායම යටතේ හඳුනා ගැනෙන අතර ප්‍රත්‍යගණන සංචිතය යන මාතෘකාව යටතේ ස්කන්ධය තුල දක්වා ඇත. කෙසේ

වෙතත්, කලින් ලාභය සහ අලාභය ලෙස හඳුනාගත් එකම වත්කමේ ප්‍රත්‍යාගණනය කිරීමේ අඩුවීමක් ප්‍රත්‍යවර්තනය කරන ප්‍රමාණයට ලාභය හෝ අලාභය තුළ වැඩිවීම හඳුනාගෙන ගනු ලැබේ.

ප්‍රත්‍යගණනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ධාරණ වටිනාකමේ අඩුවීමක් ලාභ අලාභය තුල හඳුනා ගැනේ. කෙසේ වෙතත්, එම වත්කම සම්බන්ධයෙන් ප්‍රත්‍යාගණනය කිරීමේ අතිරික්තයේ පවතින ඕනෑම ණය ශේෂයක ප්‍රමාණයට අනෙකුත් විස්තීර්ණ ආදායමෙන් අඩුවීම හඳුනා ගැනේ.

තවද, ප්‍රත්‍යගණන දිනයේ දී සමුච්චිත ක්ෂයවීම් වත්කමේ ධාරණ අගයට එරෙහිව ඉවත් කරනු ලබන අතර ශුද්ධ මුදල වත්කමේ ප්‍රත්‍යාගණන වටිනාකමට නැවත ප්‍රකාශ කරනු ලැබේ. බැහැර කිරීම මත, විකුණනු ලබන නිශ්චිත වත්කමට අදාළ ඕනෑම ප්‍රත්‍යගණන සංචිතයක් සෘජුවම රඳවා ගත් ඉපැයීම් වෙත මාරු කරනු ලැබේ.

**3.5.1.4 ක්ෂය**
දේපල, පිරියත සහ උපකරණවල අයිතමවල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය මත සරල මාර්ග ක්‍රමය භාවිතා කරමින් ඒවායේ ඇස්තමේන්තුගත සුන්බුන් අගයන් අඩු කිරීම සඳහා වන අතර එය සාමාන්‍යයෙන් ලාභ හෝ අලාභයෙන් හඳුනා ගැනේ.

මෙය වත්කමේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනයේ අපේක්ෂිත රටාව වඩාත් සමීපව පිළිබිඹු කරයි.

වත්මන් සහ සංසන්දනාත්මක කාල පරිච්ඡේද සඳහා ඇස්තමේන්තුගත ඵලදායි ආයු කාලයන් පහත පරිදි වේ.
• ගොඩනැගිලි: වර්ෂ 20-40
• ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්: වර්ෂ 5-10
• කාර්යාල සහ අනෙකුත් උපකරණ: වර්ෂ 5-10
• විදුලි ජනක යන්ත්‍ර සහ වායු සමීකරණ පිරියත: වර්ෂ 5-10
• මෝටර් රථ: වර්ෂ 4-5
• සවිකිරීම්: වර්ෂ 6 2/3
• පිරියත සහ උපකරණ: වර්ෂ 20
• පරිගණක සහ පරිගණක උපකරණ: වර්ෂ 4-7
• එල්පී ගෑස් ගබඩා ටැංකි, නළ මාර්ග සහ සවිකිරීම්: වර්ෂ 25
• එල්පී ගෑස් සිලින්ඩර: වර්ෂ 10
• අනෙකුත් ස්ථාවර වත්කම්: වර්ෂ 3-12

ක්ෂයවීම් ක්‍රම, ඵලදායි ආයු කාලය සහ සුන්බුන් අගයන් සෑම වාර්තාකරණ දිනකම සමාලෝචනය කර අවශ්‍ය නම් ගැලපීම් සිදුකරනු ලැබේ.

**3.5.1.5 හඳුනා නොගැනීම**
දේපල, පිරියත සහ උපකරණ අයිතමයක ධාරණ අගය බැහැර කිරීමේදී හෝ එහි භාවිතයෙන් හෝ බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට ගණනය කරනු නොලැබේ. දේපල, පිරියත සහ උපකරණ අයිතමයක් හඳුනා නොගැනීමෙන් ඇතිවන ලාභය හෝ අලාභය එම අයිතමය හඳුනා නොගන්නා අවස්ථාවේදී ලාභය හෝ අලාභයට ඇතුළත් වේ.

**3.5.1.6 හානිකරණය**
ආර්ථික අර්බුදයේ බලපෑම ද සලකා බැලීමෙන්, 2024 දෙසැම්බර් 31 වන දිනට දේපල, පිරියත සහ උපකරණ වල විභව හානිකරණ අලාභය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තක්සේරු කර ඇත.තක්සේරුව මත පදනම්ව, දේපල, පිරියත සහ උපකරණ සම්බන්ධයෙන් වාර්තාකරණ දිනට මූල්‍ය ප්‍රකාශනවල කිසිදු හානිකරණ ප්‍රතිපාදනයක් සිදු කිරීම අවශ්‍ය නොවේ.

**3.5.1.7 කාරක ප්‍රාග්ධනය**
කාරක ප්‍රාග්ධනය පිරිවැයට දක්වා ඇත. මේවා ප්‍රාග්ධනීකරණය අපේක්ෂාවෙන් ගොඩනැගිලි ඉදිකිරීමේදී සෘජුවම දරන ලද ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් වේ.

**3.5.2 අස්පෘශ්‍ය වත්කම්**
අස්පෘශ්‍ය වත්කමක් හඳුනාගනු ලබන්නේ, එම වත්කමට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහයට ගලා ඒමට ඉඩ තිබේ නම් සහ පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම් ය.

**3.5.2.1 කීර්තිනාමය**
පරිපාලිත සමාගම් අත්පත් කරගැනීම මත ඇතිවන කීර්තිනාමය සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ පිරිවැයට මනිනු ලබයි.

**කීර්තිනාමය හානිකරණය**
ව්‍යාපාර සංයෝජනයකින් අත්පත් කරගත් කීර්ති නාමය වාර්ෂිකව හානි සඳහා පරීක්ෂා කරනු ලබන අතර, තත්වයන් මගින් ධාරණ අගය අඩාල විය හැකි බව පෙන්නුම් කරන විට එසේ කරනු ලැබේ. කීර්ති නාමයට අදාළ වන සෑම මුදල් උත්පාදන ඒකකයකම අයකර ගත හැකි ප්‍රමාණය තක්සේරු කිරීමෙන් කීර්ති නාමය සඳහා හානිකරණය තීරණය කරනු ලැබේ. මුදල් උත්පාදන ඒකකයේ අයකර ගත හැකි වටිනාකම ඒවායේ ධාරණ අගයට වඩා අඩු වූ විට, ලාභය හෝ අලාභය තුළ හානිකරණ අලාභයක් හඳුනා ගැනේ. කීර්ති නාමය මත හානිකරණ අලාභය ප්‍රතිවර්තනය කල නොහැක.

**3.5.2.2 මෘදුකාංග**
සමූහය විසින් අත්පත් කරගත් සහ සීමිත ප්‍රයෝජනවත් ආයු කාලයක් ඇති අනෙකුත් අස්පෘශ්‍ය වත්කම්, පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානි අලාභ අඩු කර මනිනු ලැබේ. අස්පෘශ්‍ය වත්කම් වලට හානි සිදුවිය හැකි බවට ඇඟවීමක් ඇති විට, සීමිත ප්‍රයෝජනවත් ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම්, හානිකරණය සඳහා තක්සේරු කරනු ලැබේ. අවිනිශ්චිත ප්‍රයෝජනවත් ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් වාර්ෂිකව තනි තනිව හෝ මුදල් උත්පාදන ඒකක (CGU) මට්ටමින් හානිකරණය සඳහා පරීක්ෂා කරනු ලැබේ. වාර්තා කරන දිනයේදී සමූහය විසින් අනෙකුත් අස්පෘශ්‍ය වත්කම් ලෙස වෙන වෙනම අත්පත් කරගත් මෘදුකාංග පවතියි.

**පසුකාලීන වියදම්**
මෘදුකාංග සඳහා පසුකාලීන වියදම් ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ එය අදාළ වන නිශ්චිත වත්කමෙහි අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩිවන විට පමණි. අනෙකුත් සියලුම වියදම් ලාභ හෝ අලාභය ලෙස හඳුනා ගැනේ.

**ක්‍රමක්ෂය**
අස්පෘශ්‍ය වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය මත සරල මාර්ග ක්‍රමය භාවිතා කරමින් පිරිවැයෙන් ඇස්තමේන්තුගත සුන්බුන් අගයන් අඩු කිරීමෙන් පිරිවැය කපා හැරීම සඳහා ක්‍රමක්ෂය ගණනය කරනු ලබන අතර එය ලාභ හෝ අලාභ තුල හඳුනා ගැනේ. මෘදුකාංගයේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය අවුරුදු පහකි.

සෑම වාර්තාකරණ දිනකම ක්‍රමක්ෂය කිරීමේ ක්‍රම, ඵලදායි ජීව කාලය සහ සුන්බුන් අගයන් සමාලෝචනය කර සුදුසු නම් සකස් කරනු ලැබේ.

**හඳුනා නොගැනීම**
අස්පෘශ්‍ය වත්කමක් බැහැර කිරීමේදී හෝ එහි භාවිතය හෝ බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනා නොගනියි. එවැනි අස්පෘශ්‍ය වත්කම් හඳුනා නොගැනීමෙන් ලැබෙන ලාභය හෝ අලාභය, අයිතමය ගණනය නොකරන විට ලාභය හෝ අලාභයට ඇතුළත් වේ.

2024 දෙසැම්බර් 31 වන දිනට ආර්ථික අර්බුදයෙන් ඇති වූ බලපෑම ඇතුළුව අස්පෘශ්‍ය වත්කම්වල විභව හානිකරණ දර්ශක සමූහය විසින් තක්සේරු කර ඇත. තක්සේරුව මත පදනම්ව, කිසිදු හානිකරණ දර්ශකයක් හඳුනාගෙන නොමැත.

**3.5.3 භාවිතයට අයිතිය ඇති වත්කම්**
SLFRS 16, මගින් LKAS 17- කල්බදු අවලංගු වන අතර, IFRIC 4 මගින් යම් ගිවිසුමක් තුල කල්බද්දක් අන්තර්ගත වේද යන්නත්, SIC-15 මෙහෙයුම් කල්බදු දිරිගැන්වීම් සහ SIC-27 කල්බද්දක නෛතික ස්වරූපය ගන්නා ගනුදෙනුවල හරය ඇගයීම් කිරීම සිදුවේ. මෙම ප්‍රමිතිය තුල කල්බදු හඳුනා ගැනීම, මැනීම, ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම සඳහා වන මූලධර්ම දක්වා ඇති අතර, තනි ශේෂ පත්‍ර ආකෘතියක් යටතේ සියලුම කල්බදු සඳහා ගිණුම්ගත කිරීමට බදුකරුවන්ගෙන් ඉල්ලා සිටී. ප්‍රමිතියේ නිශ්චිත සංක්‍රාන්ති විධිවිධාන යටතේ අවසර දී ඇති පරිදි, 2018 වාර්තාකරණ කාලය සඳහා සංසන්දනාත්මක කරුණු නැවත ප්‍රකාශ නොකර, සමූහය 2019 ජනවාරි 01 වන දින සිට සම්පූර්ණ ප්‍රතිලෝම ක්‍රමය භාවිතා කරමින් SLFRS 16 අනුගමනය කර ඇත.

එකඟතාවයක් ආරම්භ වන විට, එය කල්බදු ගිවිසුමක් ද, නැතහොත් කල්බදු ගිවිසුමක් අඩංගු ද යන්න සමූහය විසින් මූලිකව ඇගයීම් කරයි. කොන්ත්‍රාත්තුවක් හඳුනාගත් වත්තමක භාවිතය පාලනය කිරීමේ හිමිකම, නියමිත කාලයක් සඳහා, යම් ප්‍රතිෂ්ඨාවක් වෙනුවෙන් ලබා දෙන්නේ නම්, එය කල්බදු ගිවිසුමක් ලෙස හඳුනාගත හැකිය.

ගිවිසුමක් හඳුනාගත් වත්කමක භාවිතය පාලනය කිරීමේ හිමිකම ලබාදෙනවාද යන්න තීරණය කිරීම සඳහා, සමූහය විසින් පහත සඳහන් කරුණු සලකා බලනු ලැබේ.

- ගිවිසුමට හඳුනාගත් වත්කමක් භාවිතා කිරීම ඇතුළත් වේද,
- සම්පත් භාවිතා කරන කාලය පුරාම භාවිතා කිරීමෙන් සැලකිය යුතු ලෙස සියලු ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීමට සමාගමට අයිතියක් පවතින්නේද; සහ
- වත්කම භාවිතා කිරීම මෙහෙයවීමට සමාගමට අයිතියක් පවතින්නේද.

කල්බදු ආරම්භක දිනයේදී සමූහය විසින් භාවිත කිරීමේ අයිතිය සහිත වත්කමක් සහ කල්බදු වගකීමක් හඳුනා ගනු ලැබේ.

සමූහයේ භාවිත කිරීමේ අයිතියට LKAS 17 යටතේ මෙහෙයුම් කල්බදු ලෙස පෙර හඳුනාගෙන තිබූ කුලියට ගත් ශාඛා පරිශ්‍ර ඇතුළත් වේ.

**මූලික අගය කිරීම**
භාවිත අයිතියේ වත්කම ප්‍රථමයෙන් පිරිවැයට මනිනු ලැබේ. මෙම පිරිවැයට ගිවිසුම ඇරඹෙන දිනට හෝ ඊට පෙර ගෙවූ කල්බදු ගෙවීම්, ආරම්භක සෘජු වියදම්, අදාළ වත්කම ඉවත් කිරීම, එය ප්‍රතිස්ථාපනය කිරීම හෝ එහි පිහිටි ස්ථානය ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා ඇස්තමේන්තුගත වියදම් වලින් කල්බදු ප්‍රසාද දීමනා අඩු කිරීමෙන් ලබාගනියි.

කල්බදු වගකීම මුලින් මනිනු ලබන්නේ ආරම්භක දිනයේදී නොගෙවන ලද කල්බදු ගෙවීම්වල වර්තමාන වටිනාකම අනුව වන අතර, කල්බදුවේ ගම්‍ය පොලී අනුපාතය භාවිතා කර වට්ටම් කරනු ලැබේ, නැතහොත් එම අනුපාතය පහසුවෙන් තීරණය කළ නොහැකි නම්, සමූහයේ වර්ධක ණය ගැනීමේ අනුපාතය භාවිතා කරයි. සාමාන්‍යයෙන්, සමූහය එහි වර්ධක ණය ගැනීමේ අනුපාතය වට්ටම් අනුපාතය ලෙස භාවිතා කරයි.

සමාගම විසින් පරිපාලිත ආයතනයට කුලියට දී ඇති දේපලක ප්‍රතිඵලයක් ලෙස වත්කම් සහ කල්බදු වගකීම් භාවිතා කිරීමේ අයිතිය එම පරිපාලිත සමාගමකට ඇති විට, එවැනි භාවිත කිරීමේ අයිතිය පිළිබඳ වත්කම් සහ කල්බදු වගකීම් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කරනු ලැබේ.

**පසුකාලීන මැනීම**
භාවිතයේ අයිතිය ඇති වත්කමේ ප්‍රයෝජනවත් ආයු කාලය අවසන් වන දිනය හෝ කල්බදු කාල සීමාව අවසන් වන දිනය යන දිනවලින් ප්‍රථමයෙන් එළඹෙන දිනය දක්වා සරල මාර්ග ක්‍රමය භාවිතයෙන් ක්ෂය කරනු ලැබේ. දේපළ හා උපකරණවල ආයු කාලයට සමාන පදනමක් මත භාවිතා කිරීමේ අයිතිය පිළිබඳ වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය තීරණය වේ. ඊට අමතරව, භාවිතා කිරීමේ අයිතිය පිළිබඳ වත්කම වරින් වර හානිකරණ අලාභ (ඇත්නම්) මගින් අඩු කරනු ලබන අතර, කල්බදු වගකීමේ ඇතැම් නැවත මිනුම් සඳහා සකස් කරනු ලැබේ.

කල්බදු වගකීම සඵල පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂ පිරිවැයට මනිනු ලැබේ.දර්ශකයක හෝ අනුපාතයක වෙනසක් හේතුවෙන් අනාගත කල්බදු ගෙවීම්වල වෙනසක් ඇති වූ විට, සුන්බුන් වටිනාකම් ඇපකරයක් යටතේ ගෙවීමට අපේක්ෂිත මුදල පිළිබඳ සමූහයේ ඇස්තමේන්තුවේ වෙනසක් ඇති වූ විට හෝ සමූහය මිලදී ගැනීමක්, දිගුවක් හෝ අවසන් කිරීමේ විකල්පයක් ක්‍රියාත්මක කරන්නේද යන්න පිළිබඳ එහි තක්සේරුව වෙනස් කළහොත් එය නැවත මනිනු ලැබේ.

**භාවිත අයිතිය වත්කම්වල හානිකරණය**
වාර්තා කරන දින වන විට, සෑම ව්‍යාපාර ඒකකයක්ම සමාගමේ අවදානම් කළමනාකරණ උපාය මාර්ගයට අනුව ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් යටතේ ක්‍රියාත්මක වන අතර, හැකිතාක් දුරට රජයේ නියෝග දැඩි ලෙස පිළිපදින අතර සහ සහාය දක්වන බැවින්, ආර්ථික අර්බුදය හේතුවෙන් වත්කම් භාවිතයේ අයිතියට හානි වීම සම්බන්ධයෙන් සමූහය විසින් කිසිදු හානි කිරීමේ අලාභයක් හඳුනාගෙන නොමැත.

**3.5.4 ආයෝජන දේපල**
ආයෝජන දේපළ යනු කුලී ආදායම උපයා ගැනීමට හෝ ප්‍රාග්ධන අගය වැඩි කිරීමට හෝ දෙකම සඳහා තබා ගන්නා දේපළකි. ආයෝජන දේපළ මුලින් පිරිවැයට අනුව මනිනු ලබන අතර පසුව සාධාරණ වටිනාකමට වාර්ෂික පදනමක් මත ලාභය හෝ අලාභය තුල හඳුනා ගනු ලබන එහි ඕනෑම වෙනසක් සහිතව මනිනු ලැබේ.

බැහැර කිරීමේදී හෝ භාවිතයෙන් ස්ථිරව ඉවත් කරන විට, ආයෝජන දේපල තුලින් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන බැවින් ආයෝජන දේපල හඳුනා නොගනී. ආයෝජන දේපල ලබාදීමේ ඕනෑම ලාභ හෝ අලාභයක් (බැහැරකිරීමෙන් ලද ශුද්ධ ප්‍රතිලාභ සහ අයිතමයේ ධාරණ අගය අතර වෙනස ලෙස ගණනය කරනු ලැබේ) ලාභ හා අලාභ ගිණුමෙහි සටහන් කරනු ලැබේ. පෙර දේපල, පිරියත සහ උපකරණ ලෙස වර්ගීකරණය කර තිබූ ආයෝජන දේපල විකිණූ විට, ප්‍රත්‍යාගණන සංචිතයට ඇතුළත් කර ඇති අදාල වටිනාකමක් වේ නම් එය රඳවාගත් ඉපැයීම් වලට මාරු කරනු ලැබේ.

භාවිතයේ වෙනස්වීමක් තිබේ නම් ආයෝජන දේපල වලට මාරු කිරීම් සිදුකරනු ලැබේ. සමූහයේ සමාගමක් පරිපාලිත සමාගමක ආයෝජන දේපලක සැලකිය යුතු කොටසක් අත්පත් කරගෙන සිටින විට, එම ආයෝජන දේපල ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලදී දේපල, පිරියත සහ උපකරණ ලෙස සලකනු ලැබන අතර LKAS 16 – 'දේපල, පිරියත සහ උපකරණ' අනුව ගිණුම් කරනු ලැබේ.

**3.5.5 මූල්‍ය නොවන වත්කම් හානිකරණය**
සෑම වාර්තාකරණ දිනයකම, සමූහය තම මූල්‍ය නොවන වත්කම්වල (ආයෝජන දේපල, තොග සහ විලම්භිත කල බදු වත්කම් හැර) ධාරණ අගය සමාලෝචනය කර හානිකරණය පිළිබඳ යම් ඇඟවීමක් ඇත්ද යන්න තීරණය කරයි. එවන්නක් වේ නම්, වත්කමේ අයකරගත හැකි අගය ඇස්තමේන්තු කරනු ලැබේ. කීර්තිනාමය හානිකරණය සඳහා වාර්ෂිකව පරීක්ෂා කරනු ලැබේ.

වත්කමක හෝ මුදල් උපයන ඒකකයක (CGU) අයකරගත හැකි අගය යනු, එහි භාවිත අගය සහ සාධාරණ අගයෙන් විකිණීමේ වියදම් අඩු කළ පසු ලැබෙන අගය යන දෙකෙන් වඩා වැඩි අගයයි.

භාවිතයේ ඇති වටිනාකම තක්සේරු කිරීමේදී, ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් බදු ගෙවීමට පෙර වට්ටම් අනුපාතයක් භාවිතා කරමින් වත්මන් වටිනාකමේ කාලීන වටිනාකම සහ වත්කම් හෝ CGU සඳහා විශේෂිත අවදානම් පිළිබඳ වත්මන් වෙළඳපල තක්සේරු කිරීම් පිළිබිඹු කරන ඒවායේ වර්තමාන වටිනාකමට වට්ටම් කරනු ලැබේ.

වත්කමක හෝ මුදල් උපයන ඒකකයක (CGU) ප්‍රමාණය එහි අයකරගත හැකි අගය ඉක්මවා ගියහොත් හානිකරන අලාභයක් හඳුනාගනු ලැබේ. හානිකරණය අලාභ, ලාභ හා අලාභ ගිණුමෙහි සටහන් කරනු ලැබේ. ඒවා ප්‍රථමයෙන් CGU ට වෙන් කර ඇති කීර්තිනාමයේ ධාරණ අගය අඩුකිරීමට වෙන් කරනු ලැබන අතර, පසුව CGU හි අනෙකුත් වත්කම්වල වර්තන අගයට සමානුපාතිකව අඩුකිරීමට වෙන් කරනු ලැබේ.

කීර්තිනාමය සම්බන්ධ හානිකරණ අලාභ වෙනස් කල නොහැක. අනෙකුත් වත්කම් සඳහා, හානිකරණ අලාභයක් ආපසු වෙනස් කල හැකි වනුයේ, වත්කමේ ධාරණ අගය, කිසිදු හානිකරණ අලාභයක් හඳුනාගෙන නොමැති නම්, ක්ෂයවීම් හෝ ක්‍රමක්ෂය කිරීම් වලින් ශුද්ධව තීරණය කළ හැකි ධාරණ අගය ඉක්මවා නොයන තාක් දුරට පමණි.

**3.5.6 තොග**
පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් වඩා අඩු අගයට දක්වා ඇති සියලුම පරිභෝජන අයිතම තොග වලට ඇතුළත් වේ.

සමූහය සතුව ඇති තොගවල ස්වභාවය ඇගයීමෙන් පසු, ආර්ථික අර්බුදයේ ඇඟවුම් හේතුවෙන් තොගවල ශුද්ධ සාක්ෂාත් කරගත හැකි වටිනාකමට කිසියම් බලපෑමක් තිබේද යන්න සහ තොගවල ධාරණ අගය සකස් කිරීම අවශ්‍යද යන්න සමූහය විසින් තක්සේරු කර ඇත. තොගවල ධාරණ අගය අඩු කිරීම සඳහා ගැලපීම් අවශ්‍ය වන කිසිදු තත්වයක් සමූහය විසින් හඳුනාගෙන නොමැත.

**3.5.7 මූල්‍ය උපකරණ – LKAS 39**
සමාගම ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් පහත සඳහන් කාණ්ඩවලට වර්ගීකරණය කරයි: විකිණීමට ඇති මූල්‍ය වත්කම්, ණය සහ ලැබිය යුතු දේ, කල්පිරීම දක්වා රඳවා තබා ඇති මූල්‍ය වත්කම් සහ ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමකින් යුත් මූල්‍ය වත්කම් සමාගම ව්‍යුත්පන්න නොවන මූල්‍ය වගකීම් අනෙකුත් මූල්‍ය වගකීම් කාණ්ඩය යටතේ වර්ගීකරණය කරයි.

**3.5.7.1 ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්**
සමාගම මූලිකව ණය සහ ලැබිය යුතු දේ සහ උත්පාදනය කරන දිනයට නිකුත් කරන ලද ණය සුරැකුම්පත් හඳුනා ගනී. අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් (ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමින් නම් කරන ලද වත්කම් ඇතුළුව) මූලිකව හඳුනාගනු ලබන්නේ සමාගම උපකරණයේ ගිවිසුම්ගත විධිවිධානවලට පාර්ශවකරුවෙකු වන වෙළඳ දිනයේදීය.

මූල්‍ය වත්කමක් මූලිකව සාධාරණ අගයට මනිනු ලැබේ. ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයට ගණනය නොකරන වත්කමක් සඳහා, එම වත්කම ලබා ගැනීමට හෝ නිකුත් කිරීමට ඍජුවම අදාළ ගනුදෙනු වියදම්ද එකතු කරනු ලැබේ.

මූල්‍ය වත්කමෙන් මුදල් ප්‍රවාහ සඳහා වන ගිවිසුම්ගත අයිතිවාසිකම් කල් ඉකුත් වූ විට හෝ මූල්‍ය වත්කමේ හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස මාරු කරන ලද ගනුදෙනුවකදී මූල්‍ය වත්කම මත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිවාසිකම් මාරු කළ විට සමාගම මූල්‍ය වත්කමක් හඳුනා නොගනී. සමාගම විසින් නිර්මාණය කරන ලද හෝ රඳවා ගන්නා ලද මාරු කරන ලද මූල්‍ය වත්කම්වල ඕනෑම පොලියක් වෙනම වත්කමක් හෝ වගකීමක් ලෙස පිළිගනු ලැබේ.

මූල්‍ය වත්කම් සහ වගකීම් පියවා ගනු ලබන අතර ශුද්ධ මුදල මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ඉදිරිපත් කරනු ලබන්නේ, සමාගමට දැනට නීත්‍යානුකූලව බලාත්මක කළ හැකි අයිතියක් ඇති විට සහ එම වටිනාකම පියවා ගැනීමට සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම සාක්ෂාත් කර ගැනීමට සහ වගකීම එකවර පියවීමට අදහස් කරන විට පමණි.

**පසුකාලීන මැනීම**
**(අ) විකිණීමට ඇති මූල්‍ය වත්කම් (AFS)**
විකිණීමට ඇති මූල්‍ය ආයෝජන යනු වෙළඳාම සඳහා රඳවා තබා ඇති ලෙස වර්ගීකරණය කර නොමැති හෝ ලාභ හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමට නම් කර නොමැති ඒවා වේ.

සාධාරණ අගයට මූලික මිනුම් කිරීමෙන් පසුව, විකිණීමට ඇති මූල්‍ය ආයෝජන පසුව සාධාරණ අගයට මනිනු ලබන අතර එහි වෙනස්කම් අනෙකුත් විස්තීර්ණ ආදායම තුල හඳුනාගෙන විකිණීමට ඇති සංචිතයේ රැස් කරනු ලැබේ.

මෙම වත්කම් හඳුනා නොගත් විට, ස්කන්ධය තුල සමුච්චය වූ ලාභය හෝ අලාභය, ලාභය හෝ අලාභය ලෙස නැවත වර්ගීකරණය කෙරේ. කෙටි කාලීනව විකිණීමට ඇති හැකියාව සහ අභිප්‍රාය තවමත් සුදුසු දැයි තීරණය කිරීම සඳහා සමාගම එහි විකිණීමට ඇති මූල්‍ය වත්කම් ඇගයීමට ලක් කරයි.අක්‍රිය වෙළඳපොළවල් හේතුවෙන් සමාගමට මෙම මූල්‍ය වත්කම් වෙළඳාම් කිරීමට නොහැකි වූ විට සහ කළමනාකාරිත්වයේ අභිප්‍රාය නුදුරු අනාගතයේ දී සැලකිය යුතු ලෙස වෙනස් වුවහොත්, දුර්ලභ අවස්ථාවන්හිදී සමාගමට මෙම මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කිරීමට තෝරා ගත හැකිය. මූල්‍ය වත්කම්, ණය සහ ලැබිය යුතු දේ වලට අදාළ අර්ථ දැක්වීම සපුරාලන විට සහ කළමනාකරණයට මෙම වත්කම් අපේක්ෂා කළ හැකි අනාගතය සඳහා හෝ කල් පිරීම දක්වා තබා ගැනීමට අභිප්‍රාය සහ හැකියාව ඇති විට ණය සහ ලැබිය යුතු දේ ලෙස මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කිරීමට අවසර දෙනු ලැබේ.

සමාගමේ විකිණීමට ලබා ගත හැකි මූල්‍ය ආයෝජන වෙළඳාම සඳහා පන්තිගත කර නොමැති හෝ ලාභ හා අලාභ හරහා සාධාරණ අගයට නම් කර නොමැති කොටස් සහ ණය සුරැකුම් විකිණීමට ඇති මූල්‍ය ආයෝජනවල අන්තර්ගත වේ.

**(ආ) ලාභ හා අලාභ තුලින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් (FVTPL)**
මූල්‍ය වත්කමක් ලාභ හා අලාභ හරහා සාධාරණ වටිනාකම ලෙස පන්තිගත කෙරෙන්නේ එය වෙළඳාම සඳහා රඳවා ගත් ලෙස පන්තිගත කර ඇති නම් හෝ ආරම්භක හඳුනාගැනීමේදී එලෙස නම් කර ඇත්නම් ය. සෘජුවම ගිණුම් ගත කළ හැකි ගනුදෙනු, වියදම් සිදුවන විට ලාභ හා අලාභ තුල හඳුනාගනු ලැබේ.

ලාභ හා අලාභ තුලින් සාධාරණ අගයේ මූල්‍ය වත්කම් සාධාරණ අගයට මනිනු ලබන අතර, ඕනෑම පොලී හෝ ලාභාංශ ආදායම් ඇතුළු ඒවායේ වෙනස්කම් ලාභ හා අලාභ තුල හඳුනාගනු ලැබේ.

වත්කම් සහ වගකීම් යනු සමාගම විසින් කළමනාකරණය කරනු ලබන මූල්‍ය වත්කම්, මූල්‍ය වගකීම් හෝ දෙකෙහිම කොටසක් වන අතර, සමූහයේ ආයෝජන උපාය මාර්ගයට අනුකූලව සාධාරණ අගය මත ඒවායේ කාර්ය සාධනය ඇගයීමට ලක් කෙරේ.

සමාගමේ ලාභය හෝ අලාභය තුලින් සාධාරණ අගයක් ඇති මූල්‍ය වත්කම් ලැයිස්තුගත කොටස් ආයෝජන වලින් සමන්විත වේ.

**(ඇ) කල්පිරෙන තුරු රඳවාගෙන සිටින මූල්‍ය වත්කම් (HTM)**
මේවා ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වන අතර සහ සමාගමට ඒවා කල්පිරෙන තෙක් තබා ගැනීමට අභිප්‍රාය සහ හැකියාව යන දෙකම ඇති විට කල්පිරීම දක්වා රඳවා තබා ගන්නා පරිදි වර්ගීකරණය කරන ලද ස්ථාවර කල්පිරීම් වේ. සාධාරණ අගයට සහ සෘජුවම ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැයට මෙම වත්කම් ප්‍රථමයෙන් හඳුනාගනු ලැබේ. මූලික පිළිගැනීමෙන් පසුව, ඒවා ඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂ කළ පිරිවැයට මනිනු ලැබේ.

කල්පිරීම දක්වා රඳවාගෙන ඇති මූල්‍ය වත්කම්වලට සමාගම විසින් සිදු කරන ලද භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජන ඇතුළත් වේ.

**(ඈ) ණය සහ ලැබීම්**
ණය සහ ලැබීම් යනු ක්‍රියාකාරී වෙළඳපොළක මිල ගණන් ඉදිරිපත් නොකරන ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහිත මූල්‍ය වත්කම් වේ. මෙම වත්කම් සාධාරණ අගයට සහ සෘජුවම ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැයට මූලිකව හඳුනාගනු ලබන්නේ ය. මූලික හඳුනාගැනීමෙන් පසුව, ණය සහ ලැබීම් ඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලැබේ.

ලැයිස්තුගත නොකළ ආයතනික ණය, කාලීන තැන්පතු, ඇප සහිත සුරැකුම්පත්, සංවර්ධන බැඳුම්කර, වාණිජ පත්‍රිකා, අනෙකුත් ණය සහ ලැබීම්, මුදල් සහ මුදල් සමාන දේවල ආයෝජන ණය සහ ලැබීම් වලට අන්තර්ගත වේ.

**ලැබිය යුතු ප්‍රතිරක්ෂණ**
සමාගම සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී රක්ෂණ අවදානම පිළිගත් ප්‍රතිරක්ෂණකරුවන්ට විධිමත් ප්‍රතිරක්ෂණ විධිවිධාන හරහා පවරා දෙයි. ප්‍රතිරක්ෂණ වත්කම්වලට ප්‍රතිරක්ෂණ සමාගම්වලින් ගෙවන ලද සහ නොගෙවූ පාඩු සඳහා ගෙවිය යුතු ශේෂයන් සහ අලාභ ගැලපුම් වියදම් ඇතුළත් වේ. ප්‍රතිරක්ෂණකරුවන්ගෙන් අයකර ගත හැකි මුදල්, ප්‍රතිරක්ෂණකරුගේ ප්‍රතිපත්ති හා සම්බන්ධ හිඟ හිමිකම් ප්‍රතිපාදන හෝ පියවීම් හිමිකම් වලට අනුකූල වන ආකාරයෙන් ඇස්තමේන්තු කර ඇති අතර ඒවා අදාළ ප්‍රතිරක්ෂණ ගිවිසුමට අනුකූල වේ. හිලව් කිරීමේ අයිතියක් නොමැති නම්, ප්‍රතිරක්ෂණයේ දළ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සටහන් වේ.

වාර්තා කරන සෑම දිනකම හෝ වාර්තා කරන වර්ෂය තුළ හානිකරණ ඇඟවීමක් මතු වූ විට, ප්‍රතිරක්ෂණ වත්කම් හානිකරණය සඳහා සමාලෝචනය කරනු ලැබේ.ප්‍ර තිරක්ෂණ වත්කම මුලින් හඳුනා ගැනීමෙන් පසු සිදු වූ සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස කොන්ත්‍රාත්තුවේ නියමයන් යටතේ ගෙවිය යුතු සියලුම හිඟ මුදල් සමාගමට නොලැබෙන බවට සාක්ෂි ඇති විට සහ එම සිදුවීම ප්‍රතිරක්ෂණකරුගෙන් සමූහයට ලැබෙන මුදල් ප්‍රමාණයන්ට විශ්වාසදායක ලෙස මැනිය හැකි බලපෑමක් ඇති කළ විට හානිකරණයක් ඇති වේ. කිසියම් හානිකරණ අලාභයක් වේ නම්, එය ලාභ අලාභ ගිණුමේ සටහන් වේ.

පවරා ඇති ප්‍රතිරක්ෂණ විධිවිධාන මගින් රක්ෂණ ඔප්පු හිමියන්ට ඇති බැඳීම් වලින් සමාගම නිදහස් නොවේ.

ගිවිසුම්ගත අයිතිවාසිකම් අවසන් වූ විට හෝ කල් ඉකුත් වූ විට හෝ ගිවිසුම වෙනත් පාර්ශවයකට මාරු කළ විට ප්‍රතිරක්ෂණ වත්කම් හෝ වගකීම් හඳුනා නොගනු ලැබේ.

**ලැබිය යුතු වාරික**
රක්ෂණ ලැබිය යුතු දේ ලැබිය යුතු විට හඳුනා ගනු ලබන අතර ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගයට අනුව මූලික පිළිගැනීම මත මනිනු ලැබේ. වාරික එකතු කිරීමේ හැකියාව අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කෙරේ.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) විසින් නිකුත් කරන ලද වාරික ගෙවීමේ වගකීම් (PPW) නියෝගයට අනුව, ජීවිත රක්ෂණ නොවන ප්‍රතිපත්ති, රක්ෂණ වාරික ගෙවීමේ ප්‍රතිඥාභාරයන්ට (PPW) ට යටත්ව නිකුත් කරනු ලබන අතර පියවා නොමැති නම් දින 60ක් ඉකුත් වූ පසු අවලංගු කරනු ලැබේ.

සමාගම උපචිත පදනම මත ජීවිත රක්ෂණ වාරික ගිණුම්ගත කරයි. ගෙවිය යුතු රක්ෂණ වාරික (දින 30 ක සහන කාලය තුළ ගෙවිය යුතු වාරික පමණක්) සෑම වාර්තා කිරීමේ දිනකම හඳුනා ගනු ලබන අතර ඊළඟ මාසය තුළ වාරික පියවා නොමැති නම් ඒවා ප්‍රතිවර්තනය කරනු ලබන අතර, එම නිසා සමාගම් ප්‍රතිපත්තියට අනුව ඔප්පු අවලංගු වේ.

ආර්ථික අර්බුදයේ ආර්ථික ගමයාර්ථ සැලකිල්ලට ගනිමින්, 2024 දෙසැම්බර් 31 වන දිනට ලැබිය යුතු වාරික මුදල් අහිමි වීමේ විභවය සමූහය විසින් තක්සේරු කර ඇත. තක්සේරුව මත පදනම්ව, ලැබිය යුතු වාරික මුදල් සම්බන්ධයෙන් වාර්තා කරන දිනට මූල්‍ය ප්‍රකාශනවල කිසිදු හානිකරණ ප්‍රතිපාදනයක් සිදු කිරීම අවශ්‍ය නොවේ.

**අනෙකුත් ලැබිය යුතු සහ සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු හිඟ**
පිරිවැයෙන් බොල්ණය සහ අවිනිශ්චිත ලැබිය යුතු වටිනාකම් අඩුකිරීමෙන් අනෙකුත් ලැබිය යුතු සහ අදාළ පාර්ශවයන්ගෙන් ලැබිය යුතු හිඟ හඳුනාගනු ලැබේ.

**මුදල් සහ මුදල් සමාන දෑ**
මුදල් සහ මුදල් සමාන දේවලට ප්‍රතිලෝම ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම්, මුදල් ශේෂයන් සහ අත්පත් කර ගැනීමේ දිනයේ සිට මාස තුනක් හෝ ඊට අඩු කල්පිරීම් සහිත ඒක්ෂණ තැන්පතු ඇතුළත් වන අතර ඒවා සාධාරණ වටිනාකමෙහි වෙනස්කම් සඳහා සැලකිය යුතු අවදානමකට යටත් වන අතර සමූහය විසින් එහි කෙටි කාලීන බැඳීම් කළමනාකරණය කිරීමේදී භාවිතා කරනු ලැබේ.

### 3.5.7.2 ව්‍යුත්පන්න නොවන මූල්‍ය වගකීම්
නිකුත් කරන ලද ණය සුරකුම්පත් සහ යටත් වගකීම් සමාගම මුලින් මූලිකව හඳුනා ගනු ලබනුයේ ඒවා ආරම්භ වූ දිනයේ දී ය. අනෙකුත් සියලුම මූල්‍ය වගකීම් වෙළඳ දිනයේදී එනම් සමූහය උපකරණයේ ගිවිසුම්ගත විධිවිධානවලට පාර්ශවයක් බවට පත්වන දිනයේදී ප්‍රථමයෙන් හඳුනාගනු ලබන්නේ ය.

අනෙකුත් මූල්‍ය වගකීම්, සාධාරණ අගයෙන් සෘජුවම ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය අඩු කිරීමෙන් ලැබෙන අගයට මූලිකව මනිනු ලැබේ. මූලික හඳුනාගැනීමෙන් පසුව, මෙම වගකීම් ඵලදායී පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය කළ පිරිවැයකින් මනිනු ලැබේ.

ගිවිසුම්ගත බැඳීම් ඉටු කළ විට, අවලංගු කළ විට හෝ කල් ඉකුත් වූ විට සමාගම මූල්‍ය වගකීමක් හඳුනා නොගනී.

සමූහයේ අනෙකුත් මූල්‍ය වගකීම් අතරට ණය සහ ණය ගැනීම්, බැංකු අයිරා සහ වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ ඇතුළත් වේ.

### 3.5.8 මූල්‍ය වත්කම් හානිකරණය (ව්‍යුත්පන්න නොකළ)
ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කර නොමැති මූල්‍ය වත්කම්, හානිකරණය පිළිබඳ සාක්ෂි තිබේද යන්න තීරණය කිරීම සඳහා සෑම වාර්තාකරණ දිනකම තක්සේරු කරනු ලැබේ.

මූල්‍ය වත්කම් හානි වී ඇති බවට සාක්ෂි අතරට පහත සඳහන් දෑ ඇතුළත් වේ.

- ණයගැතියෙකු විසින් පැහැර හැරීම හෝ නොගෙවා සිටීම
- ණයගැතියෙකු හෝ නිකුත් කරන්නෙකු බංකොලොත්භාවයට ඇතුළු වන බවට ඇඟවීම්
- ණය ගැතියන්ගේ හෝ නිකුත් කරන්නන්ගේ ගෙවීම් තත්ත්වයේ අහිතකර වෙනස්කම්
- මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් හෝ මූල්‍ය වත්කම් සමූහයකින් අපේක්ෂිත මුදල් ප්‍රවාහයේ මැනිය හැකි අඩුවීමක් ඇති බව පෙන්නුම් කරන නිරීක්ෂණය කළ හැකි දත්ත හේතුවෙන් ආරක්ෂාව උදෙසා ක්‍රියාකාරී වෙළඳපොළ අතුරුදහන් වීම

විකිණීමට ඇති කොටස් ආයෝජන සම්බන්ධයෙන්, සාක්ෂි අතරට ආයෝජනයේ සාධාරණ අගය එහි පිරිවැයට වඩා "සැලකිය යුතු" හෝ "දීර්ඝකාලීන" පහත වැටීමක් ද ඇතුළත් වේ.

### 3.5.8.1 ක්‍රමක්ෂය පිරිවැයට දක්වන මූල්‍ය වත්කම්
මෙම වත්කම් සඳහා හානිවීම් පිළිබඳ සාක්ෂි ඒකල මට්ටමින් සහ සාමූහික මට්ටමින් යන දෙකෙහිම සලකා බලනු ලැබේ. සියලුම තනි තනිව සැලකිය යුතු වත්කම් හානිකරණය සඳහා තනි තනිව තක්සේරු කරනු ලැබේ. හානිකරණයට භාජනය වූ බව තනි තනිව හඳුනාගෙන නොමැති වත්කම් සඳහා, හානිකරණයට භාජනය නොවූ බව හඳුනාගත් වත්කම්, සාමූහිකව ඇස්තමේන්තු කරනු ලැබේ. තනි තනිව සැලකිය යුතු නොවන වත්කම්, හානිකරණය සඳහා සාමූහිකව ඇස්තමේන්තු කරනු ලැබේ. සමාන අවදානම් ලක්ෂණ සහිත වත්කම් එකට කාණ්ඩගත කරමින් සාමූහික ඇස්තමේන්තුව සිදු කරනු ලැබේ.

වත්කමක ධාරණ අගය සහ වත්කමේ මුල් ඵලදායී පොලී අනුපාතයට වට්ටම් කරන ලද ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන වටිනාකම අතර වෙනස ලෙස හානිකරණ අලාභය ගණනය කෙරේ. අලාභය ලාභ හෝ අලාභ ගිණුම තුල හඳුනාගෙන අත්තිකාරම් ගිණුමක පිළිබිඹු කරනු ලැබේ. පසුව හානි කිරීමේ අලාභයේ ප්‍රමාණය අඩු වුවහොත් සහ අඩුවීම හානිකරණය හඳුනා ගැනීමෙන් පසු සිදුවන සිදුවීමකට සම්බන්ධ කළ හැකි නම්, කලින් හඳුනාගත් හානිකරණ අලාභය ලාභය හෝ අලාභය හරහා ප්‍රතිවර්තනය කෙරේ.

**3.5.8.2 විකිණීමට මූල්‍ය වත්කම් (AFS)**
විකිණීමට ඇති මූල්‍ය වත්කම්වල හානිකරණ අලාභය හඳුනාගනු ලබන්නේ විකිණීමට ඇති සංචිතයේ එකතු වී ඇති අලාභ, ලාභය හෝ අලාභය ලෙස නැවත වර්ගීකරණය කිරීමෙනි. නැවත වර්ගීකරණය කරන ලද වටිනාකම යනු අත්පත් කර ගැනීමේ පිරිවැය (ඕනෑම ප්‍රධාන ආපසු ගෙවීමක සහ ක්‍රමක්ෂයක ශුද්ධ) සහ වත්මන් සාධාරණ අගයෙන් ලාභය හෝ අලාභ තුල කලින් හඳුනාගෙන ඇති ඕනෑම හානිකරණ පාඩුවක් අඩු කිරීමෙන් ලැබෙන අගය අතර වෙනස වේ.

විකිණීමට ඇති හානිකරණයට ලක්වූ ණය සුරැකුමක සාධාරණ අගය පසුව වැඩි වුවහොත් සහ වැඩිවීම හානිකරණ අලාභය හඳුනා ගැනීමෙන් පසු සිදුවන සිදුවීමකට සම්බන්ධ කළ හැකි නම්, හානිකරණ අලාභය ලාභය හෝ අලාභය හරහා ආපසු ප්‍රතිවර්තනය කල හැකිය. විකිණීමට ඇති හිමිකම් උපකරණයක ආයෝජනයක් සඳහා ලාභය හෝ අලාභය තුළ හඳුනාගෙන ඇති හානිකරණ අලාභ ලාභය හෝ අලාභය හරහා ප්‍රතිවර්තනය කල නොහැක.

**3.5.9 මූල්‍ය උපකරණ - SLFRS 09**
SLFRS 09 මගින් මූල්‍ය වත්කම්, මූල්‍ය වගකීම් සහ මූල්‍ය නොවන අයිතම මිලදී ගැනීම හෝ විකිණීම සඳහා වන ඇතැම් ගිවිසුම් හඳුනා ගැනීම සහ මැනීම පිළිබඳ අවශ්‍යතා දක්වා ඇත. මෙම ප්‍රමිතිය මගින් LKAS 39 මූල්‍ය උපකරණ: හඳුනාගැනීම සහ මැනීම ප්‍රතිස්ථාපනය කරයි. අතිරේකව, සමූහය විසින් SLFRS 07 මූල්‍ය උපකරණ සඳහා ආනුෂාංගික සංශෝධන සම්මත කර ඇත: 2018 පිළිබඳ හෙළිදරව් කිරීම් සඳහා මෙය අදාළ වන නමුත් සාමාන්‍යයෙන් සංසන්දනාත්මක තොරතුරු සඳහා යොදා නොගනී.

SLFRS 09 හි මූල්‍ය වත්කම් සඳහා ප්‍රධාන වර්ගීකරණ කාණ්ඩ තුනක් අඩංගු වේ: ක්‍රමක්ෂය, පිරිවැයට වෙනත් විස්තීර්ණ ආදායම තුලින් සාධාරණ අගය (FVOCI) සහ ලාභය හෝ අලාභය තුලින් සාධාරණ අගයට (FVTPL) කළ පිරිවැය අනුව මනිනු ලබන වශයෙනි. SLFRS 09 යටතේ මූල්‍ය වත්කම් වර්ගීකරණය සාමාන්‍යයෙන් මූල්‍ය වත්කමක් කළමනාකරණය කරන ව්‍යාපාර ආකෘතිය සහ එහි ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ මත පදනම් වේ. SLFRS 09 මගින් කල්පිරීම දක්වා රඳවාගෙන ඇති, ණය සහ ලැබිය යුතු සහ විකිණීමට ඇති වශයෙන් වූ පෙර LKAS 39 යටතේ දක්වන ලද කාණ්ඩ ඉවත් කරනු ලබයි.

LKAS 39 යටතේ කලින් ණය සහ ලැබිය යුතු ලෙස කලින් වර්ගීකරණය කරන ලද වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දේ, මුදල් සහ මුදල් සමාන දේ සහ සම්බන්ධිත පාර්ශව ලැබිය යුතු දේ, SLFRS 09 යටතේ ක්‍රමක්ෂ පිරිවැය ලෙස වර්ගීකරණය කර ඇත.

මූල්‍ය වගකීම් වර්ගීකරණය සහ මැනීම සඳහා LKAS 39 හි පවතින අවශ්‍යතා SLFRS 09 බොහෝ දුරට රඳවා තබා ගන්නා අතර, මූල්‍ය වගකීම්වලට අදාළ සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති මත වූ බලපෑම හැර, ප්‍රමිතිය අනුගමනය කිරීම සමූහයට සැලකිය යුතු බලපෑමක් ඇති කර නොමැත.

**3.5.10 විලම්භිත වියදම්**
**විලම්භිත අත්පත්කර ගැනීමේ පිරිවැය (DAC)**
විලම්භිත අත්පත්කර ගැනීමේ පිරිවැය (DAC) අදාළ වන්නේ ජීවිත රක්ෂණ නොවන ගිවිසුම් සඳහා පමණි. අත්පත් කර ගැනීමේ පිරිවැය උපයන ලද ආදායමට අනුකූලව දරනු ලබන බැවින් ජීවිත රක්ෂණ ගිවිසුම් සඳහා DAC ගණනය නොකෙරේ.

රක්ෂණ ගිවිසුම් ලිවීමෙන් හෝ අලුත් කිරීමෙන් පැන නගින මූල්‍ය කාල සීමාව තුළ දරනු ලබන ඍජු හා වක්‍ර වියදම්, අදාළ ආදායම් උපයන කාල සීමාව තුළ විලම්භනය කර ක්‍රමක්ෂය කරනු ලැබේ. අනෙකුත් සියලුම අත්පත් කර ගැනීමේ වියදම්, වියදම් දැරූ විට වියදමක් ලෙස පිළිගනු ලැබේ. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ (IRCSL) පවතින නියාමන මාර්ගෝපදේශයන්ට අනුකූලව, 365 පදනම මත DAC ගණනය කරනු ලැබේ.

අදාළ ගිවිසුම් සමථයකට පත් කළ විට හෝ බැහැර කළ විට විලම්භිත අත්පත්කර ගැනීමේ පිරිවැය (DAC) පිළිගැනීම අවලංගු වේ.

**3.5.11 ප්‍රකාශිත ප්‍රාග්ධනය**
සාමාන්‍ය කොටස් ස්කන්ධය ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

සාමාන්‍ය කොටස් නිකුත් කිරීමට ඍජුව ආරෝපණය කළ හැකි අතිරේක පිරිවැයන්, ඕනෑම බදු බලපෑමක් අඩු කළ පසු, කොටස් ප්‍රාග්ධනයෙන් අඩු කිරීමක් ලෙස හඳුනාගනු ලැබේ.

**කොටස් ප්‍රතිමිලදී ගැනීම**
2007 අංක 07 දරන පනත යටතේ, සමාගමකට පනතේ විධිවිධාන අනුව හෝ අධිකරණ නියෝගයක් මත පදනම්ව තමන්ගේම කොටස් මිලදී ගැනීමට හෝ අත්පත්කර ගැනීමට හැකියාව ඇත. මෙම විධිවිධානය මගින් සමාගම්වලට නීතිමය සහ නියාමන අවශ්‍යතාවලට යටත්ව ඔවුන්ගේ කොටස් ප්‍රාග්ධනය සහ හිමිකාරිත්ව ව්‍යුහය කළමනාකරණය කිරීමේ නම්‍යශීලීත්වයක් ලබා දෙයි.

**3.5.12 වගකීම් සහ වෙන්කිරීම්**

**3.5.12.1 රක්ෂණ ගිවිසුම් වගකීම්**

**රක්ෂණ වෙන්කිරීම – ජීවිත රක්ෂණය**

ගිවිසුම්වලට එළඹෙන විට සහ වාරික අය කරන විට ජීවිත රක්ෂණ වගකීම් හඳුනා ගැනේ. මෙම වගකීම් මනිනු ලබන්නේ ශුද්ධ වාරික ක්‍රමය භාවිතා කිරීමෙනි. වගකීම තීරණය කරනු ලබන්නේ භාවිතා කරන ලද තක්සේරු උපකල්පන මත පදනම්ව, අනාගත මුදල් පිටතට ගලායාම සපුරාලීමට අවශ්‍ය වන අපේක්ෂිත අනාගත වාරිකවල වට්ටම් කළ වටිනාකම, අපේක්ෂිත අනාගත ප්‍රතිලාභවල වට්ටම් කළ වටිනාකමේ එකතුවෙන් අඩුකිරීමෙන් වගකීම තීරණය කරනු ලැබේ.

කාර්තුමය පදනම මත සහ වාර්ෂික පදනමින් IRCSL විසින් සපයනු ලබන අනුපාත මත පදනම්ව මුදල් ප්‍රවාහ වට්ටම් කරනු ලැබේ. අහිතකර අපගමනයන් සඳහා ඉඩ සැලසීම සඳහා නියමිත අවදානම් රුචිය සහිත ප්‍රශස්ත ඇස්තමේන්තු අත්දැකීම මත පදනම්ව තක්සේරු උපකල්පන ව්‍යුත්පන්න කර ඇත. සහභාගී නොවන වගකීම් අවදානම් රහිත ප්‍රතිඵල භාවිතා කරමින් වට්ටම් කරනු ලැබේ.

සහභාගී වන රක්ෂණ අරමුදල් මට්ටමින් ලබා ගන්නා සහතික කළ ප්‍රතිලාභ වගකීම් සහ මුළු ප්‍රතිලාභ වගකීම්වල යන වටිනාකමෙන් ඉහළ අගය සහභාගී වන ප්‍රතිපත්ති වගකීම්වල වටිනාකම වශයෙන් සැලකේ. සහතික කළ ප්‍රතිලාභ වගකීම ගණනය කිරීමේදී, සහතික කළ ප්‍රතිලාභ පමණක් සලකා බලනු ලබන අතර, අවදානම් රහිත පොලී අනුපාත ප්‍රතිඵල වක්‍රය භාවිතයෙන් මුදල් ප්‍රවාහ වට්ටම් කරනු ලැබේ. මුළු ප්‍රතිලාභ වගකීමට සියලුම සහතික කළ සහ සහතික නොකළ ප්‍රතිලාභ ඇතුළත් වන අතර සහභාගී වන රක්ෂණ අරමුදලේ අරමුදල් පාදක ප්‍රතිලාභය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ වට්ටම් ලබා දේ.

තවද, දැනට කල් ඉකුත් වී ඇති ගිවිසුම් අනාගතයේදී නැවත පණ ගැන්වීම හේතුවෙන් ඇතිවිය හැකි වගකීම් ග්‍රහණය කරගැනීම සඳහා ගැලපීම් සිදු කරනු ලැබේ.

**ශ්‍රී.ලං.මු.නි.ප්‍ර. 4 (SLFRS 4)** - 'රක්ෂණ ගිවිසුම්' මගින් අවශ්‍ය පරිදි, සමාගම විසින් බාහිර රක්ෂණ ආයුගණකවරයෙකුගේ සහාය ඇතිව ජීවිත රක්ෂණ ගිවිසුම් වගකීම් සම්බන්ධයෙන් වගකීම් ප්‍රමාණතා පරීක්ෂණයක් (LAT) සිදු කර ඇත. වගකීම් ප්‍රමාණතා පරීක්ෂණය සිදු කිරීමේදී, හිමිකම් හැසිරවීම සහ ඔප්පු පරිපාලන වියදම්, ඔප්පු හිමියන්ගේ විකල්ප සහ ඇපකර වැනි අදාළ මුදල් ප්‍රවාහයන් මෙන්ම එවැනි වගකීම් සඳහා සහාය වන වත්කම් වලින් ලැබෙන ආයෝජන ආදායම ඇතුළුව, අනාගත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් පිළිබඳ වත්මන් ප්‍රශස්ත ඇස්තමේන්තු භාවිතා කරනු ලැබේ.

**රක්ෂණ වෙන්කිරීම – ජීවිත  නොවන රක්ෂණ**

ජීවිත  නොවන රක්ෂණ ගිවිසුම් වගකීම් අතරට වැයකරන ලද නමුත් වාර්තා නොකල (IBNR) සහ වැයකරන ලද නමුත් ප්‍රමාණවත් තරම් වාර්තා නොකල (IBNER) ඇතුළුව පවතින හිමිකම් ප්‍රතිපාදන, උපයා නොගත් වාරික සඳහා ප්‍රතිපාදන සහ වාරික ඌනතාවය සඳහා ප්‍රතිපාදන ඇතුළත් වේ.

උපයා නොගත් වාරික සංචිතය (UPR) තක්සේරු කිරීම 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ මාර්ගෝපදේශයන්ට අනුකූලව සිදු කරනු ලැබේ (එනම් 365 පදනම මත පදනම්ව). කෙසේ වෙතත්, අවදානම් කාලය  ගිවිසුම් කාලයට වඩා සැලකිය යුතු ලෙස වෙනස් වන ගිවිසුම් සඳහා, අවදානම් කාලය තුළ වාරික උපයා ගනු ලබන්නේ රක්ෂණ ආවරණයේ ප්‍රමාණයට සමානුපාතිකවය.

වැයකරන ලද නමුත් වාර්තා නොකළ (IBNR) සහ වැයකරන ලද නමුත් ප්‍රමාණවත් නොවන ලෙස වාර්තා කළ (IBNER) හිමිකම් සංචිතය ආයුගණකව ගණනය කෙරේ.

සමානකිරීමේ හෝ ව්‍යසනකාරී සංචිත සඳහා ප්‍රතිපාදන හඳුනාගෙන නොමැත. හිමිකම් පෑමක් ගෙවීමේ බැඳීම කල් ඉකුත් වූ විට, නිදහස් කළ විට හෝ අවලංගු කළ විට වගකීම් හඳුනා නොගනු ලැබේ. ශ්‍රී. ලං.මු.නි.ප්‍ර. 4 (SLFRS 04) - 'රක්ෂණ ගිවිසුම්' මගින් අවශ්‍ය පරිදි, සමාගම විසින් බාහිර ආයුගණකවරයකුගේ සහාය ඇතිව ජීවිත රක්ෂණ නොවන ගිවිසුම් වගකීම් සම්බන්ධයෙන් වගකීම් ප්‍රමාණතා පරීක්ෂණයක් (LAT) සිදු කරන ලදි.

**3.5.12.2 හිමිකම් රක්ෂණ රක්ෂිතය**

හිමිකම් රක්ෂණ ඔප්පු වලින් පැන නගින විභව හිමිකම් ගෙවීම සඳහා සමාගම විසින් හිමිකම් රක්ෂණ සංචිතය පවත්වාගෙන යනු ලැබේ. හිමිකම් රක්ෂණ ඔප්පු සාමාන්‍යයෙන් වසර 5ක් හෝ ඊට වැඩි කාලයක් සඳහා නිකුත් කරනු ලැබේ. මේ අනුව, රක්ෂණ ඔප්පුවේ පළමු වසර තුළ  හිමිකම් පෑමේ ඉහළ සම්භාවිතාවක් පවතින බැවින්  එම වසර තුල කිසිදු ලාභයක් හඳුනා ගනු නොලැබේ. 02 වන වසරේ සිට, ලැබුණු වාරිකය ක්‍රමක්ෂය කිරීමෙන් ලාභය හඳුනා ගනු ලබන අතර සරල මාර්ගික ක්‍රමය භාවිතයෙන් රක්ෂණ ඔප්පුවේ ඉතිරි කාලය පුරා බෙදා හරිනු ලැබේ. 02 වන වසරේ සිට, ලැබුණු වාරිකය ක්‍රමක්ෂය කිරීමෙන් ලාභය හඳුනා ගනු ලබන අතර සරල මාර්ගික ක්‍රමය භාවිතයෙන් රක්ෂණ ඔප්පුවේ ඉතිරි කාලය පුරා බෙදා හරිනු ලැබේ. පළමු වසර සඳහා ලාභය 02 වන වසර තුළ පමණක් හඳුනා ගනු ලබන අතර ඉන් පසුව එය වරින් වර හඳුනා ගනු ලැබේ.

නිකුත් කරන ලද හිමිකම් රක්ෂණ ඔප්පුවේ අනුරූප ණය මුදල කල්පිරීමට පෙර පියවනු ලැබුවහොත්, එම ණය පියවීමේ දිනයේ ඉතිරිව ඇති එවැනි ඔප්පුවල සම්පූර්ණ වාරිකය අදාළ බැංකුව විසින් තහවුරු කිරීමෙන් පසු ලාභය හෝ අලාභය ලෙස පිළිගනු ලැබේ.

### 3.5.12.3 වෙන්කිරීම් (රක්ෂණ ගිවිසුම් හැර)
සමූහයකට/සමාගමකට අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස නෛතික හෝ ඵලදායී බැඳීමක් ඇති විට සහ එම බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලා යාමක් අවශ්‍ය වන විට සහ එය විශ්වාසදායක ලෙස මැනිය හැකි විට, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුල වෙන් කිරීම් හඳුනාගනු ලැබේ. රක්ෂණ ගිවිසුම් මත හැර අනෙකුත් වෙන් කිරීම තීරණය කරනු ලබන්නේ, මුදල්වල කාලීන වටිනාකම පිළිබඳ වත්මන් වෙළඳපල තක්සේරුව සහ වගකීමට විශේෂිත වූ අවදානම් පිළිබිඹු කරන, බදු ගෙවීමට පෙර අනුපාතයකට අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කිරීමෙනි.

## 3.6 බැඳීම් සහ අසම්භාව්‍ය වගකීම්
අසම්භාව්‍ය වගකීම් යනු විය හැකි බැඳීම් වන අතර, ඒවායේ පැවැත්ම තහවුරු වන්නේ සමූහයේ/සමාගමේ පාලනයට සම්පූර්ණයෙන්ම යටත් නොවන හෝ ආර්ථික ප්‍රතිලාභ මාරු කිරීම සිදුවිය නොහැකි හෝ විශ්වාසදායක ලෙස මැනිය නොහැකි වර්තමාන බැඳීම්වලට යටත් නොවන අවිනිශ්චිත අනාගත සිදුවීම් සිදුවීමෙන් හෝ සිදු නොවීමෙන් පමණි.

සමූහයේ/සමාගමේ ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශනවල අදාළ සටහන්වල හෙළිදරව් කර ඇත.

## 3.7 ඛණ්ඩමය වාර්තාකරණය
මෙහෙයුම් ඛණ්ඩයක් යනු යනු ව්‍යාපාරික කටයුතුවල නියැලෙන ආදායම් උපයා ගත හැකි සහ වියදම් දැරීමට සිදුවන සමූහයක අංගයකි. සමූහයේ අනෙකුත් සංරචක සමඟ ගනුදෙනුවලට අදාළ ආදායම් සහ වියදම් ද ඊට ඇතුළත් වේ. ඛණ්ඩ සඳහා වෙන් කළ යුතු සම්පත් සහ එහි කාර්ය සාධනය තක්සේරු කිරීම සහ තීරණ ගැනීම සඳහා සහය ලබා ගත හැකි විවික්ත මූල්‍ය තොරතුරු ප්‍රධාන විධායක නිලධාරී (CEO) විසින් සියලුම මෙහෙයුම් ප්‍රතිඵල නිතිපතා සමාලෝචනය කරනු ලැබේ.

ප්‍රධාන විධායක නිලධාරියා වෙත වාර්තා කරන ලද ඛණ්ඩිත ප්‍රතිඵල තුල, ඛණ්ඩයකට සෘජුවම ආරෝපණය කළ හැකි අයිතම මෙන්ම සාධාරණ පදනමක් මත වෙන් කළ හැකි අයිතමද ඇතුළත් වේ. ඒ අනුව, සමූහයේ ඛණ්ඩික තොරතුරු මගින් ජීවිත නොවන රක්ෂණ, ජීවිත රක්ෂණ, සෞඛ්‍ය සේවා, බලශක්ති සහ අනෙකුත් ඛණ්ඩ පිළිබිඹු වේ. ඛණ්ඩ අතර මාරු කිරීම් සාධාරණ වෙළඳපල මිල ගණන් මත පදනම් වේ.

## 3.8 කොටසකට ඉපැයීම් (EPS)
සමූහය එහි සාමාන්‍ය කොටස් හිමියන් සඳහා මූලික සහ තනුක කළ කොටසකට ඉපැයීම් දත්ත ඉදිරිපත් කරයි. මූලික EPS ගණනය කරනු ලබන්නේ LKAS 33 අනුව, සමූහයේ සාමාන්‍ය කොටස් හිමියන්ට ආරෝපණය කළ හැකි ලාභය හෝ අලාභය, බරිත සාමාන්‍ය කොටස් සංඛ්‍යාවෙන් බෙදීමෙනි. කොටසකට තනුක කළ ඉපැයීම් ගණනය කිරීමේදී කොටස්වල තනුක කළ බලපෑම සලකා බලනු ලැබේ.

## 3.9 යෝජිත ලාභාංශ
වාර්තා කරන දිනයෙන් පසු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා කරන ලද ලාභාංශය වගකීමක් ලෙස හඳුනා නොගන්නා අතර එය මූල්‍ය ප්‍රකාශන සඳහා සටහනක් ලෙස පමණක් අනාවරණය කරනු ලැබේ. වාර්ෂික මහා සභා රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා කරන ලද ලාභාංශය කොටස් හිමියන් විසින් අනුමත කරන අවස්ථාවේ දී පමණක් හඳුනා ගනු ලැබේ.

## 3.10 වාර්තාකරණ දිනයෙන් පසු සිදුවන සිදුවීම්
වාර්තාකරණ කාල සීමාවෙන් පසු සිදුවීම් යනු වාර්තාකරණ දිනය සහ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අවසර දී ඇති දිනය අතර සිදුවන හිතකර සහ අහිතකර සිදුවීම් වේ. වාර්තාකරණ දිනයෙන් පසු ඇති සියලුම වැදගත් සිදුවීම් සලකා බලා ඇති අතර සුදුසු අවස්ථාවලදී, මූල්‍ය ප්‍රකාශනවල අදාළ සටහන් වල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කර ඇත. වැඩිදුර සටහන් 47 සටහනේ ඇතුළත් කර ඇත.

## 3.11 මුදල් ප්‍රවාහ ප්‍රකාශය
ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක (LKAS) 7 'මුදල් ප්‍රවාහ ප්‍රකාශනය' ට අනුකූලව මුදල් ප්‍රවාහ සකස් කිරීමේ වක්‍ර ක්‍රමය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇත. මුදල් ප්‍රවාහ අරමුණු සඳහා, බැංකු අයිරා අඩුකල පසු සහ මුදල් සමාන දෑ ඉදිරිපත් කරනු ලැබේ.

# 4. නිකුත් කර ඇති නමුත් වාර්තාකරණ දිනට බලාත්මක නොවන ගිණුම්කරණ ප්‍රමිතීන්
## 4.1 ගිණුම්කරණ ප්‍රමිතිවල වෙනස්කම්
සමාගම විසින් පළමු වරට ඇතැම් ප්‍රමිතීන් සහ සංශෝධන අදාළ කරගන්නා ලද අතර, ඒවා 2024 ජනවාරි 01 වන දින හෝ ඉන් පසු ආරම්භ වන වාර්ෂික කාල පරිච්ඡේද සඳහා බලපැවැත්වේ.

| ගිණුම්කරණ ප්‍රමිතිය | විස්තරය | ක්‍රියාත්මක වන දිනය |
|---|---|---|
| LKAS 1 හි සංශෝධන මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම | ජංගම හෝ ජංගම නොවන ලෙස වගකීම් වර්ගීකරණය, ජංගම නොවන ගිවිසුම් සහිත වගකීම් | 2024 ජනවාරි 1 |
| IFRS 16 හි සංශෝධන කල්බදු | විකිණීම් සහ කල්බදු ආපසු දීමේ කල්බදු වගකීම | 2024 ජනවාරි 1 |
| LKAS 7 මුදල් ප්‍රවාහ ප්‍රකාශ සහ SLFRS 7 මූල්‍ය සංරචක අනාවරණය හි සංශෝධන | සැපයුම්කරු මූල්‍ය ගිවිසුම් | 2024 ජනවාරි 1 |
| LKAS 12 හි සංශෝධන | ජාත්‍යන්තර බදු ප්‍රතිසංස්කරණ - ද්විත්ව ස්තම්භ ආදර්ශ නීතිය | 2024 ජනවාරි 1 |

## 4.2. නිකුත් කරන ලද නමුත් බලාත්මක නොවූ බලපෑමක් ඇති කළ හැකි ප්‍රමිතීන්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පහත සඳහන් නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් නිකුත් කර ඇති අතර ඒවා 2025 ජනවාරි 01 වන දින හෝ ඊට පසු දිනකදී ආරම්භ වන මූල්‍ය කාල පරිච්ඡේද සඳහා අදාළ වනු ඇත.

නිකුත් කරන ලද නමුත් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන දිනයට බලාත්මක නොවූ නව සහ සංශෝධිත ප්‍රමිතීන් පහත දැක්වේ.

| ගිණුම්කරණ ප්‍රමිතිය | විස්තරය | ක්‍රියාත්මක වන දිනය |
|---|---|---|
| LKAS 21 හි සංශෝධන - විදේශීය විනිමය අනුපාත වෙනස්වීම්වල බලපෑම | විනිමය හැකියාව නොමැතිකම | 2025 ජනවාරි 01 |
| SLFRS S1 - තිරසාරත්වය සම්බන්ධ මූල්‍ය තොරතුරු හෙළිදරව් කිරීම සඳහා සාමාන්‍ය අවශ්‍යතා | සාමාන්‍ය කාර්යාල මූල්‍ය වාර්තා භාවිතකරන්නන්ට තීරණ ගැනීමේදී ප්‍රයෝජනවත් වන පරිදි එහි තිරසාරත්වය සම්බන්ධ අවදානම් සහ අවස්ථා පිළිබඳ තොරතුරු හෙළිදරව් කිරීම | 2025 ජනවාරි 01 |
| SLFRS S2 - දේශගුණික සම්බන්ධ හෙළිදරව් කිරීම් | සාමාන්‍ය කාර්යාල මූල්‍ය වාර්තා භාවිතකරන්නන්ට තීරණ ගැනීමේදී ප්‍රයෝජනවත් වන පරිදි එහි දේශගුණික අවදානම් සහ අවස්ථා පිළිබඳ තොරතුරු හෙළිදරව් කිරීම | 2025 ජනවාරි 01 |
| SLFRS 17 - රක්ෂණ ගිවිසුම් | රක්ෂණ ගිවිසුම් වගකීම වත්මන් ඉටුකිරීමේ වටිනාකමකින් මැනීම සහ සියලුම රක්ෂණ ගිවිසුම් සඳහා වඩා ඒකාකාර මිනුම් සහ ඉදිරිපත්කිරීමේ ප්‍රවේශයක් සැපයීම | 2026 ජනවාරි 01 |
| SLFRS 9 සහ SLFRS 7 හි සංශෝධන | මූල්‍ය උපකරණ වර්ගීකරණය සහ මිනුම් | 2026 ජනවාරි 01 |
| SLFRS 18 හි සංශෝධන | මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත්කිරීම සහ හෙළිදරව්කිරීම | 2027 ජනවාරි 01 |
| SLFRS 19 හි සංශෝධන | මහජන වගකීම් නොමැති අනුබද්ධ සමාගම්: හෙළිදරව්කිරීම් | 2027 ජනවාරි 01 |

**SLFRS 09 න් තාවකාලිකව බැහැර වීම**
**SLFRS 09 - "මූල්‍ය උපකරණ"**
මෙම ප්‍රමිතිය මගින් LKAS 39 - 'මූල්‍ය උපකරණ: හඳුනාගැනීම සහ මැනීම' හි පවතින මාර්ගෝපදේශ ප්‍රතිස්ථාපනය කරයි. SLFRS 9 හි මූල්‍ය උපකරණ වර්ගීකරණය සහ මිනුම් පිළිබඳ සංශෝධිත මාර්ගෝපදේශ, මූල්‍ය වත්කම්වල හානිකරණය ගණනය කිරීම සඳහා නව අපේක්ෂිත ණය අලාභ ආකෘතියක් සහ නව සාමාන්‍ය ආරක්ෂණ ගිණුම්කරණ අවශ්‍යතා ඇතුළත් වේ. SLFRS 09 2018 ජනවාරි 01 වන දින හෝ ඊට පසු ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාල පරිච්ඡේද සඳහා ක්‍රියාත්මක වන අතර, කලින් සම්මත කර ගැනීමට අවසර ඇත. SLICLL සහ SLICGL ප්‍රධාන වශයෙන් SLFRS 04 'රක්ෂණ ගිවිසුම්' සඳහා යෝජිත සංශෝධන මත පදනම් වී ඇති අතර, රක්ෂණ ගිවිසුම් නිකුත් කිරීම ප්‍රමුඛ ක්‍රියාකාරකම වන ආයතනවලට 2022 දී ආරම්භ වූ සංශෝධිත SLFRS 04 සම්මත කරන තෙක් SLFRS 09 හි සම්පූර්ණයෙන් අදාල කරගැනීම කල් දැමීමට අවසර ඇත. 2026 ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන දිනය වන IFRS 17 - රක්ෂණ ගිවිසුම් ගෝලීය වශයෙන් කල් දැමීමේ ප්‍රතිඵලයක් ලෙස, SLICLL සහ SLICGL තාවකාලික නිදහස් කිරීම 2026 ජනවාරි දක්වා කල් දැමීමට අපේක්ෂා කරයි.

රක්ෂණකරුවෙකුට SLFRS 09 සිට තාවකාලික සහන ක්‍රියාත්මක කළ හැක්කේ:
ආ) ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයක් ලෙස නම් කර ඇති මූල්‍ය වගකීම් මත ලාභ සහ අලාභ ඉදිරිපත් කිරීම සඳහා වන අවශ්‍යතා හැර, එය SLFRS 09 හි කිසිදු අනුවාදයක් මීට පෙර ක්‍රියාත්මක කර නොමැති වීම.
ආ) එහි ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් 2016 අප්‍රේල් 01 වන දිනට පෙර වාර්ෂික වාර්තාකරණ දිනය හෝ ඊට පසු වාර්ෂික වාර්තාකරණ දිනයකදී රක්ෂණය සමඟ සම්බන්ධ වීම.

SLFRS 04 - රක්ෂණ ගිවිසුමට කරන ලද සංශෝධනවලට අනුකූලව, රක්ෂණකරුවෙකුගේ ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් රක්ෂණය සමඟ සම්බන්ධ වන්නේ, පහත සඳහන් අවස්ථා වලදී පමණි:
අ)මෙම SLFRS හි විෂය පථය තුළ ඇති ගිවිසුම් වලින් පැන නගින එහි වගකීම්වල ධාරණ අගය, රක්ෂණ ගිවිසුම් වලින් වෙන් කරන ලද ඕනෑම තැන්පතු සංරචක හෝ සංග්‍රහිත අවකාශිත උපකරණ ඇතුළත් වන අතර, එහි සියලුම වගකීම්වල මුළු ධාරණ අගයට සාපේක්ෂව සැලකිය යුතු වේ. සහ
ආ) එහි සියලුම වගකීම්වල මුළු ධාරණ අගයට සාපේක්ෂව රක්ෂණයට සම්බන්ධ වගකීම්වල මුළු ධාරණ අගයේ ප්‍රතිශතය:
I. සියයට 90 ට වැඩි; හෝ
II. සියයට 90 ට අඩු හෝ සමාන නමුත් සියයට 80 ට වැඩි වන අතර, රක්ෂණකරු රක්ෂණයට සම්බන්ධ නොවන කිසිදු සැලකිය යුතු ක්‍රියාකාරකමක නිරත නොවේ.

SLFRS 09 වෙතින් තාවකාලික නිදහස් කිරීම, එහි ව්‍යාපාර කටයුතු ප්‍රධාන වශයෙන් රක්ෂණය සමඟ සම්බන්ධ වී ඇත්දැයි නැවත තක්සේරු කරනු ලබන්නේ, එම දිනයේ අවසන් වූ වාර්ෂික කාල සීමාව තුළ ආයතනයේ ව්‍යාපාර කටයුතුවල වෙනසක් සිදුවී ඇත්නම් සහ එසේ වුවහොත් පමණි.

සංශෝධිත SLFRS 04 සම්මත කර ගැනීමට ආසන්නව, සමාගම විසින් SLFRS 09 යටතේ තම ආයෝජන සුදුසු ලෙස වර්ගීකරණය කිරීම පිළිබඳව තීරණය කරනු ලබන අතර, එබැවින් වාර්තාකරණ දිනයේදී එහි මූල්‍ය ප්‍රකාශන කෙරෙහි SLFRS 09 සම්මත කර ගැනීමේ බලපෑම සම්පූර්ණයෙන්ම ගණනය කිරීමට නොහැකි වේ. කෙසේ වෙතත්, එය සමාගමේ මුළු කොටස් හිමිකම සැලකිය යුතු ලෙස වෙනස් නොවන බව අපේක්ෂා කෙරේ.

SLFRS 4 හි 20G පරිච්ඡේදයට අනුව, SLFRS 9 තාවකාලික නිදහස් කිරීම සඳහා කලින් සුදුසුකම් ලබා ඇති ආයතනයක්, වර්ෂය තුළ ආයතනයේ ව්‍යාපාර කටයුතුවල වෙනසක් සිදුවී ඇත්නම්, ඊළඟ සෑම වාර්ෂික වාර්තාකරණ දිනකම එහි ව්‍යාපාර කටයුතු ප්‍රධාන වශයෙන් රක්ෂණය සමඟ සම්බන්ධ වී තිබේද යන්න නැවත තක්සේරු කිරීමට අවශ්‍ය වේ.

SLFRS 4 හි 20J පරිච්ඡේදයට අනුව, නැවත තක්සේරු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ආයතනය තවදුරටත් නිදහස් කිරීම සඳහා සුදුසුකම් නොලබන්නේ නම්, එම නැවත තක්සේරුවෙන් පසු වහාම ආරම්භ වූ වාර්ෂික කාල සීමාව අවසන් වන තෙක් පමණක් SLFRS 9 වෙතින් තාවකාලික නිදහස් කිරීම දිගටම කරගෙන යාමට එයට අවසර ඇත. එසේ වුවද, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිර්දේශ කරන ලද නිදහස් කිරීමේ කාල සීමාව අවසන් වීමෙන් පසු පළමු වාර්ෂික වාර්තාකරණ කාල සීමාව ආරම්භයේ සිට ආයතනය SLFRS 9 යෙදිය යුතුය.

**SLFRS 17 – රක්ෂණ ගිවිසුම්**
SLFRS 17 2026 ජනවාරි 01 වන දිනෙන් ආරම්භ වන වාර්ෂික කාල පරිච්ඡේද සඳහා බලාත්මක වේ. මෙදිනට ප්‍රථම SLFRS 09 සහ SLFRS 15 අනුගමනය කර ගැනීමත් සමඟ, මෙය අනුගමනය කිරීමට  අවසර ඇත. SLFRS 17, SLFRS 04 රක්ෂණ ගිවිසුම් ප්‍රතිස්ථාපනය කරයි.  නව ප්‍රමිතිය එහි අනිවාර්ය ක්‍රියාත්මක වන දිනයේදී සම්මත කර ගැනීමට සමාගම විසින් අදහස් කරනු ලැබේ.

SLFRS 4 මඟින් රක්ෂණකරුවන්ට 2005 ජනවාරි මාසයට පෙර තම නීත්‍යානුකූල බල ප්‍රදේශයෙන් ඉවත් වූ රක්ෂණ වත්කම් සහ වගකීම් සඳහා ගිණුම්කරණයේ නීතිමය පදනම දිගටම භාවිතා කිරීමට අවසර ලබා දී ඇත. SLFRS 17 මගින් සියලුම රක්ෂණ ගිවිසුම් සඳහා නව මිනුම් ආකෘතියක් සමඟ පවතින ක්‍රමවේදය ප්‍රතිස්ථාපනය කරයි.

SLFRS 17 රක්ෂණ ගිවිසුම් සඳහා වගකීම් අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන වටිනාකම ලෙස පිළිගැනීමට අවශ්‍ය වන අතර, වත්මන් තත්ත්වයන් පිළිබිඹු කිරීම සඳහා සෑම වාර්තාකරණ දිනයකම යාවත්කාලීන කරන පැහැදිලි අවදානම් ගැලපීමක් සහ ඕනෑම දිනයකට සමාන සහ ප්‍රතිවිරුද්ධ ගිවිසුම් සේවා ආන්තිකයක් (CSM) ඇතුළත් වේ - මූලිකව පිළිගැනීම මත පැන නගින එක් ලාභයක්. අලාභ සෘජුවම ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ. මිනුම් අරමුණු සඳහා ගිවිසුම් සමාන අවදානම් ලාභදායිතා පැතිකඩක් සහ නිකුත් කළ වර්ෂයේ ගිවිසුම් ලෙස කාණ්ඩගත කර ඇති අතර, ගිවිසුම් සඳහා තවදුරටත් බෙදීම් වෙන වෙනම කළමනාකරණය කරනු ලැබේ.

SLFRS 17 යටතේ රක්ෂණ ගිවිසුම් සඳහා ලාභය, රක්ෂණ ඔප්පු හිමියන්ට සපයනු ලබන සේවාව පිළිගැනීම (CSM මුදා හැරීම), ආර්ථික නොවන අවදානම් වලින් නිදහස් කිරීම (අවදානම් ගැලපුම් මුදා හැරීම) සහ ආයෝජන ලාභය මගින් නිරූපණය කෙරේ.

රක්ෂණ ගිවිසුම ක්‍රියාත්මක වන කාලය තුළ, ගිවිසුම් සේවා ආන්තිකය (CSM) පියවරින් පියවර ලාභයක් ලෙස හඳුනාගනු ලැබේ. මෙය රක්ෂණ දාරකයාට සේවා සැපයීම පවතින බව පෙන්වයි. සහාගිදායක ලක්ෂණ සහිත රක්ෂණ ගිවිසුම්වලදී, රක්ෂණ දාරකයින්ට ආයෝජනවලින් ලැබෙන ලාභ බෙදාදෙන අතර, එවැනි ගිවිසුම්වල ගිවිසුම් සේවා ආන්තිකය  තුළ කොටස් හිමියන්ට අයත් විචල්‍ය ගාස්තුවක් ඇතුළත් වේ. මෙම වර්ගයේ ගිවිසුම් සඳහා, ආර්ථික අත්දැකීම් සහ ඇස්තමේන්තු වල වෙනස්කම් අනුව ගිවිසුම් සේවා ආන්තිකය යාවත්කාලීන කෙරේ. නමුත් අනෙකුත් සාමාන්‍ය ගිවිසුම්වලදී, ගිවිසුම් සේවා ආන්තිකය  යාවත්කාලීන කෙරෙන්නේ ආර්ථිකය නොවන උපකල්පන  සඳහා පමණි.

SLFRS 17 මඟින් රක්ෂණ ආදායම පිළිබඳ නව මිනුමක් හඳුන්වා දෙන අතර එය රක්ෂණ ඔප්පු හිමියන්ට සේවා සැපයීම මත පදනම් වන අතර ඔප්පු ආයෝජන අංගවලට අදාළ ඕනෑම වාරිකයක් බැහැර කරයි. එය දැනට ආදායම් ප්‍රකාශයේ වාර්තා කර ඇති පවතින වාරික ආදායම් මිනුම්වලට වඩා සැලකිය යුතු ලෙස වෙනස් වනු ඇත. SLFRS17 වෙත සංක්‍රමණය වීම සඳහා, ගිවිසුම් සේවා ආන්තිකය  සංක්‍රාන්ති දිනය මත පදනම්ව, විලම්භිත ලාභ ප්‍රමාණය තීරණය කළ යුතුය.

SLFRS 17 ට අනුව, ගිවිසුම් සේවා ආන්තිකය (CSM) ප්‍රමිතීන් අතීතයට අදාළ කර ඇති ආකාරයට ගණනය කළ යුතුය. මෙය ප්‍රායෝගික නොවේ නම්, ආයතනයක් සරල කළ අතීතයට අදාළ ප්‍රවේශයක් තෝරා ගැනීමට හෝ සංක්‍රාන්ති දිනයේ වගකීම්වල සාධාරණ වටිනාකමට යොමු කිරීමෙන් ගිවිසුම් සේවා ආන්තිකය තීරණය කිරීමට අවශ්‍ය වේ. ගිවිසුම් සේවා ආන්තිකය තීරණය කිරීම සඳහා වන ප්‍රවේශය අනාගත වාර්තාකරණ කාල පරිච්ඡේදවලදී කොටස් හිමියන්ගේ කොටස් සහ බලාත්මක ව්‍යාපාරයේ ලාභ ප්‍රමාණය යන දෙකටම සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ඇත.

නව ප්‍රමිතියේ අවශ්‍යතා සංකීර්ණ වන අතර රක්ෂණ ගිවිසුම් සඳහා ගිණුම්කරණයේ මූලික වෙනසක් මෙන්ම සැලකිය යුතු විනිශ්චයන් සහ නව ඇස්තමේන්තු ශිල්පීය ක්‍රම යෙදීම අවශ්‍ය වන බැවින්, මූල්‍ය ප්‍රකාශන සහ හෙළිදරව් කිරීම් ඉදිරිපත් කිරීමේදී SLFRS 17 සැලකිය යුතු වෙනසක් ඇති කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අවශ්‍ය වෙනස්කම්වල බලපෑම දැනට අවිනිශ්චිතය, නමුත් මෙම වෙනස්කම් වෙනත් දේ අතර ලාභ හඳුනාගැනීමේ කාලය වෙනස් කරනු ඇතැයි අපේක්ෂා කළ හැකිය.

SLFRS 17 ක්‍රියාත්මක කිරීමත් සමඟ, රක්ෂණ ආශ්‍රිත වත්කම් සහ වගකීම් සඳහා ඡායා ගිණුම්කරණය අදාළ නොවේ.

SLICLL සහ SLICGL අතර SLFRS 17 ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාත්මක කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වෙමින් පවතී. ගිණුම්කරණ ප්‍රතිපත්ති සැකසීම සහ යෙදුම් ක්‍රමවේද සංවර්ධනය කිරීම, සුදුසු ක්‍රියාවලීන් සහ පාලනයන් ස්ථාපිත කිරීම, සුදුසු දිනයක් ලබා ගැනීම සහ ආයුගණක සහ මූල්‍ය පද්ධති වෙනස්කම් ක්‍රියාත්මක කිරීම සඳහා මෙම වැඩසටහන වගකිව යුතුය.

### 4.3 ආංශික තොරතුරු

අංශයක් යනු සමූහයේ වෙන්කර හඳුනාගත හැකි සංරචකයක් වන අතර එය අදාළ නිෂ්පාදන හෝ සේවා සැපයීමේ (ව්‍යාපාර අංශය) හෝ විශේෂිත ආර්ථික පරිසරයක් තුළ නිෂ්පාදන හෝ සේවා සැපයීමේ නිරත වන අතර එය අනෙකුත් අංශවලට වඩා වෙනස් අවදානම් සහ ප්‍රතිලාභ වලට යටත් වේ. අංශ පිළිබඳ වාර්තා කිරීම සඳහා සමූහයේ ප්‍රාථමික ආකෘතිය ව්‍යාපාර අංශ මත පදනම් වේ. ව්‍යාපාර අංශ තීරණය කරනු ලබන්නේ සමූහයේ කළමනාකරණය සහ අභ්‍යන්තර වාර්තාකරණ ව්‍යුහය මත ය.

ආංශික ප්‍රතිඵල, වත්කම් සහ වගකීම් අතරට අංශයකට සෘජුවම ආරෝපණය කළ හැකි අයිතම මෙන්ම සාධාරණ පදනමක් මත වෙන් කළ හැකි අයිතම ද ඇතුළත් වේ.

කළමනාකරණ අරමුණු සඳහා, සමූහය එහි නිෂ්පාදන සහ සේවා මත පදනම්ව ව්‍යාපාරික ඒකකවලට සංවිධානය කර ඇති අතර පහත දක්වා ඇති පරිදි වාර්තා කළ හැකි මෙහෙයුම් අංශ පවතියි.

| වාර්තා කළ හැකි මෙහෙයුම් අංශ | පැහැදිලි කිරීම |
|---|---|
| ජීවිත රක්ෂණ | SLIC වෙන් කිරීමෙන් පසු ජීවිත රක්ෂණ ව්‍යාපාරය සිදු කිරීමට පිහිටුවන ලදි. |
| ජීවිත නොවන රක්ෂණ | SLIC වෙන් කිරීමෙන් පසු සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය සිදු කිරීමට පිහිටුවන ලදි. |
| සෞඛ්‍ය සේවා | සෞඛ්‍ය සේවා සහ රසායනාගාර සේවා සැපයීමට පිහිටුවන ලදි. |
| ආගන්තුක සත්කාර | වාණිජ අරමුණු සඳහා කාර්යාල ඉඩ කුලියට සැපයීමට සහ ආගන්තුක සත්කාර ව්‍යාපාරයේ නිරත වීමට පිහිටුවන ලදි. |
| බලශක්තිය | ද්‍රව පෙට්‍රෝලියම් වායු (LPG) ආනයනය, සැකසීම, ගබඩා කිරීම, බෙදා හැරීම සහ අලෙවි කිරීම සහ අනෙකුත් ආනුෂංගික සේවා සැපයීමට පිහිටුවන ලද්දේය. |

## 5 මූල්‍ය ආයොජනය

| දෙසැම්බර් 31 දිනට | සටහන | සමූහය | | | | සමාගම | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2024 | | 2023 | | 2024 | | 2023 | |
| | | ධාරණ අගය රු. 000' | සාධාරණ අගය රු. 000' | ධාරණ අගය රු. 000' | සාධාරණ අගය රු. 000' | ධාරණ අගය රු. 000' | සාධාරණ අගය රු. 000' | ධාරණ අගය රු. 000' | සාධාරණ අගය රු. 000' |
| **මූල්‍ය ආයොජන** | | | | | | | | | |
| කල්පිරීමට තබා ඇති මූල්‍ය වත්කම් (HTM) | 5.1 | **82,805,116** | **83,506,647** | 72,571,731 | 66,961,669 | - | - | 72,571,731 | 66,961,669 |
| ණය සහ ලැබීම් (L & R) | 5.2 | **52,926,445** | **53,554,545** | 66,276,591 | 66,276,591 | **2,146,539** | **2,146,539** | 59,300,582 | 59,300,582 |
| විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම් (AFS) | 5.3 | **160,387,039** | **160,387,039** | 102,644,036 | 102,644,036 | **41,085,639** | **41,085,639** | 102,644,036 | 102,644,036 |
| ලාභ හෝ අලාභ තුලින් සාධාරණ අගයට (FVTPL) මූල්‍ය වත්කම් | 5.4 | **20,278,447** | **20,278,447** | 16,592,638 | 16,592,638 | **2,010,130** | **2,010,130** | 16,592,638 | 16,592,638 |
| **මුළු මූල්‍ය ආයෝජන** | | **316,397,047** | **317,726,678** | 258,084,996 | 252,474,934 | **45,242,308** | **45,242,308** | 251,108,987 | 245,498,925 |

### 5.1 කල්පිරීමට තබා ඇති මූල්‍ය වත්කම් (HTM)

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| භාන්ඩාගාර බැඳුම්කර | **62,077,643** | **62,359,174** | 66,528,073 | 60,918,011 | - | - | 66,528,073 | 60,918,011 |
| ලැයිස්තුගත ණයකර | **20,727,473** | **21,147,473** | 6,043,658 | 6,043,658 | - | - | 6,043,658 | 6,043,658 |
| | **82,805,116** | **83,506,647** | 72,571,731 | 66,961,669 | - | - | 72,571,731 | 66,961,669 |

### 5.2 ණය සහ ලැබීම් (L සහ R)

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ලැයිස්තුගත නොකල ණයකර | **29,544,425** | **30,172,525** | 27,384,412 | 27,384,412 | - | - | 27,384,412 | 27,384,412 |
| නියොජිත ණය | **478,667** | **478,667** | - | - | - | - | - | - |
| කාලීන තැන්පතු | **20,718,817** | **20,718,817** | 38,892,179 | 38,892,179 | **2,146,539** | **2,146,539** | 31,916,170 | 31,916,170 |
| කාර්ය මණ්ඩල ණය සහ ලැබීම් | **2,184,536** | **2,184,536** | - | - | - | - | - | - |
| | **52,926,445** | **53,554,545** | 66,276,591 | 66,276,591 | **2,146,539** | **2,146,539** | 59,300,582 | 59,300,582 |

### 5.3 විකිණීම සඳහා පවතින (AFS)

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ලැයිස්තුගත කොටස් | **47,551,164** | **47,551,164** | 26,067,713 | 26,067,713 | **25,900,124** | **25,900,124** | 26,067,713 | 26,067,713 |
| ලැයිස්තුගත නොකල කොටස් | **6,389,015** | **6,389,015** | 5,926 | 5,926 | **5,934** | **5,934** | 5,926 | 5,926 |
| ඒකක භාර | **2,808,088** | **2,808,088** | 2,286,672 | 2,286,672 | - | - | 2,286,672 | 2,286,672 |
| ලැයිස්තුගත ණයකර | **20,694,685** | **20,694,685** | 29,948,862 | 29,948,862 | - | - | 29,948,862 | 29,948,862 |
| වාණිජ පත්‍රිකා | **38,485,072** | **38,485,072** | 16,368,416 | 16,368,416 | **15,179,581** | **15,179,581** | 16,368,416 | 16,368,416 |
| භාන්ඩාගාර බැඳුම්කර | **44,459,015** | **44,459,015** | 27,966,447 | 27,966,447 | - | - | 27,966,447 | 27,966,447 |
| | **160,387,039** | **160,387,039** | 102,644,036 | 102,644,036 | **41,085,639** | **41,085,639** | 102,644,036 | 102,644,036 |

### 5.4 ලාභ හෝ අලාභ තුලින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් (FVTPL)

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ලැයිස්තුගත කොටස් | **16,284,581** | **16,284,581** | 14,299,067 | 14,299,067 | **2,010,130** | **2,010,130** | 14,299,067 | 14,299,067 |
| ඒකක භාර | **3,993,866** | **3,993,866** | 2,293,571 | 2,293,571 | - | - | 2,293,571 | 2,293,571 |
| | **20,278,447** | **20,278,447** | 16,592,638 | 16,592,638 | **2,010,130** | **2,010,130** | 16,592,638 | 16,592,638 |

ලාභ හෝ අලාභ තුළින් සාධාරණ වටිනාකම මත ආයෝජන සහ විකිණීමට සඳහා ඇති ආයෝජන සාධාරණ වටිනාකමින් මනිනු ලැබේ. කල්පිරීමේ කාලය දක්වා රඳවා ගත් ආයෝජන සහ ණය හා ලැබිය යුතු දේ ක්‍රමක්ෂය කළ පිරිවැයෙන් මනිනු ලැබේ.

## 5 මූල්‍ය ආයොජන (ඉතිරි කොටස...)

### 5.5 ආයොජනවල ධාරණ අගයන්හි වෙනස්වීම්

| සමාගම | විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම් රු. 000 | ලාභ හෝ අලාභ තුලින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් රු. 000 | කල්පිරීම සඳහා පවතින මූල්‍ය වත්කම් රු. 000 | ණය සහ ලැබීම් රු. 000 | එකතුව රු. 000 |
|---|---|---|---|---|---|
| 2024 ජනවාරි 01 දිනට | **102,644,036** | **16,592,639** | **72,571,730** | **59,300,583** | **251,108,987** |
| වෙන් කිරීමේ මාරු කිරීම් | **(92,108,553)** | **(13,984,125)** | **(69,535,415)** | **(49,782,390)** | **(225,410,483)** |
| මිළදී ගැනීම | **19,590,144** | **590,171** | **-** | **2,674,285** | **22,854,600** |
| කල් පිරීම | **(250,000)** | **-** | **(2,900,000)** | **(1,726,200)** | **(4,876,200)** |
| බැහැර කිරීම් | **-** | **(1,746,527)** | **-** | **(6,874,409)** | **(8,620,936)** |
| වෙනත් විස්තීර්ණ ආදායමෙහි වාර්තා කළ සාධාරණ අගයේ ලාභය | **(1,901,798)** | **-** | **-** | **19,343** | **(1,882,455)** |
| උපලබ්ධිත/උපලබ්ධිත නොවූ ප්‍රාග්ධන ලාභ/(අලාභ) | **12,727,026** | **705,804** | **-** | **-** | **13,432,830** |
| ක්‍රමක්ෂය ගැලපීම | **40,003** | **-** | **2,130** | **-** | **42,133** |
| ලභය | **-** | **209,706** | **-** | **-** | **209,706** |
| ආදායම් ප්‍රකාශය තුල හඳුනාගත් පොළී ආදායම | **536,766** | **-** | **679,855** | **1,614,018** | **2,830,639** |
| විදේශ විනිමය පරිවර්තන ගැලපුම් | **(40,173)** | **(13,325)** | **-** | **(77,786)** | **(131,284)** |
| පසු වෙන්වීම් ගැලපුම් | **-** | **103,673** | **-** | **(103,673)** | **-** |
| පොළි/කූපන් ලැබීම් | **(151,812)** | **(447,886)** | **(818,300)** | **(2,897,232)** | **(4,315,230)** |
| 2024 දෙසැම්බර් 31 දිනට | **41,085,639** | **2,010,130** | **-** | **2,146,539** | **45,242,308** |
| | | | | | |
| 2023 ජනවාරි 01 දිනට | 51,513,246 | 25,763,811 | 71,832,664 | 62,142,194 | 211,251,915 |
| මිළදී ගැනීම | 41,142,396 | 2,929,952 | 4,000,000 | 29,170,764 | 77,243,112 |
| කල් පිරීම | (7,961,108) | (650,484) | (3,170,000) | (23,046,147) | (34,827,739) |
| බැහැර කිරීම් | (22,500) | (11,836,683) | - | (12,293,684) | (24,152,867) |
| අනෙකුත් විස්තීර්ණ ආදායමට වාර්තා වූ සාධාරණ වටිනාකම් ලාභය | 16,609,607 | 94,452 | - | - | 16,704,059 |
| උපලබ්ධිත/උලබ්ධිත ප්‍රාග්ධන ලාභ/(අලාභ) | (658,643) | (320,838) | - | - | (979,481) |
| වර්ෂය තුල වත්කම් හානිකරණය | - | - | - | 2,676,150 | 2,676,150 |
| පොලි ක්‍රමක්ෂය | 114,506 | - | 4,062 | - | 118,568 |
| විදේශ විනිමය ගණුදෙනු පරිවර්තන ගැලපුම් | (135,080) | 16,222 | - | (1,916,205) | (2,035,063) |
| ලාභය | - | 586,717 | - | (497,925) | 88,792 |
| පොලී ආදායම | 5,760,168 | - | 7,887,569 | 10,005,165 | 23,652,903 |
| පොලී/කූපන් ලැබීම් | (3,718,556) | 9,490 | (7,982,566) | (6,939,729) | (18,631,361) |
| 2023 දෙසැම්බර් 31 දිනට | 102,644,036 | 16,592,639 | 72,571,730 | 59,300,583 | 251,108,987 |

## 5. මූල්‍යමය ආයෝජන (ඉතිරි කොටස...)

### 5.5 මූල්‍ය ආයොජනවල ධාරණ අගයන්හි වෙනස්වීම (ඉතිරි කොටස...)

| සමූහය | විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම් රු. 000 | ලාභ හෝ අලාභ තුලින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් රු. 000 | කල්පිරීම සඳහා පවතින මූල්‍ය වත්කම් රු. 000 | ණය සහ ලැබීම් රු. 000 | එකතුව රු. 000 |
|---|---|---|---|---|---|
| 2024 ජනවාරි 01 දිනට | **102,644,036** | **16,592,639** | **72,571,730** | **66,276,591** | **258,084,995** |
| වෙන් කිරීමේදී සැබෑ වත්කම් වෙන් කිරීම කෙරෙහි බලපෑම | **3,722** | **(94,184)** | **-** | **94,184** | **3,722** |
| මිලදී ගනීම් | **35,259,065** | **1,551,354** | **15,023,597** | **20,288,967** | **72,122,983** |
| කල්පිරීම් | **(2,761,974)** | **-** | **(5,250,018)** | **(23,837,609)** | **(31,849,601)** |
| බැහැරකිරීම් | **(7,009,127)** | **(572,499)** | **-** | **(6,874,409)** | **(14,456,035)** |
| ප්‍රතිවර්ගීකරණය | **-** | **-** | **-** | **179,221** | **179,221** |
| දායකත්ව අයිතිය ක්‍රියාවේ යෙදවීම (...) | **747,755** | **27** | **-** | **-** | **747,782** |
| වෙනත් විස්තීර්ණ ආදායමෙහි වාර්තා කළ සාධාරණ අගයේ ලාභය | **8,662,255** | **-** | **-** | **19,343** | **8,681,598** |
| උපලබ්ධිත/උපලබ්ධිත නොවූ ප්‍රාග්ධන ලාභ/(අලාභ) | **12,728,181** | **2,127,146** | **-** | **-** | **14,855,327** |
| ලාභ හෝ අලාභ ගිණුමේ වාර්තා කර ඇති සාධාරණ වටිනාකම් ලාභ සහ විදේශ මුදල් පරිවර්තනය | **-** | **821,796** | **-** | **(215,052)** | **606,744** |
| සාධාරණ අගය ගැලපීම | **-** | **-** | **-** | **87,988** | **87,988** |
| උපචිත පොලියේ ශුද්ධ වෙනස | **346,627** | **-** | **(69,769)** | **(148,544)** | **128,314** |
| ක්‍රමක්ෂය ගැලපුම් | **31,410** | **-** | **8,758** | **-** | **40,168** |
| ලාභය | **-** | **209,706** | **-** | **-** | **209,706** |
| ආදායම් ප්‍රකාශය තුල හඳුනාගත් පොළී ආදායම | **8,907,054** | **-** | **8,107,936** | **6,435,631** | **23,450,621** |
| විදේශ විනිමය ගණුදෙනු පරිවර්තන ගැලපුම් | **(78,074)** | **(13,325)** | **-** | **(163,933)** | **(255,332)** |
| කැන්විල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගමේ ආයොජන | **6,383,081** | **-** | **-** | **-** | **6,383,081** |
| | **-** | **103,673** | **-** | **(103,673)** | **-** |
| පොලී/කූපන් ලැබීම් | **(5,476,972)** | **(447,886)** | **(7,587,118)** | **(9,112,260)** | **(22,624,236)** |
| 2024 දෙසැම්බර් 31 දිනට | **160,387,039** | **20,278,447** | **82,805,116** | **52,926,445** | **316,397,047** |
| | | | | | |
| 2023 ජනවාරි 01 දිනට | 51,513,246 | 25,763,811 | 71,832,664 | 69,065,402 | 218,175,123 |
| මිලදී ගනීම් | 41,142,396 | 2,929,952 | 4,000,000 | 29,223,565 | 77,295,914 |
| කල්පිරීම් | (7,961,108) | (650,484) | (3,170,000) | (23,046,147) | (34,827,739) |
| බැහැරකිරීම් | (22,500) | (11,836,683) | - | (12,293,684) | (24,152,867) |
| වෙනත් විස්තීර්ණ ආදායමෙහි වාර්තා කල සාධාරණ අගයේ ලාභය | 16,609,607 | 94,452 | - | - | 16,704,059 |
| උපලබ්ධිත/උලබ්ධිත ප්‍රාග්ධන ලාභ/(අලාභ) | (658,643) | (320,838) | - | - | (979,481) |
| වර්ෂය තුල වත්කම් හානිකරණය | - | - | - | 2,676,150 | 2,676,150 |
| පොලි ක්‍රමක්ෂය | 114,506 | - | 4,062 | - | 118,568 |
| විදේශ විනිමය ගණුදෙනු පරිවර්තන ගැලපුම් | (135,080) | 16,222 | | (1,916,205) | (2,035,063) |
| ලාභය | - | 586,717 | | (497,925) | 88,792 |
| පොලී ආදායම | 5,760,168 | - | 7,887,569 | 10,005,165 | 23,652,902 |
| පොලී/කූපන් ලැබීම් | (3,718,556) | 9,490 | (7,982,567) | (6,939,729) | (18,631,362) |
| 2023 දෙසැම්බර් 31 දිනට | 102,644,036 | 16,592,639 | 72,571,730 | 66,276,591 | 258,084,996 |

## 6 අනුබද්ධිත සමාගම්වල ආයෝජන

| දෙසැම්බර් 31 දිනට | උප සටහන | සමාගම 2024 රු. 000 | 2023 රු. 000 |
|---|---|---|---|
| අනුබද්ධිත සමාගම්වල ආයෝජන | | | |
| පිරිවැයට | | | |
| ලැයිස්තුගත අනුබද්ධිත සමාගම් | 6.1 | **2,764,196** | 2,764,196 |
| ලැයිස්තුගත නොකල අනුබද්ධිත සමාගම් | 6.2 | **37,160,338** | 21,059,696 |
| | | **39,924,534** | 23,823,892 |

## 6.1 ලැයිස්තුගත අනුබද්ධිත සමාගම්

| දෙසැම්බර් 31 දිනට | 2024 | | | | 2023 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | කොටස් සංඛ්‍යාව | මව් සමාගම % | පිරිවැය රු. 000 | ධාරණ අගය රු. 000 | කොටස් සංඛ්‍යාව | මව් සමාගම % | පිරිවැය රු. 000 | ධාරණ අගය රු. 000 |
| | | | | | | | | |
| ලංකා හොස්පිටල්ස් කොර්පරේෂන් පුද්ගලික සමාගම | **114,861,951** | **51.34%** | **2,764,196** | **9,081,453** | 114,861,951 | 51.34% | 2,764,196 | 13,783,434 |
| | | | **2,764,196** | **9,081,453** | | | 2,764,196 | 13,783,434 |

## 6.2 ලැයිස්තුගත නොකල අනුබද්ධිත සමාගම්

| දෙසැම්බර් 31 දිනට | 2024 | | | 2023 | | |
|---|---|---|---|---|---|---|
| | කොටස් සංඛ්‍යාව | මව් සමාගම % | ධාරණ අගය රු. 000 | කොටස් සංඛ්‍යාව | මව් සමාගම % | ධාරණ අගය රු. 000 |
| | | | | | | |
| ලිට්රෝ ගෑස් ලංකා ලිමිටඩ් | **35,976,853** | **99.94%** | **3,510,063** | 35,976,853 | 99.94% | 3,510,063 |
| ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම | **158,710,945** | **100.00%** | **5,280,188** | 158,710,945 | 100% | 5,280,188 |
| මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ ලිමිටඩ් | **5** | **100.00%** | **-** | 5 | 100% | - |
| කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම | **-** | **0.00%** | **-** | 1,085,294,117 | 52.05% | 10,399,358 |
| කැන්වින් හෝටල්ස් ඇන්ඩ් ස්පාස් (පුද්ගලික) සමාගම | **87,008,686** | **100.00%** | **870,087** | 87,008,686 | 100% | 870,087 |
| ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කොර්පරේෂන් ජෙනරල් ලිමිටඩ් | **50,000,001** | **100.00%** | **15,000,000** | 50,000,001 | 100% | 500,000 |
| ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කොර්පරේෂන් ලයිෆ් ලිමිටඩ් | **50,000,000** | **100.00%** | **12,500,000** | 50,000,000 | 100% | 500,000 |
| | | | **37,160,338** | | | 21,059,696 |

## 6.2.1 අනුබද්ධිත සමාගම් තුල සමූහයේ ආයොජන

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් අලුතින් ස්ථාපිත කල සහ මෙයට පෙර ශ්‍රී ලංකා ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩින්ග්ස් ලිමිටඩ් හි පරිපාලනය දරන ලද ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් හි කොටස් අයිතියෙන් 100% ක් අත්කර ගන්නා ලද අතර, 2023 ඔක්තෝබර් 16 වන දින ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් විසින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් හි අතිරේක රුපියල් මිලියන 400 ක් ආයෝජනය කරන ලදී. ඊට අමතරව, 2023 ඔක්තෝබර් 18 වන දින, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් විසින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් හි රුපියල් මිලියන 500 ක් ආයෝජනය කරන ලදී.

### ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්

*අ) අත්පත් කර ගැනීමේ දිනයේ දී හඳුනාගත හැකි මුළු වත්කම් සහ වගකීම් පහත වගුවේ සාරාංශ කර ඇත.*

**මව් සමාගම %** **100%**

| වත්කම්/වගකීම් | හඳුනාගෙන තිබෙන උපකල්පිත වත්කම් සහ වගකීම් රු. 000 |
|---|---|
| වෙනත් ලැබීම් | 200 |
| සම්බන්ධිත පාර්ශව වලින් ලැබිය යුතු මුදල් ප්‍රමාණයන් | 508 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 166,400 |
| ගෙවිය යුතු ආදායම් බදු | (5,269) |
| වෙනත් ගෙවීම් | (302) |
| අත්පත් කර ගැනීමේ දිනට හඳුනාගත් ශුද්ධ වත්කම් | **161,537** |

# 6. අනුබද්ධිත සමාගම් තුල සමූහයේ ආයොජන (ඉතිරි කොටස...)

## 6.2.1 අනුබද්ධිත සමාගම් තුල සමූහයේ ආයොජන (ඉතිරි කොටස..)

*අ) ඉහත දක්වා ඇති ගනුදෙනු හේතුවෙන් ලාභ හෝ අලාභ ප්‍රකාශනයට ඇති ශුද්ධ බලපෑම පහත වගුවේ දක්වා ඇත.*

කීර්තිනාමය / (කේවල් කිරීමේ මිලදී ගැනීම මත ලාභය) ගණනය

| | |
|---|---|
| ගෙවන ලද ප්‍රතිෂ්ඨාව | 100,000 |
| අත්පත් කර ගැනීමේ දිනට ශුද්ධ වත්කම් | (161,537) |
| කේවල් කිරීමේ මිලදී ගැනීම මත ලාභය | **(61,537)** |

*අ) ඉහත දක්වා ඇති ගනුදෙනු හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ඇති ශුද්ධ බලපෑම පහත වගුවේ දක්වා ඇත.*

| | |
|---|---|
| ගෙවන ලද ප්‍රතිෂ්ඨාව | (100,000) |
| අත්පත් කරගන්නා ලද මුදල් සහ මුදල් සමාන දෑ | 166,400 |
| මුදල් ප්‍රවාහ අරමුණු සඳහා ශුද්ධ මුදල් ප්‍රවාහය | **66,400** |

## 6.2.2 අනුබද්ධිත සමාගම් තුල සමූහයේ බැහැර කිරීම

අ) 2024 ජූලි 7 වන දින, සමූහය විසින් කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගමෙ හි තම ආයෝජනය බැහැර කරන ලද අතර, එමගින් සමූහයට කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගමෙසහ එහි 100% හිමිකාරීත්වය දරන අනුබද්ධිත සමාගම් වන සිනොලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම, හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම සහ නිල්යාන් හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම යන සමාගම් කෙරෙහි තිබූ පාලනය රු. 10,499,999,995 ක සලකා බැලීමකට අහිමි විය. ගනුදෙනුවෙන් සමූහයට ඇති වූ ශුද්ධ බලපෑම පහත වගුවේ සාරාංශගත කර ඇත.

*අ) පහත වගුවේ බැහැර කිරීමේ දිනය වන විට හඳුනාගත හැකි මුළු වත්කම් සහ වගකීම් සාරාංශගත කර ඇත.*

| | කැන්විල් හෝල්ඩි න්ග්ස් (පුද්ගලික) සමාගම | සිනොලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම | හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම | එකතුව (රු. 000) |
|---|---|---|---|---|
| වත්කම් | | | | |
| අනුබද්ධිත සමාගම්වල ආයෝජන | 20,500,000 | - | - | 20,500,000 |
| දේපල, පිරියත සහ උපකරණ | - | 36,674,069 | 203,601 | 36,877,670 |
| විලම්භිත බදු වත්කම් | 190 | - | - | 190 |
| වෙනත් වත්කම් | 778,141 | 463,159 | 406,325 | 1,647,625 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 7,467 | 124,794 | 9,321 | 141,582 |
| මුළු වත්කම් | **21,285,798** | **37,262,022** | **619,247** | **59,167,067** |
| වගකීම් | | | | |
| වර්තන බදු වගකීම් | 84 | - | - | 84 |
| විශ්‍රාමික ප්‍රතිලාභ බැදීම් | 633 | 4,349 | - | 4,982 |
| වෙනත් වගකීම් | 415,874 | 6,476,241 | 2,323 | 6,894,438 |
| අදාළ සමාගම්වලට ගෙවිය යුතු මුදල් ප්‍රමාණයන් | - | - | - | - |
| මූල්‍ය වගකීම් | - | 5,119,434 | - | 5,119,434 |
| මුළු වගකීම් | **416,591** | **11,600,024** | **2,323** | **12,018,938** |

| | |
|---|---|
| මුළු ශුද්ධ වත්කම් | **47,148,129** |
| (-) උප සමූහය තුල ආයොජන | **(20,500,000)** |
| බැහැර කිරීමේ දිනය වන විට උප කාන්ඩයේ හඳුනාගත හැකි මුළු ශුද්ධ වත්කම් | **26,648,129** |

*ආ) ඉහත දක්වා ඇති ගනුදෙනු හේතුවෙන් ලාභ හෝ අලාභ ප්‍රකාශනයට ඇති ශුද්ධ බලපෑම පහත වගුවේ දක්වා ඇත.*

| | රු. 000 |
|---|---|
| ප්‍රතිෂ්ඨාව | 10,500,000 |
| රඳවාගත් පොළියේ සාධාරණ අගය | 6,383,081 |
| බැහැර කිරීම හේතුවෙන් NCI ගණනය නොකිරීම | 6,393,646 |
| | 23,276,727 |
| (-) ශුද්ධ වත්කම්වල ධාරණ අගය (අ) | (26,648,129) |
| අනුබද්ධිත ආයතනයක් බැහැර කිරීමේදී ලාභය/(අලාභය) (සටහන (අ)) | **(3,371,402)** |

# 6. අනුබද්ධිත සමාගම්වල ආයෝජන (ඉතිරි කොටස...)

## 6.2.2 අනුබද්ධිත සමාගම් තුල සමූහයේ බැහැර කිරීම් (ඉතිරි කොටස...)

**සටහන (අ)**

| | |
|---|---|
| බැහැර කිරීමේ දිනයේ සාධාරණ අගයට රඳවා ගත් පොලිය මැනීමකින් තොරව ලාභය/(අලාභය) | (4,754,483) |
| බැහැර කිරීමේ දිනයේ සාධාරණ වටිනාකමට රඳවා ගත් පොලිය මැනීම නිසා ඇති වූ ලාභය/(අලාභය) | 1,383,081 |
| ලාභ හෝ අලාභ ප්‍රකාශයේ අනෙකුත් වියදම් වලින් හඳුනාගෙන ඇති ලාභය/(අලාභය) (සටහන 35) | **(3,371,402)** |

*ඇ) ඉහත දක්වා ඇති ගනුදෙනු හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ඇති ශුද්ධ බලපෑම පහත වගුගත කර ඇත.*

| | |
|---|---|
| හඳුනාගන්නා ලද ප්‍රතිෂ්ඨාව | 10,500,000 |
| (-) ශුද්ධ වත්කම් තුල හඳුනාගත හැකි මුදල් සහ මුදල් සමාන දෑ | (141,582) |
| බැහැර කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ශුද්ධ මුදල් ශේෂය | 10,358,418 |
| (-) භාණ්ඩාගාර ලේකම්වරයාගෙන් ලැබිය යුතු | (10,500,000) |
| මුදල් ප්‍රවාහ අරමුණු සඳහා පිටතට ශුද්ධ මුදල් ප්‍රවාහය | **(141,582)** |

## 6.2.3 අනුබද්ධිත සමාගම් තුල සමූහයේ ආයෝජන

| | | සමාගම | |
|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | මව් සමාගමේ ප්‍රතිශතය | 2024 රු. | 2023 රු. |
| සිනොලංකා හෝටල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම | - | - | 19,999,999,995 |
| හෙලන්කෝ හෝටල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම | - | - | 500,000,000 |
| නිල්යාන් හෝටල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම | 100% | - | 10 |
| | | - | 20,500,000,005 |
| හානිකරණය සඳහා වෙන්කිරීම් | | - | (10) |
| | | - | 20,499,999,995 |

නිල්යන් හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ පවත්වාගෙන යනු ලබන ලේඛනයෙන් සමාගමේ නම ඉවත් කිරීමට තීරණය කර ඇති අතර, එම නිසා සමාගම ව්‍යාපාර කටයුතු කරගෙන නොයනු ඇත. ඒ අනුව, 2017 වර්ෂයේදී නිල්යන් හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම යටතේ රු. 10/- ක ආයෝජනයේ වටිනාකම සඳහා වෙන්කිරීම් සිදුකර ඇත.

වසර තුළ, සමූහය විසින් කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගමෙහි සිය ආයෝජනය බැහැර කර ඇති අතර, එමඟින් සමූහයට කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම සහ එහි පරිපාලාත සමාගම් වන සිනොලංකා හෝටල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම, හෙලන්කෝ හෝටල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම සහ නිල්යාන් හෝටල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගමයන සමාගම් කෙරෙහි තිබූ පාලනය අහිමි වේ.

## 6.3 ප්‍රධාන අනුබද්ධිත සමාගම්වල සමූහයේ අයිතිය

NCI විසින් දරනු ලබන සමූහයේ සංයුතිය සහ හිමිකාරිත්වයේ ප්‍රමාණය පහත දැක්වෙන අනාවරණ වලින් පෙන්නුම් කරයි.

| සමාගම | ප්‍රධාන ක්‍රියාකාරකම් | අයත් කොටස් වර්ගය | සමූහයේ අයිතිය | | පාලනය නොවන අයිතිය | |
|---|---|---|---|---|---|---|
| | | | 2024 | 2023 | 2024 | 2023 |
| ලංකා හොස්පිටල්ස් කොර්පරේෂන් (පොදු) සමාගම | සෞඛ්‍යාරක්ෂාව සහ රසායනාගාර සේවා | සමාන්‍ය | **51.34%** | 51.34% | **48.66%** | 48.66% |
| ලංකා හොස්පිටල් ඩයග්නොස්ටික්ස් ලිමිටඩ් | සෞඛ්‍යාරක්ෂාව සහ රසායනාගාර සේවා | සමාන්‍ය | **51.34%** | 51.34% | **48.66%** | 48.66% |
| ලිට්රෝ ගෑස් ලංකා ලිමිටඩ් | ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් (LPG) ආනයනය, සැකසීම, ගබඩා කිරීම, බෙදා හැරීම සහ විකිණීම සහ අනෙකුත් ආනුෂංගික සේවා සැපයීම. | සමාන්‍ය | **99.94%** | 99.94% | **0.06%** | 0.06% |
| ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම | ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් සඳහා තොග ගබඩා පහසුකම් සැපයීම | සමාන්‍ය | **100.00%** | 100.00% | **0.00%** | 0.00% |
| කැනොවින් හෝටල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම | හෝටල් ව්‍යාපාර | සමාන්‍ය | **100.00%** | 100.00% | **0.00%** | 0.00% |
| කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම | විනෝද අංශයට අදාළ ආයෝජන ප්‍රවර්ධනය | සමාන්‍ය | - | 76.01% | - | 23.99% |
| සිනොලංකා හෝටල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම | හෝටල් ව්‍යාපාර | සමාන්‍ය | - | 76.01% | - | 23.99% |
| හෙලැන්කෝ හෝටල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම | හෝටල් ව්‍යාපාර | සමාන්‍ය | - | 76.01% | - | 23.99% |
| මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (පුද්ගලික) සමාගම | කළමනාකරණ සේවා | සමාන්‍ය | **100.00%** | 100.00% | **0.00%** | 0.00% |
| ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කොර්පරේෂන් ජෙනරල් ලිමිටඩ් | රක්ෂණ | සමාන්‍ය | **100.00%** | 100.00% | **0.00%** | 0.00% |
| ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කොර්පරේෂන් ලයිෆ් ලිමිටඩ් | රක්ෂණ | සමාන්‍ය | **100.00%** | 100.00% | **0.00%** | 0.00% |

# 6 අනුබද්ධිත සමාගම්වල ආයොජනය (ඉතිරි කොටස...)

## 6.4 පාලනය නොවන අයිතිය

### 6.4.1 වැදගත් පාලනය නොවන අයිතිය සහිත පරිපාලිත සමාගම්

පහත වගුවෙන් සමූහයට වැදගත් පාලනය නොවන අයිතිය ඇති සමූහයේ පරිපාලිත සමාගම්වලට අදාළ තොරතුරු සාරාංශ කෙරේ. ප්‍රමාණාත්මක සහ ගුණාත්මක පදනම් මත මෙම පාලනය නොවන අයිතිය සමූහය විසින් හඳුනාගෙන ඇත.

| අනුබද්ධිත සමාගම | ලංකා හොස්පිටල්ස් කොර්පරේෂන් (පොදු) සමාගම<br>රු. 000 | ලිට්රෝ ගෑස් ලංකා ලිමිටඩ්<br>රු. 000 |
|---|---|---|
| NCI හිමිකාරිත්වය | **48.66%** | **0.06%** |
| සාරාංශගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | | |
| ජංගම නොවන වත්කම් | 7,257,582 | 18,572,119 |
| ජංගම වත්කම් | 11,253,739 | 16,221,887 |
| ජංගම නොවන වගකීම් | 1,883,829 | 14,376,114 |
| ජංගම වගකීම් | 2,449,095 | 4,023,248 |
| ශුද්ධ වත්කම් | **22,844,245** | **53,193,367** |
| NCI වලට ආරෝපණය කළ හැකි ශුද්ධ වත්කම් (අන්තර් සමූහ ඉවත් කිරීම් වලට පෙර) | **11,116,229** | **34,202** |
| **සාරාංශගත විස්තීර්ණ ආදායම් ප්‍රකාශය** | | |
| ආදායම | 13,650,106 | 88,755,759 |
| වර්ෂය සඳහා ලාභය | 1,339,432 | 2,248,429 |
| අනෙකුත් විස්තීර්ණ ආදායම/ (වියදම්) | 240,005 | (23,891) |
| මුළු විස්තීර්ණ ආදායම | **1,579,437** | **2,224,538** |
| **NCI** වෙත වෙන් කරන ලද ලාභය | **651,780** | **1,446** |
| **NCI** වෙත වෙන් කරන ලද **OCI** | **116,789** | **(15)** |
| **සාරාංශගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය** | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් / (භාවිතා කරන ලද) මුදල් ප්‍රවාහ | 2,046,027 | 6,536,455 |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් / (භාවිතා කරන ලද) මුදල් ප්‍රවාහ | (1,984,281) | (930,254) |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් / (භාවිතා කරන ලද) මුදල් ප්‍රවාහ | (76,407) | (6,792,629) |
| මුදල් සහ මුදල් සමාන දේවල ශුද්ධ වැඩිවීම | **(14,661)** | **(1,186,428)** |

### 6.4.2 පාලනය නොවන අයිතියේ වෙනස්වීම

| | සමූහය<br>2024<br>රු. 000 | <br>2023<br>රු. 000 |
|---|---|---|
| වසර ආරම්භයේදී ශේෂය | **13,233,465** | 12,897,579 |
| වර්ෂය සඳහා ලාභය | **621,359** | 690,330 |
| අනෙකුත් විස්තීර්ණ ආදායම, බද්දෙන් ශුද්ධ | **(37,717)** | (27,352) |
| වර්ෂය සඳහා NCI වෙත ගෙවන ලද ලාභාංශ | **(482)** | (327,092) |
| NCI හා අනුබද්ධිත ආයතනයන් සඳහා බැහැර කිරීම | **(6,393,646)** | - |
| වසර අවසානයේ ශේෂය | **7,422,979** | 13,233,465 |

# 7 ආශ්‍රිත සමාගම්වල ආයෝජන

| සමූහය/සමාගම | 2024 | | | | 2023 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | කොටස් සංඛ්‍යාව | මව් සමාගම % | ධාරණ අගය රු. 000 | සාධාරණ අගය රු. 000 | කොටස් සංඛ්‍යාව | මව් සමාගම % | ධාරණ අගය රු. 000 | සාධාරණ අගය රු. 000 |
| සිබැන්ක් ඇසට් මැනේජ්මන්ට් ලිමිටඩ් | **759,998** | **26.57%** | **191,295** | **191,295** | 759,998 | 26.57% | 191,295 | 191,295 |
| සිලෝන් ඇසට් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ් | **1,250,000** | **18.95%** | **7,378** | **7,378** | 1,250,000 | 18.95% | 7,378 | 7,378 |
| | | | **198,673** | **198,673** | | | 198,673 | 198,673 |

* ඉහත ආයෝජන මගින් ලබන්නේ (විගණනය නොකළ මූල්‍ය ප්‍රකාශන මත පදනම්ව) ආයෝජකයාගේ ශුද්ධ වත්කම් වටිනාකමෙන් (NAV) SLIC කොටස් මත වන අතර වටිනාකම්වල වෙනස්කම් වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ. සමූහයේ බදු ගෙවීමෙන් පසු ලාභය හෝ EPS හෝ මුදල් මත සැලකිය යුතු බලපෑමක් නොමැත.

# 8 දේපල, පිරියත සහ උපකරණ

## 8.1 සමූහය

| දෙසැම්බර් 31 දිනට | සටහන | 2024<br>රු.000' | 2023<br>රු.000' |
|---|---|---|---|
| | | | |
| ධාරණ අගය | | **41,350,026** | 44,101,299 |
| නොනිමි වැඩ | **8.1.3** | **566,814** | 30,707,140 |
| | | **41,916,840** | 74,808,439 |

| දෙසැම්බර් 31 දිනට | ඉඩම්<br>රු. 000 | සින්නක්කර ඉඩම් තුළ ඉදිකරන ලද ගොඩනැගිලි<br>රු. 000 | කල්බදු ඉඩම් තුළ ඉදිකරන ලද ගොඩනැගිලි<br>රු. 000 | උපකරණ<br>රු. 000 | ලී බඩු සහ සවිකිරීම්<br>රු. 000 | මොටර් රථ<br>රු. 000 |
|---|---|---|---|---|---|---|
| **පිරිවැය / ඇගයීම** | | | | | | |
| 2024 ජනවාරි 01 දිනට ශේෂය | 16,512,080 | 3,129,953 | 8,354,044 | 6,413,151 | 1,104,390 | 1,011,081 |
| වර්ෂය තුල එක්කිරීම් | - | - | 106,990 | 1,290,468 | 131,321 | 1,416 |
| ප්‍රත්‍යාගණනය | 2,962,668 | 213,672 | 396,153 | 2,644 | 2,284 | 507,249 |
| ප්‍රත්‍යගණනය කරන ලද වත්කම් මත සමුච්චිත ක්ෂයවීම් මාරු කිරීම | (17,140) | - | (92,009) | - | - | (381,317) |
| බැහැර කරන ලද අනුබද්ධිත ආයතනයට අදාළ දේපල පිරියත වටිනාකම | (2,784,166) | - | (5,536,991) | (6,421) | (4,132) | (17,265) |
| බැහැරකිරීම් | - | - | - | (35,614) | (1,660) | (61,625) |
| පිරිවැයට කරන ලද ගැලපුම් | - | - | - | - | - | - |
| ROU වෙතින් මාරුවීම් | - | - | - | - | - | - |
| වැඩ කිරීමේ ප්‍රගතියෙන් මාරු කිරීම | - | 350,266 | 84,835 | 78,554 | 72,151 | - |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **16,673,442** | **3,693,891** | **3,313,022** | **7,742,782** | **1,304,354** | **1,059,539** |
| **සමුච්චිත ක්ෂය** | | | | | | |
| | වාරික සඳහා ගෙවන ලද මුදල | **(122)** | - | **10,528** | - |
| | විදේශ මුදල් ගනුදෙනු | **91** | 196 | **91** | 196 |
| | හිමිකම් පෑම ගෙවිය යුතු මුදල | **-** | - | 36 | - |
| | හිමිකම් පියවීම | **-** | - | 36 | - |
| | කාර්ය මණ්ඩලයට අදාළ පිරිවැය | **-** | - | **26,880** | 58,307 |
| | රක්ෂණ සේවා පිරිවැය | **-** | - | **-** | 1,840 |
| | වෙනත් වියදම් | **-** | - | **(51)** | (43,591) |
| | සාමාන්‍ය ආයෝජන සඳහා සලකා බැලීම | **-** | - | **-** | 400,000 |
| | මුදල් පියවීම | **-** | 24,044 | **(32,688)** | (502,032) |
| හෙලන්කෝ හොටෙල් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම | ගෙවන ලද වියදම් | **-** | - | **(51)** | 25 |
| | කාර්ය මණ්ඩල පිරිවැය වෙන් කිරීම | **-** | - | **517** | 664 |
| | පියවීම් | **-** | - | **(1,796)** | 526,076 |
| | කොටස් ප්‍රතිමිලදී ගැනීම සඳහා සලකා බැලීම | **-** | - | **400,000** | (400,000) |
| ලංකා හොස්පිටල් ඩයග්නොස්ටික්ස් (පුද්ගලික) සමාගම | වියදම් / කුලී ආදායම ප්‍රතිපූරණය | **-** | - | **108,249** | 185,268 |
| | රක්ෂණ වාරිකය | **221** | - | **12,711** | - |
| | වාරිකය සඳහා ගෙවන ලද මුදල | **(221)** | - | **9,503** | - |
| | ගෙවූ හිමිකම් පෑම | **-** | - | **1,259** | |
| | හිමිකම් සඳහා ගෙවන ලද මුදල | **-** | - | **759** | |
| | ලැබුණු මුදල | **-** | - | **(250,000)** | (100,000) |
| | ලබාදෙන ලද රසායනාගාර සේවා | **-** | (14,120) | **(1,225,297)** | (1,085,601) |
| | ගෙවූ මුදල | **-** | 14,120 | **1,571,674** | 923,280 |
| සීබෑන්ක් ඇසෙට් මැනේජ්මන්ට් සමාගම | ලැබුණු රක්ෂණ වාරිකය | **-** | 215 | **-** | 215 |
| | ලැබුණු ලාභාංශ | **4,936** | 5,700 | **4,936** | 5,700 |
| | ලැබුණු මුදල | **(4,936)** | - | **(4,936)** | - |
| සිලෝන් ඇසෙට් මැනේජ්මන්ට් සමාගම | ඒකක භාර විකිණීම | **-** | 1,181,589 | **-** | 1,181,589 |
| | ඒකක භාරවල ආයෝජන | **-** | 250,000 | **-** | 250,000 |

## 43 සම්බන්ධිත පාර්ශව අනාවරණයන් (ඉතිරි කොටස...)

### 43.3 අනෙකුත් අදාළ සමාගම් සමඟ ගනුදෙනු

| සමාගමේ නම | ගණුදෙනුවේ ස්වභාවය | SLIC සමග ගණුදෙනු | | සමූහ සමාගම් සමඟ ගනුදෙනු | |
|---|---|---|---|---|---|
| | | 2024 රු.'000 | 2023 රු.'000 | 2024 රු.'000 | 2023 රු.'000 |
| කැපිටල් අලියාන්ස් ඉන්වෙස්ට්මන්ට් සමාගම | ලැබුණු ලාභාංශ | - | 23,992 | - | 23,992 |
| ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් | අනුබද්ධිත සමාගම්වල ආයෝජනය | - | 500,000 | - | - |
| ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් | අනුබද්ධිත සමාගම්වල ආයෝජනය | - | 500,000 | - | - |

### 43.4 පරිපාලිත ආයතනවලින් ලැබිය යුතු

| අදාළ පාර්ශවයන්ගෙන් ලැබිය යුතු වටිනාකම | SLIC සමඟ ශේෂයන් | | සමූහ සමාගම් සමඟ ශේෂයන් | |
|---|---|---|---|---|
| | 2024 රු.'000 | 2023 රු.'000 | 2024 රු.'000 | 2023 රු.'000 |
| ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් | - | 640 | - | 640 |
| ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් | **1,064,392** | 21 | **1,064,392** | 21 |
| ලිට්රෝ ගෑස් ලංකා සමාගම | **19,157** | 20,187 | **283,249** | 313,044 |
| ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම | - | 539 | **13,754** | 14,293 |
| කැන්විල් හොල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම | - | - | - | 400,000 |
| කැනොවින් හොටෙල් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම | **1,056** | - | **4,728** | 3,696 |
| සිනොලංකා හොටෙල් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම | - | 1,620 | - | 774,082 |
| හෙලන්කෝ හොටෙල් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම | - | - | - | 1,534 |
| | **1,084,605** | 23,007 | **1,366,123** | 1,507,310 |

### 43.5 පරිපාලිත සමාගම්වලට ගෙවිය යුතු මුදල

| අදාළ පාර්ශවයන් වෙත ගෙවිය යුතු වටිනාකම | SLIC සමඟ ශේෂයන් | | සමූහ සමාගම් සමඟ ශේෂයන් | |
|---|---|---|---|---|
| | 2024 රු.'000 | 2023 රු.'000 | 2024 Rs.'000 | 2024 රු.'000 |
| ලංකා හොස්පිටල් කෝපරේෂන් පොදු සමාගම | **229** | 9,743 | **20,729** | 9,743 |
| ලිට්රෝ ගෑස් ලංකා සමාගම | - | - | - | 13,754 |
| ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම | **3,938** | - | **986,609** | 1,009,503 |
| ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් | **232,009** | - | **1,294,214** | - |
| ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් | **805,847** | - | **805,847** | 677 |
| කැන්විල් හොල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම | - | 224 | - | 774,220 |
| කැනොවින් හොටෙල් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම | - | - | **1,745** | 1,838 |
| සිනොලංකා හොටෙල් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම | - | - | - | 2,247 |
| හෙලන්කෝ හොටෙල් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම | - | - | - | 400,000 |
| | **1,042,023** | 9,967 | **3,109,144** | 2,211,982 |

හිමිකම් පෑම් වලට ආරෝපණය කළ හැකි ප්‍රතිරක්ෂණ සංරචක වලින් පැන නගින වෙනස්කම් සහ තනි සමාගමේ දෘෂ්ටි කෝණයෙන් තක්සේරු කරනු ලබන සහ රක්ෂණකරු විසින් තීරණය කරනු ලබන ප්‍රතිපාදනවලට සමාන විය යුතු නොවන හිමිකම් හිඟ ඇස්තමේන්තු හේතුවෙන්, වසර තුළ ගෙවන ලද රක්ෂණ හිමිකම් සහ වාර්තා කිරීමේ දිනයේදී හිඟ හිමිකම්, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඉවත් කර නොමැත.

# 44 රක්ෂණ සහ මූල්‍ය අවදානම් කළමනාකරණය

### දළ විශ්ලේෂණය

රක්ෂණ ව්‍යාපාරය සහ මූල්‍ය උපකරණවලින් පැන නගින පහත අවදානම් වලට සමූහය නිරාවරණය වේ.
▪ රක්ෂණ අවදානම
▪ වෙළඳපොළ අවදානම
▪ ණය අවදානම
▪ ද්‍රවශීලතා අවදානම

මෙම සටහන මගින් ඉහත එක් එක් අවධානම් සඳහා සමූහයේ නිරාවරණ වීම්, SLFRS 4 සහ SLFRS 7 විසින් අවශ්‍ය පරිදි අවදානම් මැනීම සහ කළමනාකරණය සඳහා සමූහයේ අරමුණු, ප්‍රතිපත්ති සහ ක්‍රියාවලි සහ එයට අදාළ ප්‍රමාණාත්මක අනාවරණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.

### අවදානම් කළමනාකරණ රාමුව

සමූහයේ අවදානම් කළමනාකරණ රාමුව ස්ථාපිත කිරීම සහ අධීක්ෂණය කිරීම පිළිබඳ සමස්ත වගකීම සමූහයේ අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. සමූහය මුහුණ දෙන අවදානම් හඳුනා ගැනීම සහ විශ්ලේෂණය කිරීම, සුදුසු අවදානම් සීමාවන් සහ පාලනයන් සැකසීම සහ අවදානම් සහ සීමාවන්ට අනුකූල වීම නිරීක්ෂණය කිරීම සඳහා සමූහයේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ස්ථාපිත කර ඇත. වෙළඳපල තත්ත්වයන් සහ සමූහයේ ක්‍රියාකාරකම්වල වෙනස්කම් පිළිබිඹු කිරීම සඳහා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ පද්ධති නිතිපතා සමාලෝචනය කරනු ලැබේ.

## 44.1 රක්ෂණ අවධානම

රක්ෂණ අවදානම යනු රක්ෂිත සිදුවීමක් සිදුවීමේ සම්භාවිතාව වන අතර එමගින් රක්ෂණකරුට හිමිකම් පෑමක් සඳහා ගෙවීමට සිදුවේ. මෙම අවදානම ප්‍රතිරක්ෂණ ක්‍රියාවලිය හරහා සමූහයට මාරු කරනු ලැබේ. රක්ෂණ ගිවිසුම් යටතේ සමූහය මුහුණ දෙන ප්‍රධානතම අවදානම නම්, සැබෑ හිමිකම් සහ ප්‍රතිලාභ ගෙවීම් හෝ එහි කාල නියමයන් අපේක්ෂාවන්ට වඩා වෙනස් වීමයි. හිමිකම් පෑමේ වාර ගණන, හිමිකම් පෑමේ තීව්‍රතාව, ගෙවන ලද සත්‍ය ප්‍රතිලාභ සහ දිගුකාලීන හිමිකම් පෑමේ පසුකාලීන වර්ධනය මෙයට බලපායි. එබැවින්, සමූහයේ අරමුණ වන්නේ මෙම වගකීම් ආවරණය කිරීම සඳහා ප්‍රමාණවත් සංචිත ඇති බව සහතික කිරීමයි.

### 44.1.1 ජීවිත රක්ෂණ ගිවිසුම්

ගිවිසුමේ ස්වභාවය මත පදනම්ව ජීවිත රක්ෂණයේ සංකේන්ද්‍රණය පහත ඡේදය මගින් විස්තර කෙරේ.

### රක්ෂණ අවදානම් සංකේන්ද්‍රණය

සංකේන්ද්‍රණ අවදානම යනු ප්‍රමාණවත් ලෙස විවිධාංගීකරණය නොවූ වත්කම් හෝ බැඳීම් කළඹ සමඟ සම්බන්ධ වූ වැඩි වී ඇති අලාභයන් සඳහා නිරාවරණය වීමේ අවදානම ලෙස අර්ථ දැක්වේ. ජීවිත රක්ෂණකරුවෙකු සඳහා සංකේන්ද්‍රණ අවදානම භූගෝලීය ප්‍රදේශයක, ආර්ථික අංශයක හෝ ඒකල නිකුත් කරන්නන්ගේ ආයෝජන සම්බන්ධයෙන් හෝ ඔප්පු වර්ගයකට අදාළව භූගෝලීය ප්‍රදේශයක් තුළ රක්ෂණය සඳහා භාරගෙන ඇති ව්‍යාපාර හෝ ආවරණය තරනු ලබන අවදානම් හේතුවෙන් මතු විය හැකිය.

1. වෙළඳපල අවදානම් පිළිබඳ දෘෂ්ටිකෝණයකින් සලකා බැලීමේදී, අපි මූල්‍ය අංශයේ සැලකිය යුතු ලෙස ආයෝජනය කර ඇතත්, අපගේ කළඹ විවිධාංගීකරණය වී ඇති අතර විශාල ආන්තිකයන් අඩංගු වේ.

2. රක්ෂණ අවදානම් පිළිබඳ දෘෂ්ටිකෝණයකින් සලකා බැලීමේදී, සංකේන්ද්‍රණ අවදානමට බලපාන ප්‍රධාන සාධක අතර මාර්තෘතා අවදානම, රෝගාබාධ අවදානම, දීර්ඝායුෂ අවදානම, රක්ෂණ ඔප්පු හිමියන්ගේ හැසිරීම් අවදානම (අභාවිත වීම, ප්‍රතිවරණය) සහ වියදම් අවදානම ඇතුළත් වේ. භූගෝලීය කලාප, ව්‍යාපාර දාම සහ විවිධ රක්ෂණ අවදානම් සාධක හරහා පවා විවිධාංගීකරණයක් ඇත, එනම් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් රක්ෂණ අවදානම සැලකිය යුතු සංකේන්ද්‍රණයකට නිරාවරණය නොවේ.

### ජීවිත රක්ෂණය හා සම්බන්ධ අවදානම් අතරට:

• මාර්තෘතා අවදානම යනු ජීවිත රක්ෂණ ඔප්පුවල සැබෑ රක්ෂණ ඔප්පු හිමියන්ගේ මරණ අත්දැකීම අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා ඉහළ යාමේ අවදානමයි.

• දීර්ඝායුෂ අවදානම යනු ඔප්පුහිමියන් අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා දිගු කාලයක් ජීවත් වීමේ අවදානමයි.

• රෝගාබාධ අවදානම යනු රක්ෂණ ඔප්පු හිමියාගේ සෞඛ්‍ය ආශ්‍රිත හිමිකම් අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා වැඩි වීමේ අවදානමයි.

• රක්ෂණ ඔප්පු හිමියාගේ හැසිරීමේ අවදානම යනු ගිවිසුම කල් පිරීමට පෙර දායක මුදල් අත්හිටුවීම සහ අඩු කිරීම හෝ ප්‍රතිලාභ ඉවත් කර ගැනීමේදී රක්ෂණ ඔප්පු හිමියන්ගේ හැසිරීම අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා අයහපත් වීමයි. දුර්වල අඛණ්ඩතා අනුපාත හේතුවෙන් අනාගත ස්ථාවර වියදම් පියවා ගැනීමට සඳහා සුළු ගිවිසුම් ප්‍රමාණයක් පමණක් ශේෂවීමටත් සහ ව්‍යාපාරයෙන් අනාගත ධනාත්මක මුදල් ප්‍රවාහ අඩු කිරීමට මගපාදන අතර, එය ප්‍රමාද වූ වියදම් ආපසු ලබා ගැනීමේ හැකියාවට බලපෑම් කළ හැකිය.

• වියදම් අවදානම යනු ඔප්පු අත්පත් කර ගැනීමේදී සහ පරිපාලනය කිරීමේදී දරන ලද වියදම් අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා වැඩි වීමේ අවදානමයි.

• වෙළඳපල අවදානම යනු සමාගමේ ශේෂ පත්‍ර තත්ත්වයන් සමඟ සම්බන්ධ අවදානමයි, එහිදී වටිනාකම හෝ මුදල් ප්‍රවාහය මූල්‍ය වෙළඳපොළවල් මත රඳා පවතින අතර එය අවදානම් සමාලෝචනයේ "වෙළඳපල අවදානම" කොටසේ විශ්ලේෂණය කෙරේ.

• ණය අවදානම යනු ප්‍රතිපාර්ශ්වයන්ගෙන් ඔවුන්ගේ මූල්‍ය බැඳීම් ඉටු කිරීමට අපොහොසත් වීමෙන් සිදුවන පාඩුවක් හෝ විභව පාඩුවක් හා සම්බන්ධ අවදානම වන අතර එය අවදානම් සමාලෝචනයේ "ණය අවදානම" කොටස තුළ විශ්ලේෂණය කෙරේ.

ඉහත අවදානම් ඇගයීම සඳහා සමූහය විසින් ක්‍රියා පටිපාටි සහ ක්‍රියාවලීන් ස්ථාපිත කර ඇති අතර, ඒවා නිසි ලෙස පාලනය කර කළමනාකරණය නොකරන්නේ නම් සමූහයේ මෙහෙයුම් වලට බලපෑම් ඇතිවිය හැකිය. නිෂ්පාදන වර්ධනයේ සිට ප්‍රතිලාභ පරිපාලනය දක්වා සියලුම තීරණාත්මක අවධීන් ආවරණය කිරීම සඳහා ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක වේ. ඊට අමතරව, සියලුම ජීවිත මූල්‍ය ප්‍රවාහ නවීකරණය කර ඇති අතර නිෂ්පාදන සැලස්ම කිරීම සහ මිලකරණ අවදානම අවම කරමින්, ආයුගණකවරයා විසින් ලාභ පරීක්ෂාව සිදුක ඇත. එසේම, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් විසින්, වගකීම් (ALM) සඳහා සහාය වීමට ගැලපෙන උපකරණ පවතින්නේ නම් ඒවා භාවිතා කරනු ලැබේ.

අවදානම් පාදක ප්‍රාග්ධන (RBC) රාමුව යටතේ, සමූහය විසින් "දළ වාරික තක්සේරු" යාන්ත්‍රණය (GPV) අනුගමනය කර ඇත. වගකීම් තක්සේරු කිරීමේ අරමුණ සඳහා මෙය අවශ්‍ය වන අතර එහිදී නුබුන්වත් හැකියා අවශ්‍යතා සඳහා වෙළඳපොළට අනුකූල ආකාරයකට වගකීම් ගණනය කරනු ලැබේ. අවම නියාමන පදනම (RBC) හා සසඳන විට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් එහි අතිරික්ත ගණනය කිරීම සඳහා වඩාත් විචක්ෂණශීලී තක්සේරු පදනමක් අනුගමනය කර ඇත.

# 44 රක්ෂණය හා මූල්‍ය අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස...)

## 44.1 රක්ෂණ අවදානම (ඉතිරි කොටස...)

## 44.1.1 ජීවිත රක්ෂණ ගිවිසුම් (ඉතිරි කොටස...)

### ජීවිත රක්ෂණ අවදානම සඳහා සංවේදීතා විශ්ලේෂණය

ජීවිත රක්ෂණ ගිවිසුම් වගකීම තීරණය කිරීමේදී භාවිතා කරන ප්‍රධාන උපකල්පන පහත වගුවේ දක්වා ඇත.

| උපකල්පනය | විස්තරය |
|---|---|
| මර්ත්‍යතාව | - වාර්ෂික දායකයින්ගේ මර්ත්‍යතාව 1% කින් ආසන්න වශයෙන් වැඩි දියුණු කිරීමට ඉඩ සලසන පරිදි වයස වසරකින් අවහිර කිරීමෙන් පිරිමි (90) කින් හා කාන්තා (90) කින් සාමාන්‍යට බර තැබීම. |
| වියදම් | සමාගමේ 2024 අභ්‍යන්තර වියදම් අධ්‍යයනයන් සහ වියදම් සහභාගීත්ව සහ සහභාගී නොවන ව්‍යාපාර ලෙස බෙදා ඇත. |
| අවලංගුවීම්/පවාරණ | අභ්‍යන්තර පළපුරුදු අධ්‍යයනයන් සහ සුදුසු පරිදි ආයුගණක විනිශ්චය ක්‍රියාත්මක කිරීම මත පදනම් වේ. විශ්වාසදායක දත්ත නොමැති අවස්ථාවල හෝ අකාලික සිදුවීම්වලදී තීරණ ගන්නා විට, සමාගම තමන්ගේ අත්දැකීම් සහ විනිවිදභාවය පදනම් කරගෙන ක්‍රියා කරයි. මේ අතර, වෙළඳපලේ සාමාන්‍ය අපේක්ෂා සහ යෙදුම් ක්‍රියාමාර්ග ගැනද — එම නිෂ්පාදන වර්ගයට සහ ඉලක්ක වෙළඳපලට අදාළව — සලකා බලනු ලැබේ. |
| රෝගාතුරවීම | සමූහයේ අභ්‍යන්තර පළපුරුදු සහ සත්‍ය ත්ත්වයට එරෙහිව අපේක්ෂිත විශ්ලේෂණය මත පදනම්ව. අපේක්ෂිත අනුපාත ප්‍රතිරක්ෂණ අනුපාත වගු මත පදනම් වේ. |
| ප්‍රතිරක්ෂණය | ප්‍රතිරක්ෂණයට අදාළ සමූහයේ අභ්‍යන්තර පළලපුරුදු අධ්‍යයනයන් මත පදනම් වේ. |
| ආයෝජන ප්‍රතිඵලය | 2024.12.31 දිනට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් යෝජනා කරන ලද අවදානම් රහිත අනුපාත ව්‍යුහය |

2024 වසර පුරාවට සමූහය සිය ජීවිත රක්ෂණ ව්‍යාපාරය සඳහා ස්ථාවර සහ ශක්තිමත් නුබුන්වත් හැකියා අනුපාතයක් පවත්වා ගෙන ගිය අතර, 2024 දෙසැම්බර් 31 වන දින වන විට, අවදානම් මත පදනම් වූ ප්‍රාග්ධන ප්‍රමාණතා අනුපාතය (CAR), 568% ක් වන අතර ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් හි ජීවිත අංශය යටතේ 2023 දෙසැම්බර් 31 වන විට එය 422% ක් විය. මෙය නියාමන අවම අවශ්‍යතාවය වන 120% ට වඩා බෙහෙවින් වැඩිය.

| උපකල්පනය | උපකල්පනයේ වෙනස | වගකීම මත බලපෑම |
|---|---|---|
| මර්ත්‍යතාව | +10% | මිලියන 886 |
| | -10% | මිලියන (886) |
| වියදම් | +10% | මිලියන 2,638 |
| පැවතීම | +20% | මිලියන (2,265) |
| | -20% | මිලියන 2,265 |
| වට්ටම් අනුපාතය | අවදානම් පදනම් ප්‍රාග්ධනය යටතේ ඉහළ කම්පන තත්ත්වය | මිලියන (21,023) |
| | අවදානම් පදනම් ප්‍රාග්ධනය යටතේ පහළ කම්පන තත්ත්වය | මිලියන 27,595 |

### ජීවිත

අවදානම් පදනම් ප්‍රාග්ධන නීතිවලට අනුකූලව, දිගුකාලීන රක්ෂණ ගිවිසුම් සඳහා සෘණාත්මක ඔප්පු වගකීම් පිළිගත හැකි යැයි සලකනු ලබන අතර සෘණාත්මක ඔප්පු වගකීම් සහිත තනි ගිවිසුම් සම්බන්ධයෙන් වගකීම්වල වටිනාකම ශුන්‍යයට අඩු කර නොමැත. කෙසේ වෙතත්, බෙදා හැරීමේ පදනම (එනම් SLFRS අරමුණු සඳහා) වගකීම් සඳහා, සමූහය වඩාත් විචක්ෂණශීලී ප්‍රවේශයක් අනුගමනය කර ඇති අතර සෘණාත්මක වගකීම් ඔප්පු මට්ටමේ දී බිංදුව දක්වා අඩු කර ඇත.

### ජීවිත නොවන

අවදානම් පදනම් ප්‍රාග්ධනය නීතිවලට අනුකූලව, වට්ටම් කළ ඔප්පු වගකීම් රඳවා ගත හැකි වුවද, SLFRS වාර්තාකරණයේ අරමුණ සඳහා, වට්ටම් නොකළ වගකීම් වට්ටම් කළ වගකීම්වලට වඩා වැඩි නම්, වට්ටම් නොකළ වගකීම් රඳවා තබා ගැනීම සඳහා සමූහය වඩාත් විචක්ෂණශීලී ප්‍රවේශයක් අනුගමනය කර ඇත.

### නිෂ්පාදන කාණ්ඩය අනුව ගිවිසුම් වගකීම් වෙන් කිරීම

| දෙසැම්බර් 31 දිනට | 2024 | | | 2023 | | |
|---|---|---|---|---|---|---|
| | රක්ෂණ වගකීම් (ලාභ සහිත) රු. 000' | රක්ෂණ වගකීම් (ලාභ රහිත) රු. 000' | මුළු දළ රක්ෂණ වගකීම් රු. 000' | රක්ෂණ වගකීම් (ලාභ සහිත) රු. 000' | රක්ෂණ වගකීම් (ලාභ රහිත) රු. 000' | මුළු දළ රක්ෂණ වගකීම් රු. 000' |
| සම්පූර්ණ ජීවිත | **15,753** | **4,010** | **19,763** | 14,074 | 3,740 | 17,813 |
| දායාද රක්ෂණය | **95,304,980** | **7,884,963** | **103,189,943** | 73,856,974 | 6,373,566 | 80,230,540 |
| කාලීන රක්ෂණය | **-** | **2,919,583** | **2,919,583** | - | 2,563,886 | 2,563,886 |
| වාර්ෂිකය | **16,752,827** | **4,046,401** | **20,799,227** | 12,774,746 | 3,258,587 | 16,033,333 |
| රිඩර් ප්‍රතිලාභ | **90,329** | **3,713,075** | **3,803,404** | 85,050 | 3,235,029 | 3,320,079 |
| එකතුව | **112,163,889** | **18,568,031** | **130,731,920** | 86,730,844 | 15,434,808 | 102,165,651 |

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් යටතේ සමූහයේ සහභාගීත්ව සහ සහභාගී නොවන අරමුදල් තත්ත්වය පහත වගුවේ දැක්වේ.

| සහභාගී වන අරමුදලට එරෙහිව සහභාගී නොවන අරමුදල | සාභාගීත්ව රු. 000' | සාභාගී නොවන රු. 000' | එකතුව රු. 000' |
|---|---|---|---|
| 2024 | **194,546,922** | **18,681,308** | **213,228,229** |
| ප්‍රතිශතය | **91.24%** | **8.76%** | |
| 2023 | 164,885,291 | 15,984,632 | 180,869,924 |
| ප්‍රතිශතය | 91.16% | 8.84% | |

# 44 රක්ෂණය හා මූල්‍ය අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස...)

## 44.1 රක්ෂණ අවධානම (ඉතිරි කොටස...)

### 44.1.2 ජීවිත නොවන රක්ෂණ ගිවිසුම්

#### සාමාන්‍ය රක්ෂණ අවධානම

සාමාන්‍ය රක්ෂණ අවදානමට රක්ෂිත සිදුවීම් සිදුවන වාර ගණන පිළිබඳ අවිනිශ්චිතතාවය මෙන්ම එහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන හිමිකම්වල තීව්‍රතාවයේ අවිනිශ්චිතතාවය හේතුවෙන් සැලකිය යුතු පාඩුවක් සිදුවීමේ සාධාරණ සම්භාවිතාව ද ඇතුළත් වේ.

සමූහයේ ප්‍රධාන රක්ෂණ ක්ෂේත්‍ර පිළිබඳ සාරාංශයක් පහත දක්වා ඇත.

- මෝටර් රථවාහන රක්ෂණයට මෝටර් රථ භෞතික හානි, රක්ෂිත වාහනය නැතිවීම සහ මෝටර් රථ තෙවන පාර්ශවීය වගකීම් රක්ෂණය ඇතුළත් වේ.
- දේපල හානි රක්ෂණයට, ගිනි අවදානම් (උදාහරණයක් ලෙස ගින්න, පිපිරීම් සහ ව්‍යාපාර බාධා කිරීම්), ස්වාභාවික අනතුරු (උදාහරණයක් ලෙස භූමිකම්පාව, සුළං කුණාටු සහ ගංවතුර), ඉංජිනේරු මාර්ග (උදාහරණයක් ලෙස, බොයිලේරු පිපිරීම, යන්ත්‍රෝපකරණ බිඳවැටීම් සහ ඉදිකිරීම්) සහ සමුද්‍ර (භාණ්ඩ සහ නෞකා) ඇතුළත් වේ.
- වගකීම් රක්ෂනය යටතේ සාමාන්‍ය / පොදු වගකීම්, නිෂ්පාදන වගකීම්, අතිරික්ත සහ ආවරණ වගකීම්, වෘත්තීය වගකීම් සහ දෝෂ සහ නොසලකා හැරීම් වගකීම් ඇතුළත් වේ.
- විශේෂ රක්ෂණ වර්ග යටතේ, අධ්‍යක්ෂවරුන් සහ නිලධාරීන් සඳහා රක්ෂණය, ණය සහ ආරක්ෂක වගකීම්, වංචා සහ විශ්වාසභංගය පිළිබඳ වගකීම්, අනතුරු සහ සෞඛ්‍ය රක්ෂණය සහ වගා රක්ෂණය අදාළ වේ.
- සේවක අනතුරු රක්ෂණය යටතේ සේවක වන්දි සහ සේවායෝජකයින්ගේ වගකීම ඇතුළත් වේ

සමූහයේ ප්‍රතිරක්ෂණ උපාය මාර්ගය වන්නේ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය ක්‍රියාත්මක වන කර්මාන්ත සහ භූගෝලීය කලාප හරහා සාමාන්‍ය රක්ෂණ අවදානම් විවිධාංගීකරණය කිරීමේ වාසිය ලබා ගැනීමයි. කොටස් හිමියන්ගේ වටිනාකම ප්‍රශස්ත කිරීමට සමූහය උත්සාහ කරන්නේ එහි මධ්‍ය කාලීන ප්‍රතිලාභ ඉලක්ක කරා ළඟා කර ගැනීමෙනි. එසේ කිරීම සඳහා එහි තරඟකාරී ශක්තීන්ගෙන් ප්‍රයෝජන ගැනීමට සහ බාධාකාරී අස්ථාවරත්වය සමඟ අවදානම් වළක්වා ගැනීමට අරමුණු කරන විචක්ෂණශීලී, ස්ථාවර ප්‍රතිරක්ෂණ දර්ශනයක් අවශ්‍ය වේ. සමූහයේ ප්‍රතිරක්ෂණයේ හරය වන්නේ ශක්තිමත් පාලන ක්‍රියාවලියකි.

ප්‍රතිරක්ෂණයට පෙර සහ ප්‍රතිරක්ෂණයෙන් පසු සෘජු ලිඛිත වාරික මත පදනම්ව සමූහයේ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය තුළ ඇති අවදානම් සංකේන්ද්‍රණය පහත වගුවේ දැක්වේ.

| 2024<br>වර්ගය | දළ ලිඛිත වාරිකය රු. 000' | ජාතික රක්ෂණ භාර අරමුදලට (NITF) ලබාදුන් මුදල් රු. 000' | ප්‍රතිරක්ෂණ රු. 000' | ශුද්ධ ලිඛිත වාරික රු . 000' | % |
|---|---|---|---|---|---|
| මොටර්රථ වාහන | 13,189,328 | (1,975,623) | (150,618) | 11,063,087 | 66.76% |
| ගිනි | 2,842,920 | (826,491) | (1,558,067) | 458,362 | 2.77% |
| නාවුක | 872,291 | (7,206) | (572,311) | 292,774 | 1.77% |
| වෙනත් | 6,666,109 | (79,931) | (1,827,898) | 4,758,280 | 28.71% |
| | 23,570,648 | (2,889,251) | (4,108,894) | 16,572,503 | 100.00% |

| 2023<br>වර්ගය | දළ ලිඛිත වාරිකය රු. 000' | ජාතික රක්ෂණ භාර අරමුදලට (NITF) ලබාදුන් මුදල්Rs. 000' | ප්‍රතිරක්ෂණරු. 000' | ශුද්ධ ලිඛිත වාරික රු . 000' | % |
|---|---|---|---|---|---|
| මොටර්රථ වාහන | 13,508,448 | - | (433,238) | 13,075,211 | 74.95% |
| ගිනි | 2,951,485 | - | (2,079,701) | 871,784 | 5.00% |
| නාවුක | 942,988 | - | (219,515) | 723,473 | 4.15% |
| වෙනත් | 5,742,135 | - | (2,968,361) | 2,773,774 | 15.90% |
| | 23,145,056 | - | (5,700,815) | 17,444,242 | 100.00% |

# 44 රක්ෂණය හා මූල්‍ය අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස...)

## 44.1 රක්ෂණ අවදානම (ඉතිරි කොටස...)

### ප්‍රතිරක්ෂණ අවධානම

සමූහය එහි අවදානම් අවම කිරීමේ වැඩසටහනේ කොටසක් ලෙස ප්‍රතිරක්ෂණ මිලදී ගනී. පවාරණ ප්‍රතිරක්ෂණ සමානුපාතික සහ සමානුපාතික නොවන පදනම මත සිදු කෙරේ. සමානුපාතික ප්‍රතිරක්ෂණ විධිවිධානයට කෝටා කොටස් සහ අතිරික්ත ගිවිසුම් වැඩසටහන් දෙකම ඇතුළත් වන අතර ඒවා ඇතැම් ව්‍යාපාර පන්තිවලට සමූහයේ සමස්ත නිරාවරණය අඩු කිරීම සඳහා යොදාගනු ලැබේ. ප්‍රධාන වශයෙන් අලාභ ප්‍රතිරක්ෂණ විධිවිධාන ඉක්මවා ඇති සමානුපාතික නොවන ප්‍රතිරක්ෂණ වැඩසටහන්, විශාල තනි සහ ව්‍යසනකාරී පාඩු සඳහා සමූහයේ ශුද්ධ නිරාවරණය අවම කිරීම සඳහා නිර්මාණය කර ඇත. අලාභ ප්‍රතිරක්ෂණ වැඩසටහන් වල රඳවා ගැනීමේ සීමාවන් නිෂ්පාදන වර්ගය අනුව වෙනස් වේ.

සමූහය සමඟ ගිවිසුම් ඇති ප්‍රතිරක්ෂණ සමාගම්වල ණය ශ්‍රේණිගත කිරීම් පහත වගුවේ දැක්වේ.

| සමාගමේ නම | මව් රට | ණය ශ්‍රේණිගත කිරීම | මූල්‍ය ශක්ති ශ්‍රේණිගත කිරීම | ශ්‍රේණිගත කිරීමේ ආයතනයේ නම |
|---|---|---|---|---|
| අබු ධාබි නැෂනල් ඉන්ෂුවරන්ස් කම්පැනි | එක්සත් අරාබි එමීර් රාජ්‍යය | A | a | ඒ.එම්.බෙස්ට් |
| ඒසිස් මැනේජින් එජන්සි ලිමිටඩ් | එංගලන්තය | A+ | aa- | ඒ.එම්.බෙස්ට් |
| ඇෆ්‍රිකා රීඉන්ෂුවරන්ස් කොපරේෂන් | නයිජීරියාව | A- | A- | එස් ඇන්ඩ් පී |
| ඒඅයිජී ඒෂියා පැසිෆික් ඉන්ෂුවරන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සිංගප්පූරුව | A+ | a+ | ඒ.එම්.බෙස්ට් |
| ඒඅයිජී එමිරේඑ් ලිමිටඩ් | එක්සත් අරාබි එමීර් රාජ්‍යය | A+ | a+ | ඒ.එම්.බෙස්ට් |
| ඇලියාන්ස් ග්ලෝබල් කොපරට් ඇන්ඩ් ස්පෙෂල්ටි එස්ඊ | ජර්මනිය | A+ | aa | ඒ.එම්.බෙස්ට් |
| ඇලයිඩ් වර්ල්ඩ් මැනේජින් එජන්සි ලිමිටඩ් | බර්මියුඩා | A+ | aa- | ඒ.එම්.බෙස්ට් |
| ඒඑම් ෆස්ට් ස්පෙෂල්ටි ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | ඇමරිකාව | A- | a- | ඒ.එම්.බෙස්ට් |
| ඇන්වරා ලිමිටඩ් | එක්සත් අරාබි එමීර් රාජ්‍යය | A+ | A+ | එස් ඇන්ඩ් පී |
| ඒඔන් අන්ඩරයිටර් මැනේජර්ස් | එංගලන්තය | A+ | aa- | ඒ.එම්.බෙස්ට් |
| ඇපොලෝ සින්ඩිකට් මැනේජ්මන්ට් ලිමිටඩ් | එංගලන්තය | A | a | ඒ.එම්.බෙස්ට් |
| ආච් මැනේජින් එජන්සි ලිමිටඩ් | එංගලන්තය | A+ | aa- | ඒ.එම්.බෙස්ට් |
| ආක් සින්ඩිකට් මැනේජ්මන්ට් ලිමිටඩ් | එංගලන්තය | A+ | aa- | ඒ.එම්.බෙස්ට් |
| ඇස්කොට් අන්ඩරයිටින් ලිමිටඩ් | එංගලන්තය | A+ | aa- | ඒ.එම්.බෙස්ට් |
| ඔරෝරා පී ඇන්ඩ් අයි ක්ලබ් | එංගලන්තය | AA- | AA- | එස් ඇන්ඩ් පී |
| ඒ ඒ එක්ස් ඒ එක්ස් එල් | ප්‍රංශය | AA- | AA- | එස් ඇන්ඩ් පී |
| ආක්සිස් මැනේජින් එජන්සි ලිමිටඩ් | එංගලන්තය | A+ | aa- | ඒ.එම්.බෙස්ට් |
| බාජාජ් ඇලියන්ස් ඉන්ෂුවරන්ස් කොම්පැනි ලිමිටඩ් | ඉන්දියාව | Aa2 | Aa2 | මූඩිස් |
| බීස්ලි ෆර්ලොන්ජ් ලිමිටඩ් | එංගලන්තය | A | a+ | ඒ.එම්.බෙස්ට් |
| බර්ක්ෂයර් හතවේ ස්පෙෂල්ටි ඉන්ෂුවරන්ස් | ඇමෙරිකාව | AA+ | AA+ | එස් ඇන්ඩ් පී |
| බෙස්ට් මෙරිඩියන් ඉන්ටනැෂනල් ඉන්ෂුවරන්ස් කොම්පැනි | ඇමෙරිකාව | A- | a- | ඒ.එම්.බෙස්ට් |
| කැනෝපියස් මැනේජින් ඒජන්සි ලිමිටඩ් | එංගලන්තය | A+ | aa- | ඒ.එම්.බෙස්ට් |
| කැස්ටල් අන්ඩරයිටින් ඒජන්සිස් ලිමිටඩ් | එංගලන්තය | A+ | aa- | ඒ.එම්.බෙස්ට් |
| සීඑෆ්සී අන්ඩරයිටින් ලිමිටඩ් | එංගලන්තය | A | aa- | ඒ.එම්.බෙස්ට් |
| චයිනා රීඉන්ෂුවරන්ස් (ග්රුප්) කොපරේෂන් සිංගප්පූරු ශාඛාව | චීනය | A | a | ඒ.එම්.බෙස්ට් |
| චබ් යුරෝපියන් ග්රුප් එස්ඊ | ප්‍රංශය | A++ | aa+ | ඒ.එම්.බෙස්ට් |
| චබ් අන්ඩරයිටින් (ඩීඅයිඑෆ්සී) ලිමිටඩ් | ඇමෙරිකාව | A++ | aa+ | ඒ.එම්.බෙස්ට් |
| කොන්වෙක්ස් ඉන්ෂුවරන්ස් යුකේ ලිමිටඩ් | එංගලන්තය | A | a | ඒ.එම්.බෙස්ට් |
| එකෝ රීඉන්ෂුවරන්ස් ලිමිටඩ් | ස්විට්සර්ලන්තය | A- | a- | එස් ඇන්ඩ් පී |
| එල්සෙකෝ ඩීඅයිඑෆ්සී | එංගලන්තය | AA- | AA- | එස් ඇන්ඩ් පී |
| එවරෙස්ට් ඉන්ෂුවරන්ස් (අයර්ලන්ඩ්) ඩෙසිග්නේටඩ් ඇක්ටිවිටි කම්පැනි | අයර්ලන්තය | A- | a- | ඒ.එම්.බෙස්ට් |
| ෆිඩෙලිස් අන්ඩරයිටින් ලිමිටඩ් | එංගලන්තය | A+ | aa- | ඒ.එම්.බෙස්ට් |
| ගාර්ඩ් මැරින් ඇන්ඩ් එනර්ජි ලිමිටඩ් (සිංගප්පූරු ශාඛාව) | බර්මියුඩා | A+ | A+ | එස් ඇන්ඩ් පී |
| ජෙනරල් ඉන්ෂුවරන්ස් කොපරේෂන් ඔෆ් ඉන්ඩියා | ඉන්දියාව | A- | a- | ඒ.එම්.බෙස්ට් |
| ජෙනරාලි චයිනා ඉන්ෂුවරන්ස් කොම්පැනි ලිමිටඩ් | ඉතාලිය | A | a+ | ඒ.එම්.බෙස්ට් |

# 44 රක්ෂණ හා මූල්‍ය අවදානම (ඉතිරි කොටස...)

## 44.1 රක්ෂණ අවදානම (ඉතිරි කොටස...)

### ප්‍රතිරක්ෂණ අවදානම (ඉතිරි කොටස...)

| සමාගමේ නම | මව් රට | ණය ශ්‍රේණිගත කිරීම | මූල්‍ය ශක්ති ශ්‍රේණිගත කිරීම | ශ්‍රේණිගත කිරීමේ ආයතනයේ නම |
|---|---|---|---|---|
| ජෙනරාලි අයි ඒ ආර් ඩී එස්. ඒ | ඉතාලිය | A | a+ | ඒ.එම්.බෙස්ට් |
| ග්ලෝබ් අන්ඩරයිටින් ලිමිටඩ් | එංගලන්තය | A- | a- | ඒ.එම්.බෙස්ට් |
| ග්‍රේට් ලේක්ස් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | ජර්මනිය | AA- | AA- | එස් ඇන්ඩ් පී |
| ග්‍රීන්ලයිට් රී ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | අයර්ලන්තය | A- | a- | ඒ.එම්.බෙස්ට් |
| හැනෝවර් රක් එස්.ඊ මැලේසියා ශාඛාව | ජර්මනිය | A+ | aa | ඒ.එම්.බෙස්ට් |
| හාර්ඩි (අන්ඩරයිටින් ඒජන්සීස්) ලිමිටඩ් | එංගලන්තය | A | a+ | ඒ.එම්.බෙස්ට් |
| එච් ඩී අයි ග්ලෝබල් ස්පෙෂල්ටි එස්.ඒ, හැනෝවර්, ස්කැන්ඩිනේවියානු ශාඛාව | ජර්මනිය | A+ | aa- | ඒ.එම්.බෙස්ට් |
| හෙල්වෙෂියා ඇෂුරන්ස් එස්.ඒ., ලේ හවර්, ප්‍රාන්සය | ස්විට්සර්ලන්තය | A+ | A+ | ෆිච් |
| හුවෙයි ප්‍රොපටි ඇන්ඩ් කැෂුවල්ටි ඉන්ෂුවරන්ස් කම්පැනි ලිමිටඩ් | චීනය | A+ | A+ | ෆිච් |
| කොරියන් රී ඉන්ෂුවරන්ස් කම්පැනි | දකුණු කොරියාව | A | a | ඒ.එම්.බෙස්ට් |
| කුවේට් රී ඉන්ෂුවරන්ස් කම්පැනි | කුවේට් | A- | a- | ඒ.එම්.බෙස්ට් |
| ලැන්කෂයර් සින්ඩිකට් ලිමිටඩ් | එංගලන්තය | A+ | aa- | ඒ.එම්.බෙස්ට් |
| ලිබර්ටි මියුචුවල් ඉන්ෂුවරන්ස් යුරෝප් එස්.ඒ - යු.කේ. ශාඛාව | එංගලන්තය | A | A | එස් ඇන්ඩ් පී |
| ලිබර්ටි ස්පෙෂල්ටි මාර්කට්ස් මෙනා ලිමිටඩ් | එංගලන්තය | A | a | ඒ.එම්.බෙස්ට් |
| ලිබර්ටි ස්පෙෂල්ටි මාර්කට්ස් සිංගප්පූරු පීටීඊ ලිමිටඩ් | සිංගප්පූරුව | A | a | ඒ.එම්.බෙස්ට් |
| මැලේසියන් රී ඉන්ෂුවරන්ස් බර්හඩ් | මැලේසියාව | A- | a- | ඒ.එම්.බෙස්ට් |
| මැප්ෆ්රේ රී කොම්පැනියා ද රීඅසෙගුරෝස් එස්ඒ | ස්පාඤ්ඤය | A | a+ | ඒ.එම්.බෙස්ට් |
| මාර්කෙල් ඉන්ටනැෂනල් සිංගප්පූරු පීවීටී ලිමිටඩ් | සිංගප්පූරුව | A | a+ | ඒ.එම්.බෙස්ට් |
| මාර්ලින් අන්ඩරයිටර්ස් (ලොයිඩ්ස්) | එංගලන්තය | A+ | aa- | ඒ.එම්.බෙස්ට් |
| මීනා රී අන්ඩරයිටර්ස් ලිමිටඩ් | එක්සත් අරාබි එමීර් රාජ්‍යය | A- | A- | එස් ඇන්ඩ් පී |
| එම් එම් ඒ අයි ආර් ඩී එස්.ඒ., ලේ මාන්ස්, ප්‍රංශය | ප්‍රංශය | AA- | AA- | එස් ඇන්ඩ් පී |
| එම් එස් ඇම්ලින් ලොයිඩ්ස් සින්ඩිකේට් නම්බර් 2001 | එංගලන්තය | A+ | aa- | ඒ.එම්.බෙස්ට් |
| එම් එස් ෆස්ට් කැපිටල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සිංගප්පූරුව | A | a+ | ඒ.එම්.බෙස්ට් |
| මුන්චෙනර් රක්වර්සිචෙරංස්-ගෙසල්ෂාෆ්ට් | ජර්මනිය | AA- | AA- | එස් ඇන්ඩ් පී |
| මියුනික් රී සින්ඩිකේට් සිංගප්පූරු පීටීඊ ලිමිටඩ් | සිංගප්පූරුව | A+ | aa- | ඒ.එම්.බෙස්ට් |
| නැස්කෝ ප්‍රාන්ස් | ප්‍රංශය | A | a+ | ඒ.එම්.බෙස්ට් |
| නාවියම් මැරින් ලිමිටඩ් | එංගලන්තය | A | a | ඒ.එම්.බෙස්ට් |
| නෙක්සස් අන්ඩරයිටින් ලිමිටඩ් | එංගලන්තය | A- | a- | එස් ඇන්ඩ් පී |
| පී.අයි.සී.සී. ප්‍රොපටි ඇන්ඩ් කැෂුවල්ටි කම්පැනි ලිමිටඩ් | චීනය | A- | A- | එස් ඇන්ඩ් පී |
| පයින් වොක් කැපිටල් ලිමිටඩ් | එංගලන්තය | A | a | ඒ.එම්.බෙස්ට් |
| පින් ආන් ප්‍රොපටි ඇන්ඩ් කැෂුවල්ටි ඉන්ෂුවරන්ස් කම්පැනි ඔෆ් චයිනා | චීනය | A | a+ | ඒ.එම්.බෙස්ට් |
| ප්‍රොබිටාස් මැනේජින් ඒජන්සි ලිමිටඩ් | එංගලන්තය | A+ | aa- | ඒ.එම්.බෙස්ට් |
| පී.වී.අයි. ඉන්ෂුවරන්ස් කෝපරේෂන් | වියට්නාමය | A- | a- | ඒ.එම්.බෙස්ට් |
| කිව් බී ඊ යුරෝප් එස්ඒ/එන්වී | බෙල්ජියම | A | a+ | ඒ.එම්.බෙස්ට් |

# 44 රක්ෂණ හා මූල්‍ය අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස...)

## 44.1 රක්ෂණ හා මූල්‍ය අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස...)

| සමාගමේ නම | මව් රට | ණය ශ්‍රේණිගත කිරීම | මූල්‍ය ශක්ති ශ්‍රේණිගත කිරීම | ශ්‍රේණිගත කිරීමේ ආයතනයේ නම |
|---|---|---|---|---|
| රෙඩ්බ්‍රිජ් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් | බාබඩෝස් | B++ | bbb | ඒ.එම්.බෙස්ට් |
| රෝයල් සන් අලයන්ස් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් (ඕඅයිඑෆ්සී) | එංගලන්තය | A | a+ | ඒ.එම්.බෙස්ට් |
| සැම්සන් රිඉන්ෂුවරන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දකුණු කොරියාව | A++ | aa+ | ඒ.එම්.බෙස්ට් |
| සිංගප්පූරු රිඉන්ෂුවරන්ස් කොර්පරේෂන් ලිමිටඩ් (සිංගප්පූරු රී) | සිංගප්පූරුව | A | a | ඒ.එම්.බෙස්ට් |
| සිනොපෙක් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | චීනය | A+ | A+ | එස් ඇන්ඩ් පී |
| සිරියස් පොයින්ට් ඉන්ටර්නැෂනල් ඉන්ෂුවරන්ස් කොර්පරේෂන් (පබ්ලික්) | ස්වීඩනය | A- | a- | ඒ.එම්.බෙස්ට් |
| එස්එම්එ එස්ජී | ප්‍රංශය | A+ | A+ | එස් ඇන්ඩ් පී |
| ස්ටාර් ඉන්ටර්නැෂනල් (යුරෝප්) ලිමිටඩ් | එංගලන්තය | A | a+ | ඒ.එම්.බෙස්ට් |
| ස්ටාර් ඉන්ටර්නැෂනල් ඉන්ෂුවරන්ස් (සිංගප්පූරු) ප්‍රයිවට් ලිමිටඩ් ලාබුවාන් ශාඛාව | සිංගප්පූරුව | A- | a | ඒ.එම්.බෙස්ට් |
| ස්ටීම්ෂිප් මිච්වුවල් අන්ඩර්රයිටින් අසෝසියේෂන් ලිමිටඩ් | එංගලන්තය | A+ | aa- | ඒ.එම්.බෙස්ට් |
| සුකූන් ඉන්ෂුවරන්ස් (පෙර නම් වූ ඕමාන් ඉන්ෂුවරන්ස් කම්පනි) | එක්සත් අරාබි එමීර් රාජ්‍යය | A | a | ඒ.එම්.බෙස්ට් |
| ස්විස් රී ඉන්ටර්නැෂනල් එස්ඊ, ලාබුවාන් ශාඛාව | ලුසේම්බෝර්ග් | AA- | AA- | එස් ඇන්ඩ් පී |

### දළ විශ්ලේෂණය

සමාගම ප්‍රධාන වශයෙන් මූල්‍ය අවදානම්, රක්ෂණ අවදානම් සහ නියාමන අවදානම් වලට නිරාවරණය වේ. මෙම සටහන් මඟින් එවැනි අවදානම් මැනීම, කළමනාකරණය කිරීම සහ අවම කිරීම සඳහා පවතින සමාගමේ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි පිළිබඳ කරුණු දක්වනු ලැබේ. සමාගම විසින් අවදානම් කළමනාකරණ රාමුවක් ක්‍රියාත්මක කර ඇති අතර සමාගමේ අවදානම් කළමනාකරණ කාර්යයන් ස්ථාපිත කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා වූ සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ.

### මූල්‍ය අවධානම

සමාගමේ ආයෝජන ක්‍රියාකාරකම් ණය අවදානම්, ද්‍රවශීලතා අවදානම් සහ වෙළඳපල අවදානම් ඇතුළු මූල්‍ය අවදානම් වලට නිරාවරණය වේ. එම අවදානම් අවම කිරීම සහ ආයෝජන ප්‍රතිලාභ ප්‍රශස්ත කිරීම සඳහා ආයෝජන කමිටුව වගකිව යුතුය.

වත්කම් ප්‍රතිලාභවල ඉහළ අස්ථාවරත්වය, ඉහළ සහසම්බන්ධතා හේතුවෙන් විවිධාංගීකරණ ප්‍රතිලාභ අඩුවීම සහ වෙළඳපල පිළිබඳ සංජානනය සහ අදහස්වල පුළුල් විසරණය මගින් සංලක්ෂිත වත්මන් කැලඹිලි සහිත වෙළඳපොළ තත්වයන් තුලදී ආයෝජන අවදානම් කළමනාකරණය අතිශයින් වැදගත් වේ.

ආයෝජන අවදානම් කළමනාකරණයේ අරමුණ වන්නේ ආයෝජන අරමුණු සාක්ෂාත් කර ගැනීමට බලපාන අවදානම් ක්ෂණිකව හඳුනා ගැනීම, මැනීම, කළමනාකරණය කිරීම, වාර්තා කිරීම සහ අධීක්ෂණය කිරීමයි. අදාළ (ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම) රක්ෂණ රෙගුලාසි වල සන්දර්භය තුළ විචක්ෂණශීලී අවදානම් කළමනාකරණ මූලධර්ම මත පදනම්ව, අරමුදලේ වගකීම් සපුරාලීම සඳහා වත්කම් වර්ධනය මෙන්ම ආදායම අතර සුදුසු සමතුලිතතාවයක් පවත්වා ගැනීම සඳහා අවදානම් ගැනීම, වළක්වා ගැනීම, අවම කිරීම සහ සකස් කිරීම මෙයට ඇතුළත් වේ.

## 44.2 වෙළඳපොල අවධානම

වෙළඳපොළ අවදානම යනු විදේශ විනිමය අනුපාත සහ පොලී අනුපාත වැනි වෙළඳපොළ මිල ගණන් වල වෙනස්වීම් වල අවදානම වන අතර එය සමූහයේ ආදායමට හෝ එහි මූල්‍ය උපකරණවල වටිනාකමට බලපානු ඇත. වෙළඳපොළ අවදානම් කළමනාකරණයේ අරමුණ වන්නේ පිළිගත හැකි පරාමිතීන් තුළ වෙළඳපොළ අවදානම් නිරාවරණයන් කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම සහ ප්‍රතිලාභ ප්‍රශස්ත කිරීමයි.

ආයෝජන කළඹ කළමනාකරණය කිරීමේදී කොටස් සඳහා උපරිම නිරාවරණ සීමාව සමූහය විසින් පවත්වා ගෙන යනු ලැබේ. තවද, අවිධිමත් අවදානම් අවම කිරීම සඳහා සමූහය විසින් ආයෝජන කළඹ විවිධ අංශවලට විවිධාංගීකරණය කර ඇත.

### ස්කන්ධ වෙළඳපොළ සංවේදීතාව

| සමූහය | වෙළඳපොල නැගීම | | වෙළඳපොළ පහත වැටීම | |
|---|---|---|---|---|
| | ලාභය මත බලපෑම රු. 000' | OCI මත බලපෑම රු. 000' | ලාභය මත බලපෑම රු. 000' | OCI මත බලපෑම රු. 000' |
| ***2024* දෙසැම්බර් *31* වන දිනට** කම්පන මට්ටම: | | | | |
| **5%** | **814,229** | **2,377,558** | **(814,229)** | **(2,377,558)** |
| **10%** | **1,628,458** | **4,755,116** | **(1,628,458)** | **(4,755,116)** |
| | **2,442,687** | **7,132,675** | **(2,442,687)** | **(7,132,675)** |
| *2023* දෙසැම්බර් *31* වන දිනට කම්පන මට්ටම: | | | | |
| 5% | 714,479 | 1,303,386 | (714,479) | (1,303,386) |
| 10% | 1,428,958 | 2,606,771 | (1,428,958) | (2,606,771) |
| | 2,143,437 | 3,910,157 | (2,143,437) | (3,910,157) |

# 44 රක්ෂණ සහ මූල්‍ය අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස...)

## 44.2 වෙළඳපොල අවදානම (ඉතිරි කොටස...)

| සමාගම | වෙළඳපොල නැගීම | | වෙළඳපොළ පහත වැටීම | |
|---|---|---|---|---|
| | ලාභය මත බලපෑම රු. 000' | OCI මත බලපෑම රු. 000' | ලාභය මත බලපෑම රු. 000' | OCI මත බලපෑම රු. 000' |
| ***2024*** **දෙසැම්බර්** ***31*** **වන දිනට**<br>**කම්පන මට්ටම:** | | | | |
| **5%** | **100,507** | **1,295,006** | **(100,507)** | **(1,295,006)** |
| **10%** | **201,013** | **2,590,012** | **(201,013)** | **(2,590,012)** |
| | **301,520** | **3,885,019** | **(301,520)** | **(3,885,019)** |
| *2023* දෙසැම්බර් *31* වන දිනට<br>කම්පන මට්ටම: | | | | |
| 5% | 714,479 | 1,303,386 | (714,479) | (1,303,386) |
| 10% | 1,428,958 | 2,606,771 | (1,428,958) | (2,606,771) |
| | 2,143,437 | 3,910,157 | (2,143,437) | (3,910,157) |

### 44.2.1 පොලී අනුපාත අවධානම

පොලී අනුපාත අවදානම යනු ප්‍රතිලාභ වක්‍ර හැඩයේ වෙනස්කම් ඇතුළුව පොලී අනුපාතවල වෙනස්කම් හේතුවෙන් ඇතිවන පාඩුවේ අවදානමයි. ඒ අතරම අවදානම්-රහිත පොලී අනුපාත ප්‍රතිලාභ වක්‍රය මත ණය පැතිරීම්වල මට්ටමේ හෝ අස්ථිරතාවයේ වෙනස්කම් හේතුවෙන් වත්කම් සහ වගකීම්වල වටිනාකම්වල සංවේදනය ණය පැතිරීම් අවදානම විසින් විස්තර කරනු ලැබේ.

සීමාවන් සහිත සමුච්චිත තත්ත්වයන්ට අනුකූලව, සෑම ප්‍රධාන පරිණත කාණ්ඩයකම පොලී අනුපාත අවදානම කළමනාකරණය කෙරේ. අඩු අස්වැන්නක් ලබා දෙන ආයෝජන වලින් සාපේක්ෂව ඉහළ අස්වැන්නක් ලබා දෙන ආයෝජන වෙත උපායමාර්ගිකව මාරු වෙමින්, නොගැලපීම් වල කාලසීමාව සමීපව නිරීක්ෂණය කරමින් පොලී ආදායම මත පීඩනය අවම කරමින් ආයෝජන කමිටුව විසින් ස්ථාවර ආදායම් කළඹ පෙර සැලසුම් සහිතව කළමනාකරණය කරන ලදි.

තවද, පොලී අනුපාත අවදානම අවම කිරීම සඳහා සමූහය විසින් පහත සඳහන් ප්‍රතිපත්ති අනුගමනය කර ඇත.

1 අවදානම් රහිත ආයෝජන පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම විසින් නිකුත් කරන ලද නීති සහ රෙගුලාසි වලට අනුකූලව අවදානම් රහිත රජයේ සුරැකුම්පත්වල ආයෝජනවලින් සැලකිය යුතු කොටසක් සිදු කරනු ලැබේ.
2 ආයෝජන කළඹේ ප්‍රධාන කොටස ශ්‍රේණිගත කළ මූල්‍ය ආයතනවල හෝ ශ්‍රේණිගත කළ උපකරණවල සිදු කෙරේ.
3 ආයෝජන කමිටුව විසින් ආයෝජන තීරණ ගනු ලබන අතර අවශ්‍ය අවස්ථාවන්හිදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගනු ලැබේ.

### පොලී අනුපාත අවදානමට නිරාවරණය වීම

සමූහයේ කළමනාකාරිත්වයට වාර්තා කර ඇති පරිදි, සමූහයේ පොලී සහිත මූල්‍ය උපකරණවල පොලී අනුපාත පැතිකඩ පහත පරිදි වේ.

| දෙසැම්බර් 31 දිනට | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|
| | **2024 රු. 000'** | 2023 රු. 000' | **2024 රු. 000'** | 2023 රු. 000' |
| **ස්ථාවර අනුපාත උපකරණ** | | | | |
| **කල් පිරෙන තෙක් රඳවාගත් (HTM)** | | | | |
| භාණ්ඩාගාර බිල්පත් | - | | - | - |
| භාණ්ඩාගාර බැඳුම්කර | **62,077,643** | 66,528,073 | - | 66,528,073 |
| ලැයිස්තුගත ණයකර | **20,727,473** | - | - | - |
| **ණය සහ ලැබිය යුතු (L&R)** | | | | |
| ලැයිස්තුගත නොකළ ණයකර | **22,038,619** | 19,791,084 | - | 19,791,084 |
| කාලීන තැන්පතු | **12,850,781** | 31,916,170 | **2,146,539** | 31,916,170 |
| කාර්ය මණ්ඩල ණය | **2,184,536** | - | - | - |
| නියෝජිත ණය | **478,667** | - | - | - |
| **විකිණීමට ඇති (AFS)** | | | | |
| ලැයිස්තුගත ණයකර | **20,694,676** | 13,790,893 | - | 13,790,893 |
| වාණිජ පත්‍රිකා | **38,485,072** | | **15,179,581** | |
| භාණ්ඩාගාර බැඳුම්කර | **34,740,429** | 27,966,447 | - | 27,966,447 |
| | **214,277,894** | 159,992,667 | **17,326,119** | 159,992,667 |
| **පාවෙන අනුපාත උපකරණ** | | | | |
| **ණය සහ ලැබිය යුතු** | | | | |
| ලැයිස්තුගත නොකළ ණයකර | **7,505,806** | 7,583,838 | - | 7,583,838 |
| **විකිණීමට ඇති (AFS)** | | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර | **15,967,869** | - | - | - |
| | **23,473,675** | 7,583,838 | - | 7,583,838 |
| | **237,751,569** | 167,576,505 | **17,326,119** | 167,576,505 |

# 44 රක්ෂණ හා මූල්‍ය අවධානම් කළමනාකරණය (ඉතිරි කොටස...)

## 44.2 වෙළඳපොල අවදානම (ඉතිරි කොටස...)

### 44.2.1 පොළී අනුපාත අවදානම (ඉතිරි කොටස....)

#### සංවේදිතා විශ්ලේෂණය

වාර්තාකරණ දිනයේදී පොලී අනුපාතවල පදනම් ලක්ෂ්‍ය 100 ක සාධාරණ වෙනසක් සිදුවිය හැකි නම්, පහත දැක්වෙන ප්‍රමාණයන්ගෙන් කොටස් සහ පොලී ආදායම වැඩි වීමට (අඩු වීමට) ඉඩ තිබුණි.

| 2024 දෙසැම්බර් 31 දිනට සමූහය | ඵලදායිතා වක්‍රයේ 100bps ක සමාන්තර ඉහළයාම | | ඵලදායිතා වක්‍රයේ 100bps ක සමාන්තර පහළයාම | |
|---|---|---|---|---|
| | පොළී ආදායම මත බලපෑම රු. 000' | කොටස් හිමිකම මත බලපෑම රු. 000' | පොළී ආදායම මත බලපෑම රු. 000' | කොටස් හිමිකම මත බලපෑම රු. 000' |
| මූල්‍ය ආයෝජන | | | | |
| කල්පිරීම දක්වා රඳවා තබා ඇති (HTM) | - | - | - | - |
| ණය සහ ලැබිය යුතු දේ (L&R) | 792,443 | - | (792,443) | - |
| විකිණීමට ඇති (AFS) | 162,978 | (1,104,270) | (162,978) | 735,369 |
| ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගය (FVTPL) | - | - | - | - |
| | 955,421 | (1,104,270) | (955,421) | 735,369 |

| 2024 දෙසැම්බර් 31 දිනට සමාගම | ඵලදායිතා වක්‍රයේ 100bps ක සමාන්තර ඉහළයාම | | ඵලදායිතා වක්‍රයේ 100bps ක සමාන්තර පහළයාම | |
|---|---|---|---|---|
| | පොළී ආදායම මත බලපෑම රු. 000' | කොටස් හිමිකම මත බලපෑම රු. 000' | පොළී ආදායම මත බලපෑම රු. 000' | කොටස් හිමිකම මත බලපෑම රු. 000' |
| මූල්‍ය ආයෝජන | | | | |
| ණය සහ ලැබිය යුතු දේ (L&R) | - | - | - | - |
| විකිණීමට ඇති (AFS) | - | - | - | - |
| ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගය (FVTPL) | - | - | - | - |
| | - | - | - | - |

| 2024 දෙසැම්බර් 31 දිනට සමූහය/සමාගම | ඵලදායිතා වක්‍රයේ 100bps ක සමාන්තර ඉහළයාම | | ඵලදායිතා වක්‍රයේ 100bps ක සමාන්තර පහළයාම | |
|---|---|---|---|---|
| | පොළී ආදායම මත බලපෑම රු. 000' | කොටස් හිමිකම මත බලපෑම රු. 000' | පොළී ආදායම මත බලපෑම රු. 000' | කොටස් හිමිකම මත බලපෑම රු. 000' |
| මූල්‍ය ආයෝජන | | | | |
| ණය සහ ලැබිය යුතු දේ (L&R) | 892,978 | - | (892,978) | - |
| විකිණීමට ඇති (AFS) | - | 32,275,861 | - | 37,413,811 |
| ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගය (FVTPL) | - | - | - | - |
| | 892,978 | 32,275,861 | (892,978) | 37,413,811 |

* ඵලදායිතා වක්‍රයේ විතැන් වීමක් සිදුවුවහොත්:

කල්පිරීම තෙක් රඳවා ඇති සහ ණය සහ ලැබිය යුතු යටතේ වර්ගීකරණය කර ඇති ස්ථාවර අනුපාත ණය උපකරණ සඳහා පොලී ආදායමට හෝ ස්කන්ධයට කිසිදු බලපෑමක් නැත

කල්පිරීම තෙක් රඳවා ඇති සහ ණය සහ ලැබිය යුතු යටතේ වර්ගීකරණය කර ඇති පාවෙන අනුපාත ණය උපකරණ සඳහා පොලී ආදායමට බලපෑමක් ඇති නමුත් ස්කන්ධයට කිසිදු බලපෑමක් නැත

පොලී ආදායමට බලපෑමක් නැති නමුත් විකිණීමට තබා ඇති යටතේ වර්ගීකරණය කර ඇති ස්ථාවර අනුපාත ණය උපකරණ සඳහා කොටස් වලට බලපෑමක් ඇත

පොලී ආදායමට බලපෑමක් ඇති නමුත් විකිණීමට තබා ඇති යටතේ වර්ගීකරණය කර ඇති පාවෙන අනුපාත ණය උපකරණ සඳහා ස්කන්ධයට කිසිදු බලපෑමක් නැත

### 44.2.2 විදේශ විනිමය අවධානම

ශ්‍රී ලංකා රුපියල් (LKR) නොවන වෙනත් මුදල් ඒකකයකින් නම් කර ඇති මූල්‍ය වත්කම්වල ආයෝජන වලදී සමූහය විදේශ මුදල් අවදානමට නිරාවරණය වේ. මෙම ගනුදෙනු ප්‍රධාන වශයෙන් නම් කර ඇති විදේශ මුදල් ඒකක වන්නේ එක්සත් ජනපද ඩොලර් (USD) ය.

#### විනිමය අවදානමට නිරාවරණය වීම

සංකල්පීය මුදල් ප්‍රමාණයන් මත පදනම්ව, සමූහයේ විදේශ මුදල් අවදානමට නිරාවරණය පහත පරිදි විය;

| | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|
| | ධාරණ අගය | | ධාරණ අගය | |
| | **2024 රු. 000'** | 2023 රු. 000' | **2024 රු. 000'** | 2023 රු. 000' |
| ස්ථාවර තැන්පතු: | | | | |
| එක්සත් ජනපද ඩොලර් | **4,316,170** | 3,376,092 | - | 3,376,092 |
| | **4,316,170** | 3,376,092 | - | 3,376,092 |

## 44 රක්ෂණ සහ මූල්‍ය අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස...)

### 44.2 වෙළඳපොල අවදානම(ඉතිරි කොටස...)

#### 44.2.2 විදේශ විනිමය අවදානම (ඉතිරි කොටස...)

වසර තුළ පහත සඳහන් සුවිශේෂී විනිමය අනුපාත අදාළ විය;

| | සාමාන්‍ය අනුපාතය | | වාර්තා කිරීමේ දින ස්ථාන අනුපාතය | |
|---|---|---|---|---|
| | **2024** | 2023 | **2024** | 2023 |
| | රු. | රු. | රු. | රු. |
| ඇමරිකානු ඩොලර් | **304.88** | 341.36 | **288.75** | 321.00 |
| බ්‍රිතාන්‍ය පවුම් | - | 350.08 | - | 433.49 |
| ඕස්ට්‍රේලියානු ඩොලර් | - | 192.28 | - | 242.26 |
| යුරෝ | - | 305.57 | - | 385.79 |

**සංවේදීතා විශ්ලේෂණය**

2024 දෙසැම්බර් 31 වන දින ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියල් අගය ශක්තිමත් වීමක් පහත දක්වා ඇති ප්‍රමාණයන්ගෙන් විදේශ විනිමය ලාභය/අලාභය සහ පොලී ආදායම වැඩි වීමට/(අඩු වීමට) ඉඩ තිබුණි. අනෙකුත් සියලුම විචල්‍යයන්, විශේෂයෙන් පොලී අනුපාත, නියතව පවතින බව මෙම විශ්ලේෂණයේදී උපකල්පනය කරනු ලැබේ.

| 2024 දෙසැම්බර් 31 දිනට<br>සමූහය | විනිමය අනුපාත කම්පන මට්ටම | | |
|---|---|---|---|
| | **1.0%**<br>**රු. 000'** | **1.5%**<br>**රු. 000'** | **2.0%**<br>**රු. 000'** |
| විදේශ විනිමය ලාභ/අලාභය කෙරෙහි බලපෑම | | | |
| පාවෙන අනුපාත උපකරණ | | | |
| ඇමෙරිකානු ඩොලර් | - | - | - |
| ස්ථාවර අනුපාත උපකරණ | | | |
| ඇමෙරිකානු ඩොලර් | **43,162** | **64,743** | **86,323** |
| | **43,162** | **64,743** | **86,323** |

| 2024 දෙසැම්බර් 31 දිනට | විනිමය අනුපාත කම්පන මට්ටම | | |
|---|---|---|---|
| | **1.0%**<br>**රු. 000'** | **1.5%**<br>**රු. 000'** | **2.0%**<br>**රු. 000'** |
| පොලී ආදායමට ඇති බලපෑම | | | |
| පාවෙන අනුපාත උපකරණ | | | |
| ඇමෙරිකානු ඩොලර් | - | - | - |
| ස්ථාවර අනුපාත උපකරණ | | | |
| ඇමෙරිකානු ඩොලර් | **2,482** | **3,496** | **4,661** |
| | **2,482** | **3,496** | **4,661** |

| 2023 දෙසැම්බර් 31 දිනට<br>සමාගම/සමූහය | විනිමය අනුපාත කම්පන මට්ටම | | |
|---|---|---|---|
| | **1.00%**<br>**රු. 000'** | **1.50%**<br>**රු. 000'** | **2.00%**<br>**රු. 000'** |
| පොලී ආදායමට ඇති බලපෑම | | | |
| පාවෙන අනුපාත උපකරණ | | | |
| ඇමෙරිකානු ඩොලර් | - | - | - |
| ස්ථාවර අනුපාත උපකරණ | | | |
| ඇමෙරිකානු ඩොලර් | 33,761 | 50,641 | 67,522 |
| | 33,761 | 50,641 | 67,522 |

| 2023 දෙසැම්බර් 31 දිනට | විනිමය අනුපාත කම්පන මට්ටම | | |
|---|---|---|---|
| | **1.0%**<br>**රු. 000'** | **1.5%**<br>**රු. 000'** | **2.0%**<br>**රු. 000'** |
| පොලී ආදායමට ඇති බලපෑම | | | |
| පාවෙන අනුපාත උපකරණ | | | |
| ඇමෙරිකානු ඩොලර් | 6,899 | 10,349 | 13,799 |
| ස්ථාවර අනුපාත උපකරණ | | | |
| ඇමෙරිකානු ඩොලර් | - | - | - |
| | 6,899 | 10,349 | 13,799 |

# 44 රක්ෂණ හා මූල්‍ය අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස...)

## 44.2 වෙළඳපොල අවදානම (ඉතිරි කොටස....)

### 44.2.3 වෙළඳපොල අනුපාත අවදානම

ආයෝජන කළඹ කළමනාකරණය කිරීමේදී කොටස් සඳහා උපරිම නිරාවරණ සීමාව සමූහය විසින් පවත්වා ගෙන යනු ලැබේ. තවද, අවිධිමත් අවදානම් අවම කිරීම සඳහා සමූහය විසින් ආයෝජන කළඹ විවිධ අංශවලට විවිධාංගීකරණය කර ඇත.

**ස්කන්ධ අවදානම් කළඹ විවිධාංගීකරණය**

***ජීවිත රක්ෂණ ව්‍යාපාරය***

| අංශය | කර්මාන්ත සමූහය | 2024 | | 2023 | |
|---|---|---|---|---|---|
| | | වෙළඳපොල වටිනාකම රු. 000' | % | වෙළඳපොල වටිනාකම රු. 000' | % |
| මූල්‍ය | බැංකු | **15,270,496** | **59.64%** | 17,038,254 | 63.37% |
| | විවිධාංගීකරණය වූ මූල්‍ය | **2,394,442** | **9.35%** | 1,128,383 | 4.20% |
| මූල්‍ය | | **17,664,938** | **68.99%** | 18,166,637 | 67.57% |
| ගනුදෙනුකාර අභිමතය | පාරිභෝගික සේවා | **-** | **0.00%** | 955,614 | 3.55% |
| | සිල්ලර වෙළඳාම | **47,049** | **0.18%** | 30,582 | 0.11% |
| ගනුදෙනුකාර අභිමතය | | **47,049** | **0.18%** | 986,196 | 3.67% |
| කාර්මික | ප්‍රාග්ධන භාණ්ඩ | **2,196,998** | **8.58%** | 2,637,752 | 9.81% |
| *සෞඛ්‍ය සේවා | සෞඛ්‍ය සේවා උපකරණ සහ සේවා | **201,006** | **0.79%** | 193,939 | 0.72% |
| විදුලි සංදේශ සේවා | විදුලි සංදේශ සේවා | **1,213,716** | **4.74%** | 1,647,377 | 6.13% |
| අමුද්‍රව්‍ය | අමුද්‍රව්‍ය | **1,564,478** | **6.11%** | 1,088,325 | 4.05% |
| | ආහාර, පාන වර්ග සහ දුම්කොළ | **921,850** | **3.60%** | 1,075,234 | 4.00% |
| දේපළ වෙළඳාම් | නිශ්චල දේපල | **113,441** | **0.44%** | 69,738 | 0.26% |
| බලශක්තිය | බලශක්තිය | **1,037,736** | **4.05%** | 811,545 | 3.02% |
| තොරතුරු තාක්ෂණය | උපයෝගිතා | **644,534** | **2.52%** | 208,759 | 0.78% |
| එකතුව | | **25,605,746** | **100%** | 26,885,502 | 100% |

***සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය***

| අංශය | කර්මාන්ත සමූහය | 2024 | | 2023 | |
|---|---|---|---|---|---|
| | | වෙළඳපොල වටිනාකම රු. 000' | % | වෙළඳපොල වටිනාකම රු. 000' | % |
| මූල්‍ය | බැංකු | **9,046,511** | **87.66%** | 10,552,942 | 78.33% |
| | විවිධාංගීකරණය වූ මූල්‍ය | **431,322** | **4.18%** | 501,125 | 3.72% |
| මූල්‍ය | | **9,477,833** | **91.84%** | 11,054,068 | 82.05% |
| පාරිභෝගික අභිමතය | කල් පවතින පාරිභෝගික භාණ්ඩ සහ ඇඟලුම් | **923** | **0.01%** | 4,106 | 0.03% |
| | සිල්ලර වෙළඳාම | **-** | **0.00%** | - | 0.00% |
| පාරිභෝගික අභිමතය | | **923** | **0.01%** | 4,106 | 0.03% |
| පාරිභෝගික ද්‍රව්‍ය | ආහාර, පාන වර්ග සහ දුම්කොළ | **-** | **0.00%** | 361,792 | 2.69% |
| *සෞඛ්‍ය සේවා | සෞඛ්‍ය සේවා උපකරණ සහ සේවා | **-** | **0.00%** | 69,343 | 0.51% |
| කාර්මික | ප්‍රාග්ධන භාණ්ඩ | **209,616** | **2.03%** | 870,302 | 6.46% |
| ද්‍රව්‍ය | අමුද්‍රව්‍ය | **596,327** | **5.78%** | 317,967 | 2.36% |
| උපයෝගිතා | උපයෝගිතා | **18,043** | **0.17%** | 385,690 | 2.86% |
| දේපළ | දේපළ | **-** | **0.00%** | - | 0.00% |
| විදුලි සංදේශ සේවා | විදුලි සංදේශ සේවා | **17,004** | **0.16%** | 189,863 | 1.41% |
| බලශක්තිය | බලශක්තිය | **-** | **0.00%** | 218,655 | 1.62% |
| එකතුව | | **10,319,746** | **100%** | 13,471,788 | 100% |

# 44 රක්ෂණ සහ මූල්‍ය අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස...)

## 44.3 ණය අවදානම

ණය අවදානම යනු ආයෝජක සමාගම්, ප්‍රතිරක්ෂණකරුවන් සහ අනෙකුත් ණයගැතියන් විසින් ගෙවිය යුතු ගිවිසුම්ගත බැඳීම් පැහැර හැරීමේ අවදානමයි. ඒ අනුව, ණය ගැණුම්කරුවෙකු විසින් බැඳී ඇති ගෙවීම් සිදු නොකිරීමෙන් ඕනෑම ආකාරයක ණයක් පැහැර හැරීමේ අවදානම එයින් අදහස් කෙරේ. අවදානම ප්‍රධාන වශයෙන් ණයගැතියාගෙන් සිදුවන අතර එයට මූලිකවම අහිමි වූ මුල් මුදල හා පොලිය අහිමි වීම, මුදල් ප්‍රවාහයට බාධා කිරීම සහ එකතු කිරීමේ පිරිවැය වැඩි වීම ඇතුළත් වේ.

සමූහය විසින් තනි රක්ෂණයෙකු සහ සමහර වත්කම් පන්ති වලින් සිදුකරන ආයෝජන්ගේ සංකේන්ද්‍රණය මත එයටම අයත් සීමාවන් ස්ථාපිත කර ඇති අතර ද්‍රවශීල උපකරණවල ආයෝජන සීමා කරයි.

බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල හැර වෙනත් කිසිදු ආකාරයක කාලීන තැන්පතුවල ආයෝජනයක් සිදු කර නොමැත.

ආයතනික ණයකර සහ වාණිජ පත්‍රිකාවල සියලුම ආයෝජන සඳහා පිළිගත් ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනයක් විසින් ආයතනය සහ උපකරණය යන දෙකටම ආයෝජන ශ්‍රේණියේ ණය ශ්‍රේණිගත කිරීමක් අපේක්ෂා කෙරේ.

කිසිදු ණය උපකරණයක් අදාළ සමාගම් කිසිවක් සමග සිදු කර නොමැත.

ණය සුරැකුම්ක කිසියම් ආයෝජනයක් කිරීමට පෙර අභ්‍යන්තරව පුළුල් ණය විශ්ලේෂණයක් සිදු කරනු ලැබේ.

### ණය අවදානමට උපරිම නිරාවරණය

මූල්‍ය වත්කම්වල ධාරණ අගය උපරිම ණය නිරාවරණය නියෝජනය කරයි. වාර්තාකරණ දිනයේදී ණය අවදානමට උපරිම නිරාවරණය පහත පරිදි විය;

| | | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| සෙැම්බර් 31 දිනට | සටහන | 2024<br>රු. 000' | 2023<br>රු. 000' | 2024<br>රු. 000' | 2023<br>රු. 000' |
| කල්පිරීම දක්වා රඳවාගත් (HTM) | 5 | **82,805,116** | 72,571,731 | **-** | 72,571,731 |
| ණය සහ ලැබිය යුතු දේ (L&R) | 5 | **52,926,445** | 27,384,412 | **-** | 27,384,412 |
| විකිණීමට ඇති (AFS) | 5 | **160,387,039** | 28,354,385 | **25,900,124** | 28,354,385 |
| රක්ෂණ ඔප්පු හිමියන්ට ණය | 12 | **2,288,853** | 2,095,884 | **-** | 2,095,884 |
| ප්‍රතිරක්ෂණ ණය | 13 | **3,260,696** | 1,868,737 | **-** | 1,868,737 |
| ලැබිය යුතු වාරික | 14 | **5,933,582** | 6,290,934 | **-** | 6,290,934 |
| වෙනත් වත්කම් | 16 | **18,422,206** | 13,623,084 | **10,966,118** | 4,825,689 |
| මුදල් සහ මුදල් සමාන දේ | 18 | **33,130,712** | 18,520,139 | **555,913** | 5,885,171 |
| | | **359,154,649** | 170,709,306 | **37,422,155** | 149,276,943 |

### රජයේ සුරැකුම්පත්

රාජ්‍ය සුරැකුම්පත් යනු භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර, සංවර්ධන බැඳුම්කර සහ ප්‍රතිවිකුණුම් ගිවිසුම්වල ආයෝජන වලින් සමන්විත වන අතර ඒවා ස්වභාවයෙන්ම අවදානම් රහිත උපකරණ ලෙස හැඳින්වේ.

### ආයතනික ණය සුරැකුම්පත්

ආයතනික ණය සුරැකුම්පත්, කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කර ඇති සහ දේශීය හා විදේශීය ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් සහතික කරන ලද ආයතනික ණයකර වලින් සමන්විත වේ. ණය සුරැකුම්පත් නිකුත් කරන්නන්ගේ ණය ශ්‍රේණිගත කිරීම් පිළිබඳ විශ්ලේෂණයක් මෙම සටහනේ දක්වා ඇත.

### ඔප්පුහිමියන්ට ණය

රක්ෂණ ඔප්පු හිමියන්ගේ ණයවලට අදාළ ණය අවදානම යනු රක්ෂණ ඔප්පු හිමියන් විසින් ණය නොපියවීම හේතුවෙන් ඇති විය හැකි මූල්‍ය පාඩු වේ.

රක්ෂණ ඔප්පුවේ භාරදීමේ වටිනාකම ඇපයක් ලෙස සලකා සමූහය විසින් රක්ෂණ ඔප්පු හිමියන්ට ණය නිකුත් කර ඇත. වාර්තා කරන දිනට, ලබා දී ඇති රක්ෂණ ඔප්පු ණයවල ධාරණ අගය රුපියල් මිලියන 2,289 (2023 - රු. මිලියන 2,096) ක් වූ අතර අදාළ භාරදීමේ වටිනාකම රුපියල් මිලියන 3,731 (2023 - රු. මිලියන 3,417) කි.

### ලැබිය යුතු ප්‍රතිරක්ෂණ

මෙය ප්‍රතිරක්ෂණකරුවන් සමූහය කෙරෙහි ඔවුන්ගේ මූල්‍ය බැඳීම් ඉටු කිරීමට අපොහොසත් වීමේ අවදානමයි.

### ප්‍රතිරක්ෂකයන්ගේ ණය යෝග්‍යතාව

කළමනාකාරිත්වය විසින් නිතිපතා ප්‍රතිරක්ෂණකරුවන්ගේ ණය සුදුසුකම් තක්සේරු කරන අතර ප්‍රතිරක්ෂණ වත්කම්වල හානි සඳහා සුදුසු දීමනාව තහවුරු කරයි.

ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දේ සම්බන්ධයෙන් වාර්තා කරන දිනට මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දේවල විභව හානි අලාභය සමූහයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තක්සේරු කර ඇත.

### ලැබිය යුතු වාරික

මෙය රක්ෂණ ඔප්පු හිමියන්ගෙන් සහ අතරමැදියන්ගෙන් ලැබිය යුතු වාරික වලින් සමන්විත වන අතර එමඟින් හිඟ මුදල් පියවා නොගැනීම හෝ හිඟ මුදල් පියවීමට සැලකිය යුතු කාලයක් ගතවීම හේතුවෙන් මූල්‍ය පාඩු ඇතිවීමේ අවදානමක් ඇති කරයි.

ජීවිත රක්ෂණයේ දී, රක්ෂණ ඔප්පුව නිකුත් කිරීමට පෙර වාරිකය එකතු කරන බැවින් ණය අවදානම අවම වේ. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දී, වාරිකය දින 60ක් ඇතුළත පියවා නොමැති නම් හිමිකම් පෑමක් ගෙවිය යුතු නොවන බව සඳහන් කරන වාරික වගකීම් වගන්තිය, ණය අවදානම බොහෝ දුරට අඩු කර ඇත.

වාර්තා කරන දිනයේදී සමූහයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාරික ලැබිය යුතු දේ මත ඇති විය හැකි හානි අලාභය තක්සේරු කර ඇති අතර මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා ඇත.

### වෙනත් ලැබිය යුතු

සමූහයේ ණය අවදානමට නිරාවරණය වීම ප්‍රධාන වශයෙන් බලපාන්නේ එක් එක් ගනුදෙනුකරුගේ තනි ලක්ෂණ මගිනි. වෙළඳාම සහ අනෙකුත් ලැබිය යුතු දේ සම්බන්ධයෙන් සිදු වූ පාඩු ඇස්තමේන්තුව නියෝජනය කරන හානි සඳහා දීමනාවක් සමූහය විසින් ස්ථාපිත කරයි.

# 44 රක්ෂණ හා මූල්‍ය අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස...)

## 44.3 ණය අවදානම (ඉතිරි කොටස...)

### ණය අවදානමට උපරිම නිරාවරණය(ඉතිරි කොටස...)

**මුදල් සහ මුදල් සමාන දේ**

මෙය කෙටි කාලීන ආයෝජන, බැංකුවේ මුදල් සහ වාර්තා කරන දිනට අත ඇති මුදල් වලින් සමන්විත වේ. කෙටි කාලීන තැන්පතු අතරට බැංකු සහ මූල්‍ය ආයතන දෙකෙහිම තැන්පත් කර ඇති ස්ථාවර තැන්පතු සහ ඇමතුම් තැන්පතු ඇතුළත් වේ. තවද, බැංකුවේ ඇති මුදල් ප්‍රධාන වශයෙන් පෞද්ගලික සහ රජයේ වාණිජ බැංකුවල ඉතුරුම් සහ ජංගම ගිණුම්වල හිතකර ශේෂයන්ගෙන් සමන්විත වේ.

ශ්‍රේණිගත කිරීමේ ආයතනවල ණය ශ්‍රේණිගත කිරීම් සහ ඔවුන් විසින් ගනුදෙනු සැකසීමේ කාර්යක්ෂමතාව සලකා බැලීමෙන් සමූහය විසින් තම බැංකුකරුවන් තෝරාගෙන ඇත. 2024 දෙසැම්බර් 31 වන දිනට සමූහය සතුව රුපියල් මිලියන 33,131 ක මුදල් සහ මුදල් සමානකම් (2023 දෙසැම්බර් 31 වන දිනට රුපියල් මිලියන 18,520) පැවති අතර එය මෙම වත්කම් සඳහා එහි උපරිම ණය නිරාවරණය නියෝජනය කරයි.

**ණය අවදානම් නිරාවරණය - ජීවිත රක්ෂණ ව්‍යාපාරය**

| දෙසැම්බර් 31 වන දිනට | 2024<br>රු.000' | වෙන්කිරීමේ % | 2023<br>රු.000' | වෙන්කිරීමේ % |
|---|---|---|---|---|
| මූල්‍ය ආයෝජන | | | | |
| ණය සුරැකුම්පත් - ණය සහ ලැබිය යුතු දේ | 34,368,649 | 36% | 49,582,419 | 64% |
| ණය සුරැකුම්පත් - කල්පිරීම දක්වා රඳවා තබා ඇති | 18,708,638 | 20% | - | - |
| කාර්ය මණ්ඩල සහ නියෝජිත ණය | 1,205,253 | 1% | - | - |
| ණය සුරැකුම්පත් - විකිණීමට තබා ඇති | 41,018,556 | 43% | 27,711,207 | 36% |
| | 95,301,096 | 100% | 77,293,626 | 100% |

**ණය අවදානම් නිරාවරණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| දෙසැම්බර් 31 වන දිනට | 2024<br>රු.000' | වෙන්කිරීමේ % | 2023<br>රු.000' | වෙන්කිරීමේ % |
|---|---|---|---|---|
| මූල්‍ය ආයෝජන | | | | |
| ණය සුරැකුම්පත් - ණය සහ ලැබිය යුතු දේ | 5,880,018 | 54% | 9,708,673 | 81% |
| ණය සුරැකුම්පත් - කල්පිරීම දක්වා රඳවා තබා ඇති | 2,018,835 | 19% | - | - |
| ණය සුරැකුම්පත් - විකිණීමට තබා ඇති | 2,981,620 | 27% | 2,339,599 | 19% |
| | 10,880,473 | 100% | 12,048,272 | 100% |

**ණය ශ්‍රේණිගත කිරීම අනුව ණය සුරැකුම්පත් වෙන් කිරීම**

**ජීවිත රක්ෂණ ව්‍යාපාරය**

| දෙසැම්බර් 31 වන දිනට | 2024 | | 2023 | |
|---|---|---|---|---|
| ශ්‍රේණිගත කිරීම | රු. මිලියන | එකතුවෙන් % | රු. මිලියන | එකතුවෙන් % |
| AAA | 21,894 | 23% | 26,914 | 33% |
| AA+ | - | 0% | - | 0% |
| AA | - | 0% | - | 0% |
| AA- | 17,950 | 19% | 12,283 | 15% |
| A+ | 9,411 | 10% | 11,958 | 15% |
| A | 26,579 | 28% | 22,338 | 28% |
| A- | 1,724 | 2% | 1,737 | 2% |
| BBB+ | 16,381 | 17% | 5,825 | 7% |
| BBB | 157 | 0% | 161 | 0% |
| BBB- | - | 0% | - | 0% |
| BB+ | - | 0% | - | 0% |
| BB- | - | 0% | - | 0% |
| ශ්‍රේණිගත නොකළ | 1,205 | 1% | - | 0% |
| එකතුව | 95,301 | 100% | 81,216 | 100% |

*ස්ථාවර තැන්පතු සඳහා වන ණය අවදානම බැංකුවේ ණය අවදානම මත පදනම් වේ.*

**සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| දෙසැම්බර් 31 වන දිනට | 2024 | | 2023 | |
|---|---|---|---|---|
| ශ්‍රේණිගත කිරීම | රු. මිලියන | එකතුවෙන් % | රු. මිලියන | එකතුවෙන් % |
| AAA | - | 0% | 1,900 | 14% |
| AA+ | 3,049 | 28% | 2,300 | 16% |
| AA- | 4,089 | 38% | 4,117 | 29% |
| A+ | - | 0% | 626 | 4% |
| A | 2,980 | 27% | 2,023 | 14% |
| A- | 255 | 2% | 2,585 | 18% |
| BBB+ | 507 | 5% | 507 | 4% |
| එකතුව | 10,880 | 100% | 14,058 | 100% |

*ස්ථාවර තැන්පතු සඳහා වන ණය අවදානම බැංකුවේ ණය අවදානම මත පදනම් වේ.*

# 44 රක්ෂණ හා මූල්‍ය අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස...)

## 44.4 ද්‍රවශීලතා අවධානම

මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කමක් ලබා දීමෙන් පියවනු ලබන මූල්‍ය වගකීම් හා බැදියාවන් සපුරාලීමේදී සමූහයට දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදුවන අතර එය ද්‍රවශීලතා අවදානමයි.

### කල්පිරීමේ විශ්ලේෂණය

පහත වගු මගින් ගෙවිය යුතු සහ ලැබිය යුතු පොලිය ඇතුළුව ඉතිරිව ඇති වට්ටම් නොකළ ගිවිසුම්ගත බැදියාවන් මත පදනම්ව, ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්වල කල්පිරීමේ පැතිකඩ සාරාංශ කරයි.

| 2024 දෙසැම්බර් 31 වන දිනට සමාගම | ධාරණ අගය රු. 000' | ස්ථාවර කාලයක් නොමැති රු. 000' | අවු.1 දක්වා රු. 000' | අවු.1 සිට 2 දක්වා රු. 000' | අවු.2 සිට 5 දක්වා රු. 000' | අවු.5 සිට 10 දක්වා රු. 000' | අවු.10 ට වැඩි රු. 000' | එකතුව රු. 000' |
|---|---|---|---|---|---|---|---|---|
| **මූල්‍ය වත්කම්** | | | | | | | | |
| ණය සහ ලැබිය යුතු දේ (L & R) | **2,146,539** | | **2,027,691** | **19,110** | **-** | **-** | **-** | **2,046,801** |
| විකිණීමට ඇති (AFS) | **41,085,639** | **25,906,058** | **13,880,000** | **-** | **-** | **-** | **-** | **39,786,058** |
| ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගය (FVTPL) | **2,010,130** | **2,010,130** | **-** | **-** | **-** | **-** | **-** | **2,010,130** |
| වෙනත් වත්කම් | **10,975,039** | **-** | **10,975,039** | **-** | **-** | **-** | **-** | **10,975,039** |
| මුදල් හා මුදලට සමාන දෑ | **555,913** | **-** | **555,913** | **-** | **-** | **-** | **-** | **555,913** |
| | **56,773,260** | **27,916,188** | **27,438,643** | **19,110** | **-** | **-** | **-** | **55,373,942** |
| **මූල්‍ය වගකීම්** | | | | | | | | |
| වත්මන් බදු වගකීම් | **907,421** | **-** | **907,421** | **-** | **-** | **-** | **-** | **907,421** |
| වෙනත් වගකීම් | **1,496,998** | **-** | **1,496,998** | **-** | **-** | **-** | **-** | **1,496,998** |
| | **2,404,419** | **-** | **2,404,419** | **-** | **-** | **-** | **-** | **2,404,419** |

| 2023 දෙසැම්බර් 31 වන දිනට සමාගම | ධාරණ අගය රු. 000' | ස්ථාවර කාලයක් නොමැති රු. 000' | අවු.1 දක්වා රු. 000' | අවු.1 සිට 2 දක්වා රු. 000' | අවු.2 සිට 5 දක්වා රු. 000' | අවු.5 සිට 10 දක්වා රු. 000' | අවු.10 ට වැඩි රු. 000' | එකතුව රු. 000' |
|---|---|---|---|---|---|---|---|---|
| **මූල්‍ය වත්කම්** | | | | | | | | |
| කල්පිරීම දක්වා රඳවා තබා ගත් (HTM) | 72,571,730 | - | 5,250,000 | 6,420,990 | 11,157,717 | 29,300,000 | 10,250,000 | 62,378,707 |
| ණය සහ ලැබිය යුතු දේ (L & R) | 59,300,582 | - | 23,495,157 | 29,477,873 | 6,500,000 | 9,100,000 | - | 68,573,030 |
| විකිණීමට ඇති (AFS) | 102,644,036 | 29,702,091 | 9,454,439 | 9,659,552 | 27,384,034 | 11,628,656 | - | 87,828,772 |
| ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකම (FVTPL) | 16,592,639 | 16,583,149 | - | - | - | - | - | 16,583,149 |
| ඔප්පු හිමියන්ට ණය | 2,095,883 | - | 2,095,883 | - | - | - | - | 2,095,883 |
| ලැබිය යුතු ප්‍රරක්ෂණ | 1,868,737 | - | 884,068 | 216,251 | 509,334 | 171,407 | 87,676 | 1,868,736 |
| ලැබිය යුතු වාරික | 6,290,935 | - | 6,290,935 | - | - | - | - | 6,290,935 |
| වෙනත් වත්කම් | 5,113,478 | - | 5,113,478 | - | - | - | - | 5,113,478 |
| මුදල් හා මුදලට සමාන දෑ | 5,885,171 | - | 5,885,171 | - | - | - | - | 5,885,171 |
| | 272,363,191 | 46,285,240 | 58,469,131 | 45,774,666 | 45,551,085 | 50,200,063 | 10,337,676 | 256,617,861 |
| **මූල්‍ය වගකීම්** | | | | | | | | |
| ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ | 1,183,597 | - | 1,065,197 | 77,009 | 37,756 | 3,485 | - | 1,183,447 |
| වත්මන් බදු වගකීම් | 2,114,571 | - | 2,114,571 | - | - | - | - | 2,114,571 |
| වෙනත් වගකීම් | 6,597,465 | - | 6,597,465 | - | - | - | - | 6,597,465 |
| මූල්‍ය වගකීම් | 446,033 | - | 446,033 | - | - | - | - | 446,033 |
| | 10,341,666 | - | 10,223,266 | 77,009 | 37,756 | 3,485 | - | 10,341,516 |

# 45 බැදීම්, අසම්භාව්‍යතා සහ ඇපකර

## 45.1 බැදීම්

වාර්තාකරණ දිනයේදී සමූහයට පහත විස්තර කර ඇති ඒවා හැර වෙනත් සැලකිය යුතු ප්‍රාග්ධන බැදීම් නොමැත:

### ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන් පීඑල්සී

2024 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය අවසන් වන විට සිදු කර නොමැති නමුත් ක්‍රියාත්මක වන ව්‍යාපෘති සම්බන්ධයෙන් සමූහයේ සහ සමාගමේ ප්‍රාග්ධන බැදීම් රු. මිලියන 232 ක් (2023: රු. මිලියන 168) විය.

### ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ්

2024 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 623 (2023- රු. මිලියන 2018) කි. ඔක්සිජන් සිලින්ඩර මිලදී ගැනීම සඳහා ගෙවන ලද රුපියල් මිලියන 20 ක අත්තිකාරම් ගෙවීම් සම්බන්ධයෙන් අඛණ්ඩ නීතිමය කාරණයක් පවතී.

### ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා ලිමිටඩ්

2024 දෙසැම්බර් 31 වන දින වන විට, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගබඩා අංගන (ටැංකි) යථාවත් කිරීම සඳහා රුපියල් මිලියන 792 ක් (කැපවූ ප්‍රාග්ධන සහ මෙහෙයුම් වියදම්) සහ කෙරවලපිටියේ ඉඩම් බදු දීම සඳහා රුපියල් බිලියන 2.3 ක් ඇතුළුව සැලකිය යුතු ප්‍රාග්ධන වියදම් කැපවීම් අනුමත කර ඇත.

# 45 බැඳීම්, අසම්භාව්‍යතා සහ ඇපකර (ඉතිරි කොටස...)

## 45.2 අසම්භාව්‍ය වගකීම් සහ ඇපකර

පහත විස්තර කර ඇති ඒවා හැර, ගැලපීම් අවශ්‍ය වන නැතහොත් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් අවශ්‍ය වන, ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොමැති හෝ මණ්ඩලය විසින් අනුමත කර ඇති නමුත් වාර්තා කරන දිනට ගිවිසුම්ගත කර නොමැති සැලකිය යුතු අවිනිශ්චිත වගකීම් සහ ඇපකර නොමැත.

### ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන්ස් ලිමිටඩ්

### දේශීය ආදායම් දෙපාර්තුමේන්තුවේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද එකතු කළ අගය මත බද්ද සහ ජාතිය ගොඩනැගීමේ බදු තක්සේරු කිරීම්

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මතය වී ඇත්තේ විදේශීය ප්‍රතිරක්ෂණ සමාගම්වලින් සාමාන්‍ය රක්ෂණය සඳහා ලැබෙන ප්‍රතිරක්ෂණ හිමිකම් එකතු කළ අගය මත බද්දට යටත් වන බවයි. ඒ අනුව, 2004/2005 සහ 2005/2006 තක්සේරු වසරවල පිළිවෙලින් රු. 318,099,913/- සහ රු. 26,903,739 ක හිඟ ප්‍රතිරක්ෂණ හිමිකම් සඳහා එකතු කළ අගය මත බදු (VAT) තක්සේරුවක් සමාගමට ලැබුණි.

මෙය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ බොහෝ රක්ෂණ සමාගම් සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන පොදු තක්සේරුවකි. කෙසේ වෙතත්, සාමාන්‍ය රක්ෂණ කර්මාන්තයක් දකින පරිදි, ප්‍රතිරක්ෂණ හිමිකම් පැම සඳහා එකතු කළ අගය මත බද්දට ඔවුන් වගකිව යුතු නොවේ.

බදු උපදේශකයින්ගේ උපදෙස් ලබා ගනිමින් සමාගම විසින් මෙම තක්සේරු කිරීම්වලට එරෙහිව වලංගු අභියාචනා ගොනු කර ඇත. 2010 ජූලි 21 දිනැති ලිපියක් මගින් මෙම තක්සේරු කිරීම් වලංගු බවට සමාලෝචන මණ්ඩලය විසින් තීරණය කරන ලදි. සමාලෝචන මණ්ඩලය විසින් කරන ලද තීරණයට අභියෝග කරමින් සමාගම විසින් අභියාචනාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කර ඇත. අභියාචනාධිකරණයේ තීන්දුව ලබන තෙක් සමාගම වෙත රු. මිලියන 345 ක වගකීමක් ලබා දී ඇත.

2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 25C වගන්තිය මත පදනම්ව, මූල්‍ය සේවය සඳහා එකතු කළ අගය මත බද්ද සහ ජාතිය ගොඩනැගීමේ බද්ද සඳහා සමාගම වගකිව යුතු බවට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් නිල නිවේදනයක් සමාගමට ලැබී ඇත. ඒ අනුව, 2012, 2013, 2017 සහ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන කාල සීමාව සඳහා මූල්‍ය සේවය සඳහා වන එකතු කළ අගය මත බද්ද සහ මූල්‍ය සේවය සඳහා වන ජාතිය ගොඩනැගීමේ බද්ද සඳහා පිළිවෙලින් රුපියල් මිලියන 192, රුපියල් මිලියන 232, රුපියල් මිලියන 509 සහ රුපියල් මිලියන 665 ක තක්සේරුවක් සමාගම වෙත ලැබුණි.

සමාගම් බදු උපදේශකයින්ගේ උපදෙස් මත සමාගම විසින් මෙම තක්සේරු කිරීම්වලට එරෙහිව නිසි ලෙස අභියාචනා කර ඇති අතර, බදු අභියාචනා කොමිසම විසින් 2012 සහ 2013 කාල පරිච්ඡේද වලට අදාළව මූල්‍ය සේවා සඳහා නිකුත් කරන ලද එකතු කළ අගය මත බදු තක්සේරුව වලංගු බව 2020 අගෝස්තු 27 සහ 2023 ජනවාරි 27 දිනැති ඔවුන්ගේ ලිපි මගින් තීරණය කර ඇත. එම තීරණවලට එරෙහිව සමාගම විසින් අභියාචනාධිකරණයට අභියාචනා කර ඇති අතර, තවද, බදු අභියාචනා කොමිසම විසින්, අභියාචනාධිකරණයේ පවතින බැංකු ඇපකරය මුදල් කිරීමට ගත් තීරණය නතර කිරීමට සමාගම විසින් රිට් නියෝගයක් ඉල්ලා ඇත. එක් එක් නඩුවේ අවස්ථා සහ තක්සේරු කිරීම් පහත පරිදි වේ.

| තක්සේරු වර්ෂය | තක්සේරු තත්ත්වය | අසම්භාව්‍ය | සමාගමට පවතින අසම්භාව්‍ය වගකීම් මැනීම |
|---|---|---|---|
| 2012/2013 | අභියාචනාධිකරණයෙන් තීන්දුවක් ලැබීමට නියමිතයි. | මූල්‍ය සේවා සඳහා එකතු කළ අගය මත බද්ද | රුපියල් මිලියන 192 ක අතිරේක බදු වගකීමක් |
| 2013/2014 | අභියාචනාධිකරණයෙන් තීන්දුවක් ලැබීමට නියමිතයි. | මූල්‍ය සේවා සඳහා එකතු කළ අගය මත බද්ද | රු. මිලියන 232 ක අතිරේක බදු වගකීමක් |
| 2017/2018 | බදු අභියාචනා කොමිසමේ තීරණය අපේක්ෂිතයි | මූල්‍ය සේවා සඳහා එකතු කළ අගය මත සහ ජාතිය ගොඩනැගීමේ බද්ද | රු. මිලියන 449 ක අතිරේක බදු වගකීමක් |
| 2019/2020 | බදු අභියාචන කොමිසම වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට අදහස් කර ඇත. | මූල්‍ය සේවා සඳහා එකතු කළ අගය මත බද්ද | රු. මිලියන 665 ක අතිරේක බදු වගකීමක් |
| 2020/2021 | CGIR විසින් අභියාචනා පරීක්ෂණය පැවැත්වීමට නියමිතයි. | මූල්‍ය සේවා සඳහා එකතු කළ අගය මත බද්ද | රු. මිලියන 920 ක අතිරේක බදු වගකීමක් |

කෙසේ වුවද, එම කරුණුම 2010 සහ 2011 වසර සඳහා තක්සේරු කරන ලද මූල්‍ය සේවා සඳහා එකතු කළ අගය මත බද්ද සම්බන්ධයෙන් සමාගමට පක්ෂව අභියාචනාධිකරණය විසින් තීරණය කරන ලදී. පසුව, 2014, 2015 සහ 2016 වසරවලට අදාළ තක්සේරු තුනක් බදු අභියාචනා කොමිසම විසින් සමාගමට පක්ෂව විසඳන ලද අතර, 2018 වසර සඳහා එක් තක්සේරුවක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සමාගමට පක්ෂව තීන්දු කරන ලද අතර එය රුපියල් බිලියන 4.4 කි.

එබැවින්, මෙම පොරොත්තු කටයුතු සඳහා මූල්‍ය ප්‍රකාශනවල අමතර ප්‍රතිපාදන සිදු කර නොමැත.

### ආදායම් බදු

ජීවිත රක්ෂණ බදුකරණය සම්බන්ධයෙන් 2011/2012 සිට 2019/2020 දක්වා තක්සේරු වර්ෂ සඳහා සමාගම වෙත ආදායම් බදු තක්සේරු ලැබුණු අතර එම කාල පරිච්ඡේදවල තක්සේරු ප්‍රමාණයන් පහත වගුවේ දක්වා ඇත. 2016 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 92 වන වගන්තියට පටහැනිව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් මෙම තක්සේරුව නිකුත් කරන ලදී. තවද, මෙය රක්ෂණ කර්මාන්තයේ ජීවිත රක්ෂණ සමාගම් සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති පොදු ආදායම් බදු තක්සේරුවකි. කර්මාන්තයේ, සමාගමේ සහ සමාගමේ බදු උපදේශකයින්ගේ අදහස වන්නේ එම තක්සේරුව ක්‍රියාත්මක නොවන බවයි. එබැවින්, මූල්‍ය ප්‍රකාශනවල අමතර ප්‍රතිපාදන කිසිවක් සිදු කර නොමැත.

සමාගමේ බදු උපදේශකයින්ගේ උපදෙස් ලබා ගනිමින් සමාගම මෙම තක්සේරු කිරීම්වලට එරෙහිව නිසි ලෙස අභියාචනා කර ඇත. බදු අභියාචනා කොමිසම විසින් 2011/2012, 2012/2013 සහ 2013/2014 කාල පරිච්ඡේද සඳහා ආදායම් බදු සඳහා නිකුත් කරන ලද තක්සේරු වලංගු බව තීරණය කර ඇති අතර, ඔවුන්ගේ 2020 අගෝස්තු 18, 2021 දෙසැම්බර් 14 සහ 2023 ජනවාරි 27 දිනැති ලිපිවලට අනුව එය වලංගු වේ. සමාගම එම තීරණයට එරෙහිව අභියාචනාධිකරණයට අභියාචනා කර ඇත. ඊට අමතරව, බදු අභියාචනා කොමිසම 2024 පෙබරවාරි 27 දිනැති ඔවුන්ගේ ලිපිය මගින් 2014/2015 කාල පරිච්ඡේදය සඳහා ආදායම් බදු සඳහා නිකුත් කරන ලද තක්සේරුව තීරණය කර ඇති අතර, එමගින් අභියාචනයට අර්ධ වශයෙන් ඉඩ ලබා දී ඇති අතර, සමාගම අභියාචනාධිකරණයට අභියාචනා කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටී. තවද, බදු අභියාචනා කොමිසම විසින් 2023 සැප්තැම්බර් 12 දිනැති ලිපිය මගින් සමාගමට පක්ෂව 2016/2017 කාල සීමාව සඳහා ආදායම් බදු සඳහා නිකුත් කරන ලද තක්සේරුව තීරණය කර ඇත. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව එම තීරණයට එරෙහිව අභියාචනාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කර ඇති අතර, තවද, බදු අභියාචනා කොමිසම විසින් පිළිවෙලින් 2023 නොවැම්බර් 22 සහ 2024 ජූනි 25 දිනැති ලිපිය මගින් සමාගමට බැංකු ඇපකරය නිදහස් කර ඇත. එක් එක් තක්සේරුවේ තත්වය පහත වගුවේ දක්වා ඇත.

| තක්සේරු වර්ෂය | තක්සේරු තත්ත්වය | අසම්භාව්‍ය වගකීම් ස්වභාවය | සමාගමට පවතින අසම්භාව්‍ය වගකීම් මැනීම |
|---|---|---|---|
| 2011/2012 | අභියාචනාධිකරණයෙන් තීන්දුවක් ලැබීමට නියමිතයි. | ඇදායම් බදු | රුපියල් මිලියන 524 ක අතිරේක බදු වගකීමක් |
| 2012/2013 | අභියාචනාධිකරණයෙන් තීන්දුවක් ලැබීමට නියමිතයි. | ඇදායම් බදු | රු. මිලියන 296 ක අතිරේක බදු වගකීමක් |
| 2013/2014 | අභියාචනාධිකරණයෙන් තීන්දුවක් ලැබීමට නියමිතයි. | ඇදායම් බදු | රු. මිලියන 768 ක අතිරේක බදු වගකීමක් |
| 2014/2015 | අභියාචනාධිකරණයෙන් තීන්දුවක් ලැබීමට නියමිතයි. | ඇදායම් බදු | රු. මිලියන 1,036 ක අතිරේක බදු වගකීමක් |
| 2015/2016 | බදු අභියාචනා කොමිසමේ තීරණය අපේක්ෂිතයි. | ඇදායම් බදු | රු. මිලියන 1,374 ක අතිරේක බදු වගකීමක් |
| 2016/2017 | අභියාචනාධිකරණයෙන් තීන්දුවක් ලැබීමට නියමිතයි. | ඇදායම් බදු | රු. මිලියන 1,823 ක අතිරේක බදු වගකීමක් |
| 2017/2018 | දේශීය ඇදායම් කොමසාරිස් ජෙනරාල් වෙතින් තීරණය අපේක්ෂා කෙරේ. | ඇදායම් බදු | රුපියල් මිලියන 2,170 ක අතිරේක බදු වගකීමක් |
| 2018/2019 | බදු අභියාචනා කොමිසමේ තීරණය අපේක්ෂා කෙරේ. | ඇදායම් බදු | රුපියල් මිලියන 626 ක අතිරේක බදු වගකීමක් |
| 2019/2020 | බදු අභියාචනා කොමිසමේ තීරණය අපේක්ෂා කෙරේ | ඇදායම් බදු | රුපියල් මිලියන 493 ක අතිරේක බදු වගකීමක් |
| 2020/2021 | බදු අභියාචනා කොමිසමේ තීරණය අපේක්ෂා කෙරේ | ඇදායම් බදු | රුපියල් මිලියන 48 ක අතිරේක බදු වගකීමක් |

# 45 බැඳීම්, අසම්භාව්‍යතා සහ ඇපකර (ඉතිරි කොටස…)

## 45.2 අසම්භාව්‍ය වගකීම් සහ ඇපකර (ඉතිරි කොටස...)

### ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වෙමින් පවතින නඩු

1994 සහ 2003 අතර නිකුත් කරන ලද ප්‍රතිපත්ති සඳහා තැරැව්කරු විසින් එකතු කරන ලද නමුත් ප්‍රේෂණය නොකළ රක්ෂණ වාරික නියෝජනය කරමින් රු. 1,981,883/- ක මුදලක් අයකර ගැනීම සඳහා SLIC විසින් Ceyaxxee තැරැව්කරුවන්ට එරෙහිව නඩු අංක SC/HCCA/LA 14/2023 යටතේ සිවිල් නඩුවක් ගොනු කර ඇත. දිස්ත්‍රික් අධිකරණය සහ සිවිල් අභියාචනා මහාධිකරණය යන දෙකම SLIC ට පක්ෂව තීන්දුවක් ලබා දී ඇත. තැරැව්කරු ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කර ඇති අතර, නඩුව 2025.09.10 දින සභාය සඳහා නියම කර ඇත.

SC අභියාචනා අංක 107/2014 නඩුවේදී, වැලිගම ශාඛා පරිශ්‍රය සම්බන්ධයෙන් SLIC සහ පැමිණිලිකරු අතර කුලී ආරවුලක් පවතී. පැමිණිලිකරු විසින් චෝදනා කරන ලද බදු කුලී හිඟ මුදල් අයකර ගැනීම සඳහා සිවිල් නඩුවක් ගොනු කර ඇති අතර, SLIC තර්ක කරනුයේ පැමිණිලිකරු බදු ගිවිසුමේ නියමයන් උල්ලංඝනය කළ බවයි. දිස්ත්‍රික් අධිකරණයේ සහ සිවිල් අභියාචනාධිකරණයේ තීන්දු ද්විත්වයම SLIC ආයතනයට අවාසිදායක වී ඇත. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අභියාචනා කිරීමට අවසර අයදුම්පතක් ලබා දී ඇති අතර, නඩුව දිගටම පවතී.

රක්ෂණ සංවිධායකයෙකු විසින් EPF, ETF සහ පාරිතෝෂික හිමිකම් ඉල්ලා නඩු අංක SC/APL/0036/24 ගොනු කරන ලදී. ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියට යාමට අවසර දී ඇති අතර, විවාදකිරීම 2025.11.21 දිනට නියමිතය.

නඩු අංක SC/SPL/LA/173/24 යටතේ, SLIC සේවක සංගමයක් සමාගමේ වෙන් කිරීමේ නියෝගයට අභියෝග කරමින් පෙත්සමක් ගොනු කර ඇත. නඩුව 2025.07.09 දින ශ්‍රේෂ්ඨාධිකරණයේ දී විභාග කිරීමට නියමිතය.

### ලංකා හොස්පිටල්ස් කෝපරේෂන් පීඑල්සී

#### වගකීම්

වාර්තා කරන දින වන විට ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන් පීඑල්සී සමාගමට එරෙහිව රුපියල් මිලියන 918.7 ක උපරිම වගකීමක් සහිත විභාග වෙමින් පවතින නඩු පවතී. දැනට පවතින තොරතුරු මත පදනම්ව, එවැනි නීතිමය ක්‍රියා පටිපාටිවල අවසාන විසඳුම සමාගමේ මෙහෙයුම්, මූල්‍ය තත්ත්වය හෝ ද්‍රවශීලතාවයේ ප්‍රතිඵලයට සැලකිය යුතු අහිතකර බලපෑමක් ඇති නොකරනු ඇතැයි එහි නීති සභාව විසින් සමාගමට උපදෙස් දී ඇත. ඒ අනුව, මෙම මූල්‍ය ප්‍රකාශනවල මේ සම්බන්ධයෙන් කිසිදු වගකීමක් සඳහා ප්‍රතිපාදන සලසා නොමැත.

#### වත්කම්

වාර්තාකරණ දිනට මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වන ප්‍රමාණාත්මක අසම්භාව්‍ය වත්කම් නොතිබුණි.

### මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ ප්‍රයිවට් ලිමිටඩ්

2024 දෙසැම්බර් 31 දිනට පහත පරිදි විභාග වෙමින් පවතින නීතිමය කටයුතු පවතී.

| නඩු අංකය | අධිකරණය | තත්ත්වය |
|---|---|---|
| 01/50/2022 | කම්කරු විනිශ්චය සභාව | හරස් ප්‍රශනකිරීම් |
| HCALT/68/2024 | මහාධිකරණය | විවාද කිරීම |
| HCALT/60/2024 | මහාධිකරණය | නියෝගය |
| HCALT/0004/25 | මහාධිකරණය | ලිඛිත දේශන |

# 46 ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් හි නීත්‍යානුකූල වෙන්කිරීමේ ක්‍රියාවලිය

## 46.1 වෙන් කිරීම සඳහා නීතිමය පසුබිම (IRCSL අවශ්‍යතාවය)

2011 අංක 03 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනතේ 53 වන වගන්තියට අනුකූලව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද වෙන් කිරීමේ මාර්ගෝපදේශ (අංක: IBSL/DG/LEG/14/02/089 සහ IBSL/DG/LEG/13/09/468), සහ 2023 මාර්තු 17 වන දින අංක 23/0431/604/046 දරන කැබිනට් තීරණය මෙන්ම 2023 දෙසැම්බර් 18 වන දින අංක 23/2397/604/239 දරන කැබිනට් තීරණය යටතේ අනුමත වෙන් කිරීමේ ආකෘතිය අනුගමනය කරමින්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් වෙනම නීතිමය ආයතන දෙකකට ප්‍රතිව්‍යුහගත කරන ලදී.

2023 දෙසැම්බර් 22 වන දින, දිස්ත්‍රික් අධිකරණයේ නඩුවක් ගොනු කරන ලද අතර 2024 ජනවාරි 02 වන දින සිට බලපැවැත්වෙන පරිදි වෙන් කිරීම සඳහා අධිකරණ නියෝගයක් ලබා ගන්නා ලදී. පසුව 2024 ජනවාරි 19 වන දින සමාගම 2007 අංක 7 දරන සමාගම් පනතේ 256 වගන්තිය අනුව කොළඹ වාණිජ මහාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කර යෝජනා ක්‍රම විධිවිධාන සඳහා අනුමැතිය ලබා ගන්නා ලදී. වත්කම් සහ වගකීම් පැවරීම සම්බන්ධයෙන් ඇතුළුව, S. 256 අයදුම්පතක් අනුව වාණිජ මහාධිකරණයට පුළුල් බලතල පවරා ඇත. සමාගම් පනතේ S. 257(1)(a) වගන්තියේ "චංචල හෝ නිශ්චල දේපළ, වත්කම්, අයිතිවාසිකම්, බලතල, පොලී, වගකීම්, ගිවිසුම් සහ බැඳීම් පැවරීම හෝ පැවරීම" යන නියෝග නිකුත් කිරීමට අධිකරණයට විශේෂයෙන් විධිවිධාන සලසා ඇත;

වෙන් කිරීමෙන් පැන නගින ප්‍රධාන ගනුදෙනුව අනුමත කිරීම සඳහා 2024 ජනවාරි 16 වන දින විශේෂ මහා සභා රැස්වීමක් පවත්වන ලදී. අවශ්‍ය කැබිනට්, අධිකරණ සහ කොටස් හිමියන්ගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු, සමාගම එහි ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වෙන් කිරීම අනිවාර්ය කරන නියාමන අවශ්‍යතාවයට අනුකූල වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් (IRCSL) 2024 පෙබරවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් වෙත රක්ෂණ බලපත්‍ර ප්‍රදානය කරන ලදී.

2024 පෙබරවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් සඳහා රක්ෂණ ව්‍යාපාර සිදුකිරීමේ බලපත්‍රය අවලංගු කරන ලදී. තවද, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ජීවිත රක්ෂණ ව්‍යාපාර සිදුකිරීම සඳහා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් වෙත සහ ජීවිත නොවන රක්ෂණ ව්‍යාපාර සිදුකිරීම සඳහා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් වෙත රක්ෂණ බලපත්‍රයක් ලබා දෙන ලදී. 2024 පෙබරවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි, SC SPL LA 173/24 දරන නඩුව අවසන් වන තෙක් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන්ස් ලිමිටඩ් යන නම භාවිතා කිරීම සඳහා IRCSL විසින් තීරණය කරන ලද පරිදි ගරු නීතිපතිවරයාගේ නීතිමය මතය/උපදෙස් ලබා ගැනීමට යටත්ව, සමාගමට තවදුරටත් අවස්ථාව ලැබී ඇත.

මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (පුද්) ලිමිටඩ් විසින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් (SLIC) වෙත අනුයුක්ත කරන ලද සේවකයින්, 2024 පෙබරවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් හි වෙන් කිරීම ක්‍රියාත්මක කිරීමත් සමඟ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් වෙත මාරු කර ඇත.

වෙන් කිරීමේ ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස ඉහත සේවක මාරුවීම් හේතුවෙන්, 48.1 සටහනේ සඳහන් කර ඇති පරිදි MSRPL හි විභව ඈවරකිරීම සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා සේවක සම්බන්ධ නීතිමය නඩු විසඳීමෙන් පසු MSRPL හි ව්‍යාපාර ක්‍රියාකාරිත්වය ඇගයීමේ ක්‍රියාවලියක කළමනාකාරිත්වය යෙදී සිටී.

## 46.2 වෙන් කිරීම සඳහා SLFRS 3 අවශ්‍යතා බැහැර කිරීම

SLFRS 3 – ව්‍යාපාර සංයෝජනවලට අනුකූලව, පොදු පාලනය යටතේ ඇති ආයතන අතර ගනුදෙනු විශේෂයෙන් ප්‍රමිතියෙන් බැහැර කර ඇත. එබැවින්, ගනුදෙනුවට පෙර සහ පසු එකම පාර්ශවයක් හෝ පාර්ශවයන් විසින් අවසානයේ පාලනය කරනු ලබන ආයතන අතර වත්කම් සහ වගකීම් මාරු කිරීම SLFRS 03 යටතේ ව්‍යාපාර සංයෝජන ඇති නොකරයි.
මෙවැනි ගනුදෙනු සම්බන්ධයෙන්, ගනුදෙනුවේ මූලික ස්වභාවය පෙන්වන විකල්ප ගිණුම් ක්‍රමවේද භාවිතයෙන් ඒවා ගිණුම්ගත කරනු ලැබේ. මෙම සන්දර්භය තුළ, 2011 අංක 03 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනතේ 53 වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද සැකසුම් යෝජනා ක්‍රමයේ සහ ඉදිරිපත් කිරීම් සහ හෙළිදරව් කිරීම් පිළිබඳ මාර්ගෝපදේශවල දක්වා ඇති නියමයන්ට අනුකූලව අනුබද්ධිත සමාගම් විසින් මාරු කළ වත්කම් සහ වගකීම් හඳුනාගෙන ඇත. අත්පත් කර ගැනීමෙන් කිසිදු කීර්ති නාමයක් හෝ ලාභයක් හඳුනාගෙන නොමැති අතර, වාර්තාකරණ කාල පරිච්ඡේද හරහා පොත් වටිනාකම්වල අඛණ්ඩතාව සහ මූල්‍ය තොරතුරු සංසන්දනය කිරීම සහතික කරයි.

# 46 ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්හි නීත්‍යානුකූල වෙන්කිරීමේ ක්‍රියාවලිය (ඉතිරි කොටස...)

## 46.3 SLFRS 5 අදාල කරගැනීම -විකිණීම සඳහා තබා ඇති ජංගම නොවන වත්කම් සහ අත්හිටුවන ලද මෙහෙයුම්

ඉහත අවශ්‍යතාවය යටතේ රක්ෂණ ව්‍යාපාර වෙන් කිරීම, විකිණීම සඳහා තබා ඇති වත්කම්වල නිර්වචනය සපුරාලනු නොලබයි. මන්ද යත් මාරු කරන ලද වත්කම්වල ධාරණ අගය ප්‍රධාන වශයෙන් විකුණුම් ගනුදෙනුවක් හරහා නොව අඛණ්ඩ භාවිතය හරහා අයකර ගනු ලබන බැවිනි. ආයතනයට අනුබද්ධිත ආයතනයක ආයෝජනයක ස්වරූපයෙන් වත්කම් සඳහා වටිනාකමක් ලැබුණද, සමාගම විසින් විකිණීමක් සැලසුම් කර නොමැති නම්, එම ආයෝජනය සාක්ෂාත් කරගනු ලබන්නේ අඛණ්ඩ භාවිතය හරහා පමණි.

එබැවින්, සාරාංශයක් ලෙස, මෙම වෙන් කිරීම යනු මෙහෙයුම් ආකාරයෙහි වෙනසක් හෝ රක්ෂණ ව්‍යාපාරය ප්‍රතිව්‍යුහගත කිරීමක් පමණි. එවැනි ප්‍රතිව්‍යුහගත කිරීම යටතේ, ආයතනයට වත්කම්වල පාලනය අහිමි වී නොමැති බවත්, එම නිසා වත්කම් බැහැර කර ඇති බව සැලකිය නොහැකි බවත් සැලකිල්ලට ගත යුතුය. එබැවින්, රක්ෂණ ව්‍යාපාරය වෙන් කිරීම SLFRS 5 "විකිණීමට ඇති ජංගම නොවන වත්කම් සහ අත්හිටුවන ලද මෙහෙයුම්" යෙදීම සඳහා විෂය පථයෙන් බැහැර ලෙස සැලකේ.

## 46.4 ව්‍යාපාර වත්කම් සහ වගකීම් නව නීතිමය ආයතන දෙක වෙත පැවරීම

මෙම විධිමත් වෙන් කිරීමට පෙර, සමාගම එහි ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ අංශ වෙනම ව්‍යාපාර අංශ ලෙස ක්‍රියාත්මක කළ අතර, ඒ සෑම එකක්ම තමන්ගේම ලාභ අලාභ ප්‍රකාශන, මූල්‍ය මෙහෙයුම් සහ උපායමාර්ගික අවධානයක් සහිතව ක්‍රියාත්මක විය. මෙම ස්වාධීන කළමනාකරණය මගින් එක් එක් ව්‍යාපාර අංශවල වත්කම් සහ වගකීම් දැනටමත් පැහැදිලිව වෙන් කර ඇති බව සහතික කරන ලදී.

ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර අතර වත්කම් සහ වගකීම් වෙන් කිරීම අනුමත විධිවිධාන යෝජනා ක්‍රමයට අනුකූලව සිදු කරන ලද අතර, එමඟින් එක් එක් සමාගමට ඔවුන්ගේ අදාළ ව්‍යාපාර වර්ගවලට අනුරූප සුදුසු වත්කම් සහ වගකීම් ලැබෙන බවට සහතික විය.

තවද, මෙම වෙන් කිරීම සහ වත්කම් සහ වගකීම් වෙන් කිරීම සඳහා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් අදාළ වන සියලුම නීති, රෙගුලාසි, IRCSL හි උපදෙස් සහ ගිණුම්කරණ ප්‍රමිති අවශ්‍යතා අනුගමනය කර ඇත. වත්කම්වලට අනුරූප වන සියලුම උපලබ්ධි නොවූ සංචිත මෙන්ම රඳවා ගත් ඉපැයීම්වලට අදාළ සියලුම වගකීම් මාරු නොකළ බවත් මහාධිකරණය විසින් අනුමත කරන ලද සැකසුම් යෝජනා ක්‍රමයට අනුව සමාගම සතුව රඳවා ගත් බවත් සැලකිල්ලට ගත යුතුය.

අදාළ බලධාරීන් විසින් අනුමත කරන ලද සැකසුම් යෝජනා ක්‍රමය මත මහාධිකරණ නියෝගයක් මගින් අනුමත කරන ලද පරිදි, මාරු කරන ලද වත්කම්වල නීත්‍යානුකූල හිමිකාරිත්වය සමාගමෙන් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන්ස් ලයිෆ් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් වෙත පවරා ඇත. කෙසේ වෙතත්, ඇතැම් අදාළ බලධාරීන් විසින් පවත්වාගෙන යනු ලබන වාර්තාවල එවැනි මාරුවීම් වාර්තා කිරීම සඳහා බලපාන තවත් යම් යම් ප්‍රායෝගික පියවර අවශ්‍ය වේ. අවශ්‍ය විටෙක පරිපාලන නාම වෙනස්කම් ඇතුළුව, අධිකරණ නියෝගය අදාළ බලධාරීන්ට ඉදිරිපත් කළ යුතු අතර, එවැනි බලධාරීන් විසින් අවශ්‍ය යයි නියම කරන අනෙකුත් විධිමත් කටයුතු ද මෙයට ඇතුළත් වේ.

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 30 වන වගන්තියට අනුව රක්ෂණකරුගේ නමින් තබා ඇති වත්කම් සම්බන්ධයෙන් මහාධිකරණය විසින් අනුමත කරන ලද විධිවිධාන යෝජනා ක්‍රමයට අනුව සියලුම වාර්තා නව නෛතික හිමිකාරිත්වය පිළිබිඹු කරන බව සහතික කිරීම සඳහා තෙවන පාර්ශවයන් සමඟ නම් වෙනස් කිරීම් ඇතුළුව ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන්ස් ලයිෆ් ලිමිටඩ් හි සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් හි මෙම පරිපාලන සංක්‍රාන්ති අඛණ්ඩව සිදුවෙමින් පවතී.
ඒ අනුව, මෙම අඛණ්ඩ මෙහෙයුම් සහ පරිපාලන අභියෝග හේතුවෙන්, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත නියාමන පනතේ 30 වන වගන්තිය යටතේ පරිපාලන ක්‍රියා පටිපාටිවලට අදාළ විභව අනුකූල නොවීමක් පිළිබඳ අවධානය යොමු වී ඇත.. තවද, වෙන් කිරීමට අදාළ පරිපාලන නාමය වෙනස් කිරීම ඇතුළු ඇතැම් පරිපාලන කටයුතු තවමත් සිදුවෙමින් පවතින අතර පුළුල් පශ්චාත් වෙන් කිරීම් ක්‍රියාත්මක කිරීමේ කොටසක් ලෙස සහ IRCSL වෙතින් ලිඛිත ප්‍රතිචාරයක් ලබා ගැනීමේ ක්‍රියාවලියේ යෙදී සිටින බැවින්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන්ස් ලයිෆ් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙන් (IRCSL) තව දුරටත් කල් ඉල්ලා ඇත.

# 47 වාර්තාකරන දිනට පසු සිදුවීම්

පහත හෙළිදරව් කර ඇති සිදුවීම් හැර, මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වන වෙනත් කිසිදු සැලකිය යුතු සිදුවීමක් වාර්තා කිරීමේ දිනයෙන් පසු සිදු නොවීය.

**සමූහය**

## 47.1 ලිට්රෝ ගෑස් ලංකා ලිමිටඩ්

වාර්තාකරණ දිනයෙන් පසු මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වන කිසිදු තත්වයක් පැන නැගී නොමැත.

## 47.2 ලිට්රො ගෑස් ටර්මිනල් ලංකා ලිමිටඩ්

වාර්තාකරණ දිනයෙන් පසු මූල්‍ය ප්‍රකාශනයේ ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය කරන වෙනත් කිසිදු වැදගත් සිදුවීමක් සිදු නොවීය.

## 47.3 ලංකා හොස්පිටල්ස් කෝපරේෂන් පීඑල්සී

වාර්තාකරණ දිනයෙන් පසු මූල්‍ය ප්‍රකාශනයේ ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය කරන වෙනත් කිසිදු වැදගත් සිදුවීමක් සිදු නොවීය.

## 47.4 ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්

2024 දෙසැම්බර් 31 වන දිනෙන් පසු, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන්ස් ලයිෆ් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩල සංයුතියේ පහත වෙනස්කම් සිදු විය:

1. නිශාන්ත දයානන්ද මහතා 2025 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය
2. 2025 ජනවාරි 02 වන දින සිට බලපැවැත්වෙන පරිදි අනිල් කොස්වත්ත මහතා ඉල්ලා අස්විය.

තවද, 2025 ජනවාරි 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, 2007 අංක 7 දරන සමාගම් පනත සහ සාංගමික ව්‍යවස්ථාවලිය ප්‍රකාරව, දැනට සිටින අධ්‍යක්ෂවරුන්ට අමතරව, පහත සඳහන් පුද්ගලයින් අදාළ අධ්‍යක්ෂ මණ්ඩලවලට පත් කරන ලදී:
1. ආර්. පී. බුල්ජන්ස් මහතා
2. ආර්. ධර්මේන්ද්‍ර මහතා
3. එන්. ඩී. බී. උණම්බුවේ මහතා, ජනාධිපති නීතිඥ

පහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩලය ඊළඟ වාර්ෂික මහා සභා රැස්වීම දක්වා තනතුරු දරනු ඇති අතර පසුව සාංගමික ව්‍යවස්ථාවලිය ප්‍රකාරව නැවත තේරී පත්වීමට සුදුසුකම් ලබයි.

| අධ්‍යක්ෂවරයාගේ නම | පත්වීම් දිනය |
|---|---|
| නුසිත් කුමාරතුංග මහතා | 2024.10.23 |
| දුෂ්මන්ත තොටවත්ත මහතා | 2023.10.06 |
| කේ රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා | 2023.10.06 |
| ආර්.පී. බුල්ජන්ස් මහතා | 2023.01.01 |
| ආර් ධර්මේන්ද්‍ර මහතා | 2025.01.01 |
| එන්.ඩී.බී. උනම්බුවේ මහතා, ජනාධිපති නීතිඥ | 2025.01.01 |

ශේෂ පත්‍ර දිනය වන විට සමාගමේ මූල්‍ය තත්ත්වය කෙරෙහි මෙම වෙනස්කම් සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා නොකෙරේ. කෙසේ වෙතත්, සමාගමේ අනාගත උපායමාර්ගික තීරණ වලදී ඒවා සලකා බලනු ලැබේ.

# 47 වාර්තාකරණ දිනට පසු සිදුවීම් (ඉතිරි කොටස...)

## 47.5 ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්

වාර්තා කිරීමෙන් පසු දින සිදුවීම් සියල්ල සලකා බලා ඇති අතර, පහත සඳහන් කරුණු හැර, සුදුසු අවස්ථාවලදී, මූල්‍ය ප්‍රකාශනවල අදාළ සටහන්වල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කර ඇත;

| අධ්‍යක්ෂවරයාගේ නම | අධ්‍යක්ෂ ධුරයේ ස්වභාවය | ක්‍රියාත්මක වන දිනය |
|---|---|---|
| පත්වීම් | | |
| ආර්. පී. බුල්ජන්ස් මහතා | විධායක නොවන | 2025.01.01 |
| ආර්. ධර්මේන්ද්‍ර මහතා | විධායක නොවන | 2025.01.01 |
| එන්. ඩී. බී. උනම්බුව මහතා, ජනාධිපති නීතිඥ | විධායක නොවන | 2025.01.01 |
| ඉල්ලා අස්වීම් | | |
| නිශාන්ත දයානන්ද මහතා | විධායක නොවන | 2025.01.01 |
| අනිල් කොස්වත්ත මහතා | විධායක නොවන | 2025.01.02 |

## 47.6 සමාගම - ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්

**2024 දෙසැම්බර් 31 වන දිනෙන් පසු, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩල සංයුතියේ පහත වෙනස්කම් සිදු විය.**

1. නිශාන්ත දයානන්ද මහතා 2025 ජනවාරි 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය.
2. අනිල් කොස්වත්ත මහතා 2025 ජනවාරි 2 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය.

තවද, 2025 ජනවාරි 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, 2007 අංක 7 දරන සමාගම් පනත සහ සාංගමික ව්‍යවස්ථාවලිය ප්‍රකාරව, දැනට සිටින අධ්‍යක්ෂවරුන්ට අමතරව, පහත සඳහන් පුද්ගලයින් අදාළ අධ්‍යක්ෂ මණ්ඩලවලට පත් කරන ලදී:

1. ආර්. පී. බුල්ජන්ස් මහතා
2. ආර්. ධර්මේන්ද්‍ර මහතා
3. එන්. ඩී. බී. උණම්බුවේ මහතා, ජනාධිපති නීතිඥ

පහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩලය ඊළඟ වාර්ෂික මහා සභා රැස්වීම දක්වා තනතුරු දරනු ඇති අතර පසුව සාංගමික ව්‍යවස්ථාවලිය ප්‍රකාරව නැවත තේරී පත්වීමට සුදුසුකම් ලබයි.

| අධ්‍යක්ෂවරයාගේ නම | පත්වීම් දිනය |
|---|---|
| නුසිත් කුමාරතුංග මහතා | 2024.10.23 |
| දුෂ්මන්ත තොටවත්ත මහතා | 2023.10.06 |
| කේ රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා | 2023.10.06 |
| ආර්.පී. බුල්ජන්ස් මහතා | 2025.01.01 |
| ආර් ධර්මේන්ද්‍ර මහතා | 2025.01.01 |
| එන්.ඩී.බී. උනම්බුවේ මහතා, ජනාධිපති නීතිඥ | 2025.01.01 |

ශේෂ පත්‍ර දිනය වන විට සමාගමේ මූල්‍ය තත්ත්වය කෙරෙහි මෙම වෙනස්කම් සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා නොකෙරේ. කෙසේ වෙතත්, සමාගමේ අනාගත උපායමාර්ගික තීරණ වලදී ඒවා සලකා බලනු ලැබේ.

# 48 අඛණ්ඩ පැවැත්ම

සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳව අධ්‍යක්ෂවරුන් විසින් තක්සේරුවක් සිදුකර ඇති අතර, ඉදිරි කාලය සඳහා ව්‍යාපාරයේ දිගටම කරගෙන යාමට සම්පත් ඇති බවට සෑහීමකට පත්ව ඇත. තවද, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි කිසිදු ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පිළිබඳව අධ්‍යක්ෂවරුන් දැනුවත් වී නොමැත. එබැවින්, මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩව පවත්වාගෙන යාමේ පදනම මත සකස් කරනු ලැබේ.

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී, කළමනාකරණය විසින් ජීවිත හා සාමාන්‍ය ව්‍යාපාර වෙන් කිරීම සහ අඛණ්ඩ සූදානම පදනම් කරගත් පදනම භාවිතා කිරීම හේතුවෙන් ආර්ථික තත්ත්වයන්, කොටස් විකිණීම සහ ඇති විය හැකි බලපෑමේ පවතින බලපෑම් තක්සේරු කර ඇත. වර්තමාන ගෝලීය සහ දේශීය ආර්ථික තත්ත්වයන් යටතේ ව්‍යාපාර කටයුතු කරගෙන යාමට හැකිවන පරිදි සමාගම විසින් ක්‍රියාත්මක කරන ලද ලාභදායිතාවය, ආදායම් ප්‍රවාහ, කාරක ප්‍රාග්ධන කළමනාකරණය, ප්‍රාග්ධන වියදම්, මුදල් සංචිත, සංචාරක සීමාවන්, ESG සලකා බැලීම් සහ පිරිවැය කළමනාකරණ මුලපිරීම් වැනි පුළුල් පරාසයක සාධක සැලකිල්ලට ගනිමින් සමාගම තම ව්‍යාපාරවල ඔරොත්තු දීමේ හැකියාව ඇගයීමට ලක් කර ඇත. පවතින තොරතුරු මත පදනම් වූ විශ්ලේෂණය සහ අනාගත දැක්ම මත පදනම්ව, සමාගමට අඛණ්ඩ පැවැත්මක් ලෙස ඉදිරියට යාමට ඇති හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි කිසිදු අවිනිශ්චිතතාවයක් පිළිබඳව අධ්‍යක්ෂවරුන් දැනුවත් වී නොමැත.

## 48.1 මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (පුද්) සමාගම

සේවකයින් සම්බන්ධ නීතිමය කටයුතු පවතින බැවින්, මෙම ගැටළු සම්පූර්ණයෙන්ම විසඳන තෙක් මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (පුද්) සමාගමෙහි මෙහෙයුම් අඛණ්ඩව කරගෙන යාමට මණ්ඩලය විසින් තීරණය කර ඇත. සියලුම නොවිසඳී ඇති නීතිමය නඩු විසඳා ගත් පසු, කළමනාකාරිත්වය තත්ත්වය ඇගයීමට ලක් කර සමාගමේ විහව ඈවරකිරීම සම්බන්ධයෙන් තීරණයක් ගනු ඇත. ඒ අනුව, අඛණ්ඩ මූලධර්මයේ උපකල්පනය මත පදනම්ව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

# ආයතනික තොරතුරු

### සමාගමේ නම
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්

### ලියාපදිංචි කාර්යාලය
අංක 21, වෝක්ෂෝල් වීදිය, කොළඹ 2.

### සම්බන්ධතා තොරතුරු
**දුරකථන:** +94 11 2357457
**ෆැක්ස්:** +94 11 2447742
**වෙබ් අඩවිය:** www.srilankainsurance.com

### සමාගමේ ලියාපදිංචි අංකය
සමාගම 1993 පෙබරවාරි 03 දින 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ අංක N (PBS/CGB)/ 159 අංකය දරමින් සංස්ථාපිත කරන ලද අතර, 2008 අප්‍රේල් 17 දින 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ PB 289 අංකය දරමින් නැවත ලියාපදිංචි කරන ලදී.

### අධ්‍යක්ෂ මණ්ඩලය

1. නුසිත් කුමාරතුංග මහතා
2. දුෂ්මන්ත තොටවත්ත මහතා
3. කේ. රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා
4. ආර්. පී. බුල්ජන්ස් මහතා
5. ආර්. ධර්මේන්ද්‍ර මහතා
6. එන්. ඩී. බී. උනම්බුව මහතා, ජනාධිපති නීතිඥ

### නෛතික ස්වභාවය

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් 1961 අංක 2 දරන රක්ෂණ සංස්ථා පනත යටතේ රාජ්‍ය සංස්ථාවක් ලෙස ස්ථාපනය කරන ලදී. 1993 දී, 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ රජය සතු ව්‍යාපාරික ආයතන රාජ්‍ය සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත යටතේ සංස්ථාව සම්පූර්ණ රජයට අයත් සීමිත වගකීම් සමාගමක් බවට පරිවර්තනය කරන ලද අතර, සියලුම කොටස් (100%) භාණ්ඩාගාර ලේකම්වරයා සතු විය. රජයේ පුද්ගලීකරණ වැඩසටහන යටතේ, සමාගම 2003 දී පුද්ගලීකරණය කරන ලද අතර වසර හයක් වැනි කෙටි කාලයක් පුද්ගලික කළමනාකරණය යටතේ පැවතුණි. සංස්ථාව 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරන ලදී. 2009 ජූනි 04 දින ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව අනුව, පුද්ගලීකරණය අවලංගු කරමින්, කොටස් 99.98%ක් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් භාණ්ඩාගාර ලේකම්වරයා සතුව පවරන ලදී.

### බදු තොරතුරු

- **බදු ගෙවන්නාගේ හැඳුනුම් අංකය (TIN):** 294001590
- **එකතු කළ අගය මත බදු (VAT) ලියාපදිංචි අංකය:** 294001590-7000

**සමාගම් ලේකම්** (2024.04.02 දින සිට බල පැවැත්වෙන පරිදි පත් කරන ලදී)
ශිරෝමි සී. එම්. කෝදාගොඩ මහත්මිය
බී.ඒ. (පේරාදෙණිය විශ්ව විද්‍යාලය), නීතිඥ, දිවුරුම් කොමසාරිස්, නොතාරිස්, සාම විනිසුරු (මුළු දිවයිනටම)

**අනුබද්ධිත සමාගම් (2024 දෙසැම්බර් 31 වන දිනට)**

මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (පුද්ගලික) සමාගම
ලංකා හොස්පිටල්ස් කෝපරේෂන් පොදු සමාගම
ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම
ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම
කැනෝවින් හෝටල් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්

**උප-අනුබද්ධිත සමාගම් (2024 දෙසැම්බර් 31 වන දිනට)**

ලංකා හොස්පිටල්ස් ඩයග්නොස්ටික්ස් (පුද්ගලික) සමාගම

**විගණකවරු**

**විගණකාධිපති**
**විගණකාධිපති** දෙපාර්තමේන්තුව

**බැංකුකරුවන්**

ලංකා බැංකුව
මහජන බැංකුව
කොමර්ෂල් බැංකුව
හැටන් නැෂනල් බැංකුව
සෙලාන් බැංකුව
ඩීඑෆ්සීසී බැංකුව
ජාතික ඉතිරිකිරීම් බැංකුව
පෑන් ඒෂියා බැංකුව

**ආයුගණකවරු**

**(i) ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සඳහා පත්කරන ලද ආයුගණක වරයා:**

**පත්කරන ලද ආයුගණක වරයාගේ නම:** කුන්ජ් බෙහාරි මහේෂ්වරි, FIA
**පත් කරන ලද දිනය:** 2019 පෙබරවාරි සිට
**සමාගම:** විලිස් ටවර්ස් වොට්සන් ඉන්දියා පුද්ගලික සමාගම
**ලිපිනය:** එමාර් කැපිටල් ටවර් 2, මෙහරෝලි-ගුර්ගාඕන් පාර, සෙක්ටර් 26, ගුරුග්‍රාම් – 122002, ඉන්දියාව
**දුරකථන/ෆැක්ස්:** (91) 124 4322 2800
**විද්‍යුත් තැපැල:** Kunj.Maheshwari@wtwco.com

**(ii) ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් සඳහා පත්කරන ලද ආයුගණක වරයා:**

**පත්කරන ලද ආයුගණක වරයාගේ නම:** රොබර්ටෝ මලාටියා, FIA
**පත් කරන ලද දිනය:** 2022 අගෝස්තු
**සමාගම:** එන්එම්ජී ෆනැන්සියල් සර්විසස් කන්සල්ටින් (පුද්ගලික) සමාගම
**ලිපිනය:** 109 නෝර්ත් බ්‍රිජ් පාර, අංක 05-21, සිංගප්පූරුව 179097
**දුරකථන/ෆැක්ස්:** +65 8920 9234
**විද්‍යුත් තැපැල:** Rob.Malattia@NMG-Group.com

# මහා සභා රැස්වීමේ නිවේදනය

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්හි පනස් එක්වන (51) වාර්ෂික මහා සභා රැස්වීම (AGM) 2025 ජුනි 30 වන සඳුදා පෙ.ව. 10.00 ට අංක 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02 හි පිහිටි එහි ලියාපදිංචි කාර්යාලයේදී (ශ්‍රවණාගාරය - 07 වන මහල), පහත සඳහන් අරමුණු පෙරදැරිව පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ:

## 1. සාමාන්‍ය යෝජනාව – 01

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන, ඒ පිළිබඳ විගණක වාර්තාව සමඟ භාරගනු ලැබ සලකා බැලීමට.

## 2. අධ්‍යක්ෂකවරුන් තෝරා පත් කර ගැනීම සඳහා:

### (i) සාමාන්‍ය යෝජනාව - 02

සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 92 වන වගන්තිය සමඟ කියවිය යුතු 93 වන වගන්තියේ නියමයන්ට අනුව ආවර්තනයට යටත්ව විශ්‍රාම යන අධ්‍යක්ෂවරයෙකු වන කන්දේගමගේ රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා නැවත තෝරා පත් කර ගැනීම සඳහා

2007 අංක 7 දරන සමාගම් පනතට සහ සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ සංගමයේ 93 වන වගන්තිය සමඟ කියවන ලද 92 වන වගන්තියට අනුව, කන්දේගමගේ  රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා පනස් එක් වන (51) වාර්ෂික මහා සභා රැස්වීමේදී නැවත තේරී පත්වීමට සුදුසුකම් ලබන අතර සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස නැවත තේරී පත්වීම සඳහා ඔහු ඉදිරිපත් වී ඇත.

මණ්ඩලය විසින් පහත යෝජනාව අනුමත කරන ලද අතර එය කොටස් හිමියන්ට සාමාන්‍ය යෝජනාවක් ලෙස සලකා බලා අනුමැතිය ලබා දෙන ලෙස නිර්දේශ තරන ලදි:

"සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ වගන්තිවල 93 වන වගන්තිය සමඟ කියවිය යුතු 92 වන වගන්තියට අනුව විසඳා ඇති, සමාගමේ පනස් එක්වන (51) වාර්ෂික මහා සභා රැස්වීමේදී ආවර්තනයට යටත්ව විශ්‍රාම යාමට යටත් වන කන්දේගමගේ රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා (NIC - 711021116V), මෙයින් සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස නැවත තේරී පත් වේ".

### (ii) සාමාන්‍ය යෝජනාව - 03

සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 92 වන වගන්තිය සමඟ කියවිය යුතු 93 වන වගන්තියේ නියමයන්ට අනුව, ආවර්තනයට යටත්ව විශ්‍රාම යන අධ්‍යක්ෂවරයෙකු වන පලවින්නගේ නුසිත් සමරසී කුමාරතුංග මහතා නැවත තෝරා පත් කරගැනීම සඳහා.

2007 අංක 7 දරන සමාගම් පනතට සහ සමාගම් සංගමයේ 93 වන වගන්තිය සමඟ කියවන ලද 92 වන වගන්තියට අනුව, පලවින්නගේ නුසිත් සමරසී කුමාරතුංග මහතා  පස්වන (51) වාර්ෂික මහා සභා රැස්වීමේදී නැවත තේරී පත්වීමට සුදුසුකම් ලබන අතර සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස නැවත තේරී පත්වීම සඳහා ඔහු ඉදිරිපත් වී ඇත.

මණ්ඩලය විසින් පහත යෝජනාව අනුමත කරන ලද අතර එය කොටස් හිමියන්ට සාමාන්‍ය යෝජනාවක් ලෙස සලකා බලා අනුමැතිය ලබා දෙන ලෙස නිර්දේශ තරන ලදි:

"සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ වගන්තිවල 93 වන වගන්තිය සමඟ කියවිය යුතු 92 වන වගන්තියට අනුව විසඳා ඇති, සමාගමේ පනස් එක්වන (51) වාර්ෂික මහා සභා රැස්වීමේදී ආවර්තනයට යටත්ව විශ්‍රාම යාමට යටත් වන පලවින්නගේ නුසිත් සමරසී කුමාරතුංග මහතා (NIC - 693431514V), මෙයින් සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස නැවත තේරී පත් වේ".

## 3. 2025 වර්ෂය සඳහා විගණකාධිපතිවරයා බාහිර විගණක ලෙස නැවත පත් කිරීම.

### සාමාන්‍ය යෝජනාව - 04

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා බාහිර විගණක ලෙස නැවත පත් කිරීම.

නැවත පත් කරනු ලැබුවහොත්, 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා විගණකාධිපතිවරයා නැවත පත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය එහි රැස්වීමේදී නිර්දේශ කර තිබුණි.

මණ්ඩලය විසින් පහත යෝජනාව අනුමත කරන ලද අතර එය කොටස් හිමියන්ට සාමාන්‍ය යෝජනාවක් ලෙස සලකා බලා අනුමැතිය ලබා දෙන ලෙස නිර්දේශ තරන ලදි:

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විගණකාධිපතිවරයා, මෙම පනස් එක්වන (51) වාර්ෂික මහා සභා රැස්වීමේ නිගමනයෙන් සමාගමේ සහ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ඊළඟ වාර්ෂික මහා සභා රැස්වීම අවසන් වන තෙක් බාහිර විගණක ධූරය දැරීමට නැවත පත් කරන බව මෙයින් නිර්දේශ කරනු ලබන අකර අදාළ ක්‍රියාවලිය සහ ක්‍රියා පටිපාටිවලට අනුව ඔවුන්ගේ වේතනය නියම කිරීමට මෙයින් බලය පවරනු ලැබේ".

## 4. සාමාන්‍ය යෝජනාව - 05

2025 වර්ෂය සඳහා සහ ඊළඟ වාර්ෂික මහා සභා රැස්වීමේ දිනය දක්වා පරිත්‍යාග තීරණය කිරීමට අධ්‍යක්ෂවරුන්ට බලය පැවරීම.

## 5. නියමිත දැනුම්දීම ලබා දී ඇති විශේෂ කාර්යය

### විශේෂ යෝජනාව - 01

සෝමදාස පලිහවඩන මහතා (වයස අවුරුදු හැත්තෑව (70) ඉක්මවූ) සීමාසහිත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීමට.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයට සහ එහිම අනුබද්ධිත සමාගම් වන ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් යන සමාගම්වලට සෝමදාස පලිහවඩන මහතා (වයස අවුරුදු හැත්තෑව (70) ඉක්මවූ) පත් කරන ලෙස මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉල්ලීමක් ලැබී ඇත.

තමාට වයස අවුරුදු 71 ක් වන බවත් 2025 ජූනි 7 වන දිනට වයස අවුරුදු 72 ක් වන බවත් සඳහන් විධිමත් දැන්වීමක්, 2007 අංක 7 දරන සමාගම් පනතේ 212 වගන්තිය යටතේ, සෝමදාස පලිහවඩන මහතාගෙන් සමාගම වෙත ලැබී ඇති අතර ඉහත සඳහන් ලිපිවල සත්‍ය පිටපතක් සහ ඔහුගේ ජීව දත්ත පත්‍රිකාව මෙම දැන්වීමට අමුණා ඇත.

ඒ අනුව, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, එහි කොටස් හිමියන්ගේ අනුමැතියට යටත්ව, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයට ඔහු පත් කිරීමට තීරණය තරන ලදි.

එබැවින්, සුදුසු යැයි හැඟේ නම්, කොටස් හිමියන් විසින් "විශේෂ යෝජනාවක්" ලෙස, යම් සංශෝධනයක් සහිතව හෝ රහිතව සම්මත කළ යුතු පහත යෝජනාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්දේශ කරනු ලැබේ:

“2007 අංක 7 දරන සමාගම් පනතේ 210 වගන්තිවල දක්වා ඇති වයස් සීමාව, 2025 ජුනි 7 වන දින වයස අවුරුදු 72 සම්පූර්ණ කළ සෝමදාස මහතාට (ජාතික හැඳුනුම්පත් අංකය - 195315901011) අදාළ නොවන බවට නිර්දේශ කරන අතර, ඊළඟ වාර්ෂික මහා සභා රැස්වීම අවසන් වන තෙක් තනතුර දැරීමට, සෝමදාස මහතා මෙයින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් හි විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරනු ලබන අතර සුදුසුකම් ලත් බැවින්, කොටස් හිමියන්ගේ අනුමැතියට යටත්ව නැවත තේරී පත්වීම සඳහා ඉදිරිපත් වී ඇත”.

6. විධිමත් දැනුම් දීමක් ලබා දී ඇති වෙනත් ඕනෑම කාරණයක් සම්බන්ධයෙන්

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ශිරෝමි කෝදාගොඩ

සමාගම් ලේකම්

2025 ජුනි 02

# පෙරකලාසි පත්‍රය

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් හි සාමාජිතයකු/සාමාජිකයින් වන ........................................................................................... හි ....................................... වන මම/අපි*……………………………………………………………………………………………
……………………………………………………………………………………………….හි
………………………………………………………………………………………………
හෝ ඇය හෝ ඔහු අපොහොසත් වන්නේ නම් පහත සඳහන් අධ්‍යක්ෂවරුන්ගෙන් අයකු

කොළඹ, පලවින්නගේ නුසිත් සමරසී කුමාරතුංග මහතා හෝ ඔහු අසමත් වන්නේ නම්
කොළඹ, දූෂ්මන්ත තොටවත්ත මහතා හෝ ඔහු අසමත් වන්නේ නම්
කොළඹ, කන්දේගමගේ රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා හෝ ඔහු අසමත් වන්නේ නම්
කොළඹ, රොහාන් පිලිප් බුල්ජන්ස් මහතා හෝ ඔහු අසමත් වන්නේ නම්
කොළඹ, කුලවරතරාසා රජීව් ධර්මේන්ද්‍ර මහතා හෝ ඔහු අසමත් වන්නේ නම්
කොළඹ, නීල් ධනුනායක බණ්ඩාර උණම්බුව මහතා
කොළඹ ජනාධිපති නීතිඥ නීල් ධනුනායක බණ්ඩාර උණම්බුව මහතා

මාගේ/අපගේ පෙරතලාසිකරු වශයෙන් 2025 ජුනි 30 වන සඳුදා පෙ.ව. 10.00 ට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් හි ලියාපදිංචි කාර්යාලයේදී (ශ්‍රවණාගාරය - 07 මහල) පැවැත්වෙන එහි පනස් එක්වන (51) වාර්ෂික මහා සභා රැස්වීමේදී (AGM) මා/අප නියෝජනය කිරීමට සහ මා/අප වෙනුවෙන් මෙහි දක්වා ඇති පරිදි ඡන්දය දීමට සහ ඉහත රැස්වීමේ ප්‍රතිඵලයක් ලෙස පැවැත්විය හැකි සෑම ඡන්ද විමසීමකදීම සහ එහි ඕනෑම කල් තැබීමකදී මා/අප නියෝජනය කිරීමට සහ මා/අප වෙනුවෙන් ඡන්දය දීමට මෙහි ලා පත්කරමි.

දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති යෝජනා සඳහා මා/අප වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ කරන ලෙස මම/අපි, මගේ/අපගේ ප්‍රතියෝජක හිමිකරුට, පහත සුදුසු කොටුවේ "X" අකුර යෙදීමෙන් නියෝග කරමි/කරමු.

| යෝජනාව | වෙනුවෙන් | එරෙහිව |
|---|---|---|
| සාමාන්‍ය යෝජනාව – 01 නිවේදනයේ දක්වා ඇති පරිදි | | |
| සාමාන්‍ය යෝජනාව – 02 නිවේදනයේ දක්වා ඇති පරිදි | | |
| සාමාන්‍ය යෝජනාව – 03 නිවේදනයේ දක්වා ඇති පරිදි | | |
| සාමාන්‍ය යෝජනාව – 04 නිවේදනයේ දක්වා ඇති පරිදි | | |
| සාමාන්‍ය යෝජනාව – 05 නිවේදනයේ දක්වා ඇති පරිදි | | |
| විශේෂ යෝජනාව – 01 නිවේදනයේ දක්වා ඇති පරිදි | | |

2025 ……………………………………………………… දින ……………………………………..

කොටස් හිමියන්ගේ/හිමියන්ගේ අත්සන
සටහන:
*කරුණාකර නුසුදුසු වචන කපාහරින්න.
පෙරකලාසි පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් මෙහි පහත හෝ පිටුපස දක්වා ඇත.

## පෙරකලාසි පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

(1) රැස්වීමට සහභාගී වී ඡන්දය දීමට හිමිකම් ඇති සාමාජිකයෙකුට සාමාජිකයෙකු වෙනුවට සහභාගී වී ඡන්දය දීමට නියෝජිතයෙකු පත් කිරීමට අයිතිය ඇත.

(2) නියෝජිතයෙකු සමාගමේ සාමාජිකයෙකු වීම අවශ්‍ය නොවේ.

(3) පත් කරන්නා සමාගමක් හෝ සංස්ථාවක් නම්, නියෝජිතයාගේ ආකෘතිය එහි පොදු මුද්‍රාව යටතේ හෝ සමාගමේ හෝ සංස්ථාවේ නිසි බලයලත් නිලධාරියෙකු විසින් එහි සාංගමික ව්‍යවස්ථාවලියට අනුකූලව ක්‍රියාත්මක කළ යුතුය.

(4) පෙරකලාසි පත්‍රය නීතිඥවරයෙකු විසින් අත්සන් කර ඇත්නම්, එවැනි ඇටර්නි බලපත්‍රය ක් දැනටමත් සමාගම සමඟ ලියාපදිංචි වී නොමැති නම් අදාළ ඇටර්නි බලපත්‍රය ලියාපදිංචි කිරීම සඳහා සම්පූර්ණ කරන ලද පෙරකලාසි පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය.

(5) සම්පූර්ණ කරන ලද පෙරකලාසි පත්‍රය, රැස්වීම සඳහා නියම කර ඇති වේලාවට  පැය 48 කට නොඅඩු කාලයකට පෙර, කොළඹ 02, චෝක්ෂෝල් වීදියේ, අංක 21,  08 වන මහලේ, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් හි සමාගම් ලේකම් කාර්යාලයේ සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ තැන්පත් කළ යුතුය.

SLIC
Sri Lanka Insurance

**ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්**

**අංක 21, වෝක්ෂෝල් වීදිය, කොළඹ 2.**

**www.srilankainsurance.com**